


දිවයින
ඉරිදා සංග්‍රහය
ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 3

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 3

ඉදිරිපත් කිරීම
**ඉන්ද්‍රජිත් සුබසිංහ**

**දිවයින ඉරිදා සංග්‍රහයේ**
**ලිපි මාලාවක් ඇසුරිනි**

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2013 මැයි
විසිවන මුද්‍රණය - 2014 ඔක්තෝබර්
විසිපස්වන මුද්‍රණය - 2015 ජූලි
විසිහයවන මුද්‍රණය - 2015 ඔක්තෝබර්
විසිහතවන මුද්‍රණය - 2015 දෙසැම්බර්
විසිඅටවන මුද්‍රණය - 2016 පෙබරවාරි
විසිනමවන මුද්‍රණය - 2016 මැයි

ISBN 978-955-7887-02-9

පොත ලබාගත හැකි ස්ථාන
**දිවයින පුරා පොත් අලෙවි සැල්**

**විමසීම්:**

දුරකථන: 0712 199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 1.30 දක්වා)

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්**
444/3B, පිටිපන දකුණ, හෝමාගම




මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩ සිටිනවාදැයි මම නොදනිමි. එහෙත් උන්වහන්සේ මේ පින් බිමේ කුමන හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාරීව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ බිය දැක මේ ආත්මයේදීම සසර දුකින් එතෙරවීම අදිටන් කරගනිමින් ඍජුව නිවන් මගේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නොවෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නොපැකිලෙමි. තම අවබෝධය මෙන්ම අත්දැකීම්ද උන්වහන්සේ සතුවූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නොකළ සටහන් ලෙසින් මා අතට පත්කළ උන්වහන්සේ නොපෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනිකද. ගැඹුරුද. ආශ්චර්යමත්ද. නිවන් මඟට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයටම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහුදුන් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදිරිපත් වුවද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නොකරන සේ කරන ලද ඇයැදුමක්ද විය. කර්තෘ අඥාත වුවද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතුවනු නිසැකය. ඒ නිසාම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිරීමට මට ඉඩ දුන මැනවි!

( 2012 වෙසක් පුන් පොහෝ දින )

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
බියදැක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරගන්න වීරිය වඩන්න
[illegible] ඔබ [illegible] "[illegible]"
[illegible] [illegible] උතුම්ම වචනයක්
ඒ අසිරිමත් නිර්වාණය
උපකාරයක් වේවා, හේතුවක් වේවා
මාර්ගයක් වේවා
තම තමාම එළඹෙන [illegible]
තම තමන්ගේ ජීවිත වලින් [illegible] ගනිත්වා.
කිසියම් හෝ ව්‍යාකරණ වරදක් ඇතොත්
ඔබ [illegible] වරදක්
ඔබ නොගැටේවා.
[illegible] අනුකම්පා කෙරේවා
[illegible] [illegible] [illegible]
[illegible] [illegible] දකින්.
[illegible] [illegible] [illegible] [illegible]
ඔබ [illegible] [illegible] වේවා.
[illegible] [illegible] [illegible] කොට ගනිත්වා.

*(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)*

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ  තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු ‘දුක’ යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය ‘දුක අවබෝධ කිරීම’ යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කළ්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කළ්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

-ඉන්ද්‍රජිත්

# පටුන

කතාව දිග්ගැස්සුනොත්....... 1

එක්කෝ මරණය- නැතිනම් සතර අපායෙන් මිදීම (හව ගමනේ ඇතිකරගන්නා ශක්තිමත්ම චිත්තය) 4

ජීවිතය යනු ඉලක්කම් ගොඩක්ද? 10

සම්බුදු සරණ විකුණනවද මාරයට? 15

ග්‍රහයන්ගේ ග්‍රහණයට හසුවූ අසරණයන්ට 22

දුක මරන්න! නැතිනම් ඔබ මැරුණත් දුක නොමැරෙයි 27

සංස්කාරයන්ට අනුව ජීවිතය නොදක්කොත්....? 31

පෙර ආත්මයේ නතරකළ තැනින් අරඹන්න 36

පින් පව් එනවා අපි පසුපස්සේ I (සෑම රියදුරෙක්ම කියවන්නේ නම් මැනවි) 41

පින් පව් එනවා අපි පසුපස්සේ II 48

හැංගි හැංගි වෙස් බැන්දත් 55

බලන්න ඊර්ෂ්‍යාවේ වෛරයේ රඟ 61

සත්තයි, ආයේ කිසිදවසක වරදින්නේ නැහැ 67

දෙමාපියන් වෙනුවෙන් දරුවන්ට-
දරුවන් වෙනුවෙන් දෙමාපියන්ට 73

සමාධියෙන් දුටු අකුසල් කන්දක් 82

ගස් නගින දෙවියකු වී කුමට? 85

දානය මහත්ඵල මහානිසංස වීමට 93

අකුසලයට පොකුරු ගසන්නට ඉඩ නොදෙන්න... 100

ගොනා පසුපස නගුල එන්නා සේ 106

හිංසාවේ ආදීනව තවදුරටත් 113

මෛත්‍රියත් පරෙස්සමින් ! 121

මාරයා කුළුමීමකු ලෙසින් පැමිණියේය 128

මාරයා තවත් මුහුණකින් 134

'මම' නැමැති කුණු ගොඩට තවත්
කසල එකතුවීමට ඉඩ නොදෙන්න 140

ලොව සුන්දරම මරණයට ඔබටද හිමිකමක් ඇත 146

# කතාව දිග්ගැස්සුනොත්.......

පුංචි කතා, ලොකු කතා කියා ස්වභාවයන් දෙකක් ලෝකයේ පවතී. පුංචි වුවද ලොකු වුවද කතාව සකස්වන්නේ ඇතිවී නැතිවී යන සිතක් හේතුවෙන්ය. එම සිතට ඇලීමේ ගැටීමේ ස්වභාවය මත කතාව පුංචි හෝ ලොකු බවට පත්වෙයි. එක සිතක් නිසා මනුෂ්‍යයෙක් සිනාසෙයි, හඬයි, අපේක්ෂා සහගත වෙයි. සමහරවිට තමා විසින්ම තමාගේ ජීවිතය සියදිවි නසාගැනීම දක්වා, ඇතිවූ සිත තණ්හාවෙන් තෙත්වූ නිසා තව තව සිත් පරම්පරාවන් ඇතිකර දෙයි. සිනාසීම පුංචි කතාවකි. දිවි නසාගැනීම ලොකු කතාවකි. දෙකටම මූලාරම්භය වූයේ ඇතිවී නැතිව ගිය සිතකි. ඒ සිතට ඇලීම නිසා හටගත් සිත් පරම්පරාවකි. සකස් වුණ සිතට ඇති වුණ ඇලීමේ, ගැටීමේ ස්වභාවය මත කතාව ලොකු, කුඩා විය. මනුෂ්‍යයෙක් කල්ප ගණන් සතර අපායේ දුක් විඳින්නේ ද, සුගතිවල සැප විඳින්නේ ද තෘෂ්ණාවෙන් තෙත් වුණු සිතක් නිසාය.

බලන්න අවිද්‍යාවෙන් තෙත් වු එක සිතක් කල්ප ගණන් ඔබට දුක උරුම කරන දිග කතාවක්, ලොකු කතාවක් කියන්න ඔබව රැගෙන යන හැටි.

ඔය සතර අපායේ ජීවත්වන අනන්ත දුක් විඳින සත්ත්වයන් ඔය දුකට වැටුණේ කවදා හරි දවසක තමා තුළ ඇතිවුණ රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තෙත් වුණු සිතක් නිසාය. එසේනම් මෙවැනි අතිභයංකර දුකක් කල්ප ගණන් දිගට ඇදෙමින් ගෙවන්නේ තමන්ට අයත් නොමැති ආගන්තුක, ඇතිව නැතිව ගිය රාග, ද්වේශ, මෝහයෙන් තෙත් වූ සිතක් නිසා වීම අභාග්‍යයකි. පුංචි සිතක් ඇති කළ දිග කතාවකි එය.

නමුත් ඔබ අතහැරීම, සිතේ අනිත්‍ය බව දකින්නට පුරුදුකර තිබී, ඇලීම ගැටීම සහිත සිත ඔබව දිග කතා ගොතන සංචාරකයෙක්

කරවන බවට ඔබ තුළ අවබෝධාත්මක සංඥාවක් වඩාගෙන තිබුණා නම් හෝ ලෝකයෙන් දුකෙන් මිදෙනවා යන්න අවංක සහගත විශ්වාසයකින් ඔබ නිවීමේ මාර්ගයට අවතීර්ණ ව සිටියා නම් යම් තීරණාත්මක මොහොතකදී ඤාණ දර්ශනයන් සඵල කරමින් ඇති වී නැති වී යන එක සිතක් ඔබට නිවීමේ ආශ්චර්යමත්, සැහැල්ලුවත්, නිදහසත් උදාකරනු ඇත.

කතාව නිමාකොට ඔබව ලෝකයෙන් නිවා දමන්නේ ද සිතක් සේ ම, ලෝකයාට විවෘත කොට ලොකු කතා ගොතන්නේ ද ඔය ඔබගේ ආගන්තුකයාමය. සිහි නුවණින් ධර්ම විනය දෙක තුළ ජීවත් වෙමින් සතිය සහ සිහිය ඇතිකර ගනිමින් මේ ආගන්තුකයා හඳුනාගෙන සැනසීම ලබන්න ඔබ උත්සාහ ගන්න.

සමාජය දෙස බැලීමේදී අපි දකින සියල්ලම ද දිග කතාය. හැම කතාවක්ම දිග්ගැසීමට හේතුව අවිද්‍යාව ශක්තිමත් වීමය. තරුණයෙක් තරුණියක් දෙස බැලුවොත් එය අවසන් වන්නේ විවාහයකිනි. දරු මුණුබුරන් ගෙනි. පවුල නැමැති බන්ධනයෙනි. ඒවා උපාදානය කරගෙන මියගිය පසු සතර අපායෙනි. එසේ නොවන්නේ නම් සුගතියෙනි.

කෙනෙක් තව කෙනෙක් දෙස ඔරවා බැලුව හොත්, ශරීරයේ හැපුන හොත්, අත්වැරැද්දක් වුනොත් එය අවසන්වන්නේ මිනීමැරුමට වසර ගණන් සිර දඬුවම් විඳීමෙනි. කල්ප ගණන් අපාදුක් විඳීමෙනි. සිංහල පින්වතෙක් ද්‍රවිඩ පින්වතකුගේ ඇඟේ හැපුනහොත්, නැතිනම් ද්‍රවිඩ පින්වතෙක් සිංහල පින්වතකුගේ ඇඟේ හැපීම අවසන් වන්නේ ජාතීන් දෙකක් අතර මහා යුද්ධයකිනි. විනාශයකිනි. මගේ රට, මගේ ජාතිය කියන උපාදානය නිසා සකස් වුන මහා වෛරයකිනි.

රට නිසා හෝ ජාතිය නිසා හෝ ඇති වූයේ වෛරය නම් ප්‍රතිඵලය දුකක්මය. මියගියේ වෛර සිතකින් නම් උරුමය සතර අපායමය.

යම් පින්වතෙක් සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිදි වුවවොත්, එම පැවිද්ද අවසන් වන්නේ දැනුම, කීර්තිය, ලාභ සත්කාර, නිකාය, පන්සල, කැළය,

කුටිය, සීලය, සමාධිය, මාර්ගඵල, රේඩියෝව, රූපවාහිනිය, ධර්ම ප්‍රචාරය.... මේවා සියල්ල මගේ කරගෙනය. කොටින්ම ස්වභාවධර්මයේ ස්වභාවය අර්ථ කර, අවබෝධ කර වදාළ සම්බුද්ධ දේශනයද ඔහු ඔහුගේ කොටගනී. මේ පොතේ සටහන්කර ඇති එකම කරුණක්වත් මේ සටහන් තබන භික්‍ෂුවට අයත් දෙයක් නොවේ. භික්ෂුව අතින් සිදු වූයේ ලෝකයේ ස්වභාවය, එම ස්වභාවය අවබෝධය ලබමින් ලත් අත්දැකීම් සටහන් තැබීම පමණක්මය.

භික්‍ෂුවට මේ කරුණු කිසිවක් අයිති නැත. ඒවා අයිති ලෝකයටයි. ලෝකය අයිති දුකටය, අනිත්‍යයටය. මේ කරුණු මගේ කරගත හොත් ඒ ඔහු අයිතිකර ගන්නේ ලෝකයයි, දුකයි, අනිත්‍යයි.

බලන්නකෝ ඇති වී නැති වී යන සිතක් සකස්කර දුන් සිත් පරම්පරාවක දිග කතාවල ස්වභාවය. මේ හැම දිග කතාවක්ම පුංචි කතාවක් බවට, නිවුන කතාවක් බවට පත්කර ගැනීමට හැකියාව තිබියදී ඇති වන සිතට ඇලීම, ගැටීම හේතුවෙන් සිත තෘෂ්ණාවෙන් තෙත් කිරීම හේතුවෙන්, සිත මගේ කරගැනීම හේතුවෙන්, අත්හැරීමෙන් නිවීම දෙසට යෑම නොව, අල්ලාගැනීමෙන් දිගකතා බවට පරිවර්තනය කරගන්නවා. අවිද්‍යාවෙන් මිදී ලෝකයෙන් මිදීමට ඔබත් වීර්යය වඩන්න.

# එක්කෝ මරණය- නැතිනම් සතර අපායෙන් මිදීම
## (භව ගමනේ ඇතිකරගන්නා ශක්තිමත්ම චිත්තය)

පසුගිය කාල වකවානුවල වැඩ සිටිය ගෞරවණීය ස්වාමීන් වහන්සේලාත් වර්තමානයේ වැඩ සිටින ගෞරවණීය ස්වාමීන් වහන්සේලාත් විසින් කරගෙන ගිය ධර්ම දේශනාමය, බෝධි වන්දනාමය පින්කම් හරහා අතිවිශාල තරුණ පිරිසක් ධර්ම මාර්ගයේ පෙරට එනවා පින්වතුන්ලා දකින්න ඇති. එම තරුණ පිරිස දිහා දැක්කහම, වර්තමානයේ පැවිදිභාවයට පත් වී උතුම් ජීවිත ගතකරන තරුණ ස්වාමීන් වහන්සේලා දැක්කහම සද්ධර්මයට සමාජය තුළ මොනතරම් දෙයක් කරන්න පුළුවන් ද කියලා සිතෙනවා, තරුණ පින්වතුන්ලාට. නමුත් මේ එක එක කාලවල දී මතුවී එන ධර්මයේ ප්‍රබෝධය කාලයක දී දුර්වලවෙලා යනවා. මෙය සටහන් තබන භික්ෂුවත් ගිහි කාලයේ දී එවැනි ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ පින්කම් තුළින් ධර්ම මාර්ගය ශක්තිමත් කරගත් අයෙක්. භික්ෂුව මේ කියන්න හදන්නේ ස්වාමින් වහන්සේලා හරහා ඇතිකර ගන්නා ධර්ම ප්‍රබෝධය ජීවිතය තුළින් වැඩිදියුණු කරගෙන ජීවිතයේ කොටසක් කරගන්න අප දක්ෂ වෙන්න ඕන කියලා. රැල්ලක් නැගෙන කොට රැල්ලත් සමග බොහෝම උද්යෝගයෙන් ගහගෙන යනවා. රැල්ල අහවරවෙනකොට නැවත සුපුරුදු තැනට එනවා. සතර ඉර්දිපාද ධර්මයන්ට අයත් ඡන්දය, වීර්යය, චිත්තය, විමංසා කියන කාරණාවලින් චිත්තය කියන ධර්මතාවය පින්වත් ඔබට මෙහිදී වැදගත් වෙනවා. මෙතනදී චිත්තය කියන්නෙ අධිෂ්ඨානයට. බෝධිසත්ත්වයන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධි මූලයේ වාඩිවෙලා ‘මගේ සම්, මස්, ඇට, නහර, වියලේවා. සම්මා සම්බෝධිය අවබෝධ කරගැනීමෙන් තොරව නොනැගිටිමිය’ කියලා චිත්තයක් ඇතිකර ගන්නවා.

බලන්න! 'අරමුණ - නැතිනම් මරණය' තමයි එම චිත්තයේ අර්ථය. මේ 'චිත්තය' කියන කාරණය පින්වත් ඔබත් ධර්ම මාර්ගයේ ශක්තිය උදෙසා ජීවිතයට එකතු කොට ගන්න. ධර්ම මාර්ගයේ රැල්ලත් සමග පෙරට ගිහිල්ලා රැල්ල නැවතුන තැන දි ආපසු හිටපු තැනට එන්නෙ ඔබ තුළ චිත්තයක් ඇතිකර නොගත් නිසාමයි.

ඔබ මේ ලිපි මාලාවම උදාහරණයට ගන්නකෝ. පුංචි හෝ ප්‍රබෝධයක් ධර්මයට කැමති පින්වතුන් ලා තුළ මේ ලිපි කෙරෙහි ඇති වෙලා ඇති. නමුත් පින්වත් ඔබ වටහා ගන්න ඕනෙ මේ කෙටි ප්‍රබෝධය අනිත්‍ය දෙයක් බව. හෙට අනිද්දා මේ ලිපිපෙළ අහවරවෙන කොට නැගුන ප්‍රබෝධය අහවරවෙනවා. නමුත් පින්වත් ඔබ නැවතිය යුතු නැහැ. ඔබ බලාපොරොත්තුවක් නොවේ 'චිත්තයක්' ඇතිකර ගන්න. ඔබ මෙතෙක් 'බලාපොරොත්තු' පමණයි ඇතිකර ගෙන තිබෙන්නේ. බලාපොරොත්තු කියන්නේ වෙනස් වෙන දෙයක්.

තරුණ කාලයමයි ධර්මය සුව සේ වැඩීමට සුදුසු කාලය. ජීවිතය ආයුෂ, වර්ණය, සැපය, බලය කියන කාරණාවලින් ජවසම්පන්න වන කාල වකවානුව. මෙම කාලයේ දී තමයි 'පටිභානය' කියන නුවණින් මෙනෙහි කිරීමේ ශක්තිය ජීවිතය තුළින් මෝදුවෙන්නේ. මේ කාලය දෘෂ්ඨීන්ගෙන් තොරව විවෘතව ලෝකය දකින කාලයක්. ඒ නිසා පින්වත් ඔබ අස්වැන්න හටගන්නා වෙලාවේම උපක්‍රමශීලීව අස්වැන්න නෙලාගන්න දක්ෂ වෙන්න ඕනේ. අස්වැන්න නැතිවුනාට පසු ගස කොතෙක් සෙලවුව ද වැටෙන්නේ අතු, කොළ, රිකිලිමය. අතු, කොළ, රිකිලි යනු ලෝභ, ද්වේෂ, මෝහයි.

වර්තමානයේ තරුණ කාලය වැඩියෙන්ම කැප වෙන්නේ අධ්‍යාපනය, රැකියාව, ආදරය වැනි කාරණයන්ටය. මේවායේ ප්‍රතිඵලය ලෝභ, ද්වේෂ, මෝහ අකුසල්වලින් ජීවිතය පිරීයාමයි. අධ්‍යාපනය ලබන්න. රැකියාව කරන්න. ආදරය කරන්න. මේවා කරන ගමන්ම ධර්ම මාර්ගයේත් පෙරටම නොකඩවා ගමන් කරන්න. වෙනස්වන බලාපොරොත්තු අභිබවා ගිය, නොවෙනස්වන චිත්තයක් ඇතිකර ගන්න. බලාපොරොත්තු වලට වටිනාකමක් දෙන්න එපා. බලාපොරොත්තුවලට බැහැ කවදාකවත් ධර්ම මාර්ගයේදී ඔබට ජයග්‍රහණයක් ලබා දෙන්න. බලාපොරොත්තු නිරතුරුවම ඔබව රවටනවා. කාමයේ ආශ්වාදය උදෙසා ඇතිවෙන

තෘෂ්ණාවේ බලවත්භාවය නිසාම බලාපොරොත්තු පසුබසිනවා. පසුබසින තැනදිම ඔබ තවත් නැවුම් බලාපොරොත්තු ඇතිකර ගන්නවා. එයත් හුදු බලාපොරොත්තුවක්මයි. ඔබ බලාපොරොත්තුවලින් ජීවිතය හිස්කරන්න. එවිට ජීවිතය එක තැනක නවතිනවා. ඒ නැවතුන තැන ඉඳලා චිත්තයක් අධිෂ්ඨානයක් ඇති කරගන්න '**එක්කෝ මරණය- නැතිනම් සතර අපායෙන් මිදීම**'ය කියලා. එය බොහෝම ශක්තිමත් තැනක්. එවැනි ශක්තිමත් චිත්තයක් ඇති විටෙක ඔබ, රැල්ල නැවතුන තැනදි, අසනීපයක් වුන තැන දි, ව්‍යාපාරය බිඳ වැටුන තැන දි, රැකියාව අහිමිවුන තැන දී ආපසු හැරෙන්නෙ නැහැ. මොකද ඔබ දුක ගැන දැනගෙනමයි දුකින් මිදීම දෙසට ගමන් කරන්නේ. මෙතනදි ඔබ තුළ ශ්‍රද්ධාව සකස්වෙලා තිබෙන්න අවශ්‍යයි. සද්ධර්මය සැකයකින් තොරව පිළිගැනීමට, ජීවිතයට එකතුකර ගැනීමට ශක්තිය ඔබ තුළ තිබිය යුතුයි.

බොහෝම ශ්‍රද්ධාවන්ත එක් තරුණ මහත්මයෙක් භික්ෂුවට ප්‍රකාශකළා 'හාමුදුරුවනේ! මා තුළ තරුණ කාලයේදී ම බලාපොරොත්තුවක් තිබුණා මම විවාහ වෙන්නෙ නැහැය කියලා. නමුත් මොකක්දෝ හේතුවක් නිසා මට පෙම්වතියක් මුණ ගැසුනා. එවිට අපි බලාපොරොත්තුවක් ඇතිකර ගත්තා විවාහ නොවී ධර්ම මාර්ගයේ ගමන් කරනවා කියලා. නමුත් හාමුදුරුවනේ මොකක්දෝ හේතුවක් නිසා අපි විවාහ වුනා. ඊට පස්සෙ අපි බලාපොරොත්තු වුනා දරුවන් හදන්නෙ නැහැ කියල. නමුත් මොකක්දෝ හේතුවක් නිසා දරුවෙක් හැදුවා. දැන් දරුවා පොඩියි. දැන් අපි බලාපොරොත්තු වෙන්නෙ දරුවා ලොකු වුනාම එයාවත් පැවිදි කරල අපිත් පැවිදි වෙන්න. අනේ හාමුදුරුවනේ අපේ මේ බලාපොරොත්තුව ඉටුකරගන්න පුළුවන් වෙයිද?' කියල ඒ මහත්මයා අහනවා. සත්‍යකින්ම එය ඉටුවෙන්නෙ නැහැ. මොකද එය හුදෙක් බලාපොරොත්තුවක් පමණක්මයි. ඔබ කළ යුත්තේ වෙනස් වෙන බලාපොරොත්තුවලින් බැහැර වෙලා නොවෙනස් වන චිත්තයක් සකස් කොට ගැනීමයි.

පින්වත් ඔබ ගිහි බැඳීම් වලට බැඳී ඇති නිසා පැවිදි වෙන්නටම අවශ්‍ය නැහැ. ගිහි ජීවිතය තුළ සිටිමින් ම '**එක්කෝ සතර අපායෙන් මිදීම- එක්කෝ මරණය**' කියන චිත්තය සකස් කොට ගන්න. ඊට අදාළ ධර්මතාවයන් ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන්න.

එසේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කොට ගතහොත් ඔබ ලෝකයේ ලොකුම ධනවතෙක්. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වර්ණනා කළ ධනවතා, පොහොසතා තමයි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කොටගත් පින්වතා. ඔබට ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ දරුවෙක් වෙන්න අවශ්‍ය නම් ඔබ ඔය ධනවත් භාවයට තමයි පත් වෙන්න ඕනේ. වර්තමාන සමාජයේ 'ධනවතා' 'පොහොසතා' කියන මිථ්‍යා මිම්ම ඔබ බැහැර කරන්න. ඔබ මේ සැබෑ ධනවත් භාවය හඳුනාගතහොත් සමාජයේ සැප ලබා ගැනීම උදෙසා පවතින තරඟකාරී මනුෂ්‍ය පොරයට ඔබ හවුල්වෙන්නෙ නැහැ. ඔබේ පොහොසත් භාවය කියන්නේ ඉලක්කම්වලින් මනින දෙයක් නොවේ. ධර්මයේ අර්ථය තුළින් මනින දෙයක් බව තේරුම් ගන්නවා. ඉලක්කමේ වටිනාකම් නොවටිනා බව ඔබ දකිනවා. ඔබට ලෝකය යන දිශාව වැඩක් නැහැ. ධර්මයේ අර්ථයන් වැඩෙන දිශාවයි වැදගත් වෙන්නේ. ඒ දිශාව වැටෙන්නෙ තමා තමාට හිරිහැරයක් නැති, කාටවත්ම හිරිහැරයක් නැති. ආර්ය අෂ්ඨාංගික මාර්ගය දෙසටයි. දැන් ඔබට පුළුවන් ශක්තිමත් චිත්තයක් ඇතිකර ගන්න. බලාපොරොත්තුවක් නම් නොවේ. බලාපොරොත්තුව තුළ සැකය, විචිකිච්ඡාව සැඟවිලා තිබෙනවා. පින්වත් ඔබ දැන් සම්මා දිට්ඨිය සකස් කොට ගෙන මාර්ගය තුළ සිටින්නේ. ආපස්සට යෑමක් නැහැ. මේ මොහොතේ ඇතිකරගත්තාවූ **'එක්කෝ සතර අපායෙන් මිදීම-නැතිනම් මරණය'** කියන චිත්තය ඔබ පසුකොට පැමිණියා වූ භව ගමනේ ඇතිකර ගත් ශක්තිමත් චිත්තය වෙනවා. පින්වත් ඔබට මේ දේ කරන්න මෙවරත් ශක්තිය නොමැති නම් ඔබ මෙවරත් පරාජය වේවි. එම නිසා සැබෑම සැපය උදෙසා ධර්මයේ සැබෑම පොහොසත් භාවය ජීවිතයට එකතු කර ගන්න.

භික්ෂුවක් ධර්ම සාකච්ඡාවකට සහභාගිවීමට ධර්මාසනයට වඩින විට එහි පැමිණ සිටි සුදුවත් දැරූ සියලුම පින්වතුන්ලා එක මියුරු ස්වරයකින් සාදු....සාදු....සාදු යන හඬින් සංඝ රත්නයට ගෞරව දැක්වූවා. ඒ හඬ බොහෝම ශ්‍රද්ධාවෙන් පිරුණු මිහිරි හඬක්. ගොඩාක් නිවුනු හඬක්. ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන්ම ඇසෙනකොට එය දිව්‍ය ලෝකයේ දෙවියන්ගේ හඬක්ද කියල සිතෙනවා. කොටින්ම ඒ සෑම සැදැහැවතෙක්ම එම මොහොතේ සිටින්නේ මනුෂ්‍ය සංඥාවලින්

මිදිලයි. දිව්‍ය සංඥා තමයි ඒ අයට සකස් වෙන්නේ. එක්තරා භික්ෂුවක් දවසක් රාත්‍රී සමාධිමත් සිතින් පසුවෙන කොට දිව්‍ය ශ්‍රෝත ඔස්සේ භික්ෂුවට දිව්‍යතලයකින් සාදු....සාදු....සාදු කියන හඬ ඇසිල තිබෙනවා. ඒ දිව්‍ය හඬත් මේ මනුෂ්‍යය ස්වරයත් එකම ස්වභාවයමයි. නමුත් එක්තරා රැයක දී භික්ෂුවට තවත් අපූරු දිව්‍ය ශ්‍රෝතයක් ඇසුනා. දිව්‍ය තලයක තනි දෙවියෙක්ගේ හඬින්. එම දෙවියාගේ හඬ වුනේ අනිත්‍යයි....අනිත්‍යයි....අනිත්‍යයි කියලා. බලන්න මුලින් සඳහන් කළ දෙවියාට වඩා කොච්චර නම් ඉදිරි දැක්මක්ද මේ දෙවැනි දෙවියාට තිබෙන්නේ. සමහර විට එම දෙවියා මාර්ගඵල ලාභී දෙවියෙක් වෙන්නත් පුළුවන්. ඒ නිසාම වෙන්ට ඇති සාදු....සාදු....සාදු කියන හඬෙහි අර්ථය ඉක්මවා ගිහිල්ලා අනිත්‍යයි....අනිත්‍යයි....අනිත්‍යයි කියන හඬ බොහෝම ගැඹුරු සංහිඳුන මනෝභාවයකින් සජ්ඣායනය කරන්නේ. භික්ෂුව පින්වත් ඔබට මතක් කරන්නේ පින්වත් ඔබත් ධර්ම මාර්ගයේ අඩියක් ඉදිරියට තබන්න. වර්තමානයේ හුඟක් තරුණ පිරිස්, ගිහි පින්වතුන්ලා පින්කම් වලදි සජ්ඣායනය කරන සාදු....සාදු....සාදු කියන සජ්ඣායන හඬේ අර්ථයෙන් අඩියක් පෙරට තබලා අර්ථවත්ව අනිත්‍යයි....අනිත්‍යයි....අනිත්‍යයි කියන සජ්ජායනයට පුරුදුවෙන්න. සාදු....සාදු කියලා බුදුරජාණන් වහන්සේට වන්දනා කරලා පමණක් ප්‍රමාණවත් නැහැ. බුදුරජාණන් වහන්සේ තුළින් ධර්මයේ අර්ථය හෙවත් අනිත්‍යය දකින්න. එවිටයි සැබවින්ම බුදුරජාණන් වහන්සේ වන්දනා කළා වෙන්නේ.

'අනිත්‍යය' කියන වචනය පාවිච්චි කරන්න, සජ්ජායනා කරන්න සමාජයේ හුඟක් බයයි. ඔබ 'අනිත්‍යය' කියන වචනය මෙනෙහි කරන්න, සජ්ඣායනා කරන්න, බයයි කියන්නේ ඔබ ධර්මයට බයයි කියන කාරණයයි. මේ දුර්වලතාවයන් දුරස් කරමින් අර්ථවත් තැනට ජීවිතය ගන්න. ඔබ දකින ස්වාමීන් වහන්සේත් අනිත්‍ය නම්, කරන පින්කමද අනිත්‍ය නම්, පින්කම නිසා සකස්වෙන වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ධර්මතාවයනුත් අනිත්‍ය නම් ඒ අර්ථයයි අපේ සිතේ මතුවෙන්න ඕනේ. මෙවැනි චිත්තයක් ඔබ තුළින් සකස් කොට ගතහොත් එයත් සතර අපායෙන් නිදහස් වීමට හුඟක් උපකාරී වේවි.

අනිත්‍යය ගැන කතා කරන්න හුග දෙනෙක් බියයි. අනිත්‍යය කියල හිතුවාම නැති වෙනවාය කියන අදහස තමයි සමහර පින්වතුන් ඇතිකර

ගෙන තිබෙන්නේ. සත්තකින්ම අනිත්‍යය ගැන සිතුවොත් යමක් නැති වෙනවා. ඒ නැති වෙන්නේ දුකයි, දුක ඇතිවීමට හේතුවයි. මේ සියල්ල ඇති කරන මෝහයයි. ඒ තුළයි ඔබ මතුකර ගන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය. අනිත්‍යයයි කියන අර්ථය තුළ චතුරාර්ය සත්‍ය ධර්මයන් සැඟවී තිබෙනවා. අනිත්‍යය කියන ධර්මය ඔබේ ජීවිතයෙන් මතුකර නොගන්නා තාක්කල් චතුරාර්ය සත්‍ය ධර්මයන් ඔබෙන් වසන් වෙලයි තිබෙන්නේ. ඔබට අනිත්‍යයේ අර්ථය දකින්න තිබෙන්නේ අනිත්‍යය තුළින්මයි. වෙනස් වෙන දෙයක් තුළ සිටිමින්ම වෙනස්වන බව දකින්නයි තිබෙන්නේ. සිතීමක් වේගවත් වන තරමට අනිත්‍යය වේගවත්. ඒ වේගවත් භාවයයි ඔබව සංකීර්ණකර තිබෙන්නේ. එතැනදියි පින්වත් ඔබට සමාධිය උපකාරී වෙන්නේ. අනිත්‍යයේ සැබෑම වේගය ඔබ සමාධිය තුළිනුයි හඳුනා ගන්නේ. ඒ නිසාමයි පින්වත් ඔබට සමාධිය සකස්වීමට හේතුවන ශ්‍රද්ධාව, සීලය ගැන මේ තරම් සටහන් තබන්නේ.

මේ සටහන් තබන භික්ෂුව පිළිබඳව පින්වත් ඔබලා යම් කටු සටහනක් සිතේ ඇඳගෙන තිබෙනවා නම් ඒ තැනට එන්නට භික්ෂුවට උපකාරී වූවේ සීලයයි. එය උත්කෘෂ්ඨ භාවයෙන් රැක්කා වූ සීලයක්. අසනීපයකට පැරසිටමෝල් පෙත්තක් ළඟ තබාගත්තේ නැහැ. පානය කලේ ස්වමුත්‍රා මාත්‍රාවක්. නමුත් වර්තමානයේ අවශ්‍ය ඖෂධ ලඟතබාගෙන පරිහරණය කරනවා අවශ්‍යතාවයන්ට අනුව. අදාළ නිවන් මාර්ගය වඩන කාලයේ සමහරදාට මුහුණ සෝදාගන්න සබන් කැබැල්ලක් තිබුණේ නැහැ. ඒක ඉවරවෙලා. ඒත් දායක මහත්මයෙක් සබන් කැල්ලක් පූජා කරන තෙක් කටින් ඉල්ලුවේ නැහැ. සබන් පාවිච්චි නොකර හිටියා, නමුත් කුමන හේතුවක් නිසාද දන්නෙ නැහැ වර්තමානයේ වැඩ සිටින සෑම කුටියකම සබන් කැට පහ හයක් තිබෙනවා භාජනයක දමලා. දැන් භික්ෂුවට හිතෙනවා අතීතයේ භික්ෂුවට එවැනි හිඟ පාඩු කුටි ලැබුණේ භික්ෂුවට අදාළ කාරණා පරිපූර්ණ කරගන්න කියලා. නොලැබීමත් ජයග්‍රහණයක් කරගන්නට, නිවීමේ මෙහෙයුමේ යෙදෙන කාලයේ දී භික්ෂුවට හොඳින් දනුනා ශරීරය බොහෝ දුර්වලයි, කෘශ වෙලා, මරණය බොහෝම ලඟය කියල. එහෙත් භික්ෂුවට ආහාර ඖෂධවල වටිනා කමක් තිබුණේ නැහැ. ජීවිතය අත හැරුන විට ආහාර ද ඖෂධ ද හුදෙක් බාධාවක් පමණක්මයි.

# ජීවිතය යනු ඉලක්කම් ගොඩක්ද?

භික්ෂුවට පින්වතකුගෙන් දැනගන්න ලැබුණා. තමන්ගේ පෙම්වතියගේ කකුලේ ඇති වුණ තුවාලයක් අසුබ සංඥාවට ලක්කරලා, පෙම්වතියගේ ශරීරයයම තුවාලයක් කොට දැකලා, තම පෙම්වතිය කෙරෙහි කළකිරීම සකස්කරගෙන ඇයගේ ආශිර්වාදය ඇතිවම අලුත පැවිදි භාවයට පත්වුණ පින්වත් තරුණයෙක් ගැන.

මෙවැනි කතා තුළ තිබෙන්නේ ජීවිතයෙන් පළා යාමක් නොවේ. ජීවිතයේ සැබෑම අර්ථය සොයා යෑමක්. පින්වත් ඔබ බියවෙන්න එපා ඔබේ පෙම්වතා, පෙම්වතිය ඔබට අහිමි වෙයි කියලා. පෙම්වතාගේ ජීවිතය පෙම්වතිය විසින් කමටහනක් කරගන්න. පෙම්වතියගේ ජීවිතය පෙම්වතා කමටහනක් කර ගන්න. දෙදෙනා, දෙදෙනාට විවෘත වන්න. මේ ගඳ ගසන ජීවිතය රසගුලාවක් නෙවෙයි. තුවාලයක් ගඩුවක් ලෙස දකින්න. ගිහි ජීවිතය තුළ සිටිමින් ඔබලාට පුළුවන් ධර්මයේ අර්ථය ජීවිතයට එකතුකර ගන්න. පැවිදිවෙන්න පුළුවන් නම් එය වඩාත් හොඳයි. ඒත් කොයිම අවස්ථාවකවත් ඉක්මන් පැවිද්ද (පැවිද්ද සඳහා කලබල වීම) භික්ෂුව අනුමත කරන්නේ නැහැ. දක්ෂයා අදක්ෂයෙක් විය යුතු නැහැ. හරියාකාරව අනිත්‍ය සංඥාව වඩපු කෙනා ඉක්මන් වෙන්නේ නැහැ. ඔහු ගැන කව්රුවත් බිය විය යුතුත් නැහැ. මොකද ඔහු ධර්මයේ රැකවරණය තුළයි සිටින්නේ. වඩාත් ගුණාත්මක පැවිද්දක් උදෙසා ඉවසීම අප තුළ තිබිය යුතුයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ කාලයේ බොහොම ආදර්ශමත් පෙම් යුවලක් හිටියා. ඒ තමයි පිප්ඵලී සහ භද්දකාපිලානා.

කෝටිපති බමුණු පවුල් දෙකක තරුණ දරුවෝ. දෙමාපියන් පිප්ඵලීට කොතෙක් විවාහ යෝජනා ගෙනාවත් ඒවාට කැමති වුනේම නැහැ. කැමැත්ත තිබුණේ පැවිද්දට. දෙමාපියන් දැඩි තීරණයක් ගන්නවා, පිප්ඵලී විවාහ නොවුනොත් අපි මැරෙනවා කියලා. පිප්ඵලීට සිද්ධ වෙනවා දෙමාපියන්ට අවනත වෙන්න. පිප්ඵලීගේ මනාලිය තමයි භද්ධකාපිලානා තරුණිය. ඇයත් පැවිදිවීමේ අරමුණින්ම විවාහය මඟ හැරිය තරුණියක්. දෙදෙනා සම්මුතියකට එනවා, චිත්තයක් ඇතිකර ගන්නවා අපි විවාහ වෙමු. දෙමාපියන් මියගියාට පසු දෙදෙනාම පැවිදි වෙමුය කියලා. ලොකු උත්සවයක් අරගෙන දෙදනාම විවාහ වෙනවා. ලෝකයා සිතාගෙන සිටින්නේ කම් සැප විඳිනවා කියලා. නමුත් මේ තරුණ පෙම්වතුන් ඇතිකරගත් චිත්තය බිඳෙන්න දුන්නේ නැහැ. දෙමාපියන් මියයන තුරුම බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කළා. දෙදෙනා දෙදෙනාව ස්පර්ශ කළේවත් නැහැ. මේ පිප්ඵලී තමයි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ. භද්ධකාපිලානා තමයි භද්දකාපිලානා රහත් තෙරණින් වහන්සේ. මේ චරිත පින්වත් තරුණ ඔබ ආදර්ශ කරගත යුත්තේ උපක්‍රමසීලීව කම් සැප කෙරෙහි ඇති කැමැත්තෙන් මිදෙන්න. ජීවිතය තුළින් ඔබ චිත්තයක් ඇතිකර ගන්න. මේ සතිය මම බ්‍රහ්මචාරීව ජීවත් වෙනවා කියලා. මේ සතිය මම දන් දීමෙන් ජීවත් වෙනවා කියලා. මේ සතිය මම අධිසිල් ආරක්‍ෂා කරමින් ජීවත් වෙනවාය කියලා. මේ සතිය මම ශක්තිමත්ව තෙරුවන්ගේ ගුණයන් සිහිකරමින් ජීවත් වෙනවා කියලා. මේ හැම චර්යාවකින්ම ඔබ තුළින් සිදු වන්නේ නෙක්කම්මයක්මයි. මේ නෙක්කම්ම සිතමයි ඔබට උපකාරී වෙන්නේ පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීමට.

ලොව්තුරා බුදුරජාණනන් වහන්සේ නන්ද හාමුදුරුවන්ට ප්‍රකාශ කරනවා 'නන්ද මම ඔබව මේ ජීවිතයේ දී පමණක් නොවෙයි ඔබ ජනපද කළ්‍යාණියගෙන් බේරා ගත්තේ කියලා. පෙර ආත්ම භවයක නන්ද ඔබ කොටළුවෙක් වෙලා මම ඔබේ ස්වාමියා වෙලා මා ළඟ ඔබ සේවය කරමින්, මගේ ගැල අදිමින් සිටිය දී කොටළු දෙනක් වෙලා උපත ලබා සිටි ජනපදකළ්‍යාණිය ඔබට බොරු කියලා පොළඹවලා කැලයට අරගෙන යන්න හැදුවා. එදත් මමයි ඔබව බේරාගත්තේ. තවත් ආත්ම භවයක නන්ද ඔබ ඌරෙක් වෙලා ජනපදකළ්‍යාණියගේ

නිවසේ ඉපදිලා ඇය ඔබට හොඳට ආහාර දීලා, ලොකුමහත් කරලා ජනපද කළ්‍යාණියගේ විවාහය දවසේ ඔබව මරාගෙන මසට ගත්තා ඔය ජනපදකළ්‍යාණියම. සංසාරයක බැඳීම, උපාදානය.

උපාදානය නැමැති එළදෙනගේ තන බුරුල්ලෙන් වැගිරෙන කිරි තමයි භවය. භවය නමැති කිරි ජාතිය මත කැමැති කැමැති පස්ගෝ රසයන් උපද්දනවා. නිමාවක් නැහැ. නැවතීමක් නැහැ. අතීතය ගොළුවෙලා. වර්තමානය කතා කරනවා. මේ ජීවිතයේ දී අපි ආශ්චර්යමත් මනුෂ්‍යයෝ. ලකුණු ගොඩක් දීලා තමන්ම ප්‍රගති වාර්තාවක් සකස්කර ගන්නවා. එහි බුද්ධාගමට ලකුණු නැහැ. ආර්ථික විද්‍යාවටයි ලකුණු වැඩිපුර දීලා තියෙන්නේ. දැන් ජීවිතය ඉලක්කම් ගොඩක්. ඔබ මෙතැන සිට සිතන්න නන්ද හාමුදුරුවෝ ගැන. ජනපදකළ්‍යාණී ගැන. ඔබගේ නිවසේ සාලය තුළ, වීදුරු අල්මාරියේ දිළිසෙමින් තිබෙන ඔබගේ මංගල ජායාරූපයේ, ඔබ ළඟම සිටිනා යෙහෙළිය, මේ මොහොතේ සිනාසෙමින් ඔබට සමීපවී සිටියත් ඇය නිසා සංසාරයේ ඔබ කොතෙක් දුක් විඳින්නට ඇතිද? ඔබ නිසා ඇය කොතෙක් දුක් විඳින්නට ඇතිද? මේ ජීවිතයේ ඔබගේ යෙහෙළිය වූ ඇය, මේ ජීවිතයේ පමණක්ම ඔබගේ යෙහෙළිය නොවූ බවද ඉහත කරුණුවලින්ම වටහා ගන්න. ජීවිතය ඉදිරියේ ඇත්තේ මෙවැනි 'නොවටිනා' වටිනාකමක් නම් ඔබ ජීවිතයේ අර්ථය මනින්නට ඉලක්කම් වලට ඉඩ නොදෙන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, දානය, සීලය ජීවිතයේ වටිනාකම් කරගන්න. ඔබ කැමැති ජීවිතයේ අගට ඉලක්කම් එකතුකර ගැනීමට නම් ඔබ ඒ ජීවිතයට එකතුකර ගන්නේ දුකමය. ඔබට ලැබෙන දෙය, එකතු කරන දෙය දානය උදෙසා අත හරින්නේ නම් ඒ ඔබ අත හරින්නේ ද දුකමය.

ඊයේ පින්වත් තරුණයෙක් පැමිණියා, භික්ෂුව මුණගැසෙන්නට. ඔහු විවාහකයෙක්. ඔහු භික්ෂුවට කියනවා, 'හාමුදුරුවනේ, මම අමාරුවෙන් හම්බ කරලා ඉතිරි කරගත් රුපියල් ලක්ෂ දෙකක් මා ළඟ තිබෙනවා. ඒකෙන් ගෙදරට අල්මාරියක් ගන්න ඕනේ. ඉතිරි මුදල සම්පූර්ණයෙන් ලබන මාසෙ පින්කමට වැය කරනවා' කියලා. බලන්න, අමාරුවෙන් හම්බ කරලා ඉතිරිකරපු දෙයට ඔහු සැබෑ

වටිනාකමක් දුන්නා. ඔබ දක්ෂ වෙන්න, වෙහෙස මහන්සි වෙලා හම්බ කළාවූ මුදලට ලෝකයේ ඇති සැබෑම වටිනාකම දෙන්න. දුක් උපදින දේවල් කෙරෙහි වැය කරලා එම මුදල් අපතේ හරින්න එපා. ඔබ ළඟ තිබෙන මුදල සුරක්ෂිතව තැන්පත්කළා කියන්නේ දානය තුළට, පින්කම් තුළට බැංකුගත කිරීමයි. ඉහත තරුණ මහතාද තමන්ට අවශ්‍ය ප්‍රමාණය නිවසට අවශ්‍ය භාණ්ඩය සඳහා වැයකර ඉතිරිය සුරක්ෂිතව තැන්පත් කළා. දානය නැමැති බැංකුකරණය කෙරෙහි අවිශ්වාසයෙන්, බියෙන් තොරව තැන්පත් කරන්න. ගිහි පින්වතුන්ලාටයි මේ සටහන ලියන්නේ. පින්වතුන්ලා දානය කෙරෙහි, දන් දීම කෙරෙහි ප්‍රමාදයට පත්වන්නේ නම්, දන්දීමට ලෝභ නම් ඔහු හෝ ඇය නිරතුරුව තමන්ටත්, තම පවුලේ අයටත් රෝගී භාවයන් අනිවාර්යයෙන්ම බලාපොරොත්තු විය යුතුය. මොකද දානය තුළින්මයි මනුෂ්‍යයාට ආයුෂ, වර්ණය, සැපය, බලය ලැබෙන්නේ. ඔබ මේ ජීවිතයේදී දන්දීමට මැළි නම්, පෙර ජීවිතයේ දන්දීම හීන නම් තමයි නිරතුරුවම පින්වතුන්ලාට ලෙඩ රෝග වැළඳෙන්නේ. තමන් හම්බ කරන දෙයින් යම් ප්‍රමාණයක් තෘෂ්ණාවෙන් තොරව, කර්මය කර්මඵල විශ්වාසයෙන් යුතුව දන්දීමට යමෙක් ලෝභ නම් අනිවාර්යයෙන්ම ඔහුට හෝ ඇයට දන්දීමට වැය නොකළ මුදලට වඩා ඉතා වැඩි මුදලක් බෙහෙත් සඳහා, රෝහල් ගාස්තු සඳහා වැය කිරීමට සිදුවනු ඇත. දන්දීමට අකමැති කෙනාට බෙහෙත් වෛද්‍ය ගාස්තු සඳහා ඊට වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදුවීම හේතුඵල ධර්මයක්මය. ලෞකික සැපයේ රහස දානයයි. මේ සැපය ඔබ උපයෝගීකර ගත යුත්තේ සතර අපායෙන් මිදීම උදෙසාම, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත් සීලයත් පරිපූර්ණකර ගැනීම සඳහාය. ඉන්ද්‍රිය ධර්මයන් දියුණුකර ගැනීම සඳහාමය. එසේ නොවුනොත් පින්වත් ඔබ උපක්‍රමශීලීව ජීවිතය තුළට මතුකොට ගත් සැපය තවත් හුදු සංස්කාරයක්ම වී විපාක දීමෙන් අනතුරුව අනිත්‍ය වී යනු ඇත. දන්දීම නිසා ඔබට නීරෝගී භාවයද, එම නීරෝගී භාවය නිසාම සුවසේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමට හැකියාව ලැබෙන අතර දන් නොදීම නිසා රෝගී භාවයද, රෝගී භාවයන් නිසාම ධර්ම මාර්ගයෙන් දුරස්වීම ද සිදුවේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත්වුණ අනාගාමී උපාසක උපාසිකා දෙපළක් වන උග්ග ගෘහපතිත්, වේළුකන්ඨකී නන්ද මාතාවත් නිරතුරුවම මහා සංඝරත්නයට දන් පූජා කළා. වේළුකන්ඨකී නන්ද මාතාව පිරිනැමූ දානයන්ගේ එක් ආශ්චර්යමත් කාරණයක් තිබුණා. ඒ තමයි ඇය දන්දීමට පෙරාතුවත් සතුටු වෙනවා, දානයෙන් පසුවත් සතුටු වෙනවා. දානය පූජාකරන වේලාවෙත් සතුටු වෙනවා. මෙය ඇය සතු ආශ්චර්යමත් කාරණයක්. ගිහි අනාගාමී උවැසි උවැසියනුත් දානය උතුම්කොට සැලකුවා. පන්සලද, ආරණ්‍යයද කියන භේදයකින් තොරව, නිරතුරුවම මහාසංඝරත්නය අරමුණු කරගෙන, මහා සංඝරත්නයටම පූජා කරන දානයමයි මහත්ඵල මහානිසංස වෙන්නේ.

පින්වත් ඔබ ඉදිරියේ ඇති අනතුර නුවණින් දකින්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර නොගත්තොත් මිථ්‍යාදෘෂ්ඨිකභාවයට පත්වෙනවා. ශිල්පද ආරක්ෂාකර නොගත්තොත් නැවත දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ජීවිතයක් ලැබෙන්නේ නැහැ. දන් නොදුන්නොත් ආයුෂ, වර්ණය, සැපය, බලයෙන් හීන ජීවිත ලැබෙනවා.

මෛත්‍රිය නොවැඩුවොත් ලස්සන, රූමත්, ප්‍රසන්න රූපයක් නැවත නොලැබෙනවා. මේසා බියකරු අභියෝගයක සෙවණැල්ල අපේ ජීවිතවලට වැටී තිබියදී අපි හිතන්නේ, මුල් තැන දෙන්නේ රැකියාවට. ව්‍යපාරයට නොගියොත් ආදායම නොලැබෙයි. මිල මුදල් නොමැතිවුනොත් සමාජ තත්වයක් නොලැබෙයි. විවාහයක් නොවුනොත් පරම්පරාව නැති වෙයි. මෙන්න මේ වගේ සරල, බොළඳ කෙටි අපේක්ෂාවන්ටයි අපි මුල්තැන දෙන්නේ. අපි ජීවත්වෙන්නේ අනතුරත්, අනතුරින් ගැලවීමේ මාර්ගයත්, අතර මොන තරම් පරතරයකින්ද. ගිහි පින්වත් ඔබට මෙලොව පරලොව දෙකම යහපත් කොට ගන්න නම් හේතුඵල ධර්මයන් නිසා සකස් වෙන ඉහත කාරණා දෙකටම මුල්තැන දියයුතු වෙනවා. ඔබ ඉදිරියේ ඇති අනතුර නුවණින් මෙනෙහි කර, දුක නැමති ඉපදීමෙන් මිදීමේ මාර්ගයටම අවතීර්ණ වෙන්න. අපට සැඟවිලා තිබෙන ඉහත කාරණා ගැන ඔබ සිතන්න ගත්තොත් එය හොඳ ප්‍රවේශයක් වේවි ශක්තිමත් චිත්තයක් ඇතිකර ගන්න.

# සම්බුදු සරණ විකුණනවද මාරයට?

දායක මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා හාමුදුරුවනේ මම නිතරම දන් දෙන අයෙක් මමත් අවිද්‍යාව තුළද සිටින්නේ කියල. පින්වත් ඔබ දන් දුන් පමණින් අවිද්‍යාවෙන් මිදෙන්නෙ නැහැ. අවිද්‍යාව කියන්නෙ චතුරාර්ය සත්‍ය නොදැනීම. ඒ කියන්නෙ දුක, දුක ඇතිවීමට හේතුව, දුක නැතිකිරීම, දුක නැතිකිරීමේ මාර්ගය කියන කාරණා හතර නොදැනීමයි අවිද්‍යාව. ඔබ ලෝකය දුකයි කියන කාරනය නොදන්නා නිසයි ඇසත්, ඇසට පෙනෙන රූපත් තුළින් සැප සොයන්නේ, කනත් කනට ඇසෙන ශබ්දත් තුළින් සැප සොයන්නෙ, අනෙක් ආයතනත් එසේමයි. ඔබ මේවා දුකක් හැටියට නොවේ දකින්නේ සැපයක් හැටියට. එහෙමනම් පින්වත් ඔබ පූජාකරන දානයත් දුක් බවට පත්වෙන සැපයක් අයිතිකර ගන්න දෙන දානයක් බවටයි පත්වෙන්නේ. සැප බලාපොරොත්තුවෙන් දෙන දානයත් අවිද්‍යාව තුළටමයි අයිතිවෙන්නේ. ලෝකය දුකයි කියල දැකලා දුකට ඔබව බැඳතබන තෘෂ්ණාව අඩුකර ගැනීම සදහා දෙන දානයයි අවිද්‍යාවෙන් බැහැරට ඔබව තල්ලුකරන්නේ. මිල මුදල්, ආහාරපාන පමණක් නොවේ ඔබ දන්දිය යුතුව ඇත්තේ ඒවා තුළින් දුක උපද්දවන තෘෂ්ණාවයි ඔබ තුළින් දන්දිය යුත්තේ.

තෘෂ්ණාව දන් දෙන කෙනාමයි දානයේ සැබෑම අර්ථය ජීවිතයට එකතු කර ගන්නේ. එම නිසා දන් දීමේදී ගිහි පින්වතුන්ලා ශක්තිමත් චිත්තයක් ඇති කරගන්න තෘෂ්ණාවෙන් මිදීම උදෙසාමය දන් දෙන්නෙ කියලා.

භික්ෂුව වැඩ සිටින කුටියට පැමිණි මහත්මයෙක් භික්ෂුවගෙන් ඇහුවා හාමුදුරුවනේ කුටියට වෙලා මොකද කරන්නේ කියලා තනිවම. භික්ෂුව ප්‍රකාශ කළා කුටියට වෙලා විවේකයෙන් වැඩ සිටිනවා

කියලා. ඒ වෙලාවේ ඔහු කියනවා ඔහොම සිටියම ජීවිතේ කිසිම තේරුමක් නැහැනේ හාමුදුරුවනේ කියලා. භික්ෂුව ප්‍රකාශ කළා ජීවිතේ කොහෙත්ම තේරුමක් නැති හින්දයි මෙහෙට වෙලා විවේකයෙන් වැඩ ඉන්නේ කියලා. මේ මහත්මයාට විවේකය කියන එක ප්‍රශ්නයක්. මොහු භික්ෂුව තුළින් දකින්ට කැමති අවිවේකී, කාර්ය බහුල, ක්‍රියාශීලී චරිතයක්. අනුන්ගේ විවේකය දකලා තමන්ගේ සිතේ විවේකය නැති කරගන්නවා. අනවශ්‍ය ගොඩාක් සිතුවිලි සිතලා අකුසලුත් රැස්කර ගන්නවා. ඇසත් මට අයිති නැත්නම්, ඇසට බැදෙන රූපත් මට අයිති නැත්නම්, දිව, කන, නාසය, මනස, කය මට අයිති නැත්නම් කුමක් සදහා අවිවේකී වෙන්නද? වෙහෙස වෙලා කුමක් අයිතිකොට ගන්නද? මම කියා සටහන් කළ නාමරූප ධර්මයන්ගේ හේතුවෙන් හටගත් ඵලය සළායතන නම් එතැනද හේතුඵල ධර්මතාවයක් මිස සත්ත්වයෙක් පුද්ගලයෙක් නැතිනම් අවිවේකය කවුරුන් උදෙසා සොයන්නද? යමෙක් එසේ සොයන්නේ නම් ඒ ඔහු සොයන්නේ රැවටීමමය. ඇසෙන් තේරුමක් නැත්නම්, කනෙන් තේරුමක් නැතිනම් ජීවිතයෙන් තේරුමක් තියෙන්න බැහැනේ. තේරුමක් නැති ජීවිතය ඔබට තේරුම් කොට දෙන්නේ සද්ධර්මයයි. විවේකීව නාම රූප ධර්මයන් දෙස බලන්න. එවිට ඔබට වැටහේවි අවිවේකයෙන් අයිති කරගන්න දෙයක් මෙතන නැහැය කියලා. එම නිසා පින්වත් ඔබ ස්වාමීන් වහන්සේ නමක් මුණගැසුනහම සැමවිටම ධර්මකාරණයක්මයි කතා බහ කරන්නෙ කියල චිත්තයක් ඇතිකර ගන්න.

සිත විවේකී භාවයට පත්වෙන කොට අවිවේකී භාවය සකස් කරන හේතු ඔබට වැටහෙන්න පටන් ගන්නවා. සිත අවිවේකී වෙන්නේ රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණ නිත්‍යභාවයෙන් ගැනීම නිසාමයි. අනිත්‍ය දෙය නිත්‍යභාවයෙන් ගත්තාහම ඔබව පටලවනවා. ඔබ නැති දෙයක් තිබෙනවාය කියල ගන්නවා. දැන් ඔබ අවිවේකියි. ඔබට කරන්න, සොයන්න, බලන්න, කියන්න ගොඩාක් දේවල් තිබෙනවා. ලෝකය නැවතිලා තිබෙන්නේ. ඒත් පින්වත් ඔබ දුවනවා. වේගයට හොඳ වටිනාකමක් තිබෙනවා අවිද්‍යාවේදී. අවිද්‍යා පච්චයා සංඛාරා අවිද්‍යාවයි සංස්කාර සකස්කොට දෙන්නේ. ඔබ වේගවත්ය කියන්නේ වේගයෙන් සංස්කාර රැස්කරනවාය කියන කාරණයයි. නමුත් ඔබ විවේකීව සිතන්න ගත්තොත් රූපයේ, වේදනාවේ, සංඥාවේ,

සංස්කාරයේ, විඤ්ඤාණයේ අනිත්‍යභාවය සංස්කාර නිරෝධය දෙසටයි ඔබ ගමන් කරන්නේ. බලන්න අවිවේකයත් විවේකයත් අතර තිබෙන පරතරය. රූපය නිත්‍යභාවයෙන් ගැනීම නිසා, නැති දෙයක් සෙවීම නිසා අවිවේකයත්, රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණ අනිත්‍ය භාවයෙන් ගැනීම නිසා සෙවීමට දෙයක් නැති නිසා විවේකයත් ලැබිය හැකිය. විවේකීභාවය ඔබෙන් දුරස්වෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් දුරස්වීම නිසයි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණි කෙනා ජීවිතයේ අවිවේකයට හේතු සොයනවා. කල්‍යාණමිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය තුළින්මයි ශ්‍රද්ධාව සකස් වෙන්නේ. මේ උතුම් ශ්‍රද්ධාව ගැන සටහන් තබන කොට අතීතයේ සිදුවීම් පෙළක් මතකයට එනවා. භික්ෂුවගේ තාත්තා දෙවියන් කෙරෙහි බොහෝම ලැදි කෙනෙක්. භික්ෂුවට මතකයි ළමා කාලයේ තාත්තා සෑම වසරකම දෙවොල් මඩුවක් කරලා දේව දානයක් දෙනවා. ඒ වගේම සෑම මසකම කඩවර පූජාවක් තියනවා නිවසේ පිටුපස්සේ. ඒ කාලයේ ළමයෙකු හැටියට ශ්‍රද්ධාව කියන්නේ කුමක්ද කියලා මම හඳුනාගෙන තිබුණේ නැහැ. මගේ තාත්තා හඳුනාගෙන තිබුණෙත් නැහැ. ඒ නිසා මේ දැත් වලින් මට මතකයි මම අනන්තවත් හාල්මැස්සෝ පුච්චලා, හරක් සම් පුච්චලා තිබෙනවා පූජාවන්ට. නමුත් මේ මොහොතේ භික්ෂුවට ඒ අතීතය මතකයට එන කොට භික්ෂුව පැහැදිලිව දන්නවා එදා ගිහියෙක් හැටියට මම තුළ සහ තාත්තා තුළ තිබුනේ අමූලිකා ශ්‍රද්ධාවයි කියලා. අමූලිකා ශ්‍රද්ධාව තිබුන නිසයි තෙරුවන් කෙරෙහි විශ්වාසයෙන් බැහැරව දේව විශ්වාසයන්ට බැහැ ගත්තේ. අමූලිකා ශ්‍රද්ධාව නිසාමයි හාල්මැස්සො පිච්චුවේ, හරක් සම් කැබලි පිච්චුවේ, පූජාවන්ට බුලත් තටු හදලා, ගණන් කරලා මල් තැබුවේ. ඉහත සටහන තැබුවේ පින්වත් ඔබට ශ්‍රද්ධාවේ සහ අමූලිකා ශ්‍රද්ධාවේ වෙනස හඳුනාගන්න. පින්වත් ඔබ තෙරුවන් වඳින, දන්දෙන, සිල්රකින කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් ඔබ ජීවිතය ඉදිරියට රැකියාවේ, ව්‍යාපාරයේ, රෝගී භාවයන් වැනි අභියෝගයන් එනකොට තෙරුවන් කෙරෙහි විශ්වාසයෙන් බැහැරව හාල්මැස්සෝ පුච්චන්න, හරක් සම් පුච්චන්න, පළතුරු වට්ටි තබන්න දේව අමනුෂ්‍ය ඇදහිලි. ඔස්සේ ඒවාට විසඳුම් බලාපොරොත්තු වෙනවා නම් පින්වත් ඔබ නියත වශයෙන්ම දැනගත යුතුයි ඔබ තුළ තවම තිබෙන්නේ අමූලිකා ශ්‍රද්ධාව කියලා (මෝහය මුසු ශ්‍රද්ධාව) නමුත් භික්ෂුවට තරුණ

කාලයේදීම යම් හේතුවක් නිසාම මේ අමූලිකා ශ්‍රද්ධාව තමා තුළින් හඳුනාගන්න හැකි වුනා කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්ම ශ්‍රවණය නිසාම, ඇසුවා වූ ධර්මය නුවණින් මෙනෙහි කිරීම නිසාම.

පින්වත් ඔබ ධර්මය ඇසීමෙන් පමණක් ඵලක් නැහැ. එම ධර්මය නුවණින් මෙනෙහි කරන්න. අපගේ ආයුෂය බොහෝම වේගයෙන් ගෙවීයනවා. මරණය බොහෝම ඉක්මනට ළඟා වෙන්න පුළුවන්. එම නිසා රැකියාව, ව්‍යාපාරය, විවාහය නොවේ වන්දනීය මරණයකට හිමිකරුවෙක් වෙන්න. මුලාවට එක වචනයකින්වත්, හැඟීමකින්වත්, සිතුවිල්ලකින්වත් බැඳෙන්න එපා. ආදරය කරන්න එපා. බිය ඇතිකරගන්න. අමූලිකා ශ්‍රද්ධාවමයි සංසාරයේ ඔබට මිථ්‍යාදෘෂ්ඨික භාවය ඇති කොට දෙන්නේ. මෙය බියකරු ලෝකයක්, චපල ලෝකයක්, මිනීමරු ලෝකයක්. මනුෂ්‍යයා තුළ සකස් වෙන පංච උපාදානස්කන්ධය ඒ තරමටම බියකරුයි, විෂමයි. භික්ෂුවට මුණගැසුණ එක් කට්ටඩි මහත්මයෙක් භික්ෂූවට ප්‍රකාශ කළා තමා දන්නා මන්ත්‍ර ගුරුකම් ශාස්ත්‍රය තුළින් තමාට මිනිසෙක් මරන්න, විනාශ කරන්න පුළුවන් කියලා. ඔහු සපථ කළා තමා එවැනි ගුරුකම් කරලා තිබෙනවා කියලා. ඔහු උදම් ඇනුවා. ධර්මයේ අර්ථය නොදත් මුලා වූ ලෝකයාට මනුෂ්‍යයෙක් මැරීම මදුරුවෙක් මැරීම වගේ සරල දෙයක්. ධර්මයෙන් බැහැර වුන සිතකට ජීවිතයක වටිනාකම තබා තමාගේ ජීවිතයේ වටිනාකමවත් තේරෙන්නෙ නැහැ. තමාගේ ජීවිතයට ලබා දී ඇති නොවටිනා ලංසුවමයි අනුන්ගේ ජීවිතවලටත් ලබා දෙන්නේ. පින්වත් ඔබලා ශ්‍රද්ධර්මය ශ්‍රවණය කරන පින්වතුන්ලා වශයෙන් සෑම මොහොතකම සමාජය තුළ තිබෙන අන්තරායකාරී ධර්මයන් හඳුනාගන්න. ශ්‍රද්ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණිකෙනා දක්ෂවෙනවා හඳුනාගන්න තමාගේ රැකියාව අහිමිවුනෙත්, තමාගේ ව්‍යාපාරය පාඩුවුනේත්, තමාට රෝගයක් හැදුනේත් මගේම හොඳටයි කියලා. මේ බිඳවැටීම් තුළින් මම අත් දකින්නේ ලෝක ස්වභාවයයි. අනිත්‍ය ධර්මයේ අර්ථයයි කියලා. අනිත්‍ය වෙන දේවල් කෙරෙහි, බිඳෙන, වැටෙන දේවල් කෙරෙහි බැඳීමෙන් මිදිලා තව තවත් ධර්මාවබෝධය දෙසට එනවා. එහෙම කෙනා තව තවත් උත්සාහයෙන්, වීර්යයෙන් යුතුව වැටුන දෙය ගොඩනඟා ගැනීමට උත්සාහ ගන්නවා වගේම ධර්මය තුළින්මයි සැනසීම සොයන්නේ. වර්තමාන සමාජයේ

වේගයෙන්ම ජනප්‍රිය වෙන අංශයක් තමයි යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් ක්ෂේත්‍රය. මේ අංශයේ දියුණුව, භාවිතය වැඩිවෙන්න වැඩිවෙන්න ධර්මයේ භාවිතය හීනවෙනවා. එය ධර්මතාවයක්. සද්ධර්මයේ සැබෑ ආයුකාලය බොහෝම කෙටියි කියලා භගවත අනතුරු හැගවීමක්. කර්මය කර්මඵල විශ්වාසයෙන් බැහැරව ලෝකය ගමන් කරන විට මිථ්‍යාදෘෂ්ඨිකභාවයේ ගොදුරක් බවටයි ඔබව පත්වෙන්නේ. නමුත් අවාසනාවේ මහත කියන්නේ මෝහය නිසාම මේ මනුෂ්‍යයා මුදල් වියදම් කරලයි මිථ්‍යාදෘෂ්ඨිකභාවයට පත්වෙන්නේ. උතුම් ශ්‍රද්ධර්මය ප්‍රතික්ෂේප කරලා සල්ලිවලට මිථ්‍යාදෘෂ්ඨිකභාවය ගන්නවා. බලන්න මාර ධර්ම මොනතරම් සියුම්ද කියලා. ඔබේ ඇස් වහලා ඔබේ මුදල්වලින් ඔබට මිථ්‍යාදෘෂ්ඨිකභාවය විකුණනවා. ප්‍රේතයන්ගේ ලෝකය, යක්ෂයින්ගේ ලෝකය, අමනුෂ්‍යයන්ගේ ලෝකය හරිම බියකරුයි, හරිම පුළුල්, බොහෝම සංකීර්ණයි. ඔවුන්ගේ ධර්මය අධර්මයයි, විනාශයයි, ද්වේෂයයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැනි උතුම් ශාස්තෘන්වහන්සේ නමකගේ සරණ අහිමිකොට ගෙන තාවකාලික දියුණුවක් උදෙසා සිහින දකිමින් අමනුෂ්‍යයන් සරණ යාම පින්වත් මිනිසුනේ ඔබේ ජීවිතය ඔබම මාරයාට විකිණීමකි.

මේ ලෝකයේ මෝහය, ලෝකය තුළ සැගවුන ඇත්ත, මේ මස් ඇසට නොපෙනෙනා ලෝකය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ධර්මයේ සත්‍යතාවය අත්දැකීමෙන්ම දැකිය යුත්තේ උතුම් සමාධිය තුළින්මය. මස් ඇසෙන් දකින ලෝකයේ චිත්‍රය නොව පිනෙන් සහ පවෙන් පිරුණු සත්ත්වයන්ගේ ලෝකයේ අපූරු චමත්කාර ජනක දුක්මුසු භව ගමනේ නවාතැන්පළවල් සමාධිය තුළින් යම් භික්ෂුවක් අත්දකින කොට මිනිසුන් වශයෙන් අපි මොන තරම් බොළඳ වැරදි ඔස්සේ ලෝකය ග්‍රහණය කොට තිබෙනවා ද කියලා පැහැදිලි වෙනවා. දෙවියන්ගේ පුද පූජා තියෙන කොට කපුමහත්වරු කන්නලව් කරනවා. ඔබ අසා ඇති ඒ අය මෙහෙම කන්නලව් කරනවා, හරක් රැළට, මොනර රැළට මැණික් ගඟට දිවැස් හෙළන දෙවියන් කියලා. අපි එතකොට සිතන්නේ මේ දෙවියන් හරක් රැළට දිවැස් හෙළනවා කියලා. පින්වත් ඔබම සිතන්නකෝ ගොම ගොඩේ, මුත්‍රා ගොඩේ, මඩ නාගෙන ගාල් කරල තිබෙන හරක් ගාලට, එම සතුන්ට, පින් කරල ඉපදුන දෙවියන් දිවැස් හෙළලයිද?

නමුත් මේ කතාවේ සැඟවුන ඇත්තක් තිබෙනවා. ඒ ඇත්ත පින්වත් ඔබට දකින්න පුළුවන් සමාධිය තුළින් පමණයි. දිනක් භික්ෂුවක් සමාධියෙන් වැඩ සිටින කොට දිව්‍ය මී ගවයන් දොලොස් දෙනෙක් පමණ සමන්විත දිව්‍ය හරක් රංචුවක් දර්ශණය වුනා. මෙතන ලොකු දෙනුන් හයක් සහ පැටවුන් වශයෙන් තමයි ඉතිරි අය සිටියේ. මේ දිව්‍ය මී දෙනුන් රංචුව මනුෂ්‍ය ලෝකය තුළ ජීවත්වෙන දිව්‍ය හරක් රංචුවක්. මේ මී දෙනුන් ආයුෂ, වර්ණ, සැපයෙන් හුඟක් පිරිලා. මේ සතුන් බොහෝම පිරිසිදු, ශරීරය පුෂ්ඨිමත්, තෙල් පැහැයෙන් දිලිසෙන, රෝම ගහන ශරීරයක් තිබෙන්නේ. කිරි බුරුල්ල බොහෝම ලොකුයි, තන පුඩු ලොකුම ප්‍රමාණයේ කෙසෙල් ගෙඩියක් වගේ, කිරිවලින් තන බුරුල පිරිලා. එම දිව්‍ය මීහරක් රංචුව දකින කොට එය සෞභාග්‍යයේ සංකේතයක් වගේ. මේ දිව්‍ය හරක් රංචුව පාරක් දිගේ ගමන් කරන ස්වභාවයෙනුයි භික්ෂුවට දර්ශණය වෙලා තිබෙන්නේ. ඔබගේ මස් ඇසට නොපෙනෙන ඇත්තක් මෙතන තිබෙනවා. හරක් රංචුවට දිවැස් හෙළන දෙවියෙක් සිටිනවා. ඒ ගමේ සිටින ගොම, මුත්‍රා ගොඩේ දඟලන හරක් නොවේ. ඉහත සදහන් කළ පිනෙන් වැඩි එහෙත් දිව්‍ය හරක් බවට භවයේ උපත සකස් කොට ගත් ඉහත හරක් රැළවලටය. බලන්න අන්ධ විශ්වාසයත් සත්‍යත් අතර තිබෙන වෙනස කොපමණද කියලා. ඉහත දිව්‍ය මීගව රංචුව භවයේ තවත් එක් නාවතැන් පළක්. මෙවැනි අනතුරුදායක භව ගමනක් ඉදිරියේ පින්වත් ඔබ දෙවියන්ගේ මුහුණ දෙස නොවේ බැලිය යුත්තේ තෙරුවන්ගේ ගුණයන් දෙසයි.

පින්වත් ඔබ ඔබේ ජීවිතය සෑම විටම පර්යේෂණාගාරයක් කර ගන්න. මොන පර්යේෂණාගාරයක්ද? ධර්ම පර්යේෂණාගාරයක්. පින්වත් ඔබ ඇසෙන, දකින, සිතෙන සෑම දෙයක්ම නුවණින් පර්යේෂණය කරන්න. ධර්මය අධර්මය තෝරාබේරා ගන්න. සසර අවදානමට එරෙහිව සැමවිටම විමසිලිමත් වන්න.

සැපයට එරෙහි අන්තරාකාරී ධර්මයන්ගෙන් මිදීමට පෙරාතුව එම අන්තරාකාරී ධර්මයන් තමා තුළ තිබෙනවාය කියන කාරණය ඔබ පිළිගන්න අවශ්‍යයි. බොහෝ වේලාවට අපිට වරදින තැන ඔතැනමයි. සියලුම අකුසල් මූලයන් අප තුළ වැඩෙනවා. නමුත් අපි දක්ෂ නැහැ ඒ බව හඳුනාගන්න. හඳුනාගන්න අයත් ඒවා වසන් කරගෙනයි

ධර්ම මාර්ගයේ පෙරට යන්න උත්සාහ ගන්නේ. මෙසේ වන්නේ ඔබ තුළින් ඔබ ධර්ම පර්යේෂණයක් නොකරන නිසා. හික්ෂුව ගිහි කාලයේ හොඳින්ම හඳුනාගත්තා තමා තුළ ඇති රාග, ද්වේෂ, මෝහ අකුසලයන්. ඒ ගැන කියන්න හික්ෂුවට ලැජ්ජාවක් නැහැ. මොකද එම හඳුනාගැනීමමයි හික්ෂුවට මේ තැනට එන්න පාර එළිපෙහෙලි කර දුන්නේ. ගිහි කාලයේ තමා තුළ තිබූ රාගය තුළින්මයි, රාගයේ තුච්ඡ බව හඳුනාගත්තේ. තමා තුළ තිබූ ද්වේෂයේ තුච්ඡ බව තුළින් තමයි, ද්වේෂය හඳුනාගත්තේ. තමා තුළ තිබූ මෝහය තුළින්මයි මෝහයේ අඳුර හඳුනාගත්තේ. ලෝකයා දෙස බලලා ඉගෙනගන්න දෙයක් තමාට තිබුණේ නැහැ. සියලුම අන්තරාකාරී ධර්මයන් තමා තුළම අඩු වැඩි වශයෙන් තිබුණා. තමා තුළින් තමාට එදා ඒ අකුසල මූලයන් හඳුනාගත හැකි වූයේ තමාගේ ජීවිතය පර්යේෂණාගාරයක් කරගත්ත නිසා. අනුන් උදෙසා පර්යේෂණ කරන්න නොවේ. අවංකවම තමාගේ නිවැරදි බව උදෙසාමතමා, මෙවැනි පර්යේෂණයක් කිරීමට යොමු වූයේ, මුළින්ම තමා තුළ ඉහත අකුසල මූලයන් ඇතිබව හඳුනාගත් නිසයි. හික්ෂුව එදා ලෝකයාට අවංකවෙන්න නොවේ ගියේ. තමා තමාට අවංකවීමටයි. ඒ අවංකභාවය තුළ සිට තමා දෙස නුවණින් බලනවිටයි ජීවිතය තුළ තිබූ අකුසල මූලයන් හඳුනාගත්තේ. මේ හඳුනාගැනීම හික්ෂුවට එදා ලොකු වටිනාකමක් වුනා. ඒ නිසාමයි තමා තුළ අකුසල මූලයන් තිබෙන බව දැනගත්තේ. දෙවැනිව, ඒවායේ අන්තරාකාරී බව දැක්කේ. තෙවැනිව, ඒවා උපක්‍රමශීලීව නැතිකර ගැනීමේ මාර්ගයට අවතීර්ණවූයේ. හික්ෂුව ගිහි ජීවිතයේ දී තමා තුළ රාගය, ද්වේෂය, මෝහය තිබෙන බව ලෝකයාට පෙන්වන්න ලැජ්ජා වුනේ නැහැ. තමා ලෝකයාට විවෘත වුනා. ඒ විවෘතභාවය තුළින්ම තමා තමාව ලැජ්ජාවට පත්කර ගත්තා. පින්වත් ඔබත් ඔබගේ ජීවිතය හැකිතාක් ලෝකයාට විවෘත කරන්න. ලෝකයාට සැඟවීම තුළ වැඩෙන්නේ සක්කාය දිට්ඨියම බව හඳුනාගන්න. මේ සක්කාය දිට්ඨියමයි ඔබ තුළ ඇති රාග, ද්වේෂ මෝහ අකුසල ධර්මයන් ලෝකයාගෙන් වසන්කොට තබා ගන්න උපකාරී වන්නේ. මගේ ආරක්ෂාව උදෙසා, මගේ පැවැත්ම උදෙසා, මම කව්ද කියලා ලෝකයාට පෙන්වීම උදෙසා කාවද මේ පුම්බා තබන්න හදන්නේ?

# ග්‍රහයන්ගේ ග්‍රහණයට හසුවූ අසරණයන්ට

මේ දවස්වල භික්ෂුව වැඩ සිටින කුටිය අවට තිබෙන පළු ගස් කැලයේ පළු ගෙඩි හට අරගෙන මුළු පළු යායම කහ පාටින් පෙනෙන්නේ. වෙසක් මාසයේ සෞම්‍යය දේශගුණයත් එක්ක සෑම සතා සිව්පාවෙක්ටම හොඳහැටි ආහාර තිබෙනවා. භික්ෂුවගේ කුටිය වටේ තිබෙන වැලි මළුව නිතරම අපවිත්‍ර වෙලා තිබෙන්නේ. වැලි පොළවට වැටෙන පළුගෙඩි කන්න හරක් නිතරම වැලි මළුවට එනවා. හරක් කුර සටහන් වලින් වැලි පොළව අපවිත්‍ර වෙලා. දැන් වෙලාව උදෑසන හයට විතර ඇති. භික්ෂුව කුටියේ බිම අතුගාන කොට හරක් කීප දෙනෙක්ම වැලි මළුවේ පළු ගෙඩි කනවා. වැලි මළුව හොඳටම අපවිත්‍ර වෙලා. හරක් ටික දැක්ක ගමන් භික්ෂුවට එක පාරටම කියවුනේ පුතේ කරදර නොකර ඉක්මනට කාල යන්න කියලා. කාටද මේ පුතේ කියලා කියවුනේ මිදුලේ සිටි හරකුන්ට. මේ හරක් සංසාරයේ කොච්චර නම් මා සමඟ එකම අම්මාගේ, තාත්තාගේ දරුවෝ වෙලා ඉන්න ඇතිද? සංසාරයේ හේතුඵල ධර්මයක් නිසාම ඉපදිලා එක පිඟානේ බත් කන්නට ඇතිද? එකට ගුලිවෙලා කොච්චර නම් දුකට හඬන්නට ඇතිද? සතුටට සිනාවෙන්න ඇතිද? ඔබත් මමත් අතර තිබෙන වෙනස පුතේ, සංස්කාරයන්ගේ වෙනස පමණයි. මේ දැක්ම තුළ ඉඳගෙන තමයි මහා සංසරත්නයේ කරුණාව, මෛත්‍රිය ලෝකයට පැතිරෙන්නේ. සෑම සත්ත්වයෙක් කෙරෙහිම 'මම ලෝකය හඳුනාගත්තාය, ඔබ ලෝකය හඳුනා නොගත්තාය' කියන අනුකම්පාව මත සිටිමිනුයි මහා සංසරත්නය ලෝකය දකින්නේ. මේ අනුකම්පාව සකස් වෙන්නේ සසර දිග, සසර ගැඹුර, සසර දුක ගැන අවබෝධය තුළිනුයි. මේ සටහන් තබන වේලාවේ භික්ෂුවට මතකයට එනවා එක්තරා ආරණ්‍යයකදී

තරුණ සාමණේර හිමිනමකට 'පුතේ' කියන වචනයෙන් ඇමතුවා, කියලා එක් ගුණවන්ත වැඩිහිටි ස්වාමීන්වහන්සේ නමක් අවවාද කළ කාරණය. මේ සියල්ලම තුළ අපි දකින්නේ ලෝකයයි. ලෝකය වසාගෙන පැතිරෙන විවිධත්වයයි. සංඝ සමාජයේ පැවැත්ම උදෙසාම තමාට වඩා පැවිද්දෙන් අඩු ස්වාමීන්වහන්සේ නමකට 'ආයුෂ්මතුන්' නමින් හැඳින්වීම නිවැරදිම බව භික්ෂුවත් පිළිගන්නවා. පසුව එම වරද භික්ෂුව නිවැරදි කරගත්තා. එහෙත් මොකක් දෝ හේතුවක් නිසාම ඉන් ඔබ්බට ගිය කරුණාවක්, මෛත්‍රියක් මහා සංසරත්නයේ ජීවිතය තුළ තිබෙනවා. තමන්ගේ කුටියේ වැලි මළුව අපවිත්‍ර කරන එළදෙනත් දරුවෙක් හැටියට දකින්න වෙන දවසක් අප ඉදිරියට එනවා. අන්න එතැනට යන්නයි පින්වත් ඔබ මේ ධර්ම මාර්ගයේ පෙරට යන්නේ. නමුත් පින්වත් ඔබම සිතන්න අවංකවම ඔබට පුළුවන්ද යාබද නිවසේ සිටින අසල්වැසියාව මිතුරෙක් හැටියට දකින්න? ඔබට එය එහෙම දකින්න බැරිනම් මුලින්ම ඔබ එතැනින් පටන්ගන්න. අසල්වැසියාව මිතුරෙක් බවට පත්කරගන්න. අසල්වැසියා මොනතරම් අකීකරු වුවද ඒ අකීකරු බවේ තරමටම ඔබ උපේක්ෂාව තුළට එන්න. පින්වත් ඔබ මේ වෙහෙසෙන්නේ ඔබ උදෙසා මිස අනුන් උදෙසා නොවේ. අනුන්ගේ අකීකරු භාවය ඔබ ඔබේ ජයග්‍රහණය සඳහා උපයෝගී කර ගන්න.

අද නැකත් දවසක්. ඒ කියන්නේ සුබ දවසක්. භික්ෂුව උදෑසන පිණ්ඩපාතය වඩිනකොට, මෝටර් රථයක් වේගය බාලකොට භික්ෂුව අසලින් ගමන් කළා. භික්ෂුව එදෙස බලනකොට එය මංගල රථයක්. මලින් සරසලා. එහි මනමාල මහත්මයෙක් සිටියා. නැකත් බලලා, ඒ කියන්නේ සුබ දවසක් බලලා 'දූකක්' කැන්දාගෙන ගෙදරට එන්නයි මේ යන්නේ. භික්ෂුව එය දුකක් හැටියට දැක්කත් එම මනමාල මහත්මයා අද දවස දකින්නේ ජීවිතයේ ලස්සනම, වැදගත්ම දිනය හැටියටයි.

සම්බුදු දහමේ දී නැකත් කියන කාරණය ප්‍රතික්ෂේප වෙනවා. යමෙක් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් නම් ජීවත්වෙන්නේ, සීලයට ජීවිතය තුළින් වටිනාකමක් ලබාදෙමින් නම් ජීවත් වෙන්නේ එම පින්වතාට සෑම දවසක්ම සුබ දවසක්, සෑම මොහොතක්ම සුබ මොහොතක් කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එම නිසා පින්වත්

ඔබ සුබ නැකත් සොයන්න හඳහන අරගෙන නැකත් බලන්න, සල්ලි වියදම් කරන්න අවශ්‍ය නැහැ. ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, සීලයෙන් පිරිසිඳු නම් ඔබේ ජීවිතයම නැකතක්. ඔබට සුබ දවසක් බවට පත්වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටිය දී ඔය රාහු කියන අසුරිඳු තමන්ගේ බලපුළුවන්කාරකමින් හිරු, ඒ කියන්නේ සූර්යාව ගිලගත්තා. මුළු ලෝකයම කළුවර වුනා. ඒ වෙලාවේ හිරුට අධිපති දෙවියෙක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිපත් කළා. බුදුරජාණන් වහන්සේ සරණ ගියා. බුදුරජාණන් වහන්සේට දිව්‍ය ශ්‍රෝත ඤාණය ඔස්සේ ඇසුනා හිරුදෙවියන් තමන්ගෙන් පිහිට ආරක්‍ෂාව යදින බව. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ රාහු අසුරිඳුට ප්‍රකාශ කරනවා, 'මා සරණ ගිය, මා දහම් පුත් හිරු මුදව! කියලා. ඒ මොහොතේම වෙව්ලමින් රාහු අසුරිඳු හිරුදෙවියන්ව තම ග්‍රහණයෙන් මුදවා වේපචිත්ති අසුරිඳු වෙත පළායනවා. වේපචිත්ති අසුරිඳු රාහුගෙන් අහනවා 'ඇයි ඔබ හිරුව ග්‍රහණයෙන් මුදවා පළා පැමිණියේ' කියලා. ඒ වෙලාවේ රාහු කියනවා 'එසේ හිරු දෙවියන් මුදවා පළා නොගියා නම් සම්බුද්ධ ආඥාව ඉටු නොකිරීම නිසා මගේ හිස සත්කඩකට පුපුරාවී' කියලා. බලන්න බුදුරජාණන් වහන්සේගේ සරණ හමුවේ රාහු පළා ගිය ආකාරය. නමුත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවේ ඇති හීන භාවය නිසාම අපි රාහුට බයේ, සෙනසුරුට බයේ, කේතුට බයේ මොනතරම් පුද පූජා, බලි තොවිල්, යන්ත්‍ර මන්ත්‍ර කරනවාද?

මේ සටහන් තබන භික්‍ෂුවගේ ජීවිතයේ සෑම මොහොතක්ම සුබ මොහොතක්, සෑම දවසක්ම සුබ දවසක්. කේන්දර නැකත් බලලා හෙම නොවෙයි. ඒවා අතහැරලා සැබෑම තෙරුවන් සරණේ සිත පිහිටවපු නිසා.

ජීවිතය ඉදිරියට කුමන කාරණයක් පැමිණියද එය භික්‍ෂුව දකින්නේ සංස්කාරයන්ගේ ඵලයක් වශයෙන්මයි. ඒ කියන්නේ මා විසින්ම, හේතුඵල ධර්මයන්ට අනුව සිදුකොටගත් කුසල් සහ අකුසල්වල ඵලයන් හැටියටයි. මෙතැන රාහු හෝ සෙනසුරු නැහැ. අපේ අකුසල්වල බලවත්භාවය නිසාම, තෙරුවන් සරණින් බැහැරට ගිය නිසාම, රාහු

සෙනසුරු කේතු බලෙන්ම අපි අපේ හිස මතට දාගන්නවා. දැන් ඉතින් ජීවිතයම අපළයක්, හූනියමක්, එහෙම නැතිනම් කොඩිවිනයක්. තෙරුවන් සරණ අහිමිකරගත් තැනදී ජීවිතයම ප්‍රශ්න ගොඩක් තමයි.

තමන්ට තිබෙන ප්‍රශ්න ගොඩ මදිවට, තව ප්‍රශ්න ගොඩක් කරගහගන්න ගිය මනමාල මහත්තයාව භික්ෂුවට මතකයට නැගෙන කොට අතීතයේ සිදුවූ සිද්ධියක් මතකයට පැමිණියා. එදා භික්ෂුව ගිහියෙක්. වයස අවුරුදු 30ක් පමණ ඇති. එදා මම සති අන්ත පුවත්පතක මංගල දැන්වීමක් පළකළා. විවාහයක් සඳහා, එම දැන්වීමේ එක තැනක මෙහෙම සඳහන් කළා. 'නිහඬ විවාහයකට, ආගම දහමට කැමැති යුවතියක් සොයයි' කියලා. සති දෙකක් පමණ යනකොට විශාල පිළිතුරු ලිපි ගණනක් ලැබුණා. ඉන් තෝරාගත් ලිපි කිහිපයකින් එකකට පිළිතුරු යැව්වා. මා එහි සඳහන් කළේ, කිසිම විවාහ උත්සවයක් ගන්නේ නැහැ. විවාහය ලියාපදිංචි කරලා අපි අනුරාධපුරයට හෝ කතරගමට ගිහිල්ලා ආගමික කටයුතු කරලා ජීවිතය පටන්ගමු කියලා. ලිපිය අදාළ තැනැත්තියට යවලා සතියකට විතර පස්සේ මට පිළිතුරු ලිපියක් ලැබුණා ඇයගෙන්. එය දීර්ඝ ලිපියක්. එහි මුළින්ම මෙහෙම සඳහන් කර තිබුණා. 'ඔබ මහා චපල පිරිමියෙක්. ඔබ තරුණියකගේ බලාපොරොත්තු හඳුනන්නේ නැහැ. ගැහැණු දරුවෙක් වැඩිවියට පත්වුණ දවසේ ඇය බලාපොරොත්තුවක් ඇතිකර ගන්නවා. ඒ තමයි ඇයගේ උතුම්ම බලාපොරොත්තුව. ජීවිතයේ එකම සිහිනය. ඒ සිහිනය තමයි, කවදාහරි දවසක නෑදෑයෝ වටකරගෙන මඟුල් සාරි ඇඳලා, පෝරුවට නැගලා, මුදු මාරුකරලා..... මේ සුන්දර සිහිනය හැමදාකම දරාගෙනයි තරුණියක් ජීවත් වෙන්නේ. තරුණියකගේ එම සිහිනය නොහඳුනන මනුෂ්‍යයෙක් ඔබ. ඔබ උත්සාහ ගත්තේ තරුණියකගේ එම සිහිනය මරාදමන්නයි. ඔබගෙන් මෙයට පිළිතුරු ලිපියක්වත් බලාපොරොත්තු නොවන බව ඇය සඳහන්කර තිබුණා. මේ ලිපිය කියවලා අහවරවෙන විට මාව තුෂ්ණිම්භූත වුනා. ඇත්තටම මම තේරුම් ගත්තා තරුණියකගේ විවාහ උත්සවයක් නැමැති ඒ සුන්දර සිහිනය බිඳ දමන්නයි මම උත්සාහ ගත්තේ කියලා. ඇයත් මමත් අතර අහසයි පොළොවයි වගේ පරතරයක් ඇති බවයි මම දැක්කේ. අහසයි පොළොවයි කවදාකවත් එකතු වෙන්නේ නැහැ. ඒ නිසාමයි ඇය

පිළිතුරු ලිපියක්වත් එවන්න එපාය කියලා සටහන් කර තිබුණේ. මේ ලිපිය කියවලා කරුණු නුවණින් මෙනෙහි කරනකොට අවංකවම මට සතුටක් ඇති වුනා. ලෝකය සිතනවාට වඩා මම මොනතරම් දුරස්වද සිතන්නේ කියලා. ලෝකයාට වඩා දුරස් ආකාරයට හිතන්න මා තුළ තිබුණා වූ දක්ෂ භාවය නිසාමයි මේ මොහොතේ මා ලෝකයාගෙන් ගොඩාක් දුරස් තැනක ජීවත්වන්නේ. නමුත් මට හොඳටම විශ්වාසයි මේ මොහොතේ ඇය ජීවිත්ව සිටිනවා නම් දරුවන් කිහිප දෙනෙකුගේ මවක් හැටියට මහා දුක් කන්දරාවක් දරාගෙන ජීවත් වෙනවා ඇතිය කියලා. එදා ඒ මුල් ලිපියෙන් සිදුවූ හමුවීම, වෙන්වීමක් බවට පත්වූයේ රාහු නිසා හෝ සෙනසුරු කේතු නිසා නොව, සංස්කාර ධර්මයන් නිසාමයි. මගේ තිබුණු කුසල් විසින් ඒ අකුසල් වළක්වා දැම්මා. මට මේ මොහොතේ ඉන්න තැනට එන්න බුදුරජාණන් වහන්සේ කෙරෙහි එදා මා තුළ තිබූ ශ්‍රද්ධාවමයි එදා මාව මේ අනතුරු වලින් බේරුවේ. මගේ අතීත ජීවිතයේ මෙවැනි අනතුරු කිහිපයකින්ම බුදුරජාණන් වහන්සේගේ සරණ විසින් මාව බේරාගෙන තිබෙනවා. මේ ඉන්න තැනට එන්න.... ඒ කියන්නේ මේ සියල්ල අහම්බයක් නොවේ. සංස්කාරයන්ගේ ප්‍රතිඵලයන්මයි. මේ වෙලාවේ මට නැවතත් මතකයට එනවා අද හිමිදිරියේ පිණ්ඩපාතය වඩිනකොට මංගල රථයේ ගමන් කළ මනමාල මහත්තයාව. 'අනේ මනමාල මහත්තයෝ, ඔබට ලැබුණ මනමාලියත් ඉහත ආකාරයෙන්ම උපාදානය බලවත් මනමාලියක් වුනෝතින් ඔබටත් දෙවියන්ගේම පිහිටයි'

මෙතැනදී 'දෙවියන්ගේම පිහිටයි' කියලා කීවේ පුතේ කවදානම් ඔබට ගැලවෙන්න පුළුවන්ද කියන කාරණයයි. ගිහි පින්වතුන්ලා මිථ්‍යාදෘෂ්ඨික සම්මුතීන්ගෙන් බැහැරවෙලා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ජීවිතය පටන්ගත හොත් එම ජීවිත මොන තරම් නම් ශක්තිමත් සැනසිලිදායක තැනකට රැගෙන යන්න පුළුවන්ද. බලාපොරොත්තු කන්දක් ගොඩගසාගෙන එම බලාපොරොත්තු කන්දටම යටවී මෙලෝ සිහියක් නැතිව ජීවත්වෙන මිනිස්සුන්ට මඟ නොමඟ කියාදෙන උතුම් ධර්මයක හිමිකාරීත්වය පින්වත් ඔබට හිමියි. කළ්‍යාණ මිත්‍ර ඇසුරම සොයන්න. ශ්‍රද්ධර්ම ශ්‍රවණය සිදුකරන්න. ඇසෙන්නා වූ ධර්මය නුවණින් මෙනෙහි කරන්න. එය ඔබේ ගමනක ආරම්භය වනු ඇත.

# දුක මරන්න! නැතිනම් ඔබ මැරුණත් දුක නොමැරෙයි

භික්ෂුවට ඇසෙනවා සර සර ගාන හඬක් ඒ හඬ නිතරම ඇසෙන්නේ කුටිය අසල ගැවසෙන තලගොයාගෙන්. එම සතා නිතරම වියළි කොළ වැටුණු පොළවට ඉව කරමින් කෑම සොයනවා. පොළව හාරන සෑම තැනකින්ම අනිවාර්යෙන්ම ගැඩවිල් පණුවෙක්, පත්තෑයෙක්, ගෝනුස්සෙක් ඩැහැගන්නවා. තලගොයා මේ සෑම සතෙක්ම මරාගෙන කන්නේ මරණීය චේතනාවක් ඇතිකර ගෙනමයි. මේ තලගොයා තුළත් මනුස්සයාට වගේම පංචඋපාදානස්කන්ධයක් සකස් වෙනවා. නමුත් මේ සතා මේ ධර්මතාවයන් ගැන දන්නේ නැහැ. ඔහු ප්‍රමාදයට පත්වෙලා. කුමක් නිසාද මේ ප්‍රමාද භාවය සකස් වුනේ. පෙර ජීවිතයේ සීලයේ දුර්වලතාවය නිසාමයි. මේ සතාට කර්මය කර්ම ඵල විශ්වාසය නැහැ. නමුත් මරණීය චේතනාව සකස් වෙනවා. තලගොයා ගිල දමන සෑම සතෙක් පාසාම තලගොයාට ප්‍රණඝාත අකුසලය සිද්ධවෙනවා. ඒ වගේමයි තලගොයාට ගොදුරු වී මියයන සෑම සතෙක්ටම එම සතා කළාවූ අකුසලයක් විපාක දෙනවා. කෙනෙක් අකුසල් සංස්කාරයන් උපද්දවා ගන්නකොට තවකෙනෙක් අකුසල් සංස්කාර ගෙවනවා. මේකට තමයි ලෝකය කියන්නේ. කෙනෙක් උපද්දවනවා තව කෙනෙක් ගෙවනවා. කඳුළ සිනහව දෝලනය වන ලොවක අපි සැපම සොයනවා.

මේ තලගොයාම පෙර ජීවිතයේ මනුෂ්‍යයෙක් වශයෙන් ඉපදිලා සිටියදී තේරුම් නොගත් දෙය තලගොයෙක් වෙලා කෙසේ නම් තේරුම් ගන්නද? මේ තලගොයා තව කල්ප ගණනාවක්ම අකුසල් කරමින්ද කළාවූ අකුසල්වලට විපාක විඳිමින්ද භවයේ ගමන් කරනු ඇත. මේ තලගොයාගේ ජීවිතය තුළ සැඟවී ඇති භව ගමනේ අන්තරාකාරී

බව ඔබ නුවණින් මෙනෙහි කිරීමට දක්ෂ වුවහොත් එය ඔබට මේ ජීවිතයේ දීම සතර අපායෙන් මිදීමට අවබෝධය සකස් කරනු ඇත.

පින්වතුන්ලා මුලින්ම කරන්නට යන්නේ භාවනා කිරීම. ඔතනදී තමයි අපි වරද්දගන්නේ. මුල්ම කාරණය ලෙසින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගන්න. දෙවැනිව සීලයක් ආරක්ෂා කරගන්න. මේ කාරණා දෙක පරිපූර්ණ නැතිව විදර්ශණා භාවනාවක්, සමථ භාවනාවක් වැඩෙන්නේ නැහැ. නිසියාකාරව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින්, සීලය තුළින් පින්වත් ඔබ පිරිසිදු භාවයට පත්වෙලා ඕනේ භාවනාවකට යොමු වෙන්න. ඔබ තුළ ඒ පිරිසිදු භාවය සකස්වෙලා නැතිනම් භාවනාවක් වැඩෙන්නේ නැහැ. භාවනාව නාමයෙන් සක්කාය දිට්ඨියමයි, මාන්නයමයි වැඩෙන්නේ.

මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ පින්වත් ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ පිහිටීම කියන කාරණය නිවැරදි අර්ථය තේරුම් අරගෙන නැහැ. භික්ෂුව දන්න භාවනා උපදේශක මහත්මයෙක් සිටියා. ඔහු විශාල පිරිසකට භාවනා පංති පවත්වන භාවනා ගුරුවරයෙක්. මේ භාවනා ගුරුවරයා බාහිරට නොපෙනෙන්න උදරය හරහා සුදු නූලක් (ආරක්ෂාවක්) දමා ගෙනයි සිටින්නේ. භික්ෂුව ඔහුගෙන් ඇසුවා ඇයි ඔබ ඔය ශරීරයට සුදු නූලක් දමාගෙන ඉන්නේ කියලා. මේ භාවනා ගුරුවරයා කියනවා 'මට හරියට සතුරු කරදර තිබෙනවා. ඒකට ආරක්ෂාවක් කරලයි මේ නූල දැම්මේ' කියලා. බලන්න මේ භාවනා ගුරුවරයා අඩුම වශයෙන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවවත් ඇති කෙනෙක් නොවේ. මොහු රැවටීම තුළයි ජීවත් වෙන්නේ. අවංකවම මොහු දන්නේ නැහැ මොහු තුළ ශ්‍රද්ධාව පිහිටල නැහැ කියන එකවත්. එය හරිම අවාසනාවක්. ඔහුත් රැවටිලා තම ගෝලයනුත් රවට්ටලා. සසර මෙතුවක් කලක් අපට වැරදුන ලොකුම තැන තමයි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ සැබෑම අර්ථය හඳුනා නොගත් කාරණය. යමෙක් අන්‍ය සීල ව්‍රතවලට ගරුකරනවා නම්, මිථ්‍යා දෘෂ්ඨික මාර්ගය ඔස්සේ ආරක්ෂාව බලාපොරොත්තු වෙනවා නම්, තෙරුවන්ගේ ගුණයන් කෙරෙහි විචිකිච්චාව ඇතිකර ගෙන තිබෙනවා නම්, ඔවුන් ගිහි පැවිදි කවුරුන් වුවද තවමත් තෙරුවන්

කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණ නැති බව, තමා කෙරෙහි අනුකම්පාවෙන් තමාම පිළිගත යුතුය. ඔබ තුළ ඇත්තේ අමූලිකා ශ්‍රද්ධාවකි. මෝහය මුසු, නිරතුරුවම අභියෝග හමුවේ වෙනස්වන ශ්‍රද්ධාවකි. සමාජය පුරා යන්ත්‍ර මන්ත්‍ර, හදිහූනියම්, කේන්දර, ගුරුකම් ව්‍යාපාරයක් කරගනිමින් ජීවත් වෙන, ඒවායේ ප්‍රතිලාභයක් ලබන ලක්ෂ කීයක් ඉන්නවාද? ඒ සෑම දෙනෙක්ම ඉහත අභියෝගය තුළ ජීවත්වන බව සද්ධර්මයේ නාමයෙන් සටහන් කළ යුතුව ඇත.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ සූත්‍ර දේශනා කියවීමෙන් ඉහත කාරණය ගැන නිවරුදි වැටහීමක් ලබාගත හැකිය. නමුත් මේ නිවරුදි භාවයට පත්වීම ලෝකයේ ඇති දුර්ලභම දෙයක් වනු ඇත. මේ උතුම් ශාසනයක් මුණ ගැසුන මොහොතේ එවන් දුර්ලභ මනුෂ්‍යයෙක් වීමට පින්වත් ඔබත් උත්සාහ ගන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණීමට පින්වත් ඔබ අන්‍ය සීලව්‍රතයන් කෙරෙහි, මිථ්‍යාදෘෂ්ඨික ක්‍රමවේදය කෙරෙහි ඇති බැඳීම්වලින් වහා වහා මිදෙන්න. තෙරුවන් කෙරෙහි විශ්වාසයෙන්, සිල්වත් භාවයෙන්, මෛත්‍රීයෙන්, දානය තුළින්ම, සතුරු කරදර මගහරවා ගන්න. ජීවිතය ඉදිරියට පැමිණෙන ප්‍රශ්න කම්කටොළු සංස්කාරයන්ගේම ස්වභාවයක් හැටියට දකීමටත්, ඒවාම කමටහන් කොටගෙන ලෝකය කෙරෙහි අවබෝධයෙන් කලකිරීමටත් උත්සාහ ගන්න. මෙය සටහන් තබන භික්ෂුවට ගිහි ජීවිතයේ දී විඳීමට සිදුවුන ප්‍රශ්න, බලාපොරොත්තු කඩවීම්, දුක් කම්කටොළුවල ජයග්‍රාහී ඵලය මේ භික්ෂූත්වය බව ඔබට සිහිපත් කරමි. ප්‍රශ්න අපේ ජීවිතය ඉදිරියට එන්නේ එම ප්‍රශ්න අපේ ජීවිතයට ආශිර්වාදයක් කරගන්නමයි. එම නිසා ප්‍රශ්න තුළින් ධර්මයේ යථාර්තය දකින්න. ජීවිතය කියන්නේ පිළිතුරු සොයා නොගත් ප්‍රශ්නයක්. එහෙම නම් ප්‍රශ්නවලින් මිදෙන්න ඔබට බැහැ. ජාතිය කෙටිකර ගන්න දිශාවටයි ඔබ ගමන් කරන්නේ. ජීවිතය ඉදිරියට පැමිණි ප්‍රශ්න නිසා මේ භික්ෂුව ගිහි ජීවිතයේ දී කොච්චර නම් ලෝකයට හොරෙන් තනිවම හඬලා ඇතිද? පැය ගණන්, දවස් ගණන් හිස කකියන තුරාවට කල්පනා කරලා ඇතිද? දේවාල කෝවිල්වලට කොච්චර යන්න ඇතිද? මේවා සටහන් තබන්න භික්ෂූවට ලැජ්ජාවක් නැහැ. නමුත් මේ කිසිවකින් ප්‍රශ්නයට පිළිතුරක් නොලැබෙනකොට

මම අවසානයේ ගියේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ හමුවට. උන්වහන්සේ දේශනාකර වදාළ ධර්මරත්නය හමුවට. එතැනදියි මම අවබෝධකර ගත්තේ දුක කියන්නේත්, සැප කියන්නෙත් මට අයිති දෙයක් නොවන බව. මගේ වසඟයේ තබාගත හැකි දෙයක් නොවන බව. හේතුවක් නිසා සකස් වෙන දෙයක් බව. තෘෂ්ණාවමයි හේතුවුනේ දුකට. රූපයට ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න. දුක එතකොට මැරිල යාවි. තෘෂ්ණාව නොමැරුනොත් ඔබ මැරුනත් දුක ඔබේ පසුපසින් ඒවි. දුක ඇති තැන තෘෂ්ණාවයි ඔබ අවබෝධ කරගත යුත්තේ. දුක කියන්නේ අවබෝධ කිරීමෙන් පමණක් නැතිකළ හැකි දෙයක්මයි..

# සංස්කාරයන්ට අනුව ජීවිතය නොදැක්කොත්....?

පින්වත් ඔබ සැවොම පින්කම් කිරීම සදහා බොහෝම කැපවීමෙන් කටයුතු කරනවා. නමුත් සමාජයේ ජීවත්වන තවත් පිරිසක් සිටිනවා ඒ අය පින්කම් කිරීම කෙරෙහි එතරම් වෙහෙසක් ගන්නේ නැහැ. එම පින්වතුන් කල්පනා කරනවා අපි කාටවත් වැරදි කරන්නේ නැහැ. අපි පව් වැඩ කරන්නෙ නැහැ, එම නිසා අපට පින්කිරීමේ අවශ්‍යතාවයක් නැහැ කියලා. එහෙම කියන ගමන් ඒ අය ප්‍රකාශ කරනවා පව් කරන අයයි පින්කළ යුත්තේ කියලා. මතුපිටින් මේ අදහස් බැලුවහම එකිනෙකට බොහෝම හොඳින් ගැලපෙනවා. නමුත් මෙවැනි දෘෂ්ඨී තුළ සැඟවී ඇති සතුරා තමයි මිථ්‍යාදෘෂ්ඨිය. පින්වත් ඔබේ ජීවිතය දෙස හොඳින් හැරී බලන්න. යහපත් අම්මා, තාත්තලාට දාව බෞද්ධ පරිසරයක ඉපදිලා ඔබට හතුරුකම් කරන දෘෂ්ඨීන්වලට යටවීම තුළින් මේ මනුෂ්‍ය ජීවිතයට ඔබ මොන තරම් සතුරු කමක්ද සිදුකර ගන්නේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සියලු සංස්කාරයෝ අනිත්‍යයි කියලා. සංස්කාරයෝ කියන්නේ අවිද්‍යාව හේතුවෙන් සකස් වෙන්නාවූ කාය, වචී, මනෝ සංස්කාර. කයින්, වචනයෙන්, මනසින් සිදුවෙන්නා වු කුසල් සහ අකුසල්. ඒ කියන්නේ පින්වතුන් සිදුකළා වුද සිදුකර ගන්නාවූද සියලුම කුසල් සහ අකුසල් සංස්කාර විපාකදී අවසන් වන බවයි. අති බහුතරයක් මිථ්‍යාදෘෂ්ඨික මිනිසුන් ජීවත්වන ලොවක පින්වත් ඔබට මේ අර්ථවත් බෞද්ධයෙක් ලෙස ජීවිතයක් ලැබුණේ කුසල් සංස්කාරයන් නිසා. ඇස් අන්ධ, කන් බිහිරි, දිව ගොළු, අංගවිකල මිනිසුන්ගෙන් ගහණ ලොවක අංග සම්පූර්ණ මනුෂ්‍ය ශරීරයක් ලැබුණේ කුසල් සංස්කාරයන් නිසා. විරූපී මිනිසුන් ජීවත් වන ලොවක පින්වත් ඔබට

අනුන්ගේ සිත් වසඟ කරන රූපයක් ලැබුණේ, රෝගී මිනිසුන් බහුල ලෝකයක පින්වත් ඔබට නිරෝගී ජීවිතයක් ලැබුණේ අතීත කුසල් සංස්කාර නිසා. පින්වත් ඔබට යහපත් සමාජ තත්ත්වයක්, යහපත් දෙමාපියන්, ඥාතීන්, බිරිඳක්, සැමියෙක්, දරුවෙක් ලැබුණේ අතීත කුසල් සංස්කාර නිසා. පින්වත් ඔබ මගේ කොට ගෙන සතුටු වෙන සියල්ල ඔබ අතීතයේ රැස් කළාවූ සංස්කාරයන්ගේ ප්‍රතිපලයි. මේ ඇස ඔබට ලැබුණේ කුසල් සංස්කාරයක් නිසා. දැන් ක්‍රමක්‍රමයෙන් ඔය ඇස ගෙවී යනවා. මේ මුළු ශරීරයේම ස්වභාවය එයයි. මේ අංගසම්පූර්ණ ශරීරය ඔබට ලැබුණේ කුසල් සංස්කාරයක් නිසා. සංස්කාරයන්ගේ ස්වභාවය අනිත්‍යයයි. එම නිසා ගිහි පින්වත් ඔබ නැවත නැවත රැස්කළ යුතුයි. පින්වත් ඔබට යහපත් බිරිඳක් ලැබිලා තිබෙනවා. ඇය ඔබට බොහෝම කීකරුයි. දුක සැප බෙදා ගනිමින් ජීවත් වෙනවා. මේ බිරිඳ ඔබට ලැබුණේ කුසල් සංස්කාරයක් නිසා. හොඳයි ඔබට නිරතුරුවම පීඩා දෙන වදක භාර්යාවක් ලැබුණේ නම් බිරිඳගෙන් ලැබෙන සතුට තිබෙනවාද? නැහැ. එහෙනම් ඔබට රණ්ඩු වෙන්න, පොලීසි යන්න, දික්කසාද වෙන්න..... ප්‍රශ්න ගොඩක් මුණගැසෙනවා. එය අකුසල් සංස්කාර නිසා සිදුවන්නක්. මේ දුක සහ සැප දෙකටම හේතුව අතීත කුසල් සහ අකුසල් සංස්කාරයන්මයි. එසේ නැතිව හඳහනේ වරදවත්, කපු මහතාගේ වරදවත් නොවේ. ඔබම අතීතයේ රැස්කළාවූ කුසල් අකුසල්වල ප්‍රතිඵලයි.

ඔබට සැප ලබාදෙන කුසල් සංස්කාරයන් මෙන්ම දුක ලබා දෙන අකුසල් සංස්කාරයන්ද විපාක දී අවසන් වෙනවා. ඔබ මේ ජීවිතයේ දී සැප ලබනවාය කියන්නේ ඔබම රැස්කරපු දෙය ගෙවෙනවාය කියන කාරණයයි. එම සැප ලබන්න ලබන්න ඒවා (කුසල් සංස්කාරයන්) ක්ෂය වී යනවා. ක්ෂය වන දෙය ඔබ නැවත නැවත රැස්කළ යුතුයි. එසේ නැතිවුව හොත් නැවත ලබන ජීවිතයේ දී ඔබ හීන, දීන භාවයට පත්වෙනවා. එබැවින් 'අපි පව් කරන්නේ නැති නිසා පින් කරන්න අවශ්‍ය නැහැ' ය කියන මුසාවාදය, මිථ්‍යාදෘෂ්ඨිය ගැන පින්වත් ඔබ පරෙස්සම් වන්න. නැවත නැවත පින්කම් සිදුකරමින් ගෙවී යන කුසල් සංස්කාරයන් තව තව වඩවා ගන්න. පින්වත් ඔබ අත්විඳින්නා වූ අකුසල් සංස්කාරයන්ගේ විපාකයන්ද, දුකද නැවත නැවත පින්කම් සිදුකරමින් රැස්කරන්නාවූ කුසල් සංස්කාරයන්ගේ ශක්තියෙන් යටපත් කර නැඟී සිටින්න.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ මොහොතේ පින්වත් ඔබගේ දෑසින් කඳුළක් ගලනවා නම්, ඒ ඔබ පෙර ජීවිතයේ දී අනුන්ගේ ජීවිතයකට කඳුළක් දුන් නිසාමයි කියලා. ඔබ මේ මොහොතේදී සතුටින් සිනාසෙන්නේ නම් ඒ පෙර ජීවිතයේ දී ඔබ අනුන්ට සතුටක් දුන් නිසාමයි කියලා. එසේ නම් පින්වත් ඔබගේ සිනහවටත් කඳුළටත් හේතුව ඔබගේ අතීත සංස්කාරයන්ගේ ඵලයයි. මෙසේ විවේකීව, හේතුඵල ධර්මයන්ට අනුව ජීවිතය දකින්න. මේ දැකීම ඔබට අත්‍යාවශ්‍යයි, ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව සකස් කර ගන්න. මේ ධර්මතාවයන් ගැන විශ්වාසයක් නැති මනුෂ්‍යයා නැවත මනුෂ්‍ය ජීවිතයක් ලැබුවත් මිථ්‍යාදෘෂ්ඨික භාවයට පත්වෙනවා. ඊට අමතරව කර්මය කර්ම ඵල ගැන විශ්වාසයක් නැති නිසා, දානය කෙරෙහි ඇති උදාසීන භාවය නිසා දුප්පත් වෙලයි උපත ලබන්නේ. මෙහෙම උපතක් සකස්කරගත් මනුෂ්‍යයෙක් ගැනයි පහත සටහන.

මොහු මධ්‍යම පංතික ජීවිතයක් ගතකළ මහත්මයෙක්. විවාහවෙලා දරු මුණුබුරන් සිටියා. මොහු කවදාවත් සිල් සමාදන්වුනේ නැහැ. දන් දෙන්න ගියේ නැහැ. මොහුගේ දර්ශනය වුනේ 'මම වැරදි කරන්නේ නැහැ. එම නිසා මට පින් කිරීමට අවශ්‍යතාවයක් නැහැ' කියන එකයි. මේ කෙනා මනුෂ්‍යයන්ට උපකාර කළා. ඒත් කර්මය කර්මඵල ගැන විශ්වාසයෙන් නොවෙයි. එම නිසා ඔහු කළ යහපත් දේවල් හුදු ඒ මොහොතේ සතුට ලැබූ ක්‍රියාවන් පමණක් වුනා. මේ මනුෂ්‍යයා අවුරුදු 65ක් පමණ ජීවත්වී මිය යනවා. මොහුගේ මරණින් පසුව භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණුකර බලනවා මොහු කිනම් තැනක නැවත උපත සකස් කරගත්තාද කියලා. එවිට භික්ෂුවට දර්ශනය වන්නේ දුප්පත් පැල්පතක උපත ලබා සිටින කළු පැහැති දරුවෙක්. පෙනුමෙන් භික්ෂුව අනුමාන කළේ ඒ ද්‍රවිඩ දරුවෙක් බවයි. ඒ කියන්නේ මේ මනුෂ්‍යයා තමන් අකීකරු භාවයෙන් ගත් දෘෂ්ඨිය නිසා සම්මා සම්බුද්ධ ශාසනය අහිමි කරගත් බවයි. දැන් මොහු මිථ්‍යාදෘෂ්ඨික භාවයට පත්වී අවසන්. මේ විනාශයෙන් මොහු කවදා ගොඩ එන්නද? එය දැන් සිහිනයක් පමණයි. මේ සා අර්ථවත් වටිනා දහමක හිමිකරුවෙක්ව ඉපදිලා, තම තමන්ට ඕනෑ ආකාරයට ධර්මය ගලපා ගැනීමට යාම නිසා මොහු සම්මා සම්බුද්ධ ශාසනය අහිමිකර ගත්තා. ලොව්තුරා බුදුරජාණන්

වහන්සේ අවබෝධයෙන් දේශනාකර වදාළ ධර්මය පින්වත් ඔබ විසින් ඔබේ දෘෂ්ඨීන්ට අනුව අර්ථ දක්වන්න යන්න එපා. එහෙම වුනොත් එහි විපාකය ඔබට ශාසනය අභිමිවී මිථ්‍යාදෘෂ්ඨික භාවයට පත්වීමයි.

පින්වත් ඔබට පෙනෙනවා ශාසනයේ අර්ථයන් බෙහොම වේගයෙන් අතුරුදන් වෙමින් යන ස්වභාවය. ධර්මයේ සන්දිට්ඨික ගුණය ගැන වර්තමානයේ බොහොම අඩුවෙනුයි කතාකරන්නේ. ධර්මයේ අර්ථය වන චතුරාර්ය සත්‍ය ධර්මයේ මුල්ම ආර්ය සත්‍ය වන 'දුක' වෙනුවට 'සැප' කියන කාරණය දකින්න කැමැති ප්‍රවණතාවක් සමාජය තුළ තිබෙනවා. මේ ප්‍රවණතාවය වැඩිවෙන්න වැඩිවෙන්න අපි මොකක්ද ලෝකය තුළ දකින්නේ? ඒ මිථ්‍යාදෘෂ්ඨිකභාවය වැඩිවීම. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් තොරව දෘෂ්ඨීන්, මතවාද කරපින්නාගත් බෞද්ධයන්ගේ වැඩිවීම. මේවා කම්පාවිය යුතු දේවල් නොවේ. හේතුඵල ධර්මයන්මය. ධර්මයේ සැබෑ අර්ථයට පිටුපාන සම්බුද්ධ දේශනාවන් වැරදි ආකාරයට අර්ථදක්වන කිසිම ගිහි පැවිදි පින්වතකුට මේ ජීවිතයෙන් පසු ශාසනයේ රැකවරණය උරුමවෙන්නේ නැහැ. මිථ්‍යාදෘෂ්ඨිකභාවයේ අඳුර රැඳි භව ගින්දරයි උරුමවෙන්නේ. පින්වත් ඔබ ධර්මයේ අර්ථයෙන් ඈත් වෙන්න ඈත්වෙන්න ලෝකයේ මිථ්‍යාදෘෂ්ඨිකභාවය වැඩිවෙනවා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුත් බෞද්ධයන් අඩු වෙනවා. සමහර පින්වතුන් බොහෝම වේදනාවෙන් කතා කරනවා සිංහල බෞද්ධ අම්මලා උපරිම දරුවන් දෙදෙනයි හදන්නේ. මුස්ලිම් ද්‍රවිඩ අම්මලා දරුවන් ගොඩක් හදනවා කියලා. මේ හේතුවෙන් බෞද්ධයන් අඩුවී ගෙන යනවා කියලා. පින්වත් ඔබ කලබල වෙන්න එපා. මේවා හේතුඵල ධර්මයන්. ඔය සෑම ද්‍රවිඩ, මුස්ලිම් අම්මා කෙනෙකුගේම කුසේ උපදින්නේ, මේ උතුම් ශ්‍රද්ධර්මයේ අර්ථයන්ට පිටුපෑ දෘෂ්ඨී, මතවාද නිසා ශාසනය අහිමි කරගත් බෞද්ධයන්මයි. ඉහත කරුණු කාරණා පින්වත් ඔබ ධර්මානුකූලව නොසිතා, දෘෂ්ඨිගතව සිතන්නට ගියොත්, ඒ හේතුවෙන් ද්වේෂය සකස්කර ගතහොත් පින්වත් ඔබටද මීළඟ උරුමය එවැනි මව්කුසක් වීමට පුළුවන්.

ලෝකය ලෝකයේ ස්වභාවයෙන් පවතීවී. පින්වත් ඔබ ධර්මයේ ස්වභාවයට එන්න. ඔබ තෙරුවන් සරණ ගිය උපාසක, උපාසිකාවක්

වෙන්න. කර්මය කර්මඵල විශ්වාසයෙන් ජීවිතය දකින්න. එවිට ඔබට පුළුවන් සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, ක්‍රිස්තියානි සෑම මව්කුසක්ම දුක බව දකින්න. ලෝකය අනතුරුදායකයි. බොහෝම පරෙස්සමෙන් පරිහරණය කරන්න. ලෝකය යනු පංචඋපාදානස්කන්ධයම බව දකින්න. මේ මොහොතේ ජාතිය සිංහල, ආගම බුද්ධාගම සහිත උප්පැන්න සහතික හිමි ඔබ එහි අර්ථයන් නොගැලපෙන ආකාරයට දෘෂ්ඨිගත වුවහොත් ඔබ මියගොස් හරියටම මාස 9කට පසු ජාතිය ආගම හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි යැයි සඳහන් උප්පැන්න සහතිකයක හිමිකරුවෙක් වීමට ඔබට හැකිය. මේ සියල්ල සංස්කාරයන්ගේ හේතුඵල ධර්මයන්ය. කොතැනකවත් වරදක් නොමැත. ඔබට වැරදුණිද? ධර්මයට වරදින්නේ නැත. ධර්මයට බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් භේදයක් නොමැත. සංස්කාරයන්ගේ ස්වභාවය මත තීන්දුව ලබාදීම ධර්මයේ අර්ථයයි. එහෙත් මේ උතුම් මොහොතේ පින්වත් බෞද්ධ ඔබට අන් සියල්ලන්ටම වඩා ආශ්චර්යමත් භාග්‍යයක් ඇත. ඒ සම්මා සම්බුද්ධ ඥාණයෙන් තුන් ලෝකය අවබෝධකොට වදාළ උතුම් ශාස්තෘන්වහන්සේ නමකගේ ශ්‍රී සද්ධර්මයේ උරුමය ලැබීමයි.

මුළු ලෝකයම එක ගොඩකට දමා ඔබ බුදුරජාණන් වහන්සේගේ ගොඩට විත් ලෝකය දකින්න.

ලෝකය විසින් දකින ලෝකය හුඟාක් සංකීර්ණයි. එම ලෝකය තුළ බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම්.... පින්, පව්, හොඳ, නරක, සාමය, යුද්ධය..... මේ සියල්ලම තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලෝකය මීට වඩා හුඟාක් සරලයි. චතුරාර්ය සත්‍ය ධර්මය ගත්තත්, පටිච්ඡසමුප්පාද ධර්මය ගත්තත් අවිද්‍යාව විසින් සංකීර්ණභාවයට පත්කර ඇති ලෝකය බොහෝම සරල තැනකට ගෙනෙනවා. තෘෂ්ණාව කියන එකම කාරණය නිසා ලෝකය අල්ලාගන්නා ස්වභාවයත්, තෘෂ්ණාව කියන එකම කාරණය ප්‍රහාණය කිරීමෙන් ලෝකයෙන් මිදෙන ස්වභාවයත් බොහෝම අර්ථවත්ව දේශනා කර තිබෙනවා. පින්වත් ඔබ තෘෂ්ණාව කියන කාරණයෙන් මුළු ලෝකයටම බැඳී සිටියත්, එම ලෝකය කියන සංකීර්ණ කාරණය බුදු රජාණන් වහන්සේ ඔබ තුළින්ම සකස්වෙන රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියනා කරුණු පහ තුළට ගේනවා. මුළු ලෝකයේම ක්‍රියාකාරීත්වය පංචඋපාදනස්කන්ධය තුළට ගේනවා.

# පෙර ආත්මයේ නතරකළ තැනින් අරඹන්න

ධර්මය මේසා සරලව පින්වත් ඔබට දේශනා කළ බුදුරජාණන් වහන්සේ, ඇට්ටේරියා වනයක වැඩ සිටිමින්, තම අතට බිම වැටී තිබූ ඇට්ටේරියා කොළ අහුරක් ගෙන දේශනා කරනවා 'මහණෙනි මම අවබෝධ කරගත් ධර්මය මේ ඇට්ටේරියා වනයේම ඇති කොළ වලට සමාන බවත්, මා විසින් දේශනා කළ ධර්මය මගේ මේ අතේ ඇති කොළ ප්‍රමාණය තරම් බවත්. එසේ නම් බුදුරජාණන් වහන්සේ අවබෝධ කළ ධර්මයෙන් මොන තරම් සුළු ප්‍රමාණයක්ද ලෝකයාට දේශනාකර ඇත්තේ. පින්වත් ඔබට නිවීමේ මාර්ගයට පමණක් අදාළ පුංචි ධර්මයක් මේ තරම් සරලව දේශනා කරලත්, එම ධර්මය නාසා අපේ ඇත්තෝ මේසා දෘෂ්ඨි මතවාද සීල ව්‍රතවල පැටලෙනවා නම් බුදුරජාණන් වහන්සේ අවබෝධකොට වදාළ ධර්මයෙන් අඩක් හෝ අපට දේශනා කළා නම් අපි සියල්ලන් මොන විනාශයක් සිදුකරගනීද? බුදුරජාණන් වහන්සේලා සතු මහාකරුණා ඥාණය නිසාමයි ලෝකයාට භව නිරෝධයට අවශ්‍ය කරුණු කාරණා පමණක් දේශනා කරන්නේ. ඉකුත් සටහනේ පෙර සඳහන් කළ ''පව් නොකරනවා නම් පින් කරන්න අවශ්‍ය නැහැ'' දෘෂ්ඨිය ගැනීම නිසා ඔහු මේ මොහොතේ සිටින්නේ මිථ්‍යාදෘෂ්ඨික මනුෂ්‍ය ජීවිතයක. මොහුට මේ ජීවිතයේ දී දැනීමක්වත් නැහැ මොහු පෙර ජීවිතයේ දී බෞද්ධයෙක් කියලා. තමා විසින් තමාටම කරගන්නා වූ මීට වඩා විනාශයක් තිබෙනවාද? මේසා විනාශයක් තමා තමාටම කරගන්නේ ''මම'' කියලා ගොඩනගා ගන්නා සක්කාය දිට්ඨිය නිසා. අප්‍රමාණ දුකෙන් පිරි අප්‍රමාණ ගහණයකින් පිරි සතර අපාය අභිබවා මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ලැබීමට පෙර ජීවිතයේ අප්‍රමාණ පින්කම්

කළ පින්වතුනේ!! මොහොතක් විවේකීව සිතන්න. පින්වත් ඔබ ගිය ජීවිතයේදී නතර කළ තැනක් තිබෙනවා. ඒ නතර කළ තැන බොහෝම පාරිශුද්ධ තැනක්. පාරිශුද්ධයි කීවේ දානයෙන්, සීලයෙන්, ශ්‍රද්ධාවෙන් පාරිශුද්ධ නිසා. දැන් ඔබ මෙනෙහි කරන්න හේතුඵල ධර්මයන්ට අනුව, පින්වත් ඔබ අනුමාන කරන්න ඔබ ගිය ජීවිතයේ දී මනුෂ්‍යයෙක්ය කියලා. සිංහල බෞද්ධයෙක්මය කියලා. පින්වත් ඔබ මනසින් සිහිපත් කරන්න සුදුවත් දරාගෙන වයස අවුරුදු අසූපහක්, අනූවක් වෙනතුරු සිල් සමාදන්ව සමාදන්වූ සීලය ආරක්ෂාකරගත් හැටි.

පින්වත් ඔබ මෙනෙහි කරන්න මහා සංඝරත්නයේ අවවාද, අනුශාසනා ලබපු හැටි. දන් පුජාකළ හැටි. මේ කුසල් සංස්කාරයන් සිදුකරමින් ඔබ කුමක්ද ප්‍රර්ථනා කරන්න ඇත්තේ. මේ ධර්මද්වීපයේම උපත ලබන්න කියලයි. මේ ධර්මද්වීපයේම උපාසක උපාසිකාවක් වේවා කියන පැතුමයි. පින්වත් ඔබ දක්ෂ වෙන්න, තරුණ මහළු සැවොම ඒ යටගියා වූ මතකය නැවත මතුකොට ගන්න. එවිට පින්වත් ඔබට නතර කළ තැනින් නැවත පටන් ගන්න පුළුවන්. එසේ නොවුන හොත් පින්වත් ඔබලා උත්සාහ ගන්නේ මුල ඉඳන් නැවත අළුතින් පටන් ගන්න. තරුණයෙක් තරුණියක් නම් ඔහු හෝ ඇය සිතනවා වයසට යන්න ඕනේ සිල් සමාදන් වෙන්න, දන්දෙන්න, ධර්ම මාර්ගයේ ගමන් කරන්න කියලා. එම වැරදි අදහසට ඉඩදෙන්න එපා. තරුණ කාලයේදීම සුදුවත් දරාගත් උපාසක උපාසිකාවක් වෙන්න. එහෙම වුණොත් පමණයි ඔබ මේ ජීවිතයේ දී ප්‍රමාද නොවුනා වෙන්නේ. පින්වත් ඔබ තරයේම විශ්වාස කරන්න අතීත ජීවිතයේ දී ඔබ දෘෂ්ඨි මතවාදයන්ගේ ග්‍රහණයට නතුවූ බෞද්ධයෙක් නොවන බව. එසේ වුවා නම් හේතුඵල ධර්මයන්ට අනුව ඔබ මිථ්‍යාදෘෂ්ඨික භාවයෙන් තමයි උපත ලබන්නේ. එම නිසා පින්වත් ඔබ තුළින්ම ඔබ සහතිකයක් ලබන්න. ගිය ජීවිතයේ දී ඔබ තෙරුවන් සරණ ගිය බෞද්ධයෙක්මය කියලා. ඔබේ පිහිට රැකගෙන පැමිණි සද්ධර්මයේ උරුමය, අසත් පුරුෂ ආශ්‍රය අකීකරු භාවය නිසා දෘෂ්ඨි මතවාදවල, අන්‍ය සීල ව්‍රතවල සිරකොට දමන්න එපා. එය ඔබ විසින්ම ගොඩනගා ගත්දෙය ඔබ විසින්ම විනාශකර දැමුවා වෙනවා.

ඉහත සටහන් අර්ථවත් වෙන්න පහත සටහන ඔබට උපකාර වේවි.

මේ රටේ ජීවත්වන ප්‍රභූ කාන්තාවක් සිටිනවා. ඇය ධනයෙන් බලයෙන් අනූනයි. ඇය මහේශාක්‍ය කාන්තාවක්. භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණුකර බලනවා ඇයගේ පෙර ජීවිතය ගැන. එවිට භික්ෂුවට දර්ශනය වෙන්නේ ඇය ගිය ජීවිතයේ දී මනුෂ්‍ය ලෝකයේම කාන්තාවක් බවයි. භික්ෂුවට ඇයව දර්ශණය වී ඇත්තේ ඇය ගිය ජීවිතයේ දී මහළු වයසේ දී ද, තරුණ වයසේ දී ද සුදුවත් දරාගත් කාන්තාවක් බවයි. ඒ කියන්නේ ඇය තරුණියක්ව සිටි අවධියේ පටන් මියයන තුරාවට සීලයම ජීවිතය කරගත් කාන්තාවක් බවයි. දූන් පින්වත් ඔබ හේතුඵල ධර්මයන්ට අනුව ඇයගේ මේ ජීවිතය දකින්න. මේ ජීවිතයේ දී ඇයට මහේශාඛ්‍ය භාවය ලැබුණේ අන් කවුරුත් දුන් නිසා නොව පෙර ජීවිතයේ සීලයේ ආනිසංස ධර්මයන් නිසාමයි. දෙවියෙක්, බ්‍රහ්මයෙක් එසේත් නැතිනම් ඇයගේ ස්වාමිපුරුෂයා ඇයට දුන් මහේශාඛ්‍ය භාවයක් නොවේ. ඇයම කර්මය කර්මඵල විශ්වාසයෙන් ආරක්ෂා කළා වූ සීලයේ බලයයි. ගිය ජීවිතයේ දී ඇය විසින්ම රැස්කළ කුසල් සංස්කාර සුව සේ මේ ජීවිතයේ අත්විඳින මහේශාඛ්‍ය ඇය මේ ජීවිතයේ හරි අඩක් පමණ මේ දක්වා පැමිණිය ද ගිය ජීවිතයේ නතර කළ තැනින් මේ දක්වා තම ජීවිතය පටන්ගත් බවක් දකින්නට නැත. ඇයගේ මහේශාඛ්‍ය භාවය නිසාම ගිය ජීවිතයේ දී සීලයේ ආනුභාවයෙන් ලැබූ කුසල් සංස්කාර විඳිනවා පමණක්මය. ගිය ජීවිතයේ දී දිවි පරදුවට තබා රැකි සීලය නෙක්ඛම්මය උදෙසා නොව භවයේ සැප උදෙසා චේතනා සකස්කර ගෙන එහි ඵලයක් මේ ජීවිතයේ දී ලැබ ප්‍රමාද භාවයට පත්වී භවයේ අනතුරුදායක බව ඇය දූන් අත් විඳින්නීය. කුසල් සංස්කාරයන්ගේ අනතුරුදායක බව ඇය දූන් අත්විඳින්නීය. නැවතත් සටහන් කරමි. සංස්කාරයෝ අනතුරුදායකය. ප්‍රවේශමෙන් පරිහරණය කරන්න. මඟ නොමඟ නිවැරදිව හඳුනාගන්න. හේතුඵල ධර්මයන් නොදකිමින් පින්වත් ඔබ කුසල් සංස්කාරයන් පරිහරණය කළොත් එම කුසල් සංස්කාරයන්ම ඔබව සතර අපායට වැටිමටත් පාර පෙන්නාවි. ඉහත කාරණය නුවණින් මෙනෙහිකර පින්වත් ඔබ ඔබේ පින්වත් ජීවිතයේ ධනය, බලය, රූපය හේතුඵල ධර්මයන්ට අනුව ගලපා බලන්න. ඒවා සකස්වීමට බලපෑ හේතූන් ධර්මානුකූලව

හඳුනාගන්න. ගිය ජීවිතයේ පින්වත් ඔබ නතර කළ තැනින් මේ ජීවිතය පටන් ගන්න. ගිය ජීවිතයේ පින්වත් ඔබ නතර කළේ සුදුවත් දරාගෙනමයි. එසේ නම් මේ ජීවිතයේ දී තරුණවියේදීවත් පින්වත් ඔබ සුදුවත් දරාගත් උපාසක උපාසිකාවක් වෙන්න. ඔබට මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ලබාදීමට උපකාරීවූ ධර්මයට ගරු කරන්න. පින්වත් ඔබ හිතන්නේ ඔබේ පරම්පරාවෙන්, දෙමාපියන්ගෙන්, දේපල නිසා, අධ්‍යාපනය නිසා, ලබාගත් නිලතල නිසයි මේ සශ්‍රීක භාවය ලැබුණේ කියලා. ඔය සමහරු කියන්නේ කවුරුත් නිසා නොවෙයි මමයි දහදුක් විඳගෙන අධ්‍යාපනය හදාරල මේ තැනට පැමිණියේ කියලා. පින්වත් ඔබ දුක්විඳල තමයි ඔය තැනට ආවේ. එය සම්පූර්ණ සත්‍යයක්. නමුත් මේ සියල්ලටම ඔබට මට නොපෙනෙන ධර්මතාවයක් තිබෙනවා. හේතුඵල ධර්මයක්. ඒ පෙර ජීවිතයේ දී ඔබ විසින් සකස් කොට ගත් කුසල් සංස්කාරයන්ගේ ශක්තියයි. එම නිසා පින්වත් ඔබ තෙරුවන් කෙරෙහි කෘතගුණ දක්වන්න. සීලය, දානය කෙරෙහි කෘතගුණ දක්වන්න. කෘතවේදී මනුෂ්‍යයෙක් වෙන්න. මිථ්‍යාදෘෂ්ඨියට, දුශ්සීලභාවයට, මසුරුබවට ඔබේ ජීවිතය තුළින් ඉඩකඩ සලසා ඔබේ ජීවිතයට ඔබ ද්‍රෝහිවෙන්න එපා. ගුණමකු වෙන්න එපා. ධර්ම මාර්ගය අර්ථවත්ව වඩමින් අතීතයේ ඔබ රැස්කළාවූ කුසල් සංස්කාරයන්ගේ උපරිම ඵලය නෙලාගත් ඥාණවන්ත උත්තමයෙක් වෙන්න. මේ භව ගමනේ සතර අපායන්හි කවදාකවත් අතරමං නොවන්න. මෙන්න මේ උතුම් අරමුණ උදෙසාමයි මේ ජීවිතය පින්වතුන්ලාට ලැබුණේ. එම නිසා අතීත මතකය මතක් කරගෙන ප්‍රමාදී නොවී අප්‍රමාදී වෙන්න. කුසල් අකුසල් සියලුම සංස්කාරයෝ අනිත්‍ය බවම සිතන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ජීවිතයේ දීම නිවන් අවබෝධයෙන් සැනසීම සඳහා, සතර අපායෙන් මිදීම සඳහා පින්වත් ඔබ කාරණා තුනකින් සම්පූර්ණ විය යුතුය කියලා. එම කාරණා තුන තමයි ශ්‍රද්ධාව, වීර්යය, හිරි ඔතප් කියන්නේ. හිරි ඔතප් කියන්නේ සීලය. පින්වත් ඔබ ලැජ්ජා බය දෙක සකස් කොට ගන්න ඕනේ නැවත තිරිසන්, ප්‍රේත, අසුර, නිරයට නොවැටෙන්න. මෙතනදී තමයි ඔබ තුළ අයෝමය වීර්යය සකස්කර ගත යුත්තේ. එසේ නොමැතිව පින්වත් ඔබ කාමච්ඡන්දයට

යට වී 'මට පාරමී මදි', එසේත් නොමැතිනම් 'ලෝභ, ද්වේශ, මෝහ අඩුවූ ත්‍රිහේතුක ප්‍රතිසංධියක් ලබා ගන්න තව ගොඩාක් සසර යන්න තිබෙනවා' මෙවැනි කතා ශ්‍රද්ධාව වීර්යය මඳබවේ ප්‍රතිඵලයක් මිස ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අර්ථ දැක්වීම නම් නොවේ. නමුත් බුද්ධකාලීන සමහර සිදුවීම් තිබෙනවා පෙර අදහස් සනාථකර දක්වන්න. මෙහිදී අප නිහතමානීව දකින්න ඕනේ අප තුළ ශ්‍රද්ධාව, වීර්යය, හිරි ඔතප් හීන නිසාමයි ඉහත නිදහසට කාරණා සොයන්නේ කියලා. අප විසින් නිදහස උදෙසා පෙළගස්වන ඉහත කාරණා අපේ කෙලෙස්වල දිග පළල මිස ධර්මයේ සන්දිඨික ගුණයේ වරදක් නම් නොවේ. හිස ගිනිගත්තෙක් එම ගින්න නිවන්න වෙහෙස ගන්නේ යම්සේද මේ භවගින්නෙන් මිදීමට එපමණටම වෙහෙස ගන්නයැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, භවයේ තව දුරටත් සැරිසැරීම අනතුරුදායක බව කියාදීමටය. එම සිතුවිල්ල තුළ ඇති දුක් ගින්දර කෙරෙහි බිය ඇති කරගන්න. ධර්මය කෙරෙහි විශ්වාසය ඇතිකොට ගන්න. ඔබ තුළ නැති වීර්යය එවිට ඇති වේවි, සිත නැමති මාර ධර්මය විනිවිද දැකීමට.

# පින් පව් එනවා අපි පසුපස්සේ I
## (සෑම රියදුරෙක්ම කියවන්නේ නම් මැනවි)

භික්ෂුව මෙම ලිපිය සටහන් කරන්නට වසර දෙකකට පමණ පෙර හඳුනාගත් පවුලක් හිටියා. මේ පවුලේ සාමාජිකයන් සංඝයා කෙරෙහි බොහොම ගෞරවය ඇති පිනට දහමට ලැදි අයයි. මේ පවුලේ එකම පිරිමි දරුවාට වයස අවුරුදු 15ක් පමණ වන පාසල් වියේදී රිය අනතුරකින් මරණයට පත්වෙනවා. ගාලු පාරේ ගමන් කළ නගරාන්තර සුඛෝපභෝගී බස් රථයක නැගී තම ඥාති නිවසකට යමින් සිටියදීයි මෙම අනතුර සිදුවන්නේ. අධික තුවාල සහිතව දරුවා බස්රථය තුළදීම මිය යනවා. මේ අනතුර සිදුවී හරියමට අවුරුද්දයි මාස අටකට පසු දිනක භික්ෂුව සමාධියෙන් පසුවන විටක මේ දරුවාව අරමුණු කර බලනවා. එවිට භික්ෂුවට අරමුණු වූ දර්ශනය මෙහි සටහන් කරනවා.

මුලින්ම භික්ෂුවට අරමුණු වන්නේ මේ දරුවා පෙර ජීවිතයේ දී උපත ලබා සිටි ස්වභාවය. මේ දරුවාගේ පෙර භවය දර්ශනය වන්නේ වයස අවුරුදු 70ක් පමණ පිරිමි අයෙක්. ඔහු හැඳගෙන සිටින්නේ සරමක් සහ කර නැති කමිසයක් වැනි ඇඳුමක්. මේ කමිසය බොත්තම් කාස මහපු එකක් නොවෙයි. ඔබ දැකලා ඇති පැරණි මනුෂ්‍යයෝ උඩුකයට අඳින ඇඳුමක් තිබෙනවා පැත්තෙන් ගැට දෙකක් දාලා තමයි එය අඳින්නේ. මෙවැනි ඇඳුම් ප්‍රභූ පිරිස් එහෙම නැතිනම් වැදගත් පිරිස් අඳින්නේ නැහැ. ඒ අයගේ සේවක පිරිස්, අතවැසි පිරිස් තමයි එවැනි ඒවා අඳින්නේ. ඒ කියන්නේ ප්‍රභූ පිරිස්වලට සේවය කරන අය. රිය අනතුරින් මිය ගිය දරුවා ද පෙර ජීවිතයේ මෙවැනි ප්‍රභූ පවුලකට සේවය කළ කෙනෙක්. ඔහු වයස අවුරුදු 70ක වයස් සීමාව ඉක්මවා ගිහිල්ලා මිය ගියාට පසුව ලැබූ ප්‍රතිසන්ධිය තමයි මේ දරුවා.

දැන් ඔබට වැටහෙනවා ඇති මේ හදිසි අනතුරින් මිය ගිය දරුවා පෙර ජීවිතයේ දී කවුරුන් ද කියලා. මීළඟට භික්ෂුව අරමුණු කර බැලුවේ හදිසි අනතුරින් මිය ගිය පසු මේ දරුවා කොතැනක උපත ලැබුවේද යන්නයි. මොහු උපත ලබන්නේ, මේ මනුෂ්‍යයන් ඇසුරේම ජීවත්වෙන ප්‍රාථමික දෙවියෙක් හැටියටයි. ප්‍රාථමික දෙවියෙක් යැයි කීවේ මේ අය දිව්‍යතලවල ජීවත් වෙන මහේශාක්‍ය දෙව්වරු නොවන නිසයි. මනුෂ්‍ය ලෝකය තුළ යම් යම් උපාදානයන් කෙරෙහි තෘෂ්ණාව සකස්කර ගෙන මනුෂ්‍යයන් ඇසුරේම ජීවත්වෙන දිව්‍ය ස්වභාවයක්. මේ දෙවියාගේ ඇඳුමේ ස්වභාවය දැක්කහම භික්ෂුවට හිතුන මොහුව බබා දෙවියන් යැයි හඳුන්වන්න.

වයස අවුරුදු 15ක් පමණ පෙනුමැති සාමාන්‍ය මහත දරුවෙකුගේ රූපයක් සහිත දණහිස ප්‍රමාණයට දිගැති සුදු කලිසමක් සහ කොලරය නොමැති කර පළල් සුදු කමිසයක් හැඳගෙන සිටියා. සුදු හිස් වැස්මක් පැළඳගෙන සිටියා.

මේ ඇඳුම් කට්ටලයේ ඉහත ස්වභාවය දකිනකොට භික්ෂුවට මතක් වුනේ උපාධි ප්‍රදානෝත්සවයකදී උපාධි ලබන්නකුගේ ස්වභාවය. වෙනසකට තිබුණේ කලිසමේ කෙටි බව විතරයි. මේ අනතුරින් මියගිය දරුවාගේ අම්මාත් කොළඹ ප්‍රධාන පාසලක ගුරුවරියක්. මේ දරුවාත් කොළඹ ප්‍රධාන පාසලක අධ්‍යාපනය හදාළ ශිෂ්‍යයෙක්. මේ සියල්ල සමග සසඳන කොට මේ දරුවා මියයන මොහොතේ, තමන් අනාගතයේ දී හොඳින් ඉගෙනගෙන උපාධිධාරියෙක් වෙනවාය යන ලෙසින් ඇතිකර ගෙන තිබූ උපාදානය මතුවී, ඒ උපාදානයට අදාළව එම දිව්‍ය ස්වභාවයේ රුව ගුණ සකස්වූවා ද විය හැකිය. මේ දරුවාගේ පෙර ජීවිතයත්, මතු ජීවිතයත් ගැන අරමුණු කර බලද්දී භික්ෂුවට මේ දරුවා මෙවැනි කුරිරු ආකාරයට වයස අවුරුදු 15කදී පමණ හදිසි අනතුරකින් මියයෑමට හේතුවුණ කර්ම විපාකය කුමක්ද යන්න දර්ශනය වුනා. භික්ෂුවට දර්ශනය වුනේ බොහොම තියුණු මුවහත තිබෙන කැත්තක්. ඒ ගම්වල මිනිසුන් කැළෑ එළිකරන්න ගන්න බොහොම තියුණු මුවහත සහිත කැත්තක්. ඒ මුවහත සහිත කැත්තෙන්

තැඹිලි පැහැයට හුරු සර්පයෙක් කෑලි කෑලිවලට කපනවා. මෙන්න මේ සර්පයා කෑලිකෑලිවලට කපා දමා මැරූ කර්ම විපාකය තමයි දරුවා මේ ජීවිතයේ දී රිය අනතුරකින් මරණයට පත්කර දමන්නේ.

ඔබ දැන් මේ භික්ෂුව සටහන් කළ උතුම් සමාධිය තුළදී අත්දුටු සන්දිට්ඨික ධර්මය ඔබේ නුවණින් හොඳින් ගලපා ගන්න ඕනේ. මොකද මේ හුදු කතාවක් විතරක් නෙවෙයි. ඔබට අවංකවම මේ සසර දුක නිමාකර ගැනීමට අවශ්‍ය නම් ඊට අවශ්‍ය කමටහනක් මේ කතාව තුළ අන්තර්ගතව තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබට මේ දුකින් පිරි සංසාරයෙන් එතෙර වීමට අවශ්‍ය නම් ඔබ තුළ ඇතිකර ගත යුත්තේ, මුළින්ම සංසාරය පිළිබඳව බියයි. සංසාරයේ බිය නොදකින්නා සංසාරය, මගේ කරගන්නවා. සංසාරය බිරිඳ, දුව, පුතා කර ගන්නවා. ආශ්වාදයන්මයි දකින්නේ. ඒ නිසා ඉහත කතා ප්‍රවෘත්තිය ඔබට සසර බිය ඇතිකර ගැනීමට හුඟාක් උපකාරී වෙනවා.

දැන් බලන්න මේ හදිස්සි අනතුරින් මිය ගිය 15 හැවිරිදි ප්‍රධාන පාසලක අධ්‍යාපනය ලද මේ දරුවා පෙර ජීවිතයේ උපත ලබලා සිටියේ ප්‍රභූ පවුලක මෙහෙකරුවෙක් හැටියට. මේ මෙහෙකරුවා වයස අවු 70 පමණ ජීවත්වෙලා මියගියාට පසුව තවත් අම්මා කෙනෙක්ගේ මව් කුසේ පුතෙක් හැටියට උපත ලබනවා. දැන් බලන්නකෝ මේ අම්මා, තාත්තා මගේ පුතේ කියලා අප්‍රමාණ සෙනෙහෙසක් දැක්වුවේ කාටද? ඔහු පෙර ජීවිතයේ කවුරු වෙලාද සිටියේ. අවුරුදු 70 පමණ වයසක මනුෂ්‍යයෙක් තමයි මැරිල මේ නැවත ප්‍රතිසංධිය ලැබුවේ. ඔබ එහෙමනම් දෙවියනේ මේ නළවලා තිබෙන්නේ පෝෂණය කරලා තිබෙන්නේ කාවද? ඔබට සිතෙන්නේ නැද්ද අනේ මම නළවලා තිබෙන්නේ පෝෂණය කරලා තිබෙන්නේ අර වයසක මනුෂ්‍යයාව කියලා. ඒ ප්‍රභූ පවුලේ සේවය කරපු මෙහෙකාර මනුෂ්‍යයාව කියලා. මේ විදියට පින්වතුනේ ඔබේ ඔඩොක්කුවේ සුරතල් වන ඔය දරුවා පෙර ජීවිතයේ කවුරුන් වෙන්න ඇතිද? වෙන කොහේ හරි ජීවත්ව සිටිය වයසක සීයා කෙනෙක්, වයසක ආච්චී කෙනෙක් සමහරවිට දෙවියෙක්, තිරිසන් සතෙක්, ප්‍රේතයෙක් වෙන්න පුළුවන්. එහෙම නම් ඔබ ඔය මගේ දරුවා... මගේ දරුවා කියලා නළවන්නේ සුරතල් කරන්නේ

කාවද? ඔබ ඔය සුරතල් කරන්නේ මෝහය, මුලාව, අනවබෝධය. මෙහෙම කීවාම පින්වත් ඔබ ගිය ජීවිතයේ සිටි කෙනාව මේ ජීවිතයේ ඉපදුනාය කියන ආත්ම සංඥාව ගන්න යන්න එපා. අවිද්‍යාව නිසා සකස් වුනා වූ සංස්කාර හේතුවෙන් හටගන්නා වූ ධර්මතාවයක්ය යන්න හේතුඵල ධර්මතාවයන් අනුව දකින්න උත්සාහ ගන්න.

මේ රටේ ජීවත්වූ බොහෝම ප්‍රභූ පෙළේ මහත්මයෙක් සිටියා. ඔහු මිය ගිහිල්ලා උපත ලබන්නේ ඌරෙක් වෙලා. එතකොට ඒ ඌරු අම්මගේ තන්පුඩුවල එල්ලිලා කිරි උරා බොන්නේ කවරෙක්ද? ඌරු පැටියෙක් බව ඇත්ත. ඒ ඌරු පැටියා ගිය ජීවිතේ අර ප්‍රභූ මනුෂ්‍යයා. පින්වතුනේ මනුෂ්‍යයා සීලයෙන් ඈත් වෙන්න ඈත් වෙන්න ඒ අය ඊළඟ උපතේ දී තිරිසන් අම්මලාගේ පැටවුන් ලෙස ඉපදීමේ ප්‍රතිශතය ඉතාමත් වැඩියි. මනුෂ්‍යයා අතින් මනුෂ්‍ය ඝාතන, සත්ත්ව ඝාතන, ඒවාට අනුබලදීම් සිදුවීම වැඩිවන්න වැඩිවන්න, එවැනි අකුසල් කරන අය ඊට සුදුසු විපාකයන් විඳීම සඳහා උපදින්නේ බෙලි කැපුම් කා මසට මියයන හරක්, ඌරු, එළු, කුකුල් කුළවලමයි. දැන් අපි නැවතත් අද දරුවාගේ කතාවට යමු....

මෙහි ඉහත සඳහන් කළා මේ දරුවා හදිසි අනතුරකින් ළමා වියේදීම කුරිරු ආකාරයෙන් මියයෑමට බලපාන ලද පෙර ජීවිතයේ කරන ලද කර්මය, මෙන්න මේ හේතුව ඔබට ගොඩාක් වැදගත් වෙනවා.

පසුගිය ජීවිතයේ දී අර ප්‍රභූ පවුලට සේවය කළ මනුෂ්‍යයා තියුණු කැත්තකින් තැඹිලි පාටට හුරු සර්පයෙක්ව කැලි කපා මරා දමනවා. ගිය ජීවිතයේ දී මොහු එම සර්පයා කැලි කපා මරා දමන්නේ යම් සේ ද, ඒ ආකරයෙන්ම මේ ජීවිතයේ දී මේ දරුවා සුඛෝපභොගී බසයේ රිය ගැටුමේදී, ශරීරය බිඳී මියයනවා. බලන්න එතකොට සර්පයෙක් මරා දැමීමේ අකුසලය මොන තරම් බලවත් වුනාද කියලා.

මෙතැන දී බලවත් වෙන්නෙ චේතනාව. මොකද මේ සර්පයාගේ වර්ණය දෙස බලන විට මේ සර්පයා දරුණු විෂකුරු සර්පයෙක් නෙමෙයි. අහිංසක ගැරඬියෙක්, පිඹුරෙක් වගේ සර්පයෙක්. මොහුට

තිබුණා අවශ්‍ය නම් ඒ සර්පයාව නොමරා කෝටුවකින් අරගෙන ඈතට විසිකර දමන්න. නමුත් මේ මනුෂ්‍යා තුළ ඇති වූ ක්‍රෝධ, වෛරී චේතනාව නිසා අර අහිංසක සර්පයා කෑලි කපලා මරා දමනවා. ඒ සර්පයා තියුණු කැත්තෙන් කෑලි කැපීයනවිට දඟලනවා දැකලා, ඒ මනුෂ්‍යයා අප්‍රමාණ තෘප්තියක් ලබන්න ඇති. අද සමාජයේ මොනතරම් නම් මනුෂ්‍යයෝ, දරුවෝ ඉන්නවද සතුනට හිංසා කරලා සතුටුවෙන. හූනෙක්ගේ වලිගය කඩල දමලා, ඒ කැඩුණු වලිගය දඟලන හැටි බලලා සතුටුවෙන.....

මෙතැන දි අපි කාලකන්නි සතුටක් ලබන බව ඇත්ත. නමුත් ඒවායේ විපාක පසු කලක දී, අපේ ශරීරය කෑලි කැඩී යන විපාකයන් ලෙසින් ගෙවන්න අපට සිද්ධවෙනවා. මේ විදිහට කර්මය කර්මඵල ගලපා බලන කොට, වර්තමාන සමාජයේ සිදුවෙන්නා වූ අධික වාහන අනතුරු නිසා, ආයුධවලින් කපා කොටා ගැනීම් නිසා මියයන, තුවාල ලබන, අතපය අහිමි වන මිනිසුන් දරුවන් කොපමණද? රෝහල් වල හදිසි අනතුරු වාට්ටුවල ප්‍රතිකාර ලබන දහස් ගණනක් රෝගීන් මේ කුමක්ද අත්විඳින්නේ? පෙර සංසාරයේ තමා විසින්ම කළාවූ සත්ත්ව ඝාතනයක්, සත්ත්ව හිංසාවක අකුසල් විපාකයක්.

අපි රියදුරන්ගේ වේගය වැඩිය කියලා දොස් කියනවා. බීමත්ව රිය පදවනවා කියල දොස් කියනවා. මාර්ග නීති පිළිපදින්නේ නැතිය කියලා දොස් කියනවා. මේවාත් හේතු තමයි. මෙවැනි හේතු, චේතනා මනුෂ්‍යයා තුළ සකස් වෙන්නේ තවත් අයකුට අදාළ අකුසල් විපාකදීමට අවශ්‍ය පරිසරය සකස්කර දීම සඳහාමයි. එක් අයෙක් මුදල් හම්බකිරීමට ඇති ආශාව නිසා වේගයෙන් රිය පදවනකොට, තවත් අයෙක් බීමත්ව රිය පදවනකොට, ඒ තුළින් අලුත් කර්මයන් සකස් කරගනිද්දී, තමාගේ සීලය බිඳගනිද්දී, සීලයෙන් ප්‍රමාදභාවයට පත්වෙද්දී, තවත් පුද්ගලයෙක් ඒ සීලයෙන් ප්‍රමාදභාවයට පත්වූ මනුෂ්‍යයාගේ ක්‍රියාවක් හේතුවෙන්, තමා සංසාරයේ කරන ලද එවැනිම කර්මයක අකුසල් විපාකය අත්විඳිනවා. තමන් කරනා අකුසල් විපාකදීම සඳහා, අකුසල් කරන අය නොදැන නමුත්, එකිනෙකාට උපකාර කරගන්නවා. මේ එකිනෙකාට උපකාර කර ගැනීම තමයි වර්තමානයේ සමාජය තුළදී

අපි දකින්නේ. එක් පුද්ගලයෙකුට අතීත අකුසල කර්මයන් විපාක දෙන කොට තවත් පුද්ගලයෙක් අලුතින් අකුසල් කර්ම සකස්කර ගන්නවා. ඇයි මේ? සම්මා දිට්ඨියට නොපැමිණි මනුෂ්‍යයාට නැවත නැවත දුක සකස් කර දීමට.

මේ පහළොස් හැවිරිදි දරුවාට තමා පෙර ජීවිතයේදී කරන ලද ප්‍රාණඝාත අකුසල් කර්මය විපාක දීම සඳහා කවුද උපකාර කළේ? තමන් ගමන්ගත් සුඛෝපභෝගී බස් රථයේ රියදුරා. ඔහු සීලයෙන් ප්‍රමාදභාවයට පත්වූ නිසා, සතිය සිහිය ගිලිහී ගිහින් අනතුරුදායක වේගයකින් බස් රථය පැදවීම තමයි දරුවාගේ මරණයට හේතුවුනේ. එම රියදුරා සීලයක පිහිටි අයෙක් නම් ඔහු තුළ සතිය සිහිය තිබිය යුතුයි. හිරි ඔතප් දෙක තිබිය යුතුයි. එහෙම නම් ඔහු දන්නවා වේගය කුමක්ද, සීමාව කුමක්ද කියලා. එසේ නම් මුදල් හම්බකිරීමට ඇති තෘෂ්ණාව නිසා අනතුරුදායක වේගයකින් ඔහු තම බස්රථය පදවන්නේ නැහැ. ඔබ සතියෙන් සිහියෙන් තොරවීම නිසා, ඔබ පදවන වාහනයට ගැටී, යටවී කෙනෙක් මියගිය හොත්, එසේත් නැතිනම් ජීවිත කාලය පුරාවට අබ්බගාතයෙකු බවට පත්වුව හොත්, දරු පවුලක් අනාථ වුව හොත් ඔබට පුළුවන්ද තමා හේතුවෙන් සිදුවූ එම විපත අමතක කර දමන්න. කොච්චර අමතක කර දමන්න හැදුවත් ඒවා මතකයට එනවා. ඒ නිසාම තමන් බීමත් භාවයට වැටෙන්න ඉඩ තිබෙනවා. තව තව අකුසල් වැඩි කරගන්නවා. තමන් කවදාහරි මියයන මොහොතේදී මේ සිදුවීම් මතකයට එනවා. අවිද්‍යාවෙන් ඔද්දල්වුණු සිත හරි දක්ෂයි, මැරෙන මොහොතේ දී මෙවැනි බලවත් අකුසල් කර්මයන් ඔබට මතක්කර දෙන්න. එවිට ඔබ ගැටෙන සිතිනුයි මියයන්නේ. ගැටෙන සිතින් මියයන කෙනා දුගතිවලයි උප්පත්තිය ලබන්නේ කියලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. බලන්නකෝ ඔබ අධික වේගයෙන් රිය පදවලා වැඩිපුර මගීන් දස දෙනෙක් පටවාගත හොත් ඔබ රුපියල් දාහක් වැඩිපුර හම්බකර ගනීවී. ඒත් ඒ රුපියල් දහසට තෘෂ්ණාවෙන් ඔබ රැස්කර ගන්නා අකුසලය විසින් ඔබව කල්ප ගණනක් දිගු දුකක් උරුමකර දෙනවා. ඔබ වේගයෙන් රිය පදවලා පැයක් කලින් ඔබේ ගමනාන්තයට පැමිණියොත්, ඔබ ඒ පැය විවේක ගනීවී. ඒත් ඒ වේගය නිසා ඔබ

අතින් අනතුරක් සිදුවුව හොත්, එහි අකුසල් විපාකය හේතුවෙන් ඔබට කල්ප ගණනාවක් සතර අපායවල අවිචේකීව ප්‍රමාදවීමට සිදුවෙනවා. මනුෂ්‍ය ජීවිතයක් ලැබුවත් එය අල්පායුෂ සහිත, රෝගී ජීවිතයක්ම තමයි ලබන්නේ. ඔබ යෝනිසෝ මනිසිකාරයෙන් යුතුව ඇස් දෙක ඇරලා බැලුවහොත්, කන් යොමලා බැලුවහොත් ඔබට මේ අත්දැකීම් සමාජය පුරාවටම දකින්න අහන්න පුළුවන්. මොන තරම් මිනිසුන්, දරුවන්, අඩු ආයුෂයෙන් මිය යනවද? මොනතරම් මිනිස්සු රෝගාබාධයන්ගෙන් පෙළෙනවද? ඊට සමගාමීව අනිත් පැත්තත් අපි දකිමු. මොන තරම් මිනිස්සු සත්ත්ව ඝාතන කරනවාද? මොන තරම් මිනිස්සු සත්ත්ව හිංසා කරනවාද? බලන්න දෙපැත්ත සැසඳිලා යන විදිහ. මේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ හේතුඵල ධර්මයන් මය.

# පින් පව් එනවා අපි පසුපස්සේ II

මේ ලිපිය ලියන අවස්ථාවේ භික්ෂුව වැඩ සිටින්නේ රජරට ප්‍රදේශයේ ආරණ්‍යයක. භික්ෂුව වැඩ සිටින ගල් කන්දේ ඉහළ කුටියට ගල් කන්ද පාමුල පිහිටි වැව හොඳට පෙනෙනවා. ඉඩෝර කාලය නිසා වැව හුඟක් හිඳිලා. ඊයේ රාත්‍රී 8.00 ට පමණ මුළු කඳුවැටියම දෝංකාර දෙමින් වෙඩි හඬක් ඇසුනා. මෙය මේ ප්‍රදේශයට සාමාන්‍ය සිද්ධියක්. පිපාසයට ජලය සොයාගෙන එන වන සතුනට දඩයක්කරුවන් වෙඩි තියනවා. මුළු රාත්‍රිය පුරාම වැවේ මාළු දැල් එලලා වැව බොර කරනවා, මාළු කලබල කරලා දැලේ පැටලෙන්න. මීට සති තුනකට පමණ පෙරාතුව දවසක ආරණ්‍යයේ ඈත කුටියක වැඩ සිටින ස්වාමීන් වහන්සේ නමක් පිණ්ඩපාතය සඳහා උදේ 8.00 දාන ශාලාවට වඩිනකොට උන්වහන්සේ වඩින කැලෑව මැද අඩි පාරේ දෙදෙනෙක් විසින් වෙඩි වැදුණු වල් ඌරෙක් හම ගහනවා, මස් කරනවාලු. ස්වාමීන් වහන්සේ මේ ස්ථානය පසුකරන කොටත් මේ දෙදෙනා නොදැක්කා වාගේ සතාව මස් කරනවාලු. හාමුදුරුවෝ නිහඬවම වැඩම කරලා දාන ශාලාවට. මේ වල් ඌරා මස් කරලා සතියක් මස් කාවි. එහෙම නැතිනම් එම මස් විකුණලා වැඩිම උනොත් රුපියල් දෙතුන් දාහක් ලබාගනීවි. සතියක් කටට රහට කෑම උදෙසා. ඔබ රුපියල් දෙතුන්දාහක් හම්බ කරගැනීම උදෙසා ඔය එක කුරිරු සත්ත්ව ඝාතනය නිසා රැ ස්කරගන්නා අකුසලය ඔවුනට ඊළඟ උපත සලසල දෙන්නේ නිරයේ අප්‍රමාණ දුක් දෙන තැනක. සතියක දෙකක කාලයකට නොවේ කල්ප ගණනාවකට. තිරිසන් යෝනියක උපත ලැබුවත් මනුෂ්‍යයෙක් අතින් මැරුම් කන්නම වෙනවා. මීට වසර දෙකකට විතර පෙරාතුව මේ ආරණ්‍යයේම වැඩ සිටිය අවස්ථාවේ මේ අසල වෙල් යායක

ඇතින්නක් වෙඩි තබා මරා දමලා තිබුනා. හේතුව කෙසෙල් වගාවක් පාළු කරන්න ආපු නිසා. ඇය බඩ දරු ඇතින්නක්. වෙඩි වැදීම නිසා ඇතිවූ වේදනාවේ දී ඇය කුසේ සිටි නොමේරූ අලි පැටවාද බිහි කරලා. අලි අම්මයි දරුවයි දෙන්නම මැරිලා. බලන්න සංසාරේ කරපු මොන කර්ම විපාකයක්ද? මේ සත්තු දෙන්න අත් විඳින්නේ. අපි මෙවැනි තැනක දි දකින්නේ වෙඩි තිබ්බ මනුෂ්‍යයා කරගත්ත අකුසල් විපාක පමණයි. එහෙම දකිනවා නම් එතැන දි අපි අසම්පූර්ණයි. මෙතන පෙර අකුසලයක් විපාකදීමත් අලුත් අකුසලයන් සිදුකර ගැනීමත් කියන ස්වභාවයන් දෙකම තිබෙනවා. මේ දෙපාර්ශවයේම දුකට හේතු වෙන්නේ සීලයෙන් ප්‍රමාද භාවයට පත්වීමයි. ඇතින්නට වෙඩි තිබ්බ අසරණ මනුෂ්‍යයා සීලයෙන් ප්‍රමාද භාවයට පත් වූ කෙනෙක්. ඒ නිසාම ඔහු තුළ කළයුත්ත නොකළ යුත්ත කුමක්ද කියලා අවබෝධයක් තිබිල නැහැ. රුපියල් පන්දාහකවත් වටිනාකමක් නැති කෙසෙල් වගාවක් උදෙසා කල්ප ගණනාවක් නිරයේ දුක්විඳීමට සිදුවන කුරිරු සත්ත්ව ඝාතන දෙකක් සිදුකර ගත්තා. මේ සත්ත්ව ඝාතන දෙක සිද්ධකරපු අසරණ මනුෂ්‍යයා මැරෙන මොහොතේ තමන්ගේ ලෙයින් උපන් දරුවා අමතක වෙන්න පුළුවන්. ඒත් මේ කුරිරු සත්ත්ව ඝාතනය නම් මාරයා විසින්ම ඔහුට මතක් කරදෙනවා. ඒ තරමට අකුසල් චේතනාව බලවත්.

යම් අවස්ථාවක් තිබෙනවා සත්ත්ව ඝාතන අකුසලය බලවත් නොවන. පසුගිය සතියේ දවසක භික්ෂුව ආරණ්‍යයේ පහළ තිබෙන කුටි පේළියේ ආලින්දයේ තිබුන කොස්ස අතට ගත්තා ආලින්දය අතුගාන්න. කොස්ස තිබුන තැනින් ගන්නකොට භික්ෂුව දැක්කා කොස්ස යට දරණ ගසාගෙන සිටින සර්පයෙක්. එම සත්ත්වයා පොළවේ ශීතලත් කොහුගොඩේ රස්නයටත් මැදිව දරණ ගසාගෙන සිටියා. භික්ෂුව අසල සිටි කැපකරු මහත්මයෙකුට කතාකරලා කීවා 'මහත්තයෝ මෙතන සර්පයෙක් සිටිනවා එයාව කැළයට විසිකරන්න' කියලා. එම කැපකරු සර්පයාව දැකලා කියනවා 'හාමුදුරුවනේ මේ සර්පය මේ ප්‍රදේශයේ ජීවත්වන විෂකුරු සර්ප විශේෂවලින් එක සර්ප වර්ගයක්' කියලා. කැපකරු භික්ෂුවට කීවා මේ සර්පයා ඉදිරියට පැනලා දෂ්ඨ කරනවා ඒ නිසා මෑත්ව සිටින්න කියලා. දිග ලී කෝටුවක් අරගෙන

සර්පයාව කැලයට විසිකළා. කෝටුවෙන් විසි කරන හැම වතාවකම ඒ සර්පයා ඉදිරියට පතිනවා. ඒ එම සර්පයා සංසාරෙදි පුහුණු කරපු වෛරය, ක්‍රෝධය, ව්‍යාපාදය. එම ගතිය එම සතාට අම්මා තාත්තාගෙන් ආව නොවේ. එයාම සසර වඩපු දෙය. මේ සර්පයා විසි කරන ගමන් ආරක්ෂක අංශයට සම්බන්ධ මේ කැපකරු භික්ෂුවට කියනවා හාමුදුරුවනේ මීට පෙර මේ ස්ථානයට නුදුරින් මේ වර්ගයේම විෂකුරු සර්පයන් හතර දෙනෙක් සිටියා. ඒ අය මම මරා දැම්මා කියලා.

භික්ෂුව දන්න තරමින් මොහු සත්ත්ව ඝාතන කරන කෙනෙක් නොවේ. ඒ නිසා භික්ෂුව ඔහුගෙන් ඇසුවා ඇයි ඔබ එම සර්පයන් මැරුවේ කියලා. එවිට ඔහු කියනවා මෙහි වැඩ සිටින ස්වාමීන් වහන්සේලාට, ගිහි පින්වතුන්ට දෂ්ඨ කරයි කියලා. ඒ අයට  නරකක් නපුරක් කරයි කියලයි මම ඒ සර්පයින්ව මැරුවේ කියලා. මේ සර්පයින්ව මැරුව කෙනා මේ ආරණ්‍යයේ ජීවත්වන අයෙක් නොවේ. මොහු අතින් සත්ත්ව ඝාතනයක් සිද්ධවෙනවා, සිල්පද බිඳෙනවා ක්‍රෝධය, වෛරය, ව්‍යාපාද සිතක් සකස් වෙනවා. ඒ සිත සකස් වී අනිත්‍ය භාවයට පත්වෙන කොටම හෝ ඊට පෙරාතුව මෛත්‍රී සහගත සිතකුත් සකස්වෙනවා. 'අනේ ස්වාමීන් වහන්සේලාට දෂ්ඨකරයි, උන්වහන්සේලා අපවත්වෙයි, රෝගීවෙයි, ගිහි පින්වතුන්ලාට දෂ්ඨකරයි'.....

බලන්න අර අකුසල් සත්ත්ව ඝාතන සිතත් සමඟම මොහු තුළ බලවත් මෛත්‍රී සහගත සිතකුත් සකස් වුනා. මෙන්න මෙවැනි අවස්ථාවක අර සත්ත්ව ඝාතන අකුසලයේ විපාකය හීන වෙන්න පුළුවන්. දැන් අපි නැවතත් කතාවේ මුලට යමු. එහි මෙම පහළොස් හැවිරිදි දරුවා පෙර ජීවිතයේ දී ප්‍රභූ පවුලේ අතවැසියෙක් ලෙස කැත්ත, පිහිය, උදැල්ලේ වැඩ කරමින් සිටින විට කැත්තෙන් ගසා මරා දමන්නේ අහිංසක ස්වභාවයේ සතෙක්. ඔහුට ඕන තරම් අවස්ථාව තිබෙන්න ඇති එම සතාව මඟ හැර යන්න. එහෙම නැතිනම් කෝටුවකින් අර ගෙන විසි කරන්න. එහෙත් ඔහු තුළ සකස් වූ සත්ත්ව ඝාතන චේතනාවේ බලවත් භාවය නිසා ඔහු මහා අකුසලයක් සිදුකර ගත්තා. මරණයට පත්වෙන සතා ලොකු සතෙක් වුව ද කුඩා සතෙක් වුව ද මරණීය

චේතනාව බලවත් නම් අකුසලය විපාක දීමේ ශක්තිය වැඩි වෙනවා. ඒ නිසාමයි පෙර භවයේ අහිංසක සර්පයා කැත්තෙන් කෑලි කපා මරා දැමීමේ අකුසල් විපාකය හැටියට මේ ජීවිතයේ දී එම දරුවා බස් රථයක ගමන් කරමින් සිටිය දී අනතුරට ලක්වී, ශරීරය බිඳී, අකාලයේ මිය යන්නට සිදුවන්නේ. පෙර භවයේ දී සර්පයෙක් මරා දැමීමේ අකුසලය මේ තරම් භයානක ලෙස විපාක දේ නම් ඔබ මේ ගැන හොඳ අවබෝධයකින් කටයුතු කරන්න ඕනේ. මොකද සමාජයේ සමහර පින්වතුන්ගේ මතයක් තිබෙනවා කුහුඹුවෙක්, මදුරුවෙක් වගේ සතෙක් මැරුව හම, එම සතුනට වේදනා දුන්නම එම ක්‍රියාවන් තමන්ට විපාකදීම පිණිස සකස් වෙන්නෙ නැහැය කියලා.

වියලි කලාපයේ ප්‍රදේශවල විශාල රංචු වශයෙන් ගවයන් සිටිනවා. මේ ගවයන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා හරක් හිමිකරුගේ නම හංවඩු ගසා තිබෙනවා. ගවයාගේ බෙල්ල ළඟින් පටන්ගෙන වලිගය ළඟට යනකම්ම පුච්චලා, ලොකු අකුරු කොටලා. මේවා කරන මනුෂ්‍යයන්ට දැනෙන්නේවත් නැහැ, තමාගේ මෙම ක්‍රියාවෙන් එම සතා අත් විඳින වේදනාව. මෙවැනි අකුසල් සිදුකරන අය අහම්බෙන් හෝ මනුෂ්‍ය ජීවිතයක් නැවත ලැබුවොත් වතුර කේතලය පෙරළිලා, ගෑස් ටැංකිය පුපුරලා, බෝම්බයකට පිළිස්සිලා මුළු ශරීරයම පිච්චිච්ච ස්වභාවයට පත්වෙනවා. ඒ දුකෙන්ම මැරිලා නිරයන්ට වැටෙනවා. සමහරු තමා විසින්ම තමාගේ ශරීරයට ගිනි තබාගෙන මිය යන්නේ මෙවැනි සත්ත්ව හිංසාවන් නිසා.

පින්වත් ඔබට, ඔබ නිසා, ඔබ අතින් සත්ත්ව ඝාතනයක්, සත්ත්ව හිංසාවක් සිදුවේ යැයි අනුමාන කරනවා නම් ඒ ස්ථානය, අවස්ථාව මඟහැර යන්න. සතා මදුරුවෙක් වුවත් කමක් නැහැ. ඔබ සවස අඳුර වැටීගෙන එනකොට එළි පහළියේ වාඩිවෙලා සිටිනවා. එවැනි තැනකදී ඔබට මදුරුවෝ දෂ්ඨ කරන නිසා මදුරුවෝ මරන්න සිද්ධ වෙනවා නම් ඔබ මදුරු දඟරයක් පත්තු කර ගන්න. මදුරු දැලක් භාවිතයට ගන්න. එවැනි දෙයක් කරන්න බැරි නම් එම ස්ථානය මඟහැර යන්න. මදුරුවාට පහරදීමෙන් ඔබ ලබන තාවකාලික ආශ්වාදයේ, දීර්ඝ කාලීන කටුක ආදීනවයක් තිබෙන බව දකින්න. ඔබට පීඩා කරන

ලොකු කුඩා කුමන වර්ගයේ සතෙක් හමු වුවද එම සතා මාරයා බව දැනගන්න. රූපය යම් තැනකද එතැන මාරයා ඇත කියලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ කියන්නේ එම සතා නිසා ඔබට කල්ප ගණනක දුකක් සතර අපායේ විඳින්න සිදුවෙන්න පුළුවන්. මාරයාගෙන් මිදෙන්න, බේරෙන්න නේද ඔබ මේ හැම පින්කමක්ම කරන්නේ. එම නිසා තිරිසන් සත්ත්ව වේශයෙන් ඔබ ඉදිරියට එන මාර උගුලෙන් ඔබ බේරෙන්න. එම මාර උගුල ඔබ මගහැර යන්න. එවිට ඔබ මගහැර යන්නේ දුකයි. දුක මගහැර යාමට දක්ෂ කෙනාමයි කවදාහරි දුක අවබෝධ කර ගන්නේ. මේ සඳහා ඔබට ජවය ශක්තිය ලබාදෙන්නේ සීලයයි. එහෙයින් ජීවිතය පරදුවට තබා සිල්පද ආරක්ෂා කරගන්න. සීලය උදෙසා පරදුවට තබන ඔබේ ජීවිතයත් අනිත්‍යයට අයිති දෙයක්, දුකට අයිති දෙයක්. අනිත්‍යයට, දුකට අයිති ඔබේ ජීවිතය පරදුවට තබා ඔබ ආරක්ෂාකර ගන්නා සීලය අයිති දුකින් මිදීමේ මාර්ග යට. ඒ කියන්නේ සතර අපායෙන් මිදීමේ ඒකායන මාර්ගයට.

අතිසුන්දර වුවද අතිකටුක වුවද විවිධත්වයෙන් ගහණ තිරිසන් ලෝකය දෙස බලන්න. දිය ගොඩ දෙකෙහිම ජීවත්වෙන එම තිරිසන් ලෝකය යනු පෙර ජීවිතයේ දී සිල් පද බිඳගත්තවුන්ගේ ලෝකයයි. සිල් පද ගරු නොකළ අයගේ ලෝකය වන තිරිසන් ලෝකයේ සුන්දරත්වය, විසිතුරු භාවය යනු පෙර බවයන්හි දී දන්දීමේ කුසල විපාකයයි. එහි කටුක භාවය යනු බිඳගත් සිල් පදවල අධිභාවයයි. විවිධත්වය යනු අකුසල් චේතනාවන්ගේ සංකීර්ණ භාවයයි.

බලන්න. ජීවිතය කියන්නේ, තිරිසන් සත්ත්ව ජීවිතයක් කියන්නේ මොන තරම් මංමුලාවක්ද, ඇස් බැන්දුමක්ද කියලා. තියුණු අකුසල් විපාකයක් විසිතුරු දවටනයක ඔතලා තිබෙනවා වගේ එයත් හරියට ඔබේ ප්‍රාණ ඝාතයට අනුබල දෙන, සිල් පද බිඳ ගැනීමට අනුබල දෙන සිත වගේමයි. සිල්පද බිඳගැනීම තුළ සැපයක් ලබනවා. ඒ සැපය නමැති විසිතුරු දවටනය ඔතා ඇති අකුසල් විපාකය ඔබ දකින්නේ නැහැ. ඒ තරමටම දවටනය විසිතුරුයි.

පින්වත් ඔබ සීලයට ගරු නොකරන සිතක්, ප්‍රාණ ඝාතයට, සත්ත්ව හිංසාවට අනුබල දෙන සිතක් සකස් වෙනකොටම දකින්න සිතක් කියන්නේ දුකක්ය කියලා, දුකක් කියන්නේ සිතක්ය කියලා. එවිට එම සිත අනිත්‍යවෙලා යාවී. එසේ නොවුණහොත් එම කමටහනම නිවී සැනසිල්ලේ නැවත නැවත මෙනෙහි කරන්න. එහෙම මෙනෙහි කරන කොට ඔබේ සිතේ සමාධිමත් බවක් හට ගනීවී. ඒ සීලයේ ආනිසංශයයි. ලෝකය දුක බව දකින ඇසයි. මේ සමාධිමත් සිත ඔබට සකස් වුනේ පැය ගණනාවක් එරමිනියා ගොතාගෙන භාවනා කරලා නොවෙයි. සිත දෙස බලාගෙන හිඳීමෙනුයි. සකස්වන ප්‍රාණඝාතයට අනුබල දෙන සිත, දුක පිණිස හේතු වෙන බව දැකලයි. ඒ දුකට උරුම සිත ඔබ වෙතින් අතහැරෙන කොට, ඒ සිත නැවත නැවත දුක බව මෙනෙහි කරන විට ශක්තිමත් වන සීලය නිසාම සමාධිය සකස්වුනා. පින්වත් ඔබ සමාධිය සොයාගෙන යන්න අවශ්‍ය නැහැ. උතුම් සීලයෙන් ඔබ පරිපූර්ණ වෙන්න. අවංක බවට පත්වෙන්න. ඒ පරිපූර්ණ බව තුළම සමාධිය පිහිටනවා.

භික්ෂුව මෙහි සටහන් කරන තරම් එය ඉක්මන් නොවන්න පුළුවන්. නමුත් ඔබ තුළ සංසාරික දුකින් අත් මිදෙන්න අවංකවම උවමනාව, වීර්යය තිබෙනවා නම් ඔබට එය පහසු දෙයක් වේවි.

දැන් අපි නැවතත් කතාවේ මුලට යමු. එහි දී සඳහන් කළ රිය අනතුරින් මියගිය 15 හැවිරිදි දරුවා මිය යෑමෙන් අනතුරුව ලැබූ ජීවිතය තමයි ළමා ස්වභාවයේ දිව්‍ය ජීවිතය. එම ළමා දිව්‍ය ජීවිතයෙන් රුව, ස්වභාවය එම ලිපියේ මුලදී සටහන් කළා. මෙම දිව්‍ය ස්වභාවය මනුෂ්‍ය ලෝකයේම යම් යම් දේවල් උපාදානය කර ලබන දිව්‍ය ස්වභාවයක්. 15 හැවිරිදි දරුවෙක් මෙවැනි අකාරුණික ආකාරයට මියයන කොට ඔහුට බලවත් අකුසල් චේතනාවක් සකස් වෙන්නේ නැහැ. පහත උදාහරණයෙන් ඔබට එය වටහා ගන්න පහසුවේවි.

වැඩිහිටි අයෙකුට තවත් වැඩිහිටි අයෙක් පහර දෙනවා. පහරදීමත් සමඟම පහරකෑමට ලක්වෙන්නා තුළ ක්‍රෝධය, වෛරය, ද්වේශය, පළිගැනීම.... මෙවැනි අකුසල් සිත් රාශියක් සකස් වෙනවා. එහෙත් පොඩි ළමයෙකුට පහරක් ගැසුව හොත් එම දරුවා රිදෙනවා කියලා බයේ කෑ ගසාවි, හඬන්න පටන් ගනීවී. එතැන දී දරුවාට බොහොම

අසරණ අහිංසක චේතනාවක් සකස් වෙන්නේ. මේ රිය අනතුරින් මියයන දරුවාට අවසන් චුතිසිත ලෙස සකස් වෙන්න ඇත්තේ බොහොම අහිංසක මධ්‍යස්ථ සිතක්. ඒ නිසාම ඔහුට එම ළමා දිව්‍ය ස්වභාවය ලැබෙන්නට ඇති. ඔහු එම දිව්‍ය ස්වභාවය තුළ සිටිමින්ම තමා පෙර ජීවිතයේ දී කැමති දෙමාපියන්, නිවස, අධ්‍යාපනය ලද පාසල, ඥාති මිත්‍රයින් තම දිව්‍ය සිතින් ස්පර්ශ කරමින් සතුටු වෙනවා ඇති. ආශ්වාදය ලබනවා ඇති. දෙමාපියන් කරන පින්කම් දෙස බලා සතුටු වෙනවා ඇති. ඔහු ස්වභාවයන් සමඟ ගැටෙනවාත් ඇති. කෙසේ වුවද, මේ හදිසි රිය අනතුරින් මියගිය දරුවා වාසනාවන්ත දරුවෙක්. මොකද මේ මොහොතේ සතර අපායට වැටෙන්නේ නැතිව මෙවැනි දිව්‍ය ස්වභාවයක් ලබාගැනීම භාග්‍යයක්. හැබැයි, වර්ණනා කළයුතු භාග්‍යයක් නම් නොවෙයි.

මේ සටහන මෙතැනින් නවත්වනවා. ජීවිත තුනක කතාවක් මෙතැන තිබෙනවා. මේ ජීවිත තුනක කතාව ඔබ ඔබේ ජීවිතයේ යහපත් උදෙසා ගලපා ගන්න.

මල්, ගස්වල තිබිලා වැඩක් නැහැ. ඒ මල් නෙලලා බුදු සමිඳුට පූජා කරන්න. මල් පූජා කළාය කියලා එහි සැබෑ අර්ථය සිද්ධ වෙන්නේ නැහැ. ඒ මල් පරවෙන බව සිතලා, දකලා එම අනිත්‍ය බව ඔබේ ජීවිතයටත් ගලපා ගන්න. ඉහත සටහනද ඔබ කියවලා එය ඔබේ ජීවිතයට ගලපා ගෙන එම කුසලය 'බබා දෙවියන්ටත්' අනුමෝදන් කරන්න.

# හැංගි හැංගි වෙස් බැන්දත්

භික්ෂුව මේ ලිපිය ලියන මොහොතේ වැඩ සිටින්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැලෑබද ආරණ්‍යයක. විශාල කඳුවැටි කිහිපයකින් වටව ඇති රමණීය බිමක්. උස් ගල් කන්දේ නැගෙනහිරට මුහුණලා භික්ෂුව වැඩ සිටින කුටිය තිබෙන්නේ. කඳු මුදුනේ සිට බලන කොට කඳු පාමුල දර්ශණීය වැව, අතුරු කඳුවැටි, කුඹුරුයාය, අක්කර දසදහස් ගණනක විහිදුන වනපෙත, පක්ෂීන්, වන සතුන් සැබෑම ආරණ්‍යයක ලක්ෂණ සියල්ලම මෙහි තිබෙනවා. භික්ෂුව මේ ආසනය මත වාඩිවෙලා මේ පරිසරය දෙස බලන කොට මෙහෙම සිතුනා. මේ මොහොතේ චමත්කාර ජනක පරිසරයක් මේ වටපිටාවේ තිබුණත් අතීතයේ මේ ස්ථානය මහා කටුක කාන්තාරයක්ව තිබෙන්නට ඇති. ජලයෙන් පිරී ඉතිරී ගිය මුහුදක්, ගංගාවක් ලෙස තිබෙන්නට ඇති. සශ්‍රික නගරයක්ව තිබෙන්නට ඇති. භූමිකම්පාවලින්, සුළිසුලංවලින් පෙරළී විනාශවී ගිය බිමක්ව තිබෙන්නට ඇති. සුසාන භූමියක්ව තිබෙන්න ඇති. බුදුරජාණන් වහන්සේලා, රහතන් වහන්සේලා වැඩ සිටි තැනක්ව තිබෙන්ට ඇති. බලන්න අතීත රූපයන්ගේ තිබෙන විවිධත්වය. ඒ කියන්නේ අනිත්‍යභාවය. ඒ වගේමයි අනාගතයේ හට ගත්තා වූ රූපයත්. වර්තමානය කියලා කියද්දිම ඒ වර්තමානය අතීතයට එකතුවී අභවරයි. ඒ තරම්ම වේගයෙන් ලෝකය ගෙවිල යනවා. ගෙවී යන වේගයෙන්ම ලෝකය ලියලනවා. අපේ ජීවිතත් එලෙසමයි. අද මනුෂ්‍යයෙකුව සිටින කෙනා හෙට නිරයට වැටෙනවා, දෙවියෙක් වෙනවා, බ්‍රහ්මයෙක් වෙනවා, තිරිසනෙක් වෙනවා. එක තැනක් ගෙවී යන කොට තව තැනක් දළුලනවා. මෙන්න මේ විදියට මනුෂ්‍ය ජීවිතය ගෙවී ගිහින් නිරයට වැටුන අවාසනාවන්තයෙක් ගැන

කතාවක් තමයි භික්ෂුව දැන් මෙහි සටහන් තබන්නේ. මේ කතාවත් ඔබට උතුම් සීලයේ වටිනාකම කියා දෙන කතාවක් වේවි.

අද ලෝකය සොයන්නේ සරල දේවල්, පහසු දේවල්, ක්ෂණික දේවල්. තරගකාරී ලෝකයේ අවිවේකයෙන් මිදී විවේකය අත්කර ගැනීම සඳහායි මේ දේවල් ලෝකය සොයන්නේ. මේ ලබාගන්නා වූ විවේකය ඔවුන් යොදන්නේ ජීවිතයේ නැවත අයිතිකර ගන්නා වූ අවිවේකය උදෙසාමයි.

වාර්ෂිකව දන් දෙන පින්වතුන් ආරණ්‍යයවලට එනවා. දානය ඉවරවෙලා සමහරක් පින්වතුන් යන්නේ 'අම්මෝ මේ අවුරුද්දෙ දානෙ ඉවරයි' එහෙම නැතිනම් හත්දවසේ, තුන්මාසේ, අවුරුද්දේ දානෙ ඉවරයි දැන් ඉතින් දාන ඕනේ නැහැ කියලා. පසළොස්වක පොහොය දවසට සිල් සමාදන් වන සමහරක් පින්වතුන් හවසට සීලය පවාරණය කරලා පන්සලෙන් පිටවෙන්නේ 'අම්මෝ ඒ බැඳීමෙන් නිදහස්වුනා'ය කියන සැහැල්ලුවෙන්. භාවනා වැඩසටහනට සහභාගී වන සමහර පින්වතුන් වැඩසටහනින් නැගිට යන්නේ 'මේ මාසෙට, මේ සතියට මේ හොඳටම ඇති'ය කියලා. පින්වතුන්ලා දාන, සීල, භාවනා කටයුතුවල යෙදෙන්නේ කවුරුහරි තරහ වෙයි, එයාව මොහොතක් රවටලා යාළුකර ගන්න ඕනේ කියන හැඟීමෙන් වගේ. කාවද මේ රවට්ටන්නේ. කවුද රවට්ටන්නේ. රැවටෙන්නන් රැවටෙන මොහොතක් පාසා ඔබට මිතුරුවෙන්නේ කවුරුන්ද? ඔබට මිතුරු වෙන්නේ දුක. දුක උපද්දවන මාරයා.

ධර්මය සරල කරන්න, ක්ෂණික කරන්න ගිහිල්ලා දුක මිතුරෙක් කර ගන්නවා. ධර්මය කියන්නේ සරල කරන්න පුළුවන් දෙයක් නොවේ. ධර්මය කියන්නේ අනිත්‍යයි. කුමන අනිත්‍ය භාවයද? රූපයේ අනිත්‍යයි. මොකක්ද රූපයේ අනිත්‍ය භාවයට පත්වීමේ ස්වභාවය. මස් ඇසට නොපෙනෙන ප්‍රඥාවේ ඇසෙන් පමණක් දකින ප්‍රවේගයයි. එය දකින මාර්ගය ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ඥාණයෙන් අවබෝධ කර ඔබට දේශනාකර තිබෙනවා. එකම මාර්ග යයි ඇත්තේ. එහි කෙටි මාර්ග, සරල මාර්ග, ක්ෂණික මාර්ග නැහැ.

ඔබ කවුරුන් හෝ වේවා රූපය අනිත්‍ය භාවයට පත්වෙන වේගය ප්‍රඥාවෙන් අවබෝධ කර ගෙන රූපයට ඇති ඡන්ද රාගයෙන් මිදෙන තැනදියි රූපය ඇසුරුකොට සකස් වෙන පංච උපාදානස්කන්ධයේම යථා ස්වභාවය ඔබ අවබෝධ කර ගන්නේ.

භික්ෂුව දැන් මෙහි සටහන් කරන කතාවට මුල පුරන පින්වතාත් ධර්මය සරල මාර්ග ඔස්සේ ජීවිතයට ගලපාගත් අයෙක්. මේ ගලපා ගැනීම නිසා දුක ඔහුට මිතුරුවුන හැටියි මේ කතාවේ අර්ථය පුරාම තිබෙන්නේ. දුකට මිතුරු වී දුක් විඳින ඔහුට මේ කතාව දැන් වැඩක්, අර්ථයක් නැහැ. ඔබ කැමති නම් ඔබ සතුටු නම් මේ කතාව ඔබේ ජීවිතයට ගලපා ගන්න. දුක නමැති පරම සතුරා ඔබ ඇසුරේම ඔබ තුළම සැඟව සිටින බව ඔබ දකින්න. ඔබ සමාදන් වන සීලය සරල කරන, ක්ෂණික කරන, සිල්පද සැහැල්ලු කරන සතුරා ඔබ තුළින් ඔබ හඳුනාගන්න. ඔබව දුකට ඇද දමන පාපමිත්‍රයෙක් සේ ඔහුව බැහැර කරන්න. රූපය අනිත්‍ය භාවයට පත්වෙන වේගයෙන්ම රූපය ඇසුරුකොට සකස්වෙන සිතද අනිත්‍ය භාවයට පත්වෙනවා. මෙහිදී ඔබ දකින්නේ රූපයේ හට ගැනීම සහ විනාශවීමේ ස්වභාවයයි. එවන් ප්‍රඥාවේ ඇසින් පමණක් දැකිය හැකි අති සියුම් ධර්මතාවක් අපි සරල කරන්න, ක්ෂණික කරන්න යනවා නම්, ඒ උත්සාහයේ තරමටම අප තුළ මෝහයද තිබෙන බව අප අවබෝධ කරගත යුතුයි. ලෝකයේ කෙටි කරන්න පුළුවන් දෙයක් අපට නැහැ. ඒ තරම්ම ලෝකය කෙටියි. ක්ෂණිකයි. ඒ නිසාමයි මේ මොහොතේ මනුෂ්‍ය ජීවිතයක් ගත කරන කෙනා මියගොස් ඊළඟ තත්පරයේ, සංස්කාර ධර්මයන් හේතුවෙන් නිරයේ නිරිසතෙක්ව උපත ලබන්නේ. මේ මොහොතේ මනුෂ්‍ය ජීවිතයක් ගත කරන කෙනා මිය ගොස් ඊළඟ තත්පරයේ බ්‍රහ්ම ලෝකයේ උපත ලබන්නේත්....

මෙයින් ඔබ තේරුම් ගන්න රූපයත්, රූපයක් ඇසුරින් සකස්වන සිතේ ප්‍රවේගකාරී බවත්. අවිද්‍යාවේ මහත නිසාම අපි මේ ධර්මතාවන් සරල කරන්නට යනවා. බුද්ධ වන්දනාව කෙටි කරන්න යනවා. සිල්පද වල අර්ථය හීන කරන්න යනවා. දානය ක්ෂණික කරන්න යනවා. මෙසේ කිරීමෙන් ඔබ ලබන විවේකය, සැපය, ලාභය 'බඩකට පුරා' අත්විඳින තවත් අවාසනාවන්ත මනුෂ්‍යයකුගේ කතාව දැන් සටහන් තබනවා.

මේ කතාවට සම්බන්ධ මහත්මයා මියයන කොට වයස අවුරුදු 80ක් විතර ඇති. ඔහු ජීවත්වූ ගම් ප්‍රදේශයේ වැදගත් යැයි සම්මත ජීවිතයක් ගතකරලා, විවාහක දුවා දරුවන් සිටිය පියෙක්. මොහු මියයෑමට පෙර වසර 5ක පමණ කාලයක පටන් රෝගීවයි සිටියේ. අවසාන කාලයේ ලෙඩ ඇඳේම පසුවෙලා මියයනවා. සුපුරුදු පරිදි දරුවෝ ඥාතීන් එකතුවෙලා 'බොහොම ජයට' මරණයේ කටයුතු සිදු කරනවා. සැරසිලි, බැනර, ගුණ කථන, වියහියදම් බොහොමයි. දින හතේම රාත්‍රී සතුටු සාද....

මේවායින් අඩුවක් පාඩුවක් නොතිබුණ නිසයි 'මරණය ජයට ගත්තාය' කියලා සඳහන් කළේ. පාංශකූලය අවස්ථාවේ ප්‍රදේශයේ නායක ස්වාමීන් වහන්සේලා කිහිප නමක්ම මියගිය පින්වතා ගැන බොහොම වටිනා ගුණ කථන, අනුශාසනා පැවැත්වුවා. ඇත්තෙන්ම ඒ මියගිය මහත්මයාගේ ජීවිතය දෙස බලන ඕනෑම කෙනෙකුට ඔහු වැරදි කරපු කෙනෙක්ය කියලා පෙනෙන්නේ නැහැ. මේ සටහන් කරන භික්ෂුවත් දැනගෙන සිටියේ නැහැ, මියගිය මහත්මයා වැරදි කරපු කෙනෙක්ය කියාලා. එදා අපට තිබුණු අවම අවබෝධය තුළ අපි හැමෝම එදා අවංකවම හිතුවා මියගිය කෙනා සුගතිගාමී උපතක් ලබන්නට ඇතිය කියන හැඟීම. වර්තමානයේ ගිහි පැවිදි අපි හැමෝම මෙන්න මේ අවම අවබෝධය තුළ හිඳගෙන තමයි හැමෝගෙම ජීවිත දෙස බලන්නේ. ඒ දැක්මෙන් තමයි අපි යමක් විග්‍රහ කරන්නේ. මේ කතාවේ අග කොටස ඔබ කියවනකොට ඔබට දැනේවී ධර්මයේත්, අධර්මයේත් පරතරය කොපමණද කියලා. අපේ අවම දැනුමේත්, සැබෑම අවබෝධයේත් පරතරය කොපමණද කියලා.

මෙය ඔබේ හෝ මගේ වරද නොවෙයි. අවබෝධයේත් අනවබෝධයේත් ඇති වෙනසයි. අපේ තිබෙන අවම දැනුම තුළ ඉඳගෙනයි අපි එදා මේ මරණය විග්‍රහකළේ. ඔහු සුගතිගාමී උපතක් ලබන්නට ඇතැයි අනුමාන කළේ. නමුත් මොහු මිය ගොස් වසර හයකට පමණ පස්සේ දවසක භික්ෂුව මියගිය පින්වතාව සමාධියේ දී අරමුණු කර බලනවා. ඔහු කුමන ස්ථානයක නැවත උපත ලැබුවාද කියලා. මෙය උතුම්

සමාධියේදියි දකින්නේ. භික්ෂුවට දර්ශනය වෙනවා ජලය පිරුණු ස්ථානයක්. මේ ජලය කළුම කළු පාටයි. කළුය කියල කියන්නේ පැහැපත් කළු වර්ණයක් නොවේ. ඔබ දකලා තිබෙනවානේ කුණු කාණු. කුණු පල්වෙලා ජලය පිරුණහම හැදෙන අප්‍රසන්න කළු පැහැය. බේරේ වැවේ ජලය පල්වුනාහම තිබෙන කළු පැහැය. මෙන්න මේ කුණු කළු පැහැති ජල තටාකය ඔබ හිතන්න යමෙක් ගින්දරෙන් රත් කරනවාය කියලා. එවිට මොකද වෙන්නේ. එම කුණු ජලය රත් වෙනවා. තව තව උෂ්ණත්වය වැඩිකරමින් ගින්දර වැඩිකර රත් කරනවිට මුලින්ම ජලයෙන් දුම් දමනවා. දෙවනුව ජලය උතුරන විට කඩල ඇට තරමට බුබුළු දමනවා. තව තව එම ජලය රත්කරන විට නෙල්ලිගෙඩි තරමට ජලයේ බුබුළු මතුවෙනවා. තවත් ගින්දර දමලා රත්කරන විට දෙහිගෙඩි තරමට බුබුළුදමමින් ජලය නටනවා. තව තව කුණු ජලය රත්වෙනවිට බෙලිගෙඩි තරමට බුබුළු දමමින් ජලය නටනවා. දැන් ඔබ මනසින් දකින්න, කුණු කළුපාට ජලතටාකයක් තිබෙනවා. එය බෙලි ගෙඩි තරමට බුබුළු දමමින් උතුරන ලෝදිය හැලියක් වගේ පෙනෙනවා. පෙර සඳහන් කළ මිය ගිය මහත්මයාව අරමුණු කරන විට භික්ෂුවට දකින්න ලැබෙන දර්ශනයයි ඔය සඳහන් කළේ. ඒ කියන්නේ ඔහු නිරයේ පැහෙනවා. බලන්නකෝ අපේ අවම දැනුමයි ලෝකාවබෝධයයි අතර තිබෙන පරතරය. අපි සුගතියකට යොමු කළ මනුෂ්‍යයා නිරයේ අන්ත දුකක් අත් විඳිනවා.

මේ සිද්ධිය දැක්කට පස්සෙ භික්ෂුවට ප්‍රත්‍යක්ෂ වශයෙන් විශ්වාසයි මේ ස්වභාවය ඇත්තය කියලා. මන්ද මෙය උත්තරීතර සමාධිය තුළින් දකින්නා වූ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධකර දේශනාකළ ධර්මතාවක්. භික්ෂුවට අවශ්‍ය වුනා සොයා බලන්න මියගිය පින්වතා ගිහි ජීවිතයේ ගත කරපු ස්වභාවය. ඔහුගේ සමාජයට ප්‍රකට වූ ජීවන චර්යාවත්, සමාජයට ප්‍රකට නොවුන ජීවන චර්යාවත් ගැන සොයල බැලුවා. භික්ෂුවට දැනගන්න ලැබෙනවා ඉතාමත් සත්‍ය මාර්ගවලින් ඔහු තුළ පහත සඳහන් සමාජයට ප්‍රකට නොවූ චර්යාවන් තිබුණ කියලා. ඒවායින් මේ බලවත් අකුසල විපාකයට හේතු වුණ වැරැදි කිහිපයක්ම තිබුණා. කාමය වරදවා හැසිරීම. එක් අවස්ථාවක බොහෝම විකෘති කාම ආශාවක් මොහුට

තිබිල තිබෙනවා. අප්‍රකටව මොහු තුළ ඊර්ෂාව, අනුන්ගේ දියුණුවට ඇති අකමැත්තත් තිබිල තිබෙනවා. ඒ නිසාම මොහු යන්ත්‍ර මන්ත්‍ර, හදිහූනියම් කරල තිබෙනවා. මෙන්න මේ කරුණු ටික ස්ථිර වශයෙන්ම මොහු තුළ තිබුන බවට විශ්වාස කටයුතු මාර්ගවලින් දැන ගත්තාම මොහු මේ මොහොතේ නිරයේ ලෝදිය තුළ තැම්බෙමින් විඳින දුක ගැන පුදුම වුනේ නැහැ. ඔබගේ පින්වත් ජීවිතවලට ගලපාගන්න පැති කිහිපයක් මෙහි තිබෙනවා. මෙහි වඩාත්ම වැදගත් වන්නේ ප්‍රකට අප්‍රකට කියන කතාවයි. අද සමාජයේ හුගදෙනෙක් සමාජය ඉදිරියේ හොඳ වැඩ ප්‍රකටව කරනවා. නරක වැඩ අප්‍රසිද්ධියේ කරනවා. බිරිඳත් සමග ප්‍රසිද්ධියේ ආශ්‍රය කරනවා. බිරිඳ නොවන කාන්තාවන් සමග අප්‍රසිද්ධියේ ආශ්‍රය කරනවා. මඟුල් ගෙදර කෑම මේසය ප්‍රධාන ශාලවේ තිබෙනවා. අරක්කු මේසය අප්‍රකට ශාලාවක තිබෙනවා. බණ ගෙදර, පිරිත් ගෙදර, දානෙ ගෙදර පින්කම ප්‍රධාන ශාලාවේ තිබෙනවා. අරක්කු බොන ඒවා කාමරයේ, පිළිකන්නේ අප්‍රකටව තිබෙනවා. රැකියාවෙන් වැටුප් ගන්න එක විවෘතව කරනවා. අල්ලස් ගන්න එක අප්‍රකටව කරනවා. සිනා වෙන එක ප්‍රකටව කරනවා. වෛර කරන එක අප්‍රකටව කරනවා. අපිට හරි සතුටුයි ලෝකයාගෙන් වහන්වෙලා වැරැද්දක් කලාය කියලා. කවුරුවත් දැක්කෙ නැහැ බියවෙන්න දෙයක් නැහැය කියලා. මේ මියගිය මහත්මයාත් එහෙම හිතපු කෙනෙක්. ගිහි පින්වතා ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. අපේ පින්වත් සහෝදර සමහරක් ස්වාමීන් වහන්සේලා පවා දහවල් දානය ප්‍රකටව ගන්නවා. රාත්‍රියට සුළුවෙන් යමක් අප්‍රකටව ගන්නවා, දකියි කියලා. කවුරු දකියි කියලද? ලෝකයා දකියි කියලා. අපි ලෝකයාට බියවිය යුතු නැහැ. අපි බිය විය යුත්තේ ජූරියට.........

කව්ද මේ ජූරිය?

# බලන්න ඊර්ෂ්‍යාවේ වෛරයේ රඟ

කාමයේ ආශ්වාදයට ඔබ තුළ ඇති කැමත්ත නිසා හේතුඵල ධර්මයන් අනුව සකස් වෙන ජූරි සභිකයන් පස් දෙනෙක් සිටිනවා. මේ අය එකම මොහොතක එක පේළියේ ඉඳගෙන ඉන්නෙ නැහැ. එක් අයෙක් හේතුවෙනුයි අනෙක් ජූරි සභිකයා සකස් වෙන්නේ. ඵලය සකස්වෙන විට හේතුව මැකිල යනවා. මේ ධර්මතාව නැවත නැවත සිද්ධ වෙනවා. මේ ජූරි සභිකයෝ පස්දෙනා වෙන කවුරුවත් නොවේ. පස්ස, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ කියන පස් දෙනයි. මේ පස්දෙනාම බිහිවෙන්නේ රූපය කෙරෙහි ඔබ තුළ ඇති ඡන්ද රාගය නිසා. යම් රූපයක් ස්පර්ශය නිසා, ඔබ ප්‍රකටව හෝ අප්‍රකටව යම් විඳීමක් ඇතිකර ගත්තානම් ඒ විඳීම හේතුවෙන් සකස්වෙන හඳුනාගැනීමත්, චේතනාවත්, විඤ්ඤාණයත් අනුනගේ දෙයක් නොවේ. හේතුව තුළින්ම සකස්කර ගන්නා ධර්මතාවන්. මේවා අප්‍රසිද්ධියේ කරන්න, සඟවන්න බැහැ. මොකද? සඟවන්න සඟවන්න, අප්‍රසිද්ධියේ වැරදි කරන්න, කරන්න ඔබ තුළ සකස්වෙන චේතනාවන්ගේ ස්වභාවය බලවත් වෙනවා. චේතනාවේ ස්වභාවය හේතුවෙනුයි විඤ්ඤාණය නැමති ඵලය සකස් වෙන්නේ. මිය ගිය පින්වත් මහත්මයෙක් අප්‍රකටව, අප්‍රසිද්ධියේ කරන ලද බලවත් අකුසල් කර්ම හේතුවෙන් සකස් වුන බලවත් අකුසල් චේතනාවන් නිසයි ඊට අදාළව සකස්වුන විඤ්ඤාණය නිරය වැනි අති භයානක උපතකට බැසග න්නේ. ඒ බැසගත් මොහොතේ පටන් එම නිරි සතාට තම අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත්, ස්පර්ශය හේතුවෙන් නැවත නැවත සිත් සකස් වෙනවා. දැන් ඔබට හොඳින් තේරුම් යනවානේ ලෝකයට හොරෙන් යමක් කළත් ධර්මයට හොරෙන් යමක් කරන්න බැහැය කියලා. සම්මා සම්බුද්ධ ශාසනය ලෝකයේ පැවතියත් එය අතුරුදහන්ව ගියත් පංච උපාදානස්කන්ධය කියන ධර්මය සත්ත්වයා

තුළ සකස් වෙනවා. එය අවබෝධ කර ගන්නේ සම්මා සම්බුද්ධ ශාසනයකදි පමණයි. ඔබ සිතන්නවත් අකමැති කුරිරු වේදනාවක් නිරයේ විඳින මේ නිරිසතා එම දුකට පත්වූවේ සීලය ආරක්‍ෂා නොකර ගැනීමේ හේතුවෙන්මයි. ඔබට වැටහෙනවාද උතුම් සීලයේ ඇති වැදගත්කම. කඳුළ කියන්නේ සිල් පදයක බිඳවැටීම. කඳුළ දැකලා දුක්වෙලා ඵලක් නැහැ. බිඳුන සීලයයි ඔබ පිරියම් කර ගත යුත්තේ. එවිට කඳුළු පසුබසීවි.

භික්‍ෂුව පෙර සටහන් කළ ගිනියම් වූ ජලයේ නැගෙන්නා වූ උතුරන ජල බුබුළු දකින විට, මතකයට නැගෙන විට භික්‍ෂුවට මැවී පෙනෙන්නේ මනුෂ්‍යයාගේ සහ අනෙකුත් සත්ත්වයින්ගේ ඊර්ෂ්‍යාව නිසා, වෛරය ක්‍රෝධය නිසා ඇති වෙන්නා වූ බිහිසුණු, බියකරු, පුපුරණ ස්වභායයි. මේ අකුසල් මූලයන් නිසාමයි මනුෂ්‍යයා යන්ත්‍ර. මන්ත්‍ර, හදි හූනියම් වැනි තිරස්චීන ධර්මයන් වෙතට යොමු වෙන්නේ. අකුසල මූලයන් හොඳින් වැඩෙන රසායනික පොහොර මේවා. අනුන්ගේ දියුණුව දකින්නට අකමැති කෙනා අවසානයේ දී තමන්ගේ දියුණුව, සැපය කල්ප ගණනාවක් වළකා ගන්නවා. අනුනට නිදහසේ හැදෙන්න දෙන්න, වැඩෙන්න දෙන්න. ඒ දෙස බලා සතුටු වෙන්න. ඒ සතුට ඔබේ සැපය උදෙසාම හේතු වේවි.

එක මනුෂ්‍යයෙක් ජීවත් වුනා බොහෝම ඈත දුරබැහැර ගම් ප්‍රදේශයක. සමාජයේ හොඳින් ජීවත් වන දරු මුණුපුරන් ඇති තාත්තා කෙනෙක්. මොහු මියයන විට අවුරුදු අනූවක් විතර ඇති. මොහු බොහෝම හොඳින් ගමේ ජීවත්වුන කෙනෙක්. ගමේ පන්සලට උපකාර කළා, උදව්කළා. නමුත් මොහුගේ අවාසනාවට මොහු මිය යාමට වසර තුනකට පෙරාතුව මේ පුද්ගලයා ගමේ පන්සල සමග කුමක් හෝ හේතුවක් නිසා අමනාප වෙනවා. හේතුව කුමක්ද කියන්න භික්‍ෂුව දන්නෙ නැහැ. එදා පටන් මේ වයසක මනුෂ්‍යයා මොකද කරන්නේ හාමුදුරුවන්ට බනිනවා. පන්සලට බනිනවා. හාමුදුරුවන්ට එරෙහිව පොලිසියට බොරු පැමිණිලි කරනවා. පුදුමාකාර වෛරයක් ඇතිකරගත්තා. මේ වෛරය, ඊර්ෂ්‍යාව නිසාම ඔහු සීලයෙන් පිරිහුනා. එක සිල්පදයක් ගිලිහෙනකොට අනෙක් ශිල්පදත් ගිලිහෙන්න පටන් ගත්තා. මේ හේතුව නිසාම වයස අවුරුදු අනූවක් වුනත් මොහු තුළ කාම සිතුවිලි ඇති වුනා. තමාගේ වැඩිහිටිබව නිසා තමාගේ දෙපතුළ

ළඟ වැද වැටුන කාන්තාවකගේ පවා අතින් අල්ලන්නට තරම් මොහු තුළ සිල්පදවල හීනභාවයක් ඇතිවුනා. ඊර්ෂ්‍යාවෙන් දැවෙමින් සිටියදීම මොහු මිය යනවා. භික්ෂුව අරමුණු කර බලනවා උතුම් සමාධිය තුළදී මොහු මරණින් පසු කොහේ නැවත උපත ලැබුවද කියලා. භික්ෂුවට දර්ශනය වෙන්නේ උතුම් සමාධිය තුළ දී කිඹුලෙකුගේ කුසක්. ඒ කියන්නෙ මොහු කිඹුල් බිත්තරයක එහෙම නැතිනම් කිඹුල් කුසක ප්‍රතිසන්ධිය ලබලා. බලන්න සසර භායනකකම. මේ තත්පරයේ මනුෂ්‍යයෙක් වශයෙන් සිටි කෙනා ඊළඟ නිමේශයේ දී කිඹුල් කුසකට බැස ඉගන්නවා. අසාධාරණයි කියන්න පුළුවන්ද ලෝක ධර්මය. එහෙම කියන්න බැහැ. සාධාරණ තැන එයාට හිමිකර දුන්නා. කිඹුලා කියන්නේ වෛරයෙන්ම, ක්‍රෝධයෙන්ම පසුවෙන නපුරු සතෙක්. මේ සතා දකින කෙනා තුළ අප්‍රුලක්, බියක්, තැතිගැනීමක් ඇතිවෙනවා. මේ සතා සතුන් මරාගෙනමයි කන්නේ. තමාගේ පැටවාත් තමා මරාගෙන කනවා. වර්ණය, හැඩය, හැසිරීම හරි අප්‍රිය ජනකයි.

භික්ෂුව එක අවස්ථාවක රුහුණු ප්‍රදේශයේ පෞරාණික ආරණ්‍යයක වැඩ සිටින විට එහි දැඩි නියඟයක් පැවතියා. වැව් හිඳෙන කාලයට වැව් වල සිටින කිඹුලන් කැලේ ගල් ගුහා තුළට ඇදෙනවා දහවල් කාලයට. රාත්‍රිකාලයේ කිඹුලන් ආහාර සොයාගෙන කැලයේ වැව් පිටිවල ඇවිදිනවා. භික්ෂුව වැඩ සිටිය කුටිය දොරකඩ බාග බිත්ති බැඳපු ඉස්තෝප්පුවක් තිබෙනවා. දිනක් රාත්‍රි 12.00 ට පමණ එම කුටිය ඉදිරිපස කැලෑ ප්‍රදේශයෙන් වේගවත් හඬකින් සතෙක් පිඹිනවා ඇහුනා. භික්ෂුව මුලින්ම හිතුවේ අලියෙක් වෙන්න ඇතිය කියලා. නැවත නැවතත් වේගයෙන් පිඹීමේ හඬ ඇසුනා. ඒත් සතා පේන්නෙ නැහැ. පස්සෙ බලනවිට අඩි හතක් පමණ දිග හොඳින් වැඩුණු කිඹුලෙක්. කුටියේ ඉදිරිපස බාග බිත්ති සහිත ඉස්තෝප්පුව තුළට ඇවිල්ල යන්න බැරිව කේන්තියෙන් පිඹිනවා. පස්සෙ භික්ෂුව උගුර පාදනවිට කිඹුලා භාග බිත්තියට ශරීරය කෙළින් කරලා බිත්තිය උඩින් කැලයට පැන්නා. මේ කිඹුලා කටින් පිඹින වේගයෙන්ම වලිගයනුත් ගහනවා. කිඹුලාගේ නපුරුම ස්වභාවය භික්ෂුව දැක්කේ ඒ වෙලාවේ. පුදුම වෛරී, ක්‍රෝධ ස්වභාවයක් මේ සතා තුළ තිබෙන්නේ. අපි කියන්නේ සමහර මිනිස්සු ඊරිසියාවෙන් පුපුරනවා කියලා. ඒ පිපිරීමේ උච්ජ භාවය තමයි ඔය සතුන් තුළින් අපි දකින්නේ.

පින්වත් ඔබ හොඳින් සිතන්න ඔබ ඊරිසියා සහගත සිතක්, ක්‍රෝධ සිතක් සකස් කරගන්නවා කියන්නේ නිරයේ ගිනියම් ජලයේ පැහෙන උපතක්, කිඹුල් කුලයේ සත්ත්ව උපතක් ඔබ ප්‍රාර්ථනා කරනවා කියන එකයි. දැන් බලන්න වයස අවුරුදු අනූවේ මනුෂ්‍යයා පන්සලට වෛර කරලා, හාමුදුරුවන්ට වෛර කරලා, ඊර්ෂ්‍යා කළා. එහෙම කළාය කියලා හාමුදුරුවන්ට අලාභයක් පාඩුවක් වුනාද? එක දශමයක අඩුවක් පාඩුවක් ඒ අයට වුනේ නැහැ. එතකොට මේ පුද්ගලයා කාටද වෛර කරලා, ඊරිසියා කරලා තිබෙන්නේ ?

තමාටමයි.

එහෙමනම් ඔබ සිතන්න ඔබේ සිතේ ඊර්ෂ්‍යාවක්, ක්‍රෝධයක් සකස්වෙනවා නම් එය ඔබේ භව ගිණුමේ ඉතිරි කිරීම සඳහාමයි. අනුන්ගේ ගිණුම්වලට මේවා බැරවෙන්නේ නැහැ. හැබැයි තමන් අදක්ෂනම් අනුන් නිසා තමනුත් දුකට වැටෙන්න පුළුවන්. පන්සලට, හාමුදුරුවන්ට වෛර කළා කියන්නේ තෙරුවන්ට වෛර කළා හා සමානයි. ඒ අකුසල් ස්වභාවය බලවත් නිසාමයි මොහු ජීවිතය තුළ දී කරගෙන තිබූ කුසල් යටපත්වී ගියේ. ඔහු තුළ සකස් වූ එක සිතක් මේ විනාශකාරී සිතුවිලි පරම්පරාවක් බවට පත්වූයේ. ඒ නිසා වෛරී සිතක්, ඊර්ෂ්‍යා සහගත, ක්‍රෝධ සිතක් ඇතිවන සැනින්ම අවබෝධයෙන් එය සිඳ දමන්න. ඒවා අකුසල විතර්කයක් වශයෙන් වැඩෙන්න දෙන්න එපා.

මේ සටහන පුරාවටම මනුෂ්‍යය ලෝකයේ ජීවත්වූ දීර්ඝායුෂ ලබපු මනුෂ්‍යයින් දෙදෙනෙක් මරණින් මතු මනුෂ්‍ය භාවයෙන් පහළට වැටුණු සැටි ඔබට පසක් වෙන්න ඇති. සීලයෙන් පිරිහිනු මිනිස්සු දීර්ඝ ආයුෂ ලබන්නේ ඔවුන්ගේ අවාසනාවට. මොකද වැඩිපුර ජීවත්වන මොහොතක් පාසා ඔවුන් අතින් සිදුවන්නේ අකුසලයන්. එහෙයින් මඳ ආයුෂ ඇති මිනිසුන් ක්‍රමානුකූලව බිහිවන ලොවක ඔබ දීර්ඝ ආයුෂයෙන් උපරිම ඵලය නෙලාගන්න. එය ඔබට කරගත හැක්කේ වැඩිපුර ජීවත්වන සෑම නිමේෂයකම සීලයේ ශක්තිය ඔබගේ ජීවිතයට එකතුකර ගැනීමෙනි. සීලය නොමැති ජීවිතයක මරණය දුකක් නිරතුරුවම මෙනෙහි කරන්න. සිල්පද ගරුකරන සිතට ඔබ නමස්කාර කරන්න. මන්ද ඔබව දුකෙන් මුදවන්නේ එම සිත වන නිසාය. ඔබ කැපවීමෙන් යුතුව දිවි පරදුවට තබා ආරක්ෂා කරගත

යුත්තේ උපන් රටවත්, ජාතියවත්, ආගමවත් නොවේ. සසර දුකෙන් ඔබව මුදවන, ඊට මග විවරකර දෙන, සිල් පද ආරක්ෂාකර ගැනීමට ඔබට දිරිදෙන සිතයි. එයමයි ඔබට සැප පිණිස හේතුවෙන්නේ. ඉහත මියගිය පින්වතුන් දෙදෙනාම ජීවත්ව සිටියදී තම ගම් ප්‍රාදේශවලදී උපන් රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, ආගම වෙනුවෙන්, එහි ආරක්ෂාව වෙනුවෙන් පෙළපාලි ගිය අය. ඒත් දැන් මොන රටක්ද, ජාතියක්ද, ආගමක්ද එක් අයෙක් නිරි සත්ත්ව ජාතියේ, අනෙක් කෙනා කිඹුල් ජාතියේ. මේ දෙදෙනාටම රටක් ආගමක් නැහැ. බලන්න සැපයක් කොට අල්ලාගත් මුලාවක මහත. දන් දෙන පින්වත් දායක පින්වතුන් ආරණ්‍ය වලට පැමිණියහම, අපෙන් අහනවා 'හාමුදුරුවනේ මේ කැලයට වෙලා මොකද කරන්නේ' කියලා. කැලේ මොනව රකින්නද? ගමට නගරයට ගිහින් රට ජාතිය ආගම රකින්න කියලයි මේ කියන්නේ. පින්වතුන් එහෙම කියනවිට සිහින් සිනාවක් මිස වෙන දෙයක්නම් පහළ වෙන්නෙ නැහැ. ඇත්තෙන්ම පින්වතුනේ අපි කැලේට වෙලා රටත්, ජාතියත්, ආගමත් ආරක්ෂාකරන එක තමයි කරන්නේ. දිවිහිමියෙන්ම. රට කියන්නේ සීලය. ජාතිය කියන්නේ සමාධිය. ආගම කියන්නේ ප්‍රඥාව. මේ තුන ආරක්ෂාකර ගන්න ඕනෑම කෙනෙක් නැවත නොඑන්නම ලෝකයෙන් එතෙරට යනවා. මීට වඩා ආරක්ෂාවක් කොහින්ද?

විවේකීව සිතන්න. කලබල වෙන්න එපා. දුකක්, දුකට හේතුවත්, දුකෙන් මිදීමත් ඔබ තුළම නේද තියෙන්නේ. සිත ගොඩාක් දුර යන්න දෙන්න එපා. දෑස් දෙක පියාගෙන නාසය අගට ඔබේ සිත යොමු කරන්න. දැන් ඔබට දැනේවි ජීවිතය කියන්නේ කුමක්ද කියලා. ජීවිතය අයිති කුමකටද කියලා. දැන් ඔබට වේගයෙන් හුස්ම ගන්න හිතේවි. ඔබ වේගවත් වෙන්න එපා. ස්වභාවිකවම හුස්ම ගන්න. හුස්ම පිටකරන්න. හොඳින් ඒ බව දකින්න. පින්වත් ඔබට සමාදන් වූ සිල්පදයක් බිඳීමට කරුණු සකස්වුනොත්, ඔබේ සිතට ඊර්ෂ්‍යා සහගත, වෛරසහගත සිතක් සකස් වෙන බව දැනුනොත් මොහොතක් ආශ්වාස ප්‍රශ්වාස දෙසට හොඳින් සිත යොමුකරන්න. ඔබේ සිත නිශ්චල වේවි. දැන් ඔබට පුළුවන් හොඳ නරක දකින්නට. කුසලය අකුසලය දකින්නට හඳුනාග න්නට. ඔබ දුසිල්වත් වීමේ විපාකයන් දැක උපක්‍රමශිලී වන්න සිල්පද ආරක්ෂාකර ගැනීමට. සමහර ගිහි පින්වතුන් අපිට හමුවුනාම කියනවා

'අනේ හාමුදුරුවනේ සිල්පද සියල්ලම රැකගන්න අපහසුයිනේ. සිල්පද එකක් දෙකක් නම් බිඳෙනවා' කියලා. මේක හුඟ දෙනෙකුට තිබෙන ප්‍රශ්නයක්. පින්වත් ඔබ කොහොම උත්සාහ ගත්තත් සිල්පදයක් බිඳෙන ස්වභාවයක් තිබෙනවා නම් එය කර්ම විපාකයක් නිසා සිදුවන්නක්. මෙතනදි ඔබ දුස්සීලභාවයේ විපාක දකිමින් සිල්පද ආරක්ෂාකර ගැනීමට වීර්යවන්ත වෙන්න ඕන. ඒ වගේමයි සීලයෙන් ඔබ දුර්වලනම් සිල්පද රැකීමට අපහසුනම් ඔබ සීලය ගරුකරන අයට සිල්පද හොඳින් රකින අයට ගරු කරන්න පුරුදු වෙන්න ඕන. සමහර පින්වතුන් ඉන්නවා තමා සිල්පද රකින්නෙ නැහැ, නමුත් සීලවන්තව ජීවත්වෙන කෙනාට අගෞරව කරනවා, සිනාසෙනවා. අතීතයේ අපි අතින් සිදුවූ මෙවැනි පහත් පෙළේ වැරදි නිසා තමයි සිල්පද රැකගැනීමට සමහරුනට අපහසු වෙන්නේ. තමාට සිල්පද ආරක්ෂාකර ගැනීමට අපහසුනම් අවම වශයෙන් සිල්පද ආරක්ෂා කරන අයට ගරු කරන්න පුරුදු වෙන්න. එයම ඔබට ආශිර්වාදයක් වේවි, සීලය තුළ පිහිටන්න. ඔබ තුළින් සිල්පද ගිලිහෙනකොට ඔබෙන් ගිලිහෙන්නේ සුගතියයි. මේ කතාවේ සදහන් කළ අවාසනාවන්ත මිනිසුන් දෙදෙනා දුගතියට වැටුනේ ඔවුන් අතින් සීලය ගිලිහුණු නිසාමයි. මේ දුකෙන් පිරුණු කතාව ඔබ ඔබේ සැපය පිණිස නුවණින් ගලපාගන්න දක්ෂවෙන්න. ඒ මෝදුකොට ගත් දක්ෂභාවය සතර අපායෙන් මිදීම සඳහාම පෙරට රැගෙන යන්න. නැවත නැවතත් හොඳින් අවධානය යොමුකරන්න. ඉහත කතාවේ මනුෂ්‍යයින් දෙදෙනාම මරණින් පසු දුගතියට වැටුනේ කාමය වරදවා හැසිරීමේ චේතනාවන් බලවත් වීම, එක හේතුවක් වූ නිසාමය. තත්පරයක ආශ්වාදයක් උදෙසා කල්ප ගණනාවක් දුකට අතවනන මෙවන් වැරදි ගැන ඔබ හොඳ අවධානයෙන් පසු වෙන්න. අකුසලයක් සිදුවන වැරදි කාම සිතුවිල්ලක් ඇතිවුනොත් එය නිවා දමන්න. ඔබට පුළුවන් බුදුගුණ සංඥාවක් සිතට ගන්න. මෛත්‍රී සංඥාවක්, අසුභ සංඥාවක්, සතර අපාය කෙරෙහි බියක්......... එවැනි ධර්ම මනසිකාරයකට සිත යොමු නොවනවා නම් වෙනත් බාහිර ක්‍රියාකාරී කමකට සිත යොදවන්න. එවිට ඔබට දැනේවි ඒ කාම සිතුවිල්ල අනිත්‍යවී යනවා. එතැන තිබෙන්නේ විදර්ශනාව. චතුර්ය සත්‍ය ධර්මය. බලන්න සකස්වූ එක සිතක් ඔබ අදක්ෂ වුවහොත් ඔබව සතර අපායටත් ඔබ දක්ෂ වුවහොත් ධර්මාවබෝධය දෙසටත් යොමු කරනවා.

# සත්තයි, ආයේ කිසි දවසක වරදින්නේ නැහැ

සිත නැවතිලා. ඇසට රූප පේනවා. කනට ශබ්ද ඇසෙනවා. ඒත් ඒවා නිසා විතර්ක සකස් වෙන්නේ නැහැ. දෑස් ඇරගෙන සිටින්නේ. පරිසරය පෙනෙන්නේ නැවතිලා තියෙනවා වාගේ. දෑස් වසාගනිද්දී පරිසරය මැකී යනවා. එතැන දී හිස් බවක් පෙනෙන්නේ. කාලය ගලා ගෙන යනවා. සංස්කාර ගෙවී ගෙන යනවා. වනපෙතේ දැඩි නිහඬතාවය නිහඬ සිත තව තවත් නිවා දමනවා. අරමුණක් නැහැ. බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ මරණය. කාගේවත් කැමැත්තට එය සිද්ධ වෙන්නේ නැහැ. අතීත සංස්කාර ශක්තිය මරණයේ ආධිපත්‍යය දරාගෙන සිටින්නේ. එය ස්වභාවික මරණයක් වෙන්න පුලුවන්. මරා දැමීමක් වෙන්නත් පුලුවන්. කොහොම වුනත් වෙන්න තියෙන දෙයයි සිද්ධ වෙන්නේ. මරණය අස්වාභාවික වෙන්න වෙන්න, මරණයේ සුන්දරත්වය වැඩි වෙනවා. මොකද, සංස්කාරයන්ගේ විෂම, ගොරහැඩි භාවයයි අත් දකින්නේ. සංස්කාර කියන්නේ බොහෝම සාධාරණ ධර්මතාවයක්. එයාගෙන් කාටවත් වරදක් නැහැ. හොඳට හොඳයි. නරකට නරකයි. වඩාත්ම ශක්තිමත් කුසලය හෝ අකුසලය මතු කොට ගන්නවා.

පින්වත් ඔබ සිතන්නකෝ, මේ ජීවිතයේ දී මිච්ඡා ආජීවයේ යෙදෙන කෙනෙක් ඉන්නවා. ඔහුගේ ව්‍යාපාරය මත් වතුර වෙළඳාම. මොහු බොහොම සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන්නේ. ආදායම දිනෙන් දිනම ඉහළ යනවා. මේ මහතා දන්දීමත් කරනවා. මේ මහතා මිය ගිහින් නැවත මනුෂ්‍යයෙක්ව ඉපැදුනොත්, ඔහු ලාබාල තරුණ වයසේ පටන්. මත්වතුර බීමට ඇබ්බැහි වෙනවා. මුලු ජීවිතයම මහා බේබද්දෙක් වෙනවා. ගිය ජීවිතයේ දී අනුන් මත්කළා වු වරදට, සංස්කාර

බොහොම සාධාරණව නිවැරදි හේතුඵල ධර්මයන්ට අනුව විපාකය සලස්වනවා. ඔහු ගිය ජීවිතයේ දී කළා වු දන්දීම්වලට, රැකගත්තා වු ඉතිරි සිල්පදවලට මනුෂ්‍ය ජීවිතයක් ලබා දුන්නා. අනුන්ට මත්වතුර වෙළඳාම් කොට මත්කිරීම හේතුවෙන් බේබද්දෙක් බවට පත්වුනා.

පින්වත් ඔබත් විවේකීව සිතන්න. සිත දිව්වොත් නවතාගන්න පුලුවන්ද? සසර ගැන බිය ඇතිකර ගන්න. බිය අභියස සිත තැන්පත් වේවි. නැතිව සිත තැන්පත් කරන්න බැහැ. මුහුදු රැළ වාගේ බිඳෙනවා. සකස් වෙනවා. බැරි දෙයක් නැහැ උවමනාවක් තියෙනවා නම්. උවමනාව සකස් කොට ගන්නෙ සසර බිය දැනුන කෙනායි. ඔබේ ජීවිතය තුළට මනසින් කිමිදෙන්න. ඔබ මේ මොහොතේ මිය ගියොත් කෙබඳු උපතකට ඔබ වැටෙයිද? උපාදානය නිසා.... භවය කුමක් වේවිද? සිතන්න! සිල් පද බිඳුන ඒවා මතක් වෙනවාද? ගෞරවයෙන් රැකගත් සිල් පද මතක් වෙනවාද? ලෝභ ද්වේෂ මෝහ අකුසලයන්ගේ ස්වභාවය කොහොමද? ලකුණු වැඩි සුගතියටද? දුගතියටද? පුලුවන්ද ඔය රැකගෙන සිටින 'මගේ ගොඩ' මොහොතින් අතහරින්න? මැරෙනවා කියන්නේ හිනා වෙනවා කතා කරනවා, විහිළු කරනවා වාගේ ලෙහෙසි වැඩක් නොවෙයි. ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් සියල්ල අහිමි වෙන්නයි යන්නේ. මේවායේ ග්‍රහණයෙන් බැහැරව යන්නයි හදන්නේ. අහිමි වෙන්නයි හදන්නේ. භික්ෂුවට මේ මොහොතේ මතක් වෙනවා තනතුරක් අහිමිවූ තැනකදී දේශපාලඥයකුගේ දෑසට කඳුළු නැඟී ආකාරය. ඒ කඳුළු උණුසුම් වුනේ තෘෂ්ණාවෙන්. ඔහු තනතුරු දැරූ මහේශාක්‍ය කාලයේ හෙළූ සතුටු කඳුළු උණුසුම් වුනේ තෘෂ්ණාවෙන්මයි. එකම කඳුළ දුක සැප වශයෙන් මහා පරතරයකින් වර්ගීකරණය කරනවා. දුක සැප දෙන සැම මොහොතකදීම දෙකක් වශයෙන් ගත්ත අපි කාලය ළඟදී පරදිනවා. දැන් මහලුයි. දැන් වයසයි. කාලය වේගයෙන් ඉදිරියට යනවා. ඔබත් දුවනවා. නමුත් සැම මොහොතකම කාලය වේගවත්. ඒ අපේ තෘෂ්ණාවේ බලවත් භාවය නිසා. නිශ්චිත ඉලක්කයකින් සෑහීමක් නැහැ. ඒ නිසා සෑම මොහොතකදීම අපි කාලයට පරදිනවා. ඒ කියන්නේ කාලය මදිවෙනවා. නැති දෙයක් ඇතැයි කියලා ගත්තොත්, අපිට සොයන්න වෙනවා. නමුත් වෙහෙස පමණයි.

අපි පරදිනවා. මොකද? අපි නැති දෙයකුයි සොයන්නෙ. 'ඵස්සය' හේතුවෙන් සකස්වෙන සිතිවිලි අයාලේ යන්න දෙන්න එපා. ධර්මයේ ග්‍රහණයට යටත් කොට ගන්න. සිතනවා නම් ගොඩක් දේවල් සිතන්න පුළුවන්. ඒත් ඒ සිතිවිලි මට අයිති නැහැ. මගේ සිතිවිලි මට අයිති නැතිනම්, අනුන්ගේ සිතිවිලි කෙසේ මට අයිති වෙන්නද? එහෙම සිතනකොට ලොකු නිදහසක් දැනෙනවා. එම නිදහස ළඟ ඔබ නවතින්න! එවිට ඔබට දැනේවි කාලය වේගයෙන් ගලාගෙන යනවා. එහෙත් ඔබ නැවතිලා. ඔබ නැවතුන තැනදී කාලයට කරන්න දෙයක් නැහැ. ලෝකය දුවනවා. ඔබ නැවතිලා. සිතිවිලි නැවතුන තැනදී ඔබ නවතිනවා. ඒ කියන්නේ ඔබට මේ වේගය නවතා ගන්න පුළුවන්.

අපි නිදහස විවේකය උදෙසා කොපමණ දේවල් කරනවාද? විවේකය ගත කිරීම සඳහා කොතරම් වියදම් කරනවාද? නමුත් එක සිතිවිල්ලක් නවතා ගැනීම තුළ මොන තරම් නිදහසක් ලබන්න පුළුවන්ද? අපි විවේකය කියලා හොඳට කාලා බීලා නිදාගෙන විනෝද වෙලා පංචනීවරණ තීව්‍ර වෙලා. තව තවත් කෙලෙස්වල සිරගත වීමකුයි කරගන්නේ. දුක නිසා සැප සොයනවා. සැප නැවතත් දුකකටම ඇද දමනවා. ඒ නිසාමයි නැවත නැවත සැපය සොයන්නේ. නැවත නැවත සැපය සොයන්න වෙන්නේ.

අපි මොනදේ කරන්නෙත් සැප බලාපොරොත්තුව. දුකක් බලාපොරොත්තුව අපි කිසිවක් කරන්නේ නැහැ. අපි ගින්දරට අත දමන්නේ නැහැ. අත පිච්චෙන දුක නිසා. සැප බලාපොරොත්තුවෙන් සියල්ල සිදු කළත් එහි ප්‍රතිඵලය දුකමයි.

භික්ෂුව හඳුනන එක් භික්ෂුවක් සිටිනවා. තෘෂ්ණාව මරා දමලයි සිටින්නේ. උන්වහන්සේ සිතන කිසිම සිතිවිල්ලකින් දුකක් සකස් වෙන්නේ නැහැ. සැනසිල්ලක්මයි ලබන්නේ. ජීවිතය කියන්නේ හරිම පරස්පරයක්. සැපය කියලා කුමක් ඇල්ලුවාද, කුමකට බැඳුනද, එතැන දුක් ගොඩක්. ඉතින් අපේ තිබෙන විශේෂත්වය දුක බාහිරට පෙන්වන්න යන්නේ නැහැ. සිනාවෙන්, කතාවෙන් දුක හොඳින් වසා ගන්නවා. එතැනදී ඉපැදෙන්නේ තෘෂ්ණාව. දුක නිසා දුක වර්ධනය වෙනවා. දුකට කියන තවත් නමක් කියන්න කිව්වොත්

භික්ෂුව කියන්නේ සැපය කියලයි. මොකද එය ඒ තරමටම සමීපයි දුකට. ඇත්තේ ආශ්වාදයක කෙටි පරතරය පමණමයි. ඒ පරතරය එක සිතිවිල්ලක පරතරය වෙන්න පුළුවන්. මෙතැන දුක ගැන කතා කරන්නේ මනුෂ්‍ය ලෝකයට සාපේක්ෂව. දිව්‍යතලවල සැපයේ ආශ්වාදය මනුෂ්‍ය ලෝකයට සාපේක්ෂව පින නිසා ඉතා ඉහළයි. දුක සැප කියන්නේ අවසානයක් දකින්න පුළුවන් සමීකරණයක් නොවේ. ඔබ පැටලෙන සංකීර්ණ සමීකරණයකි.

දුක සැප කියන දෙකම මිරිඟුවක් නම්, පින්වත් ඔබ මුවෙක් කියන අසරණ චරිතයෙන් මිදෙන්න. සරණක් ඇති පින්වතෙක් වෙන්න. සරණක් ඇති පුද්ගලයා ඉන්නේ සම්මා සම්බුද්ධ ශාසනයක පමණයි. ඔහු සරණ කොට ගත් සද්ධර්මය ජීවිතයට දරාගෙනයි ජීවිතය දෙස බලන්නේ. ඔහු මිරිඟුවත් යතාර්ථයත් නුවණින් හඳුනාගන්නවා. බොරුවත් මුලාවත් පස්සේ දුවන්නේ නැහැ. ඇත්ත ඇති තැන නවතිනවා. දුක කියන කාරණයට ප්‍රතික්‍රියා දක්වනවා වෙනුවට ඔහු දුක ඇතිවීමට හේතුවයි සොයන්නේ. තෘෂ්ණාව නිසාමයි අකුසල් රැස්වෙන්නෙ කියලා ඔහු දකිනවා. ඔහු දුක ගැන සිතීම නවතා දස කුසල් ගැන සිතීමට පටන් ගන්නවා. දුකට අපි හැමෝම අකැමැතියි. ඒ නිසයි අවම වශයෙන් දුකෙන් පලායන්න උත්සාහ ගන්නේ. දුකෙන් පලායන මනුෂයා අතිරේක දුක් සකස්කොට ගන්නවා. දුක කියන්නේ අකුසල්වල ඵලයක් කියලා තේරුම් නොගන්නා නිසාම..........

මේ ලෝක ධාතුව තුළ අතිශය කෲරතර දුක් විඳින සත්ත්වයින් සිටිනවා. ඔවුන් සිටින්නේ අවීචිය කියන නිරයේ. ඔබත් මමත් අතීතයේ යම් දවසක මේ දුකත් විඳලා තියෙනවා. මනුෂ්‍යයා වැරදි කරන්නේ වැරැද්දට ධර්මානුකූලව ලැබෙන දඬුවම් නොදකින නිසාමයි. මේ නොදන්නා භාවය ඇති කරන්නේ මෝහය විසින්. ධර්ම මාර්ගය තුළ නිවැරදිව දාන, සීල භාවනා කටයුතු කරන ගිහි පින්වතුන්හට රැකියා ව්‍යාපාර ආදියේදී ප්‍රශ්න මතුවෙනවා වැඩියි. මෙය ධර්මයේ ආශ්චර්යයක් බව, තමන් ධර්ම මාර්ගයේ සිටින බවට තමන්ට ලැබෙන සහතිකයක් බව තේරුම් ගත යුතුයි. ධර්මය තුළ හැසිරෙන කොට ඔබ ඉදිරියට ප්‍රශ්න එන්නේ ධර්මය පැත්තට තව අඩියක් ඉදිරියට තබන්නටයි.

නමුත් මේ තත්ත්වය නිවැරදිව හඳුනා නොගත් ශ්‍රද්ධාව අඩු පින්වතුන් මෙතැන දී ධර්මය සමග කලකිරෙනවා. ගැටෙනවා. ධර්මය සැමවිටම සන්දිට්ඨික ගුණයෙන් යුක්තයි. උත්සාහයේ කැපවීමේ තරමට ප්‍රතිඵල ලබාදෙනවා. ඒ නිසා ධර්ම මාර්ගයේ ගමන් කරන පින්වත් ඔබ හැමවිටම පෙරළුන එක හොඳයි කියලා දකින්න ඕනි. එසේ දකිමින්මයි නිවැරදි පැත්තට නැවත පෙරලාගන්න ඕනි. පෙරළීමත්, නැවත නිවැරදි පැත්තට හරවා ගැනීමත් අතර ඇති ව්‍යායාමය ඔබ තුළ ඉන්ද්‍රිය ධර්මයනගේ තීව්‍ර භාවයමයි සකස් කොට දෙන්නේ. ගොඩනැගෙනවාට වඩා වැටෙනවාට ඔබ කැමැති වෙන්න. ගොඩනැගෙන දෙය වැටෙන ස්වභාවයෙන් යුක්ත බව එවිටයි නුවණින් දකින්නේ. ඒ දැකීමයි ධර්මය කියන්නේ. යමක් නුවණින් දකින පින්වතුන් තුළ ප්‍රඥාව හෙම්හිට මෝදු වෙනවා. විදර්ශනාව ප්‍රගුණ කිරීම තුළින්මයි ඔබට එම ගුණය වඩාගත යුත්තේ. මෙය සටහන් තබන භික්ෂුව ප්‍රශ්න ගැටළු තුළින් ජීවිතය, ධර්මය දුටු කෙනෙක්. ප්‍රශ්න දැඩිව මතු වූ වේලාවක භික්ෂුව ගිහි කාලයේ සිතා තිබෙනවා ඇයි මම ඉපැදුණේ කියලා. එසේ අතීතයේ සිතුනේ ධර්මය නොදන්නා කම නිසාමයි. වර්තමානයේ මෙතරම් සුන්දර ජීවිතයක උරුමය සැඟවිලා තිබුණේ ඒ අතීත අසුන්දර ජීවිතය තුළයි. ඒ අසුන්දර අතීත ජීවිත කතාව තුළ ඒ සැම ප්‍රශ්නයක්ම භික්ෂුවගේ ජීවිතයට ආශිර්වාදයක් වෙනවා, අවාසානයේ දී. ගිහි ජීවිතයේ දී භික්ෂුවට ඉහත ප්‍රශ්න නොපැමිණියා නම්, භික්ෂුව මීට වඩා වෙනස් තැනක ඉන්න තිබුණා. නමුත් එය එසේ වෙන්න බැහැ. සංස්කාරයන් නිවැරදි තැනට ප්‍රශ්න මැදින් අවබෝධය සකස් කරමින් රැගෙන එනවා. එහෙම නම් භික්ෂුවගේ ගිහි ජීවිතයේ දී ප්‍රශ්න ඇති වුනේ හේතුවක් නිසාමයි. භික්ෂුවට මේ මොහොතේ ඉන්න තැනට එන්න අවශ්‍ය පාර කැපීම සඳහාමයි. දැන් ඔබට අවශ්‍ය පිළිතුර පැහැදිලිව තිබෙනවා. ඔබ ඉදිරියට එන ප්‍රශ්න කැමැත්තෙන් පිළිගන්න කියලා භික්ෂුව කියන කාරණය ඔබට දැන් පැහැදිලියි. ප්‍රශ්න හා ගැටෙන්න එපා. ප්‍රශ්න සුහදව පිළිගන්න. ප්‍රශ්න නිසා ඇතිවන අතුරු ඵලයන්ට සුහදව ආචාර කරන්න. මේවා ඔබ සොයා එන්නේ හේතුවක් නිසාමයි. එම නිසා ඔබ සොයා එන කිසිවක් ප්‍රතික්ෂේප නොකරන්න. ඔවුන් සතුරු

වේශයෙන් පැමිණියත් ඔබගේ මිතුරන් බව සිතන්න. දුක සහ සැප ඔබ අතීතයේ කළාවූ සංස්කාරයන්ගේ නිවුන් දරුවන්.

ඔබ ඉදිරියේ එන ප්‍රශ්න දුක් පීඩා නින්දා අපහාස අතරින් ඒකට මුහුණ දෙමින් සද්ධර්මය පැත්තෙන්ම අඩියක් ඉදිරියට තබන්න ඔබ දක්ෂ වෙන්න. පින්වත් ඔබ යාචක මහත්මයෙක් වෙලා මැරෙන්න පුළුවන්. ඒත් ඔබ හිස් අතින් නොවේ මැරෙන්නේ. ශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රිය ධර්මයන් වඩාගෙනයි සුගතියට ගමන් කරන්නේ. ඒ ඉන්ද්‍රිය ධර්මයන්මයි මතු භවයක අයෝමය ශක්තියක් වී නැඟී සිටින්නේ ධර්මාවබෝධය පිණිස. වෙනස් වන ලෝකය ඉදිරියේ ඔබ නොවෙනස් වන පුද්ගලයෙක් වෙන්න. නොවෙනස් වන පුද්ගලයා යනු ඇලීම් ගැටීම්වලින් තොරව උපේක්ෂාව තුළ ජීවත්වෙන පුද්ගලයායි. දැන් ඔබ තවදුරටත් මිරිඟුවක් පිටුපස දුවන්නේ නැහැ. මොකද, ඔබ දැන් අසරණ පුද්ගලයෙකේ නොවේ. සරණ ඇති පින්වතෙක්.

වේලාව සවස 5.30 යි. පරිසරය ඉතා සීතලයි. වෙනත් සතෙකුගේ හෝ ශබ්දයක් නැහැ, කුරුල්ලන්ගේ හඬ මිසක්. දඩයම්කරුවන්ගේ සෙවණැලි කැලය තුළින් මැවී නොපෙනී යනවා. සතුන් නැත්තේ ඒ හේතුවෙන්. ලේ රසට මස් රසට ගිජු වෙච්ච මනුෂ්‍යයෝ දඬුලේනුන්, මුගටියන් සැපයක් හැටියටයි දකින්නේ. මසට ඇති තෘෂ්ණාව නිසා. මනුෂ්‍යයාගේ දිවට දැනෙන මස් රසය මගින් වනයේ සතුන්ව සීමා කරනවා. තනිවෙච්චි වළිකුකුලෙක් නිතරම කෑගසනවා ඇසෙනවා. එයාගේ වළිකුකුල් පවුලත් විනාශයට ගොදුරු වෙලා. ලෝකය ඉපැදෙනවා. මැරෙනවා. මරපු අය මැරුම් කනවා. අරුමයක් පුදුමයක් නැහැ. මෙයයි ලෝකය. ලෝකය ලෝකයේ ස්වභාවයෙන් ගලාගෙන යනවා. සංස්කාරයෝ සංස්කාරයන්ගේ ස්වභාවයෙන් දුකත් සැපත් ජීවිතයත් මරණයත් බෙදා දෙනවා. භික්ෂුව ලියනවා. පින්වත් ඔබ කියවනවා. භික්ෂුව ලියන්නේ අවබෝධයකින්. පින්වත් ඔබ කියවන්නේ අවබෝධය ලබාගන්න. පින්වත් ඔබ කියවන කරුණු ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය සමග හොඳින් ගළපන්න. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ඵලයයි පින්වත් ඔබට මේ සටහන් තබන්නේ. පින්වතුනි ! ප්‍රඥාව අවධි කොට ගන්න.

# දෙමාපියන් වෙනුවෙන් දරුවන්ට- දරුවන් වෙනුවෙන් දෙමාපියන්ට

මේ සටහනේ තැනක සඳහන් කළා, මේ ලෝක ධාතුවේ කෲරතර දුක් විඳින සත්ත්වයන් පිළිබඳව. ආනන්තරිය පාපකර්ම කියන බලවත් අකුසල් හේතුවෙනුයි, අවීචි මහා නිරයේ නිරිසතුන්ගේ දුක මේ තරම් තියුණු. අවීචි මහා නිරයේ දුක්විඳින එක නිරිසතෙක් සිටිනවා. ඔහු දේවදත්ත. අකුසලය, ජීවිතය කොටගත් කෙනෙක්. ජීවිතය පළිගැනීම, ද්වේෂය උදෙසාම මෙහෙය වූ කෙනෙක්. දුර නොබලා, ළඟ පමණක් බලපු කෙනෙක්. අකුසල් සංස්කාරයන්ගේ උල්පතක්. ඒ උල්පතෙන් නිරතුරුව දුක වැගිරෙනවා. වැගිරෙන්නේ ජලය, කඳුළු නොවේ ගින්දරයි. එය ලෝකධාතුවේ අතිශය වේදනාකාරී දුකක්. ඔබත්, මමත් දිවා රාත්‍රී දෙකෙහිම මෙනෙහි කළයුතු වූ දුකක්. මේ උතුම් මොහොතේ සතර අපායෙන් නොමිදුනහොත් අපටත් අනාගතයේ උරුම වූ දුකක්.

භික්ෂුවක්, උතුම් සමාධිය තුළින් දේවදත්තව අරමුණු කොට බලනවා. දේවදත්ත අවීචි මහ නිරයේ සිටයි භික්ෂුවට දර්ශනය වෙන්නේ. මේ නිරිසතාගේ බෙල්ලෙන් ඉහළ කොටස් පමණයි, භික්ෂුවට පෙනෙන්නේ. හිස මුඩු වූ මිනිස් මුහුණක්. කිඹුල් කටක්. ඒ කියන්නේ කිඹුල් කටක් සහිත මිනිස් මුහුණක්. මනුෂ්‍යාගේ ස්වභාවයෙන්ම සිටිනවා. අඩියක් පමණ දිග, අඟල් 8 ක් පමණ පළල කිඹුල් කටකුයි තිබෙන්නේ. මේ නිරිසත්ත්වයා සැම නිමේෂයකදීම ශරීරය තුළින් නැගෙන ලොකු කලගෙඩියක ප්‍රමාණයේ ගිනි ජාලාවක් කිඹුල් කටෙන් පිටකරනවා. අපි නාසයෙන් ශරීරය තුළට ගන්නා වාතය නැවත නාසයෙන් පිටකරනවා වාගේ, මේ නිරිසතා කිඹුල් මුඛයෙන් සැම තත්පරයකදීම කලගෙඩියක ප්‍රමාණයේ ගිනි ජාලාවක් පරිසරයට මුදා හරිනවා. අපි හුස්ම රැල්ලක් ශරීරය තුළට ගන්න කොට මුළු ශරීරයටම එය දැනෙමින්

ප්‍රබෝධයට පත්වෙනවා. එනමුත්, මේ දේවදත්ත නිරිසතාට, අකුසලය තුළින් උපන්නාවූ ගිනි ජාලාව, ශරීර අභ්‍යන්තරය දවමින්, මුඛය ඇතුළතද පිළිස්සෙමිනුයි පිටවෙන්නේ. මෙය නැවත නැවත සිද්ධ වෙනවා, කොටින්ම ඔහුගේ ප්‍රශ්වාසය සිදුවෙන්නේ ගිනි ජාලාවකින්. ගිනි ජාලාව මුඛයෙන් පිටවෙන මොහොතේ මේ නිරිසතා දැඩි මරණීය වේදනාවකට පත්වෙනවා. එය එම නිරිසතාගේ මුහුණේ විද්‍යාමාන වෙන තියුණු ඉරියව්වලින් හොඳින් පෙනෙනවා. මේ නිරිසතාට කිඹුල් කටක් පිහිටා තිබෙන්නේ වැඩි ගින්දර ප්‍රමාණයක් පිටකිරීමට සහ, වැඩි අවකාශයක් මුඛය පිළිස්සීමේ වේදනාව දැනෙන්න. මොහුට මනුෂ්‍යයකුට තරම් කුඩා කටක් තිබුණානම්, කුඩා ගින්දරක් තමයි පිටවෙන්නේ. පිළිස්සෙන්නේ කුඩා අවකාශයක්. අකුසලයේ බලවත් භාවය නිසා, වැඩිපුරම වචනයෙන් කරගත් අකුසල් නිසාදෝ, මුඛය වැඩි දුකක් විඳීමට අවශ්‍ය හැඩයට පිහිටා තියෙනවා. මොහු ඇනුමක් අරින්න වාගේ වේදනාවෙන් කිඹුල් කට හොඳින් විවෘත කරනවා. ඒ එක්කම පිටවෙන්නේ ගින්දර ජාලාව. දේවදත්ත මේ මොහොතේත්, තවත් කල්ප ගණනාවකුත් මේ කෲරතර දුක විඳීවි. වාසනාවන්ත පිරිසක් අතර ඉපැදුණ අවාසනාවන්ත මනුෂ්‍යයෙකි දේවදත්ත.

පින්වත් ඔබත්, ධර්මයේ සන්දිට්ඨික ගුණය පවතින මේ උතුම් අවස්ථාවේ ඉපැදුන අවාසනාවන්තයෙක් වෙන්න එපා. මේ අවීචි මහ නිරයට අයත් අකුසල්වලින් එකක් තමයි දෙමාපියන් මැරීම. මව් පියන් ඝාතනය නොකළත්, වර්තමාන සමාජයේ දෙමාපියන්ට මානසිකව මරණීය වේදනාවන් දෙනවා. මහලු නිවාස, දෙමාපියන් නොසළකා හැරීම, සේවකයන් ලෙස වැඩ ගැනීම, සමාජය තුළ හුඟක් සිද්ධ වෙනවා. මේ අකුසල් අවීචි මහ නිරයට අයත් නැති වුනාට, මේවායේ විපාක බොහොම බලවත්. මවගෙන් බීපු කිරි වෙනුවෙන් ඔබ මවට පෙරළා කෘතවේදී නොවුනහොත් අනිවාර්යයෙන්ම කිරි වෙනුවට ගින්දර බොන්න වෙනවා. අම්මා කෙනෙකුගේ රුධිරය කිරි බවට පත්වුනේ, කරුණාව නිසාමයි. එවන් 'කරුණාවක්' ඔබ මහලු මඩමක ගාල් කරනවා නම්, නොසලකා හරිනවා නම්, සේවිකාවක් හැටියට දකිනවා නම්, අම්මා තාත්තා පිච්චෙන වේදනාවේ දුක්ගිනිවලින් ඔබත් කවදාහරි දවසක පිච්චෙනවාමයි. සංස්කාරයෝ බොහෝම බියකරු බව නැවත මතක් කරනවා. අඹුදරුවන් සමග පවුල් ජීවිතයක් ගතකරන ඔබ, අම්මා තාත්තාට දිය යුතු තැන,

කොතැනද කියලා සිතන්න යන්න එපා. ඔබ ඔය තැනට පැමිණියේ අම්මා තාත්තා නිසා කියලා හිතන්න දක්ෂ වෙන්න. අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් කියන්නේ ඉල්ලමක්. ඔබගේ සැපයට අවශ්‍ය කළමනා ලබාදෙන ඉල්ලමක්. ඔබ දක්ෂ වෙන්න ඒ ඉල්ලම සුවසේ ගරමින්, භවයේ සැපයට අවශ්‍ය කළමනා එකතුකර ගන්න. වැඩිකාලයක් ඒ ඉල්ලම පවතින්නේ නැහැ. එය මැරිලා යනවා. ඒ නිසා ඔබ ඉක්මන් වෙන්න. ඔතැනයි සැබෑම සැපය උපදවන මැණික් දියමන්ති තියෙන්නේ. අපි මහපොළව හාරලා මැණික් පතළක් බැස්සොත්, සැම මොහොතකම දුකමයි සකස් වෙන්නෙ. මැණික් ලැබෙන්න ලැබෙන්න තෘෂ්ණාව සහ බියමයි සකස් වෙන්නෙ. සතර අපායට යන මාර්ගයයි සකස් වෙන්නෙ. ඒත් අම්මා තාත්තා කියන ඉල්ලම ගරන්න ගරන්න පින සහ කුසලයමයි සකස් වෙන්නෙ. මව්පිය උපස්ථානය තුළ මේ ලෝකධාතුවේ ඉහළම ලෞකික සැපය වන ශක්‍රයා වීමේ අවස්ථාව සැඟවී තිබෙන බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

අම්මාට තාත්තාට බැරි අවස්ථාවක් පැමිණියොත්, ඒ දෙමාපියන්ගේ අසුචි මුත්‍රා ටිකක් ඔබේ දෑතේ නොගෑවුනොත්, ඔබ අම්මා තාත්තාට ණය නොවූ දරුවෙක් වෙන්නේ නැහැ. අම්මා තාත්තා නැමැති මැණික් ඉල්ලම හඳුනා නොගත් අන්ධයෙක් වෙනවා ඔබ. එවැනි අන්ධ භාවයට පත් වූ දරුවන්ගේ දෙමාපියන් තමයි වැඩිහිටි නිවාසවල සිටින්නේ. අම්මා කෙනෙකුගේ අසුචි මුත්‍රා කියන්නේ ඉතා සුන්දර දෙයක්. ඒ අසුචිවල, මුත්‍රාවල ඔබව ශක්‍ර දෙවියා බවට පත්කිරීමට අවශ්‍ය කුසල් සැඟවිලා තිබෙනවා. භවයේ සැප නැමැති මැණික් සොයන්නා, අම්මා තාත්තා නැමැති ඉල්ලම සුවසේ ගරා ගන්නවා. මේ භික්ෂුව ගිහි කාලයේ දී, අම්මා කියන ඉල්ලමෙන් ඇතිතාක් මැණික් ගරාගත් දරුවෙකි. අම්මා නැමැති ඉල්ලමෙන් ගරාගත් කුසල් ශක්තිය තමයි, අයෝමය ශක්තියක් වෙමින්, භික්ෂුව මේ මොහොතේ ඉන්නා තැනට ඔසවා තබන්නට මාර්ගය වුයේ. ඒ නිසයි අත්දැකීමෙන්ම කීවේ අම්මාගේ අසුචී මුත්‍රා, හරිම සුන්දරයි ආස්වාදනීයයි කියලා. ඒ සුන්දරත්වයයි ධර්මයේ සැබෑ සුන්දරත්වයට අවශ්‍ය කුසල් සංස්කාර මෝදුකර දුන්නෙ. මේ දෑත්වල අම්මාගේ මුත්‍ර බැරල් ගණනක් තැවරිලා ඇති. අම්මාගේ මුත්‍ර අසුචී තැවැරුණු රෙදි 'අප්‍රමාණ ප්‍රමාණයක්' මේ දෑත්වලින් පිරිසිදු කොට ඇති. ඒ

දැත්වලින්මයි, ඔබට මේ සටහන් ලියන්නේ. ඒ නිසාමයි මේ සටහන් පින්වත් ඔබට අර්ථවත් යැයි හැඟුනා නම් අර්ථවත් වූයේ. සුන්දර යැයි හැඟුනා නම් සුන්දර වුයේ.

මේවා හේතු ඵල ධර්මයන්. අම්මාගේ ජීවිතය දුකෙන් හීන කොට ජීවත් කිරීම තුළින්, ලබාගත් ජීවිතයේ සුන්දර අසිරියයි, භික්ෂුව මේ මොහොතේ අත්විඳින්නේ. භික්ෂුව අතීතයේදී අම්මා නැමැති කුසල් ඉල්ලම සුවසේ ගරා ගත්තේ සක්දෙව් සැප. සක්විති රජ සැප, බලාපොරොත්තුවෙන් නොවේ. තවත් මේ භවයේ මව්කුසක ප්‍රතිසන්ධිය එපාය කියන බලාපොරොත්තුවෙන්මයි. අම්මා කියන්නේ මෙවැනි දුකක් නම්, තවත් එවැනි අම්මා කෙනෙක් එපාය කියන බලාපොරොත්තුවෙන්. අම්මා තුළින්මයි අම්මා කවුද යන්න ධර්මානුකූලව විනිවිද දකින්න පුළුවන් වුනේ. 'අම්මා' කියන රූපය, ගුණය කෙරෙහි ඇතිකොටගත් ආශ්වාදය හේතුවෙන් මතුවුනා වු, ආදීනවය දෑසින් දකිමින්ය, දෑතින් ස්පර්ශ කරමින්ය, අම්මා ගැන නිස්සරණ සිතිවිලි සකස් කොට ගත්තේ. අම්මාගේ ජීවිතය කමටහනක් කරගත්තා වගේම, ඇයට මතක්කොට දුන්නේ, 'අම්මෙ, ඔය ඇස අනිත්‍යයයි' කියලා, 'අතීතයේ ඔයාට තිබුණ ලස්සන සුන්දර රූපය වැහැරිලා, රෝගී වෙලා, අසරණ වෙලා....' කියන කාරණයයි. අනිත්‍ය සංඥාවන් වැඩෙන දිශාවටයි සියල්ල කියා දුන්නේ. ඇය බොහොම සාවධානව අසාගෙන සිටියා. දරුවෙක් වශයෙන්, මවක් පෙවූ කිරිවල වටිනාකම ගෙවා හමාර කළා, අම්මා ජීවත්ව සිටියදීම. මවට තිබු ණයකාරීත්වයෙන් මිදෙන කොට, අයෝමය ශක්තියක් ලෙසින් ජීවිතය තුළින් ධර්මය මෝදු වෙන්න පටන් ගත්තා. අම්මා කියන අර්ථයට මොන තරම් දෙයක් කරන්න පුළුවන්ද? මේ ජීවිතයේ දී ඔබේ සතුට ඔබේ අම්මා තාත්තා උදෙසා කැප කරන්න. ඔවුන් සතුටු වෙනවා දකිමින් ඔබ ජීවත් වෙන්න. මගේ අම්මා රෝගී භාවය නිසා කනස්සල්ලෙන් වේදනාවෙන් පසුවෙන වේලාවන්හිදී මම කළේ පොඩි දරුවකු ලෙසින් ඇගේ පියයුරුවලින් කිරි උරා බීමයි. ඔබට එකපාරටම මේ දෙය අදහගන්නට, සිතාගන්නට බැරිවේවි. ඒත් එහෙම කිරීමට හේතුව ඇයි කියා කියන්නම්.

ඒ පියවුරු වල කිරි තිබුණේ නැහැ. ඒවා වැහැරිලා, වයෝවෘධ වෙලා, අසරණ වෙලා තිබුණා. ඒත් මට අපුලක් දැනුනේ නැහැ. ඇය පුරා

හත් වසරක් අංශභාගය රෝගයෙන් පෙළෙමින් සිටියා. ඇයට වචන කතාකිරීමට, ඇවිදීමට පුළුවන් කමක් තිබුණේ නැහැ. ඒත් ඇය නිහඬව, ඇයගේ ජීවිතය අනිත්‍යභාවයට පත්කරවමින්, මට අනිත්‍යයේ අර්ථය, ඇගේ ජීවිතය තුළින්ම කියා දුන්නා. මෙවන් ගුණයක් හඬනවා දකින්න, දෑස්වල කඳුළු තිබෙනවා දකින්න මම කැමැති වුනේ නැහැ. මට අවශ්‍ය වුනේ ඇයව හිනස්සන්නයි. ඒකයි මට අවුරුදු 40 වයසේ දී මම ඇයගේ පියයුරුවලින් කිරි උරාබොමින් ඇයව හිනැස්සුවේ. මම පොඩි දරුවකු බවට පත්වෙමින්, තවමත් සිටින්නේ එදා ඈ වටා කිරි සුවඳට දූවටුණු පුංචි පුතුම බව දැනෙන්නට සලස්වමින් ඇයව සතුටට පත්කළා. පුංචි වයසේදී මා ඇගෙන් ඈත් නොවී ඈ ළඟම රැඳුනේ යම්සේද, දැනුත් ඇගෙන් ඈත්ව නැති බව, ඇයව ඈත් කර නොමැති බව මම ඇයට හැඟෙන්න සැලැස්වුවේ එහෙමයි. අම්මා දරුවකුගේ හැසිරීමෙන් තුටුවන්නේ කොහොමද කියන ඉව මට තිබුණා. අම්මාව සතුටට පත්කළා වූ, ඇයට දෝමනස්ස සහගත සිතක් නැගෙනු වෙනුවට ඇයව සිනහගැන් වූ කුසලයයි මා මේ මොහොතේ සතුටින් ගෙවන්නේ.

අම්මාගේ කඳුළක මහා වටිනාකමක් තිබෙනවා. අම්මාගෙන් බිව් කිරි උගුරක යම් සේ මනුෂ්‍යත්වයක් කැටි වී තිබුණාද, අම්මාගේ කඳුළුත් මනුෂ්‍යත්වයෙන්මයි ඉපැදිලා තියෙන්නෙ. අම්මා කෙනෙක් හඬනවා කියන්නේ, මනුෂ්‍යත්වය හඬනවා කියන කාරණයයි. ඒ නිසා අම්මාගේ දෑස්වලට කඳුළක් උනන්න මම ඉඩදුන්නේ නැහැ, කවදාවත් දන්නා තරමින්. මට මතකයි අම්මා මියයාමට අවුරුදු හතකට පෙරාතුව දිනයක, රාත්‍රී රෝහලේ දැඩි සත්කාර ඒකකයේ වෛද්‍ය මහත්වරුන් ප්‍රකාශ කළා, 'රෝගියාගේ හෘද ස්පන්දනය ඉතා දුර්වලයි. තව මොහොතකින් අම්මා මියයයි. ඒ නිසා අනෙක් දරුවන්ට අවශ්‍ය නම් බලලා යන්න කියන්න' කියලා. මට මතකයි, එදා මුළු රාත්‍රියම දැඩි සත්කාර ඒකකයේ ආලින්දයේ පුටුවක් මත වාඩිවී මම සත්‍ය ක්‍රියාවක් සිදුකළා. සංසාරයේ මෙතෙක් පැමිණි ගමනේ දී මා කළාවූ කුසල්වල බලයෙන්, මේ ජීවිතයේ දී මා සිදුකර ගන්නා වූ කුසල්වල බලයෙන්, මා අනාගතයේ දී කිරීමට බලාපොරොත්තු වෙන්නා වූ කුසල්වල බලයෙන්, අම්මාට ජීවිතය ලැබේවා කියලා. 'ඒ කුසල් කිසිවක් මට එපා, ඒවා අම්මාටම අයිති වේවා' කියලා. වෙන කරන්න දෙයක්, කියන්න දෙයක් තිබුණේ නැහැ. දැඩි සත්කාර ඒකකයේ මවට සවිකර තිබූ හෘද ස්පන්දන යන්ත්‍රය දැඩි අක්‍රමවත් ආකාරයකටයි සටහන් නිකුත්

කළේ. මරණය පෙනි පෙනී අම්මාට ජීවිතය ලැබුණා. නමුත් අංශභාග රෝගියෙක් හැටියට. දරුවෙක් හැටියට සත්‍ය ක්‍රියා කළ නිසා නොවේ, ඇයට ජීවිතය ලැබුණේ. එය ඇයගේ සංස්කාරවල ස්වභාවයයි. එම දෙය එහෙම වෙන්න තිබුණා. මන්ද, මගේ කුසල් සංස්කාරවල බලවත් භාවය නිසා. එදා පටන් වසර හතක් පමණ ඇය මට කමටහනක් වුනා, වර්තමානයේ භික්ෂුව සිටින තැනට එන්න. මට හැම වේලාවකම දකින්න දක්ෂභාවය තිබුණා, අම්මා ලෙඩවුනේ මා උදෙසාමයි කියලා. මොකද, අම්මා නිරෝගීව ගත කළ වසර හැට හතරේදීම. ඇගෙන් මම ඉගෙන ගත්තේ ලෝකය ගැන, ජීවිතය ගැන පමණයි. එහෙත් අම්මා රෝගීව සිටි හත් වසර තුළ මම ඇයගෙන් ඉගෙන ගත්තේ, ධර්මය ගැන. අනිත්‍ය ගැන. මේ කාරණය සටහන් කිරීම තුළින් භික්ෂුව පින්වතුන් හට කියන්න උත්සාහ කරන්නේ, ජීවිතය ඉදිරියට පැමිණෙන හොඳ නරක දෙකම සම සිතින් පිළිගෙන. ඒවා නිසා පැමිණෙන අභියෝග ජයග්‍රහණය උදෙසාම යොමුකරන්න, දක්ෂ වෙන්න කියලයි.

අම්මා සතුටින් තියලා අම්මා සිනහවෙන කොට, ඒ සිනහව මම දැක්කේ මල් වැස්සක් වාගේ. ඒ මල් වැස්සට මගේ සිතිවිලි තෙමෙද්දී, පුදුමාකාර මනුෂ්‍යත්වයකින් මගේ ජීවිතය පිරුණා. ඒ මනුෂ්‍යත්වය පුරවාගත් සිතින් ලෝකය දෙස බලනකොට, මම ලෝකයාව දැක්කේ දැඩි අසරණ භාවයකින්. මේ අසරණභාවය මා තුළ දැඩි බියක් ඇතිකළා. ඒ බිය තමයි ගිහි ජීවිතයෙන් මාව දුරස් කළේ. ලෝකයෙන් ඈත් කළේ. මම සරණක් සොයා යාමට පෙළඹ වූයේ, මගේ ධර්ම ගමනට ආශිර්වාදයක් වූයේ අම්මාගේ මුවින් නික්මුණු ඒ මල් වැස්සමයි,

අම්මාට මා ආදරය කරුණාව දක්වූයේ අම්මා නැමැති අර්ථය කෙරෙහි ඇති බැඳීමකින් උපාදානයකින් නොව, 'අම්මා' කියන අර්ථය කෙරෙහි ඇති මගේ තෘෂ්ණාව ක්ෂය කර ගැනීම පිණිසමයි, ලාභ සත්කාරවලින් තොරව ඒ ඉල්ලම ගරා ගත්තේ. අම්මාගේ කය දෙස අනිත්‍ය සංඥාවෙන් බැලුවා, එම කය වේගයෙන් ජරා, ව්‍යාධිවලට පත්ව අවසානයක් කරා ගියේ නැහැ. මන්ද, ඇයගේ අකුසල් සංස්කාරවල විපාක ගෙවීමට කාලය ලබාදීමට. අම්මා නැමැති අර්ථයද. දරුවා නැමැති අර්ථයද. අපිව ලෝකයට බැඳ තබන මහා කාම වස්තුවක් බවට වන අවබෝධයත්, අවබෝධයෙන්ම ඉන්

කලකිරෙන මාර්ගයත් අම්මා තුළ සැඟවී තිබිණ. අම්මා යන අර්ථය දරුවාටද, දරුවා යන අර්ථය අම්මාටද, දුකක්ම බව අම්මා තුළින්මයි දැක්කෙ. ඇය තුළින් මා දැක්කේ ජීවත්වීමට ඇති ආසාව නොව, ජීවිතයෙන් මිදෙන්න ඇති කැමැත්තයි. රෝගී අම්මා තුළ සැඟවී තිබී, උපස්ථානය නිසාම මට එය හමුවිය. එය මව්පිය උපස්ථානයේ අග්‍රම ඵලයයි. අම්මාගේ ඇතිවීමත් අම්මාගේ නැතිවීමත්, තෘෂ්ණාව නිසාම හටගෙන, තෘෂ්ණාව ක්ෂය කර ගැනීමේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළින්ම දැකගත්තා. අම්මා කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙන ස්වභාවය අම්මා තුළින්ම දැකගත්තා.

තම දෙමාපියන්ට බ්‍රහ්මයින්ට මෙන් උපස්ථාන කරන දරුවෝ සමාජයේ අප්‍රමාණව සිටින බව අප දැක තිබෙනවා. ඒ වාගේම දරුවන් දෙමාපියන්ට උපස්ථාන කිරීමෙන් හුදු පින පමණක් බලාපොරොත්තු නොවී, ධර්මයේ ලෝකෝත්තර සුවයට අවශ්‍ය ප්‍රඥාව, දෙමාපියන්ගේ රෝගී වයෝවෘද්ධ අසරණ ජීවිත විනිවිද දකිමින්, ඒ දැක්ම තුළින්ම සකස් කොට ගන්න.

සතර සතිපට්ඨාන ධර්මයේ බොහෝම හොඳින් වැඩෙන තෝතැන්නක්, වයෝවෘධ දෙමාපියන්ගේ ජීවිත. දෙමාපියන්ට අනිත්‍ය සංඥාව කියාදෙනවා වාගේම, පින්වත් ඔබත් ඒ අවබෝධය හෙමින් සීරුවේ ලබාගන්න. මේ පැමිණි භව ගමනේ දී, පින්වතුන් අම්මලා වෙනුවෙන් හෙලූ කඳුළු, මහා සාගරයේ ජලයට වැඩියි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඔබ අතීතයේ අම්මලා ලක්ෂ ගණනකට උපස්ථාන කොට ඇති, ඒත් ඒවා හුදු ගෙවීයන සංස්කාර පමණක්මයි. තමන් අනිත්‍ය වන සංස්කාර රැස්කරන ගමන්, සංස්කාරයන්ගේ අනිත්‍ය බව දකිමින්ම දුකෙන් මිදෙන මාර්ගයට අවතීර්ණ වෙන්න.

ඒ වාගේමයි දෙමාපියනුත් දරුවන් සමග කටයුතු කිරීමේ දී බොහෝම පරිස්සම් වෙන්න අවශ්‍යයයි. සෑම වේලාවේම අම්මා තාත්තා, සිතන්න ඕන, දෙමාපියන් නිසා දරුවන්ට අකුසල් සිද්ධ වෙනවාය කියන කාරණය. නිකං අකුසල් නොවේ. ආනන්තරිය පාපකර්මය සිදුවෙන්න පුළුවන්. වර්තමානයේ දරුවන් දෙමාපියන්ගෙන් දේපළ ලියා ගත්තාට පසුව ඒ අය දෙමාපියන්ට නොසැළකීම නිසා, දරුවන්ට එරෙහිව නීතිය ඉදිරියට යන දෙමාපියන් ඉන්නවා, දේවාල ගානේ පොල් ගසන දෙමාපියන් ඉන්නවා. දරුවන්ගේ තැනට දෙමාපියන්

වැටෙන්න හොඳ නැහැ. දෙමාපියන්ට දරුවන්ගෙන් වැරැද්දක් වෙනවා නම්, එය නිවැරදි කිරීමට බැරිනම්, එය ඔබගේ අකුසල් සංස්කාර විපාක දෙනවාය කියලා සිතන ගමන්ම, දරුවන්ට හොඳින් කරුණු දක්වන්න උත්සාහ ගන්න. ඔබේ ලෙයින් උපන්, ඔබේ රුධිරය කිරිකර පෙවූ ඔබේ දරුවා, තව තව දෙමාපියන් සමග ගැටෙන ස්වභාවයට යන්න දෙන්න එපා. පින්වත් දෙමාපියන් දරුවන් සමග ගැටෙනවා කියන්නේ, දරුවන් නිරයට යොමුකිරීමට පාර කපනවාය කියන කාරණයයි. දරුවා ඔබට වරදක් කළත්, දරුවාගේ සැපය උදෙසා, ඔබ අහක බලාගෙන ඉන්න. කියලා නිවැරදි කරන්නට බැරිනම්, දරුවාගෙන් ඈත්වී ජීවත් වෙන්න.

ගුණවත් අම්මා තාත්තා කියන්නේ ගින්දරක්. ධර්මය නොදත් දරුවෝ මෙය ගින්දරක් බව නොදන, දෙමාපියන්ට එරෙහිව සිතන සෑම සිතිවිල්ලකින්ම ජීවිතය පුච්චා ගන්නවා. ඒවායේ බරපතල බව, මතු භවයන්හි දී, විපාක පිණිස පැමිණේවි. මේ විෂම දුශ්සීල සමාජ වටපිටාව නිසා නොමඟ ගිය ඔබේ දරුවා, දෙමාපියන් සමග ගැටෙන දිශාවට යොමු නොකරගෙන, දරුවන් කෙරෙහි අනුකම්පාවෙන් කටයුතු කරන්න. සමහර දරුවො සිටිනවා, උපදින කොටම අම්මා මිය යනවා. ඉපැදිලා අවුරුද්දකින් හෝ දෙකකින් අම්මා තාත්තා මිය යනවා. අම්මාගේ තාත්තාගේ උණුසුම ලබන්න පින නැහැ. අනාථ ළමා නිවසක ආදරය නොලබා ජීවත් වෙනවා. සමහර දරුවන් ඉපැදුන දිනයේම දෙමාපියන් මහ මඟ දමා යනවා. තිරිසන් සතුන් දිහා බැලුවොත්, ගොවිපොළ කුකුලු පැටවෙක් බිත්තරයෙන් එළියට එන්නෙම මව් කිකිළිය නැතිව, කෘත්‍රිම විදුලි ආලෝකයේ උණුසුමෙන්. තිරිසන් ලෝකයේ ඉපැදුනත් අම්මා කෙනෙකුගේ සෙනෙහස ආදරය රැකවරණය ලබන්න පින නැහැ. මේ පෙර ජීවිතවල දෙමාපියන්ට නොසලකපු දරුවෝ, දෙමාපියන්ගේ සිත රිදවපු දරුවෝ. සංස්කාරයන්ගේ සාධාරණත්වය මොන තරම් යුක්ති සහගතද? මේ කාමුක අමිහිරි ලෝක ස්වභාවය දැකලා, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ජීවිතය තුළින් වඩවා ගන්න. පංච සීලය ඔබේ දරුවා යැයි සිතා ආරක්ෂා කරගන්න. සීලය නැමැති දරුවා ඔබ කවදාවත් දුකට පත්කරන්නේ නැහැ. ඔබට බැරි අවස්ථාවක උපස්ථාන නොකර ඉන්නේ නැහැ. ජීවත් වන විටත්, මැරෙන මොහොතෙත්, මරණින් පසුවත්, ඔබට යහපත පිණිසමයි හේතු වෙන්නෙ. සීලය නැමැති උතුම් දරුවා, පින්වත් ඔබට ලෝක ස්වභාවයේ රුදුරු බව

දැකීමට අවශ්‍ය සමාධිමත් සිතක්, සකස්කොට දේවි. ඒ සමාධිමත් සිත තුළ සකස්වන්නා වූ විදර්ශනා දැක්ම, ඔබ තුළ අම්මා, තාත්තා, දුව, පුතා, කියන්නේ දුකටම අයිති දෙයක් බව පසක් කොට දේවි. මේවායේ නිස්සරණය තුළමයි සැනසිල්ල ලැබෙන්නෙ. අම්මා තාත්තා කියන සාධකය තුළ ලෝකෝත්තර සැපය ලැබීමට ඇති මාර්ගයත්, ශක්‍රයා වීමට ඇති මාර්ගයත්, අවීචි මහා නිරයට වැටීමටත් ඇති මාර්ගයත්, සැඟවී තිබෙනවා. පින්වත් දරුවන් දක්ෂ විය යුතුයි නුවණින් සුගතියට යන මාර්ගයම, දෙමාපියන් තුළින් පාදා ගැනීමට. දෙමාපියන් තුළින් දරුවන් සුගතියට යන මාර්ගය පාදාගත හොත්, එය දෙමාපියන්ටද සුගතියට යාමට මාර්ගයක් වෙනවා. එසේ නොවී එක පාර්ශවයක් ගැටෙන දිශාවට ගියොත්, ඉල්ලීම් ඉල්ලන දිශාවට ගියොත්, එය දෙගොල්ලන්ටම විනාශයක් වෙනවා. මේ අවදානමෙන් මිදෙන මාර්ගය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙනෙක් පමණයි කියලා දෙන්නේ, ආදරය කරලාවත්, ද්වේෂ කරලාවත්, ඔබට මේ අවදානමෙන් මිදෙන්න බැහැ කියලා ආදරයෙන්, ද්වේෂයෙන් මිදෙන මොහොතයි, නිස්සරණයේ මිදීම කියන්නෙ. එස්සය නිරෝධයෙනුයි විඳීම් නැති වෙන්නේ. පින්වත් ඔබට වැටහේවි ගොඩනැගීමටත්, බිඳදැමීමටත් නොව මිදීමමයි සැනසිල්ලට හේතු වෙන්නෙ කියලා. නෙතු අගින් කඳුළක් රූටා වැටෙද්දී ඒ කඳුළ හරි උණුසුම්. කඳුළ උණුසුම් කරන්නේ තෘෂ්ණාව විසින්. සිත වේගවත් වන තරමට, කඳුළු උණුසුම් වෙනවා. කෙනෙකුගේ ඇසෙන් කඳුළක් රූරා වැටෙද්දී, ඔහු විඳින දුක හෝ සැපයක් පිළිබඳව හෝඩුවාවක් බාහිරට පෙනෙනවා. නමුත් දුකක් හෝ සැපක් වුවත්, කඳුළු නොහෙලා සිටීමට අම්මා කෙනෙකුට පුලුවන්. අම්මාට ඒ තරම් දරා ගැනීමේ ශක්තියක් තිබෙනවා. ඒ නිසා අම්මා තේරුම් ගැනීම අපහසුයි. ඒ තේරුම් ගැනීම අපහසු වෙන තරමටම, අපි අතින් අකුසල් සිදුවෙන්නට පුළුවන්. අම්මාගේ දෙනෙතින් ගලන්නේ කඳුළු නොව ආදරයයි. ලෝකය ශක්තිමත් කරන, ලෝකයේ යථාර්ථය වසා දමන ආදරයයි. නිමාවක් නොවන භව ගමනේ, මග වියදම අම්මාගේ ආදරයයි.

# සමාධියෙන් දුටු අකුසල් කන්දක්

ආරණ්‍ය වාසී භික්ෂුවක් සවස දෙකට පමණ සාමාධියෙන් පසුවෙන කොට සද්ධන්ත අමනුෂ්‍යයෙක් දර්ශනය විය. මේ අමනුෂ්‍යයා භික්ෂුවට දර්ශනය වූයේ ඔහුගේ ඉගටියෙන් පහළ කොටස පමණි. ඒ කියන්නේ කකුල් දෙක පමණකි. කකුල් දෙකේ උස අඩි විස්සක් පමණ ඇති. කකුල් දෙක ශක්තිමත් මිනිසකුගේ කකුල්වල ස්වභාවයෙන් යුත් අතර ඇල්ශේෂන් බල්ලෙකුගේ ඇගේ ඇති දිග රෝමයන් සේ දෑඩි කලු පැහැති රෝමවලින් කකුල්දෙක පිරී තිබිණි. මහා බියකරු රූපයකි. මෙම අමනුෂ්‍යයාගේ ඉගටියෙන් ඉහළ කොටස දර්ශනය නොවුයේ ඇයිද යන්න භික්ෂුව නොදනී. මෙවැනි අතිශය බියකරු අමනුෂ්‍යයින් අකුසල් කඳු වගේය. අතීතයේ කරන ලද පාපකර්මවල බලවත් බව නිසා මොහුට මේ බියකරුබව, සද්ධන්ත බව ලැබී ඇත. මොහු නැවත නැවත කරන ලද අකුසල හේතුවෙන් මෙම බියකරු බව සද්දන්ත බව වැඩිවනු ඇතැයි භික්ෂුව අනුමාන කරයි.

මොවුන් මේ ආරණ්‍ය බිම්වල කරක් ගසමින් ආරණ්‍යයත් එහි වැඩ සිටින භික්ෂූන්වත් පීඩනයට පත්කිරීම, විකෘති මනෝභාවයන් ඇතිකිරීම, ධර්ම ශක්තියෙන් හීන භික්ෂූන්, කැප කරුවන් ග්‍රහණයට ගැනීමෙන් ඔවුන් හරහා ආරණ්‍යය අපිරිසිදු අවුල් සහගත ස්වභාවයන්ට පත්කිරීම මෙම අමනුෂ්‍යයින්ගේ කැමැත්තය. මෙම අමනුෂ්‍යයාගේ දේහ විලාශය දැක්කහම මොහුගෙන් ගැලවීමට ශක්තිමත් සීලයකින් හික්මීම ඇතිකරගත් භික්ෂුවකට මිස ඉන් පහළ අයෙකුට නම් නොහැකිය. මෙවැනි විෂම බලවේගවල බලපෑම නිසා එක්කෝ ලෙඩ රෝග, මානසික දුර්වලතා, කලකිරීම්, චංචල මනෝභාවයන් නිසා ගැටීම්, අපිරිසිදුකම වැනි මේවා සිදුවීම පුදුමයක්

නොවේ. පුදුමය වන්නේ මෙසේ සිදු නොවුනා නම්ය. මොකද මේ නිරිසතා එතරම්ම තිරශ්චීනය. බියකරුය. මේ මිථ්‍යාදෘෂ්ඨික බලවේග ශාසනය රැකෙනවාට විරුද්ධය. වර්තමානයේ ශාසනයේ ඇති සංසරත්නයේ අඩුව නිසා සුදුසු නුසුදුසු පිරිසද මහණ, පැවිදි වෙයි. පැවිද්දට සුදුසු පින්වත් පිරිසද පැවිදිවීමෙන් පසුව අතහැරීම පසෙක තබා රැස් කිරීමට පෙළඹේ. සීල, සමාධි, භික්ෂු දැනුම, මාන්නය වපුරාගනී. මේවා මේ විෂම බලවේග වලට මහා ශක්තියකි. මෙම විෂම බලවේග ආරණ්‍යම ඉලක්ක කරගන්නේ සැබෑ සම්බුද්ධ ප්‍රතිපදාව මරා දැමීමටය.

මෙම සටහන තැබුවේ ඔබට නොපෙනෙන ලෝකයේ බියකරු ජීවිතයක ස්වභාවය දැන ගැනීමටය. ඒ තුළින් ඔබට පාඩමක් ඉගෙන ගැනීමටය. මේ සද්ධන්ත අමනුෂ්‍යයා කවදාහරි දවසක ඔබ සේම මිනිසෙකු ලෙස මනුලොව ජීවත් වූවෙකි. එම ජීවිතයේ දී වැඩූ අකුසල් නිසා මෙම ආත්මය ලැබී ඇත. මෙම ආත්මය තුළදීම මොහු රැස්කරන්නේ බියකරු අකුසල්මය. මොහු කුසල් හඳුනන්නේ නැත. මේ ආකාරයෙන් භික්ෂූන්ව දුකට පීඩනයට හෙළීමෙන්, සංඝභේද ඇති කිරීමට පරිසරය සකස් කිරීමෙන් මොහු අතින් ආනන්තරීය පාපකර්මයද සිදුවිය හැකිය. දැන් හිතන්න මෙම අමනුෂ්‍යයාට සංසාරය මොන තරම් දුර වෙයිද? විෂම වෙයිද? කියලා. ඒ වගේම මෙවැනි අසරණයින්ට අනුකම්පා කරලා මෙය කියවලා පින්වත් භික්ෂුන් වහන්සේලාද අවබෝධකර ගන්න ඕනේ භික්ෂූත්වය තුළ සීල, සමාධි, දැනුම මාන්නයෙන් තොරව සැබෑ අතහැරීමේ භික්ෂු ප්‍රතිපදාව තුළ හික්මෙන්න. එසේ නොවුනහොත් එක පැත්තකින් එම බිහිසුණු අමනුෂ්‍ය බලවේගවලට තව තවත් අකුසල් රැස්කර ගැනීමට අවස්ථාව ලබාදෙන අතර ඔබද දුර්වල පින්වත් භික්ෂුවක් ලෙස කවදාහරි දවසක මේ බියකරු අමනුෂ්‍යයාගේ පිරිවර සමාජිකයෙක් වීමට ද ඉඩකඩ නැතිවා නොවේය යන්න ඔබ සිහිකළ යුතුය.

ඔබේ කුටිය අවට පරිසරය, ආරණ්‍ය පරිසරය, චීවරය, අඳනය, ශරීරය, වැසිකිළිය, නියපොතු ටික පවා පිරිසිදුව තබා ගන්න. අවුල් වෙන්න දෙන්න එපා. පරණ වූ දෙය, නරක් වූ දෙය, අනවශ්‍ය දෙය

රැස්කොට තබන්න එපා. විනාශකර දමන්න. අපිරිසිදු සතුන් ඇති කිරීමෙන් වළකින්න. බුදු පහන, බුදු කුටිය අපිරිසිදු වෙන්න දෙන්න එපා. අඳුරු වෙන්න දෙන්න එපා. මේවා අපිරිසිදුයි කියන්නේ සිත අපිරිසිදු නිසාය. සැබෑ ලෙස අන්තවාදී නොවී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ සුන්දර භික්ෂුවක් වීමට අවශ්‍ය ගුණධර්ම ඔබ තුළ ද වගාකරගෙන ඔබ සැනසෙනවා සේම විශම අමනුෂ්‍ය බලවේගවලටද උපකාර වී ඔවුන්ගේ අකුසල් වැඩි නොකිරීමට ඔබ දක්ෂවෙන්න. මේ ගමනේ දී නිවීමේ මග අවහිර කිරීමට මාර බලවේග, බියකරු අමනුෂ්‍ය බලවේග සිල්වත් වේශයෙන්ද, අසරණ වේශයෙන්ද, ගුරු ගෝල වේශයෙන්ද, ඔහුගේ ගැලවුම් කරු වේශයෙන්ද ඔබ ඉදිරියට එනු ඇත. දැනුම පාණ්ඩිත්‍ය වේශයෙන්ද, ලාභ සත්කාර වේශයෙන්ද ඔබ ඉදිරියට එනු ඇත. මේවා නිවන් මග බාල කරන සියුම් ධර්මතාවයෝය. මෙම බලවේග කෙරෙහි නොඇලී පෙරට යාම සංකීර්ණය. මොකද ඉහත බලවේග පසුපස පෙර සදහන් කළ පරිදි සද්ධන්ත විෂම මිථ්‍යාදෘෂ්ඨික අමනුෂ්‍ය බලපෑම් දැඩි ලෙස තිබෙන නිසාය. මොන පැත්තෙන් බැලුවත් මාර බලවේග අපට දැල එලා ඇත. මෙසේ මාර බලවේගවලට ඔබ අසුවන්නේ තවමත් ඔබ මාර සිත් අනිත්‍ය වශයෙන් දැක අතහැරීමට අදක්ෂ නිසාය. මෙය සටහන් කරන භික්ෂුව මෙම සද්ධන්ත අමනුෂ්‍යයාගේ අඩ රුව දුටු මොහොතේදීම, එම සිත අතහැර දැමීය. දුටුවේ රූපයකි. එහි ස්වභාවය අනිත්‍යය. එපමණකින්ම එය අවසන්ය. ඔබට පාඩමක් ඉගෙන ගැනීමට පමණක් සිද්ධිය සටහන් තබන ලදි. මෙවැනි විශම, බියකරු, සද්ධන්ත අමනුෂ්‍යයින්ගෙන් ගහණ. නොපෙනෙන ලෝකයේ වියරු ස්වභාවය දැක, ඔබ අනුනට මෛත්‍රිය කරුණාව දැක්වීමට පෙර මුලින්ම තමන්ට කරුණාව දක්වන්න. සැබෑ පරාර්ථය උදෙසා වර්තමානයේ ඔබ ආත්මාර්ථකමී වෙන්න. ඔබ මෙහිදී අත්මාර්ථකාමී විය යුත්තේ කළ්‍යාණ මිත්‍රයෙකු ගුරුවරයෙකුගේ උපදෙස් මත මිස අවිචාරයෙන් නොවේ. මොකද මාර බලවේග ඔබේ ආත්මාර්ථකාමී බවද තවත් ඇලීමකට ගැටීමකටද යොමුකොට ඔබව අසරණ කරන නිසාය. ඉහත ස්වභාවයන් ඔබ නිවන් මග වැඩීමේදී අවබෝධ නොකර ගතහොත් ඔබද, ඔහුද නැවත නැවතත් ඉපදෙනු, මැරෙනු ඇත.

# ගස් නගින දෙවියකු වී කුමට?

භික්ෂුවට පසුගිය කාලවකවානුවේ දී අවස්ථා කිහිපයකදීම පින්වතුන් තම නිවසේ, විහාරස්ථානයේ පැවති පින්කම්වල දී ලබාගත් ඡයාරූපවල දිව්‍ය ආලෝකයන් තිබෙන බව ප්‍රකාශ කළා. එම ඡයාරූප ගෙනත් පෙන්වුවා. ඇත්තටම ඒවා දිව්‍ය ආලෝකද කියන්න භික්ෂුව දන්නෙ නැහැ. යම් පින්වතෙක් එම ආලෝක නියත වශයෙන්ම දිව්‍ය ආලෝකයක්ය කියලා හිතලා ඒ තුළින් සතුටට පත්වෙනවා නම් තව තව පින්කම් කරගැනීමට, සිදුකර ගැනීමට යොමුවෙනවා නම් තෙරුවන් කෙරෙහි වඩ වඩාත් ශ්‍රද්ධාව ඇතිකරගන්නවා නම් නියත වශයෙන්ම ඒවා දිව්‍ය ආලෝකයන්යැයි සිතුවට කමක් නැහැ.

දායක ගෙදරක පසුගිය වසරක කඨින පින්කමක් තිබුනා. එදා දවස එම ගෙදර බුදුමැඳුරක් වගේ. කඨින වස්ත්‍රය සෙසු පූජාද්‍රව්‍ය සමග බොහෝම ලස්සනට තැන්පත් කරලා බොහෝම ශ්‍රද්ධාවෙන් පින්කම සංවිධානය කරලා තිබෙන්නේ. එදා රාත්‍රියේ කඨින පෙරහැර පටන් ගැනීමට පෙර ස්වාමීන් වහන්සේලා එම නිවසට වැඩම කරලා පිරිත් සජ්ඣායනයක් පවත්වලා තිබෙනවා. මේ අවස්ථාවේ ගන්න සෑම ඡයාරූපයකම දිව්‍ය ආලෝකයන් තිබෙන බවත් එම දායක පිරිස ප්‍රකාශ කළා. මේ දිව්‍ය ආලෝකය දෙස බැලුවහම පින්වතුනට ඉගෙන ගන්න වටිනා පාඩමක් තිබෙනවා. එම පාඩම පින්වතුන්ලාට ගොඩාක් වටින නිසා මෙහි සටහන් තබනවා. අපි පන්සලක් උදාහරණයට ගතහොත් පන්සලට අයත් සතර පේරුවක් තිබෙනවා. මේ සතර පේරුවේ දායක පිරිස්වල සිව්පසයෙන් තමයි පන්සල පෝෂණය වෙන්නේ. සතර පේරුවේ වයෝවෘද්ධ උපාසක මෑණිවරු පියවරු බොහෝ වේලාවට පන්සල උපාදානය කරගෙන තමයි ජීවත් වෙන්නේ. ඒ අයගේ ජීවිතයම

පන්සල තමයි. පසළොස්වක පෝය දවසට සිල් සමාදන් වෙන්න යනවා. නිරතුරුවම පින්කම් සිදු කරනවා. සෑම දවසකම සවසට බෝධිපූජාවට පන්සලට යනවා. පන්සල ජීවිතයෙන් කොටසක් වෙලා. ඉහත සඳහන් ආකාරයට පන්සල සමග දැඩි උපාදානයක් සකස්කරගත් පින්වතුන්ලා මියයන මොහොතේ තමන් ජීවිතයෙන් කොටසක් බවට පත්කර ගත් පන්සල කෙරෙහි ඡන්ද රාගයක් සකස්වීම නිසා එම පන්සල් භූමියේම අල්පේශාඛ්‍ය දිව්‍ය ස්වභාවයන් බවට පත්වෙලා පන්සල් වත්තේ කිරි ගසක් උපාදානය කරගෙන ජීවත් වෙනවා. නුග ගසක, බෙලි ගසක, රුක්අත්තන ගසක, බුදු මැදුරක ආලෝකවත් දෙවියෙක් දිව්‍යංගනාවක් වශයෙන් ජීවත් වෙනවා.

බලන්න ජීවිත කාලය තුළදීම පන්සල මගේ කරගෙන පින්කම් කරලා එම පිනෙන් අවසානයේදී ගසකට නැග ගත් දෙවියෙක් බවට පත්වෙනවා. පින්කම් කරල කරලා අවසානයේදී අපිට වෙන්නේ ආලෝකයක් විහිදාගෙන ගසට නැගලා ඉන්න නම් ඒක හරිම අවාසනාවක්. මේ අය ඉහත ආකාරයේ ආලෝකමත් දෙවියෙක් වෙලා පෙර ජීවිතයේ දී මනුෂ්‍යයෝ වශයෙන් පන්සලේ පින්කම් කරලා සතුටුවුණා වගේ දැන් අනුන් කරන පින්කම් දෙස බලලා සතුටු වෙනවා. කඨින පෙරහැරක් තිබෙන වෙලාවට මේ අයත් ඒ අවස්ථාවට එනවා. නිවසක පිරිත් පින්කමක් සිද්ධවෙන වෙලාවට මේ අයත් එම අවස්ථාවට එනවා. නිවසක පිරිත් පින්කමක් සාංඝික දානමය පින්කමක් තිබෙන අවස්ථාවල නිවස පිරිසිදුනම් එම දිව්‍ය ස්වභාවයෙන් එම පින්කම් අවස්ථාවට පැමිණිලා සතුටට පත් වෙනවා. පින්කම අහවර වුනහම නැවත පන්සල් වත්තේ කිරි ගහට යනවා. දැන් මේ දිව්‍ය ආලෝක වශයෙන් ඔබලාගේ පින්කම් පොළවලදී දකින්නේ කවුද? පිටස්තර කවුරුවත් නොවේ. ඔබේම පන්සලේ හැම කටයුත්තක දීම කැපවීමෙන් කටයුතු කළ මියගිය උපාසක උපාසිකාවන්මයි. ඔබලාගේ මියගිය වැඩිහිටි ඥාතීන්මයි. මේ දිව්‍ය ස්වභාවයන් මොන තරම් පින්කම් දැක සතුටුවුවත් මේ අයට මේ දිව්‍ය ස්වභාවයෙන් ඔබ්බට යන්න දියුණුවට පත්වෙන්න තිබෙන අවස්ථාව අඩුයි. මොකද මේ අය පන්සල උපාදානය කරගෙන ඉන්නේ. ඒ උපාදානය නිත්‍යවූ සැපයක් හැටියට ඒ අය අරගෙන තිබෙන්නේ. ඒ නිසා ආමිසය පැත්තම දකිමින් වඩමින්

සිටිනවා. ඇයි පෙර මනුෂ්‍ය ජීවිතයේ දී පන්සල මගේ කරගැනීම හේතුවෙන් ආමිසයෙන් ඔබ්බට නොගිය නිසා.

මෙහෙම දිව්‍ය ස්වභාවයෙන් පින්කම් දැකලා සතුටු වෙනවා වගේම පන්සලේ තමන් අකමැති දෙයක් සිද්ධ වෙනවා දකින කොට ගැටෙන ස්වභාවයට පත් වෙනවා. පෙර මනුෂ්‍ය ජීවිතයේ දී පන්සලේ එයා කැමතිකළ දෙයක්, ගොඩනගපු දෙයක් අයින් කරනවා නම්, වෙනස් කරනවා නම්, ගිහි පැවිදි යමෙක් ධර්ම විනයට පටහැනි යමක් කරනවා නම් මේ දිව්‍ය ස්වභාවයන් එම ක්‍රියාවන් දැකලා ගැටෙනවා, ක්‍රෝධ කරනවා, වෛර සිත් සකස් කර ගන්නවා. ඒ හේතුව නිසා එම අල්පේශාක්‍ය දිව්‍ය ස්වභාවයෙන් මිදිල යක්‍ෂ, ප්‍රේත වැනි ස්වභාවයන්ට වැටීමේ අවදානම තිබෙනවා. තමන් උපාදානය කරගෙන ජීවත්වෙන පන්සලේ තමන් අකමැති දේ සිද්ධ වෙනකොට වෛරය ක්‍රෝධය සකස් වෙනවා. බලන්න මොන තරම් අපරාධයක්ද කියලා තමන් කරපු පින්කම්වලින් රැස්කරගත් පින් අපතේ හරිනවා. මෙහෙම වෙන්නේ අදක්‍ෂභාවය නිසා. පින්කම් කරනවා වගේම ඒවා තුළින් රැස්වන කුසලය නිවැරදි ඉලක්කය කරා යොමු කරන්නත් ඔබ දක්‍ෂ වෙන්න ඕනේ. එහෙම නොවුනොත් පින්කම්කරලා අවසානයේදී පන්සලේ තිබෙන කිරි ගසකට නැගල ඉන්න තමයි අපිට සිද්ධ වෙන්නේ. හරියට පොල් ගස් නගින මනුෂ්‍යයෝ වගේ. හැබයි ඉතින් බැටරි කෑලි තුනක ටෝච් එළියක් වගේ ආලෝකයක් නම් තිබෙනවා. ඔය ආලෝකය වෙන්නත් පුළුවන් ඔබ ඔය පින්කම් කරන ස්ථානවලදී ගන්නා ඡායාරූපවල තිබෙන්නේ. කිසිම හේතුවක් නිසාවත් පින්වත් ඔබ ඔය ආලෝකයක් කෙරෙහි බැඳෙන්ට එපා. එවැනි දිව්‍ය ස්වභාවයක් කෙරෙහි ඡන්ද රාගය ඇතිකර ගන්න එපා. එහෙම කැමත්තක් ඔය වැනි ප්‍රාථමික දිව්‍ය ස්වභාවයන් කෙරෙහි ඔබ ඇතිකර ගතහොත් ඔබ සිදුකරගත් පින්කම් ඔබ විසින්ම අපතේ හැරියා වෙනවා.

මෙන්න මේ කාරණය තේරුම් ගත්ත ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බොහෝම වටිනා ධර්මයක් මහානාම ශාක්‍ය කුමරුට දේශනා කරනවා. මේ ධර්මය බොහෝම උපක්‍රමශීලී ධර්මයක්. මහානාම කුමාරයා

බුදුරජාණන් වහන්සේ හමුවට ඇවිත් 'ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස ගිහි ජීවිත ගත කරන අපි කුමන විහරණයකින් ගත කළ යුතුද කියලා ප්‍රශ්නයක් අසනවා.

එවිට භාග්‍යවතුන් වහන්සේ 'මහානාම ඔබ මේ විදිහට හික්මෙන්න. බුද්ධානුස්සතිය වඩන්න, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය වඩන්න. මහානාම ඔබ සීලානුස්සතිය වඩන්න, ත්‍යාගානුස්සතිය වඩන්න' කියලා දේශනා කරලා අවසානයේ පවසා සිටිනවා 'මහානාම ඔබ දේවතානුස්සතිය වඩන්න' කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ 'දෙවියෙක් වෙන්න ඔබ කැමති වෙන්න. දෙවියෙක් වෙන්න අවශ්‍ය ධර්මතාවයන් දැනගන්න. නිරතුරුවම තුසිතය, යාමය, නිම්මාණරතිය, තාවතිංසය, පරනිම්මිතය වැනි අප්‍රමාණ සැප ඇති දිව්‍යතල කෙරෙහි කැමත්ත ඇතිකර ගන්න. ඒවාට යන්න කැමති වෙන්න. ඒවායේ වැඩ සිටින දෙවියන් දිව්‍යාංගනාවන් විඳින අප්‍රමාණ සැප මනසින් දකින්න. එම සැපයට ඔබ ලොල් වෙන්න. මේ දිව්‍යතල කෙරෙහි උපාදානය සකස්කොට ගන්න'.... යනුවෙන්.

මේ ධර්මය ඔබට ඇසෙන කොට ඔබට සිතෙන්න පුළුවන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දිව්‍යතල වර්ණනා කරලා තිබෙනවා කියලා. මෙතන දිව්‍යතල වර්ණනා කිරීමක් නොවෙයි සිද්ධවෙන්නේ. බොහෝම උපක්‍රමශීලී ලෙස ඔබව සතර අපායෙන් එතෙර කරවීමේ ධර්මයකුයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මුලින්ම ඔබට දිව්‍යතල කෙරෙහි එම දිව්‍ය සැපයන් කෙරෙහි ඡන්ද රාගය තෘෂ්ණාව ඇති කරවනවා. එහෙම ඔබ තුළ දිව්‍යතල කෙරෙහි කැමත්ත ඇතිවුනාට පස්සේ ඔබ මොකද කරන්නේ. ඒ කැමත්ත උපාදානය කරගෙන ඔබ වැඩි වැඩියෙන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව වැඩිදියුණු කරගන්නවා. වැඩි වැඩියෙන් සිල් පද ආරක්ෂා කරගන්නවා. වැඩි වැඩියෙන් දන් දෙනවා. ඒවායේ ආනිසංසයන් දකිනවා. මේ ධර්මතාවයන් වැඩි වැඩියෙන් ඔබ වඩන්නේ ඇයි? ඉහත සශ්‍රික දිව්‍යතලයක සැපවිඳින්න. නමුත් පින්වතුනි ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, සීලය, දානය ඔබේ ජීවිතයෙන් වැඩි වශයෙන් වඩවා ගන්න කොට ඔබ නොදැනුවත්වම ඔබව සෝවාන් ඵලයට පත්වෙනවා. ඒ කියන්නේ සතර අපායෙන්

මිදුණ කෙනෙක් බවට පත්වෙලා ඔබ මාර්ගඵල ලාභී දෙවිකෙනෙක් වශයෙනුයි එම දිව්‍යතලවල උපත ලබන්නේ. දැන් ඔබට වැටහෙනවා ඔබට බුදුරජාණන් වහන්සේ දේවානුස්සතිය වඩන්නය කියලා කීවේ මෙන්න මේ ජයග්‍රාහි තැනට ඔබව ඔසවා තබන්න. එතකොට මේ දේවානුස්සතිය වඩන්න කියන්නේ පන්සලේ, ආරණ්‍යයේ ජීවත්වන ප්‍රාථමික අල්පේශාක්‍ය දෙවියෙක් වෙන්න ප්‍රාර්ථනා කරන්න නොවේ. සග්‍රික දිව්‍යතලවල මහේශාක්‍ය දෙවියෙක් දිව්‍යාංගනාවක් වෙන්න ප්‍රාර්ථනා කරන්න. පන්සලේ රුක් දෙවියෙක්, ආරක්ෂක දෙවියෙක් වෙන්න හිතන්නවත් එපා. ඒවා ප්‍රාථමික තත්ත්වයන්. පන්සල ඇසුරු කරගෙන අවශ්‍ය ගුණ ධර්මයන්, කුසල් ධර්මයන් වඩන්න. පන්සල තමයි කුසල් ධර්මයන් දියුණු කරගන්නා මධ්‍යස්ථානය. මොනම හේතුවක් නිසාවත් ඔබ පන්සලෙන් ඈත්වෙන්න එපා. පන්සලෙන් ඈත්වෙනවා කියන්නේ ඔබ සතර අපායෙන් මිදීමේ මාර්ගයෙන් දුරස් වෙනවා කියන එකයි. සතර අපායෙන් මිදීම සඳහා පින්වත් ඔබට අත්‍යවශ්‍ය කෙරෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, සීලය, දානය කියන සාධක ඔබ තුළින් වැඩෙන්නේ පන්සල ඇසුරින්.

මෙම කරුණු ගිහි ජීවිත ගතකරන පවුල් බැඳීම්වලට බැඳුන පින්වතුන් උදෙසායි සටහන් කළේ.

සමහර ගිහි පින්වතුන්ගේ ස්වභාවයක් තිබෙනවා අපි දැන් භාවනා කරන්නේ, සමාධිය වඩන්නේ.... ඒ නිසා පන්සල් යන්න ඕනේ නැහැය කියලා. මේ අධි තක්සේරුව නිසා තමා තමාටම වරදකුයි කරගන්නේ. පන්සලේ තිබෙන්නා වූ මොනයම්ම හෝ වරදක් නිසා ඔබ තුළ ගැටෙන සිතක් නම් තිබෙන්නේ, ඒ කියන්නේ ඔබ සීලයෙන් පරිපූර්ණ නැහැ. සීලයෙන් දුර්වලයි. ඔබ සීලයෙන් පරිපූර්ණ නම් අනුන්ගේ සීලය ගැන ගැටෙන්න යන්නේ නැහැ. ගැටෙන්න හොඳ නැහැ.

පසුගිය දවසක භික්ෂුවට ගිහි පින්වතෙක් මුණගැසුණා. ඔහු පන්සලේ ඇසුරට නොයන කෙනෙක්. ඔහු සිතාගෙන සිටිනවා තමන් මාර්ගඵල ලාභී පුද්ගලයෙක්ය කියලා. නමුත් ඔහු තුළින් එවැනි කිසිම ලක්ෂණයක්

විද්‍යාමාන වෙන්නේ නැහැ. ඔහුට තිබෙන්නේ පන්සල ගැන මෙවැනි මතයක්.

'පන්සලේ කරන්නේ ගොඩනැගිලි හදන එකයි. පින්කම් කරන එකයි. ආධාර එකතුකරන එකයි' කියලා. දැන් බලන්න තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණි කෙනෙක් අකමැතිවෙයිද සම්මා සම්බුද්ධ ශාසනයක් ඇතිවෙලා වසර 2600ක් වැනි කාලයක් ගෙවී ගිය මොහොතක භෞතික පැත්තෙන් හෝ පන්සල මේ ආකාරයෙන් හෝ දියුණුවක් ලබනවට. මේක මේ ජීවිතයේ දී නිවන් අවබෝධ කරගැනීමට යන මාර්ගය නොවේ. සතර අපායෙන් මිදීම කරා යන මාර්ගයයි. විහාරස්ථානයක ඉදිකෙරන සෑම විහාරාංගයක් පාසාම, සංවිධානය වන සෑම පින්කමක් පාසාම ඒවාට මොනතරම් පින්වතුන්ලා මුදලින් ශ්‍රමයෙන් දායක වෙලා දන්දීමේ ශක්තිය ඇතිකර ගන්නවාද. දන්දීම තුළින්මයි ඔබ තුළ තණ්හාව නැති වෙන්නේ. දන්දීමෙන් අපි කුමක්ද පුරුදු කරන්නේ. අතහැරීමයි. මේ ජීවිතයේ දී හෝ සසර කවදාහරි දවසක ඔබ මේ ඇස මගේ නොවේය කියලා අවබෝධයෙන් අතහරින්න ඕනේ. මේ කන, නාසය, දිව, මනස, කය මගේ නොවේය කියලා අවබෝධයෙන් අතහරින්න ඕනේ. ඇස නිසා සකස් වෙන්නා වූ වේදනාව, හඳුනාගැනීම, චේතනාව, විඤ්ඤාණය අනිත්‍යයි කියලා ඔබට අවබෝධයෙන් අතහැරෙන්න ඕනේ. අනිකුත් ආයතනයන් බාහිර රූපයන් සමග ඵස්සය වීමෙන් සකස්වන පංච උපාදානස්කන්ධයම අනිත්‍ය බව අවබෝධයෙන් දැන ඒවාට ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න ඕනේ. මේ අතහැරීම තමයි ඔබ දන්දීමෙන් පුරුදු කරන්නේ. දැන් ඔබ බලන්න සසර දුකින් එතෙරවීම සඳහා ගිහි පින්වතුන්ලාට දානය මොන තරම් වටිනවාද කියලා. ඒ නිසා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කිසිවෙකුට කියන්න පුළුවන්ද ශාසනයේ පැවැත්ම උදෙසා පරිත්‍යාග කරන එක රුපියලක්වත් අනවශ්‍ය දෙයක්ය කියලා. සෑදෙන එක ගොඩනැගිල්ලක්වත් අනවශ්‍ය ඉදිකිරීමක්ය කියලා.

ඔබ අනෙක් කෙනා ගැන හිතන්න යන්න එපා. ඔබ පරිත්‍යාග කරන දෙය පරිත්‍යාග කරන්න. පරිත්‍යාගය කරන්නා කුමක් කරනවාද යන්න ඔබ හොයන්න යන්න අවශ්‍ය නැහැ. ඔබ සැබැවින්ම යමක් දන්දුන්නා

නම් ඒ දන්දුන්න දේ ගැන සොයන්න යන්නේ නැහැ. මොකද එය දන් ඔබට අයිති නැති නිසා. ඔබ ඒ දෙය සහමුළින්ම අත්හැරිය නිසා. ඔබට දන් අයිති දන්දීම පමණක් මිස පසු විපරම් නොවන නිසා. ඔබ මේ අතහැරීමේ සැහැල්ලුව, සතුට භුක්ති විඳින්නේ නැතිව, ලැබුණ සැපයට පිටුපාලා, දන් දුන්න දෙයට වෙච්චි දෙය හොයන්න ගිහිල්ලා නැති අකුසලයක් රැස්කර ගන්නවා.

දන්දීම කළ යුත්තේ සමාජයේ යමක් ඇති පින්වතුන්ලා පමණක් නොවේ. අද සශ්‍රික භාවයක් ඇතිව යමෙක් ජීවත් වෙන්නේ, සසර තමන් දුන් දානයේ කුසල් ආනිසංස නිසා. සමාජයේ සශ්‍රීක පින්වතුන්ලා වගේම, සශ්‍රීකභාවයෙන් අඩු පින්වතුන්ලාත් දැඩි ලෙස දන් දෙන්න පුරුදු වෙන්න ඕනේ. අපි සමාජයේදී දකින්නේ දුප්පත් අය දන් දෙනවාට වඩා ඒ අය පුරුදුවෙලා තිබෙන්නේ අනුන් දන්දෙන දෙය ලබන්නන් බවට පත්වීමයි. මෙය ඔබ ඔබටම කරගන්න අසාධාරණයක්. අනුන්ගෙන් ලැබුණු දෙය වුණත් කමක් නැහැ, ලැබුණු දෙයින් සුළු කොටසක් හෝ කර්මය කර්මඵල විශ්වාසයෙන් දන්දෙන්න. දිනකට රුපියල් දාහක් හම්බකරන පින්වතා දිනකට රුපියල් සීයක් දානය සඳහා වෙන් කරනවා නම්. දිනකට රුපියල් සියයක් හම්බකරන පින්වතා එයින් රුපියල් දහයක් දිනක දානය සඳහා වෙන් කරන්න. මෙහි කුසල් විපාකය ඔබට ලැබෙන්නේ දන්දෙන මුදලේ ප්‍රමාණය මත නොවේ. ඔබ තුළ සකස් කරගන්නා වූ චේතනාව, ශ්‍රද්ධාව මතයි.

පින්වත් මහත්මයෙක් දිනක් භික්ෂුවට මෙවැනි කතාවක් පැවසුවා. 'අපේ ගෙදරට දිනක් හාමුදුරුනමක් වැඩියා ආධාර පත්‍රිකාවක් විකුණන්න. ටිකට් එකක් රුපියල් විසිපහයි. ගිලන් භික්ෂූන්ට උපස්ථාන කරන්නය කියලා'

මේක අහපු අර පින්වත් මහත්මයා, හාමුදුරුවන්ට දෝෂාරෝපණය කරලා එලවාගෙන. ඒ මහත්මයා ඒ කළ ක්‍රියාව ගැන උදම් අනනවා.

සැබැවින්ම අදාළ හාමුදුරුවෝ කළේ විනය විරෝධී ක්‍රියාවක්. ඒ හේතුවෙන් පින්වත් මහත්මයා කරගත්තෙත් අකුසල් සහගත ක්‍රියාවක්.

ඔබ නිරතුරුවම සමාජය හදන්න යන්න එපා. ශාසනය අතුරුදන් වෙන්න බොහෝම ළඟයි. මේ කෙටි කාලයේ, මේ කෙටි ජීවිතය තුළ ඔබ සනාථ වෙන්න. නොහැදුණු අයගෙන් හැදුණු දුසිල්වත් ලෝකය ඉදිරියේ ඔබ හැදුණු කෙනෙක් වෙන්න. සිල්වතෙක් වෙන්න. මුදල් වංචා කරන ලෝකය ඉදිරියේ ඔබ සැබෑම දානපතියෙක් වෙන්න. ලෝකයා වංචාකරනවාය කියලා ඔබ ඇයි ප්‍රමාද වෙන්නේ. ලබන්නා ගැන නොසිතා ඔබේ පින් පොදිය අර්ථවත් ලෙස වැඩිකර ගන්නා ක්‍රමය ගැන සිතන්න. ඔබට හැකියාවක් තිබෙනවා නම් රුපියල් විසිපහක් වියදම් කරලා ආධාර පත්‍රයක් ගන්න, එය සංඝයා උදෙසා කළ පූජාවක්ය කියලා සතුටු වෙන්න. එහෙම බැරිනම්, බොහොම සුහදව කතා කරලා, මුදල් නැති බව එම හාමුදුරුවන්ට ප්‍රකාශ කරලා පිටත්කර හරින්න. සතර අපායෙන් නොමිදුන මනුෂ්‍යයා, සැමවිටම අන්‍යයන් සතර අපායට වැටෙන ස්වභාවයේ කටයුතුමයි සිද්ධ කරන්නේ. ඒ අය මාරයාගේ වසඟයේ සිටින පිරිස. මාරයාගේ කැමැත්තයි ඒ අය අතින් සිද්ධ වෙන්නේ. ඒ අය මාරයාගේ තුරුළට ගියදෙන්. පින්වත් ඔබ මේ යථාර්ථය අවබෝධ කරගෙනයි කටයුතු කළ යුත්තේ.

# දානය මහත්ඵල මහානිසංස වීමට

ඔබව දන් දීමෙන් වළක්වන්න කවුරුන් හෝ සිටීනම් ඔහු මව්පියන් වේවා, බිරිඳ වේවා, දරුවන් වේවා, ඥාතීන් වේවා, හිතවතෙක් වේවා ඔහු ඔබගේ ඥාතියෙක් නොවන බව තරයේ සිහිතබා ගන්න. එවැනි අය මග හරින්න. එවැනි අයගෙන් දුරස් වන්න. යමෙක් ඔබට තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව වැඩෙන, සිල්පද ආරක්ෂාවෙන, දන්දීමට පෙළඹෙන ක්‍රියාවන්ට අනුබල දෙන්නේ නම් ඔහු ඔබේ ලඟම ඥාතියා කර ගන්න. සිදු කරන ක්‍රියාව මෝහයෙන් මිදී ලෞකික සම්මා දිට්ඨියට අනුව සිදුකර ගන්න. ඔබ නිරතුරුවට තැන්පත් කලදෙය නොව පරිත්‍යාග කළ දෙය ගැන මෙනෙහි කරන්න. විශාඛා උපාසිකාව වරක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන් වර අටක් ඉල්ලා සිටිනවා. එම වර අට තමයි මම දිවි ඇති තුරා සංඝයා හට වැසි සළු දෙන්නට, ආගන්තුක බත් දෙන්නට, ගමික බත් දෙන්නට, ගිලන් භික්ෂුවට බත් දෙන්නට, ගිලානෝපස්ථායක බත් දෙන්නට, ගිලන් බෙහෙත් දෙන්නට, නිති කැඳ දෙන්නට, මෙහෙණ සඝනට දියසළු දෙන්නට කැමත්තෙමි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බොහෝම ගෞරවයෙන් විශාඛා උපසිකාවගේ මේ ඉල්ලීමට කැමත්ත දෙනවා. බලන්න විශාඛා උපාසිකාව උතුම් සෝවාන් ඵලයට පත් උපාසිකාවක්. පින්වත් ඔබත් එම අවබෝධයට පැමිණීමට නම් ඔබ කාවද අනුගමනය කළ යුත්තේ ආදර්ශයට ගත යුත්තේ විශාඛා උපාසිකාව ගැන අනේපිඩු සිටුතුමා ගැන නකුල මාතා, නකුල පිතා ගැන නිරතුරුවම ඔබ සිතන්න, මනසින් දකින්න. එම උතුමන් දානයට ලබාදුන් වටිනාකම් කොතෙක්ද කියලා. විශාඛා උපාසිකාව ලබාගත් වර අට ගැන ඔබ මොහොතක් සිතන්නකෝ. ඔබ මේ කරුණු අටෙන් කීයක් ඔබේ ජීවිතය තුළින් ක්‍රියාත්මක කරනවාද? නිතිපතා නොවෙයි මසකට වතාවක්, අවුරුද්දට වතාවක්

ඔබ මහා සංසරත්නයට දන් දෙන කෙනෙක්ද? වැසිසළුවක් පූජාකරන කෙනෙක්ද? මහා සංසරත්නය උදෙසා අනෙකුත් උපස්ථානයන් සිදු කරන කෙනෙක්ද? ඔබ ඔබේ හෘද සාක්ෂියට තට්ටු කරල අහන්න පිළිතුර 'ඔව්' නම්, ඒත් සෑහීමකට පත් වෙන්න එපා. ඔබ ඔබට ලකුණු දෙන්න යන්න එපා. 'මම' ප්‍රමාදී බවම දකින්න. අප්‍රමාදී වීමට ඔබ උත්සාහ ගන්න. බැංකු පොතේ ඔබ රැස් කොට තබන දෙය අනුන්ගේ කෙටි ලාමක කෙටි සැපයන් උදෙසා බවත් රැස් නොකොට දන් දෙන දෙය ඔබට ආශ්චර්යමත් සැපයක් උදෙසාම බවත් දකින්න. සශ්‍රීක දේවතානුස්සතිය වඩන්න. ඉහත පින්කම් නිතිපතා, සතිපතා, මාස්පතා ඔබගේ ආදායමට ගැලපෙන ආකාරයට කිරීමට උත්සාහ ගන්න. ලැබෙන සෑම අවස්ථාවක්ම අපතේ නොහරින්න. අනුන්ගේ සීලය, සමාධිය ගැන නොසොයන්න සෑම විටම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිස වශයෙන්ම දකින්න. මේවා පින් උල්පත් බව දකින්න. උල්පතේ ගැඹුර නොගැඹුර උස් පහත් බව නොසොයා ඔබගේ සංසාරික දුක් පිපාසය සංසිඳුවා ගැනීමට අවශ්‍ය ජලය ගැන පමණක් සිතන්න. ඔබගේ දුක් පිපාසය සංසිඳවා ගැනීමට ජලය ලැබෙනවා නම් උල්පත ගැන සෙවීම මෝහය නිසාම සිදුවන්නකි. දෘෂ්ඨීන්ගෙන් මිදී හේතුඵල ධර්මයන්ට විවෘත වන්න. අතීතයේ වැඩ සිටියා වු අනන්ත වූ ගුණයෙන් ඥානයෙන් යුත් භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා සමූහයම අරමුණු කරගන්න.

මසකට එක වතාවක් එළඹෙන පසළොස්වක පෝය දිනය ඔබ ඔබගේත් ඔබගේ පවුලේත් පින්කම් දිනය බවට පත්කර ගන්න. පන්සල වේවා ඔබගේ නිවස වේවා එදින සතර අපායෙන් එතෙරවීම ම අරමුණු කොට දාන, සීල, භාවනා කටයුතු සිදුකර ගන්න. දරුවන් බිරිඳ දූසිදස්සන්වත් හවුල්කර ගන්න. ඒ අය අකමැතිනම් ඔබ තනිවම මේ ව්‍යයායාමයේ නිරත වන්න. සතර අපාය යනු කුමක්ද, එහි සත්ත්වයා විඳින දුක කුමක්ද, එහි ආයුෂ මොනතරම් දීර්ඝද, සතර අපායට වැටුණ කෙනාට එයින් මිදීම මොන තරම් අපහසුද. මේවා සකච්ඡා කරන්න ඔබ ලැජ්ජා වෙන්න එපා. මාන්නයට පත්වෙන්න එපා, අනේ අපි ආයෙත් තිරිසනෙක්, ප්‍රේතයෙක්, නිරිසතෙක් වෙන්නේ නැහැ කියලා. එහෙම කියන සිතමයි ඔබව සතර අපායට ඇද දමන්න අවශ්‍ය පාර කපන්නේ. අනේ මම තවම සතර අපායෙන් මිදිල නැතැයි කියලා

දකින්න නිහතමානී වෙන්න. සැබවින්ම ඔබ සතර අපායෙන් මිදිලා නොමැති නම් සක්කාය දිට්ඨිය ඉහවහා ගිය සතියෙන් මාසයෙන් මාර්ගඵල ලාභීන් බවට පත්කරන ක්‍රමවේදයන් සිහි බුද්ධියෙන් හඳුනාගනිමින් මඟ හරින්න. හේතුඵල ධර්මයන් ගලපමින් ඔබ ඔබ ගැනම විමසා බලන්න. මෝහයෙන් මිදෙන්න. අවබෝධය යනු අනුන් දෙන දෙයක් නොව තමා තමා තුළින්ම දැනුවත් භාවයෙන් ලබන්නක් බව හොඳින් සිහිතබා ගන්න. පසළොස්වක පොහොය දවසේ ඔබ පවුලේ සියළු දෙනාම එසේත් නැතිනම් පන්සලේ සිල්සමාදන් වෙන සියළු දෙනාම සතර අපායේ බියකරුභාවයත් එයින් මිදීමේ මාර්ගයත් සාකච්ඡා කළොත් ඒ ගැන අවධානය යොමුකළොත් ඔබට පුළුවන් මාසේ ඉතිරි දවස් විසිනවයේම එම ශක්තිය තුළ මාර්ගය තුළ ජීවත් වෙන්න. මේ සටහන පුරාවට සතර අපායෙන් මිදීම සඳහා ඔබට ත්‍යාගානුස්සතිය වැඩීම ගැනයි සඳහන් කරන්නේ. භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා හෝ දුගී මගී යාචක, බලු කපුටු එසේත් නැතිනම් දෙවියන්, අමනුෂ්‍යයින් මේ කවුරුන් විෂයෙහි වේවා ලෝභකම අතහැරීම උදෙසාම දන්දෙන්න. තෘෂ්ණාව ක්ෂය කිරීම උදෙසාම දන් දෙන්න. දන් දීමට කාලසටහන් ඇති නොකර ගන්න. පාරේ ගමනක් යනවිට පිණ්ඩපාතේ වඩින භික්ෂුවක් දැක්කොත් ශ්‍රද්ධාවෙන් යමක් පූජා කරන්න. දුර ගමනක් ඔබ යන විට බසයේ දී මඟ තොටේ දී හමුවන භික්ෂුවකට අවශ්‍ය බිස්කට් එකක්, ගිලන්පස එකක් ගැන විමසීමට සිතක් ඇතිකර ගන්න. අනුන් කරනවාද නොකරනවාද යන්න ඔබ නොසිතන්න. ලැබෙන පුංචි අවස්ථාවකින් උපරිම ත්‍යාගානුස්සතිය වැඩීමේ අවස්ථාව ලබාගැනීමට දක්ෂ වෙන්න. දන්දෙන්නේ අනුන් සඳහා නොව අනුනගේ කුස පිරවීම සඳහා නොව තමාගේම සැපය සඳහා යන්න සිතන්න. ඔබ ප්‍රාර්ථනා කරන්න වීර්යයෙන් අවස්ථාව උදාකර ගන්න. කළ පින්කම්, දුන් දානයන් නැවත නැවත දෙන්න නැවත නැවත මෙනෙහි කරන්න. මට දානය පූජාකර ගැනීම සඳහා තව තව ස්වාමීන් වහන්සේලා මුණ ගැසේවා, උපාසක උපාසිකාවන් මුණ ගැසේවා, තව තව පන්සල් ආරණ්‍ය විහාරංග ඉදිවේවා, තව තව පින්කම් සිදුවේවා, කුමක් සදාහාද ඒවා උදෙසා පරිත්‍යාගයන් සිදුකර ත්‍යාගානුස්සතිය වඩන්න. මේ සැම ඔබ ඔබේ සතුට කරගන්න. මේ සැම යනු දේවතානුස්සතිය හැර වෙන කුමක්ද? දන් දීම තුළින්

ඔබ ඇතිකර ගන්නා අතහැරීමේ ශක්තිය සක්කායදිට්ඨිය ක්ෂය කිරීමේ මාර්ගය මිස වෙන කුමක්ද? බිරිඳ ගෙන්, සැමියා ගෙන්, දූපුතුන් ගෙන්, වස්තුව දේපළවලින් ඔබ ලබන බැඳීම සක්කායදිට්ඨිය තව තව ඝනභාවයට පත්කිරීම සඳාහාම බව ඔබම දකින්න.

සතර අපායෙන් මිදීම උදෙසා ගිහි බැඳීම්වලට යටත්ව ජීවත්වන පින්වත් ගිහිපින්වතුන් උදෙසා දානයේ ඇති වටිනාකම සටහන් කිරීමයි මේ ලිපියේ අරමුණ වුනේ. ගිහි ජීවිතය තුළදී හොඳින් දන් දුන්නත් එම දානමය පින්කම් ලොව්තුරා සම්මා සම්බුද්ධ දේශනාවන්ට අනුකූලව ගලපා ගැනීමට අදක්ෂනම් පරලොව දුකට පත් වැදගත් මහත්මයෙකුගේ කතාවක් දූන් මෙහි සටහන් තබනවා. මෙම කතා ප්‍රවෘත්තිය ඔබට වැදගත් වේවි. පහත කතාවෙන් කියවෙන්නේ ඔබ අදක්ෂනම්, දන් දුන්නා පින්කම් සිදුකර ගත්තාය කියලා ඔබට සහතිකයක් ලැබෙන්නෙ නැහැ ලබන ඊළඟ ප්‍රතිසන්ධිය සුගතියක් වෙනවාමය කියලා.

එක මහත්මයෙක් සිටියා ඔහු දක්ෂ ව්‍යාපාරිකයෙක්. බොහෝම පුංචි තැනකින් පටන් ගත්තේ. අවසානයේදී කෝටිපතියෙක් වුනා. ඉඩකඩම්, ව්‍යාපාර ඔහු සතු වුනා. බොහෝම හොද බිරිඳක් දරු මුණුපුරන් සිටියා. කවදාකවත් සිල් සමාදන් වෙන්න පන්සලකට ගියේ නැහැ. නමුත් හොඳින් සිල් පද ආරාක්ෂා කරගෙන ජීවත් වුනා. තමා විසින් සදා ගත්තා වූ කාලසටහනකට අනුව හොඳින් වියදම් කර භික්ෂූන්වහන්සේලාට, උපාසක උපාසිකාවන්ට දන් දුන්නා. එම කාලසටහනෙන් පිට දන් දෙන්න ගියේ නැහැ. කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්ම ශ්‍රවණය බොහෝම අඩුවෙන් ඔහුට ලැබුණේ. එහෙම අඩුවුනත් හොඳින් දන් දුන්නා. පන්සල් ආරණ්‍ය සඳහා මුදල් පරිත්‍යග කළා. අවශ්‍ය විහාරංග ඉදිකළා. මොහු තමන්ගේ ව්‍යාපාරයට ඉඩකඩම්වලට ගොඩාක් බැඳිල සිටියේ. මොකද මේ හැම දෙයක්ම අසාධාරණයෙන් නොව තමන්ගේම දහදිය මහන්සියෙන්මයි හම්බකර ගත්තේ. මේ පින්වත් මහත්මයා හැමොටම ප්‍රිය කාටවත් කරදරයක් නැති හුදකලා වැදගත් ජීවිතයක් ගත කරලා වයස අවුරුදු හැත්තෑවේ සීමාවට පැමිණීමට පෙර මිය ගියා. දුක් විඳලා රෝග පීඩාදියට ලක්වෙලා නොවේ. ඔහු මියගියේ. ක්ෂණික මරණයක්. මේ මරණය ගැන ඔහුගේ බිරිඳට, දරුවන්ට, ඥාතීන්ට, හිතමිතුරන්ට කිසිම විදිහක බියක් තිබුණේ

නැහැ. කුහුඹියෙකුටත් වරදක් නොකළ මොහුට සුගතියේ දොර හැර වෙන දොරක් නොඇරෙන බව පාංශුකූලයට පැමිණි ගෞවරණීය සංඝරත්නය අනුශාසනා කළා. ඉහත සියළු දෙනාම තමන් ධර්මය දන්නා ආකාරයට හේතුඵල ගලපමින් මියගිය පින්වත් මහත්මයාව සුගතියටම නම් කළා. මියගිය පින්වතාට පින් පිණිස හත් දවසේ, තුන්මාසේ අවුරුද්දේ සාංඝිකදානමය පින්කම් බොහෝම සශ්‍රික ආකාරයට පුජකළා. තව තව පින්කම් සිදුකර ගත්තා. අපේ මිය ගිය ඥාතියා දෙවියෙක්ය කියන සංඥාව හැර වෙන සංඥාවක් කිසිවෙකුට තිබුණේ නැහැ. මෙහෙම කාලයක් ගියාට පස්සේ දිනක් රාත්‍රියක භික්ෂුවක් සමාධියෙන් පසුවෙන විට මේ මියගිය පින්වත් මහත්මයාව අරමුණු වෙනවා. ඒ අරමුණු වෙන්නේ ප්‍රේත ලෝකයෙදි. මනුෂ්‍ය ලෝකයේ ජීවත්ව සිටිය දී තිබූ ශරීර ප්‍රමාණය සහිතවමයි. මනුෂ්‍ය ජීවිතයේ සිටිය දී ඔහු ප්‍රියකළ ඇඳුමක් තිබුණා. විශේෂ ගමනක දී පළඳින එම ඇඳුම් කට්ටලය සහිතවයි මොහු හිටියේ. මෙම මියගිය මහත්මයාට අයිතිව තිබුණා කෝටි 5 ක පමණ ඉඩමක්. මේ ඉඩමේ මොහු එහාට මෙහාට ඇවිදිනවා. මොහු ඇවිදින්නේ බොහොම දුක්මුසු විලාසයකින්. ටිකක් කුදු ගැහිලා, හිස පහතට හෙලාගෙන, අත් දෙක පහළට දමාගෙන 'අනේ මේවට මොකද වුනේ' කියන්න වගේ හැඟීමක්, ඉරියව්වක් සහිතව තමයි ඇවිදින්නේ.

ශරීරය දුර්වල නැහැ. ඇඳුම බොහොම පිරිසිදුයි. නමුත් සිත දුකට පත්වෙලා. තෘෂ්ණාව නිසාම. මොහු ඉන්න ඉරියව්වෙන් පෙනෙන්නේ, මොහු තුළ බියක් තියෙනවා මේ දේපළ නැති වෙයි, විනාශවෙයි, වෙන කාටහරි අයිතිවෙයි කියලා. බලන්න පෙර ආත්මයේ දි කොච්චර දන් දුන්න, මොන තරම් පින් කරගත්ත මනුෂ්‍යයෙක්ද, මොනතරම් සිල්වත් ජීවිතයක් ගත කරපු මනුෂ්‍යයෙක්ද. ඒත් ඒවායින් ඔහු ප්‍රයෝජනයක් ගත්තද?

මොහු මියයන වෙලාවේ මේ පින්වත් මනුෂ්‍යයාට තමා දුන්න දානයක්, තමාගේ සිල්වත් ජීවිතය, ඒ ජීවිතය තුළින් කළ පින්කම් සිහියට නගා ගත්තා නම්, ඒ පින්කම් අරමුණු කර ගත්තා නම්, ඒ පින්කම් සිදු කර ගැනීමට මාර්ගය දේශනා කර වදාළ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ, ධර්මරත්නයේ, සංඝරත්නයේ ගුණයන් සිහියට ගත්තා

නම්, එසේ කිරීමට දක්‍ෂභාවය ඔහු තුළ තිබුණා නම් මොහු සශ්‍රීක දිව්‍ය තලයක, මහේශාක්‍ය දෙවියෙක් වශයෙන්මයි, එසේත් නැතිනම් සශ්‍රීක මනුෂ්‍ය ජීවිතයක්මයි නැවතත් ලබන්නේ ඇතිකරගත් කැමත්තට අනුව. නමුත් මේ අවාසනාවන්ත මනුෂ්‍යයා සද්ධර්ම ශ්‍රවණය අඩුවෙන් කළ නිසාත්, කල්‍යාණ මිත්‍ර සේවනය හිඟ වූ නිසාත් මිය යන මොහොතේ තමන් කළ පින්කම් ගත කළ සිල්වත් ජීවිතය යටපත් වී මතකයට පැමිණියේ ඉඩකඩම් දේපළ. දේපළ කෙරෙහි තිබූ තෘෂ්ණාවේ බලවත් භාවය නිසා සැනසීමට හේතුවන දේවල් නොව වැනසීමට හේතුවෙන ධර්මතාවයක් තමයි මතුවෙලා පැමිණියේ. ඒ නිසාම මොහු ප්‍රේත ජීවිතයකට වැටුනා. නමුත් බලන්න දේපළ කෙරෙහි ඇතිකරගත් දැඩි ඡන්ද රාගය නිසා ප්‍රේත ජීවිතයකට වැටුනත් මොහු මනුෂ්‍ය ජීවිතයේ දී දුන්න දානයන්ගේ ආනිසංස එම ප්‍රේත ජීවිතයේ දීත් මොහුට සැප විපාකයන් ලබා දුන්න. ප්‍රේත ජීවිතයේ දී මොහුට හොඳ පිරිසිදු වස්ත්‍ර ලැබිලා තිබෙනවා. හොඳ නිරෝගී ස්වභාවයේ ශරීරයක් ලැබිලා තිබෙනවා. ඇතිකර ගෙන තිබෙන තෘෂ්ණාව නිසා ඔහුගේ සිතට නම් දැනෙන්නේ දැඩි පීඩාවක් දුකක්. ඒ නිසා මොහුගේ ඉරියව්වල තිබෙන්නේ දැඩි අතෘප්තිමත් ස්වභාවයක් එම පින්වත් ව්‍යපාරික මහත්මයා මනුෂ්‍යයෙක් වශයෙන් ජීවත්ව සිටියදී සමාජය ඔහුව හැඳින්වූයේ සිල්වත් මනුෂ්‍යයෙක් හැටියටයි. දානපතියෙක් හැටියට. වෙහෙස මහන්සිවී ධනය ඉපයූ ව්‍යපාරිකයෙක් හැටියට. නමුත් ඔහුගේ බාහිර ස්වරූපය, ඇවතුම් පැවතුම් තුළින් ලෝකයා ඔහුව එසේ හඳුනාගත්තත් ඔහුගේ සිත වැඩී තිබුණේ ඉන් ඔබ්බට ගිය දිශාවකට. ඒ තමයි දේපළ කෙරෙහි තිබූ අසීමිත ඡන්ද රාගය. එයට අදාළව ප්‍රතිසන්ධිය සකස්වුනා. සුගතියක සැප විඳීමට අවශ්‍ය පරිසරය ඔහු ජීවිතය තුළින් ගොඩනගා ගෙන තිබුණත් සද්ධර්ම ශ්‍රවණය, කල්‍යාණ මිත්‍ර සේවනය, බහුශෘතභාවය නොමැති වීම හේතුවෙන්ම සැපක් ලෙස අල්ලා ගත්තේ දුකක්මයි. දැන් මේ අමනුෂ්‍ය ලෝකයේ ප්‍රේතයෙක් ලෙස ජීවත්වන මොහු පරදත්තරූපජීවි ස්වභාවයට අයත් ප්‍රේතයෙක්. ඔහුට අවශ්‍යනම් පුළුවන් පින්ගන්න නමුත් මොහු පින්ගන්නේ නැහැ. මොකද උපාදානය කරගත් දෙය කෙරෙහි තිබෙන දැඩි තෘෂ්ණාව නිසා. මෙවැනි අයෙක් අරමුණු කර ඔබ මොන තරම් සශ්‍රීක ආකාරයට සාංඝිකදානමය පින්කම් සිදුකලත් මේ ප්‍රේත සත්ත්වයා පින් ගන්නේ නැහැ. ඔබ අනුමෝදන් කරන

පින සුදුසු වෙනත් අමනුෂ්‍යයෙක් වෙතොත් ඔවුන් එය අනුමෝදන් වේවි. එසේ නොවුන හොත් ඔබලාට සැප පිණිස එම පින් හේතුවේවි. කවරදාකවත් එම පින ඔබලාට අයිති නොවේය කියල බුදුරජාණන් වහන්සේ දේශනාකර නැහැ.

මෙවැනි උපාදානය බලවත්කොට ගත් පරදත්තරූපජීවි සත්ත්ව කොටස් වලටද එම උපාදානය බිඳ පින් අනුමෝදන් කිරීමට ඔබට හැකියාව තිබෙනවා. ඔබද දක්‍ෂනම්. මොකද ඒ අය පෙර මනුෂ්‍ය ජීවිතයේ දී පුරුදු පුහුණු කරපු වඩපු ගුණධර්ම තිබෙනවා, ඒ අය තුළ යටපත් වෙලා. ඔබ දක්‍ෂ වෙන්න ඕනෙ ඒවා මතුකර ගන්න පුළුවන් ආකාරයට පින්කම් සිදුකරන්න. ඒ අයට අනිත්‍ය සංඥාවක් වැටහෙන ආකාරයට පින්කම් සිදුකරන්න. භික්‍ෂුව මේ ටික සඳහන් කළේ මිය ගිය අයගේ ස්වභාවයන් අපි අපේ කරගත යුතු නිසා නොවේ. මියගිය අයකු ගැන සිත සිතා ජීවත් විය යුතු නිසාද නොවේ. එවැනි විෂයන් ඔබ අදාළ කරගත යුතු නැහැ. නමුත් ඔබ මේ ධර්ම මාර්ගයේ නිවරැදිව ගමන් නොකළොත් ඔබට මුණ ගැසෙන අනතුරු ගැන අවබෝධය ලබා දීමටයි මෙම කරුණු සටහන් තැබුවේ. ඒ වගේම ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පින්වත් ඔබලාට දේශනා කරනවා මියගිය ඥාතීන් උදෙසා ජීවත්ව සිටින ඔබ පින්පෙත් අනුමෝදන් කිරීම යුතුකමක්ය කියලා. මේ කතාව ඔබ කියවන විට ඔබට වැටහෙන්න ඇති ඔබ දන්දිය යුත්තේ තණ්හාව, මාන්නය, දිට්ඨිය නොවැඩෙන ආකාරයට ඒවා ක්‍ෂයවෙන ආකාරයට. දන්දීම තුළින් ඉහත අකුසල ධර්මයන් වැඩෙනවා නම් එම දානය අර්ථවත් වෙන්නෙ නැහැ. නමුත් අපතේ නොයන බව ඔබ හොඳින් තේරුම් ගත යුතුයි. ඉහත කතාව අනුසාරයෙන්.

ගිහි ජීවිත ගතකරන පින්වත් ඔබලා මූලිකත්වය දෙන්නේ තමාගේ ව්‍යාපාරයට, ගේදොර වතුපිටි වලට, දරුවන්ට, බිරිඳට. ඒවාට මුල් තැන දෙන්න. නමුත් ඔබ ප්‍රධානත්වය දෙන්න අවශ්‍ය සතර අපායෙන් මිදෙමි, කියන අරමුණට. තිරිසන් ප්‍රේත ජීවිතයක් ලැබුනත් ඔබට දරුවෙක් බිරිඳක් ලැබෙයි. එහෙත් ධර්මය දැකීමේ අයිතිය ඔබට එහි දී අහිමි වෙනවා. ධර්මය දැකීමේ වරම ඔබට ලැබෙන්නේ මේ ජීවිතයේදීමයි. ධර්මය දැකීම යනු සතර අපායෙන් එතෙර වීමයි.

# අකුසලයට පොකුරු ගසන්නට ඉඩ නොදෙන්න...

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ චූලකර්ම විභංග සූත්‍රයේදී සුභ මානවකයාට බොහෝම ලස්සන ධර්මයක් දේශනා කරනවා. 'සුභ මානවකය, මේ ලෝකයේ සත්ත්වයා කර්මය දායක කොට කර්මය මගේ කොටගෙන පවතී' ය කියලා. සුභ මානවකයා බුදුරජාණන් වහන්සේගෙන් අහන එක ප්‍රශ්නයක් තමයි භාග්‍යවතුන් වහන්ස මේ ලෝකයේ ජීවත්වන මනුෂ්‍යයින් සමහරු දීර්ඝායුෂ ලබමින් ජීවත් වෙනවා. තවත් කෙනෙක් හීන ආයුෂ සහිතව මිය පරලොව යනවා. ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස, මෙහෙම වීමට හේතුව කුමක්ද? කියලා. ඊට පිළිතුරු වශයෙන් තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ 'සුභ, මේ ලෝකයේ උපදින සත්ත්වයා කර්මය දායාද කොට කර්මය මගේ කොට පවතීය' කියලා. එහෙම කියලා බුදුරාජාණන් වහන්සේ දේශනාකරනවා 'සුභ, පෙර ජීවිතයේ යමෙක් සත්ත්ව හිංසා අකුසලය සිදුකරා නම් ඔහු මරණින් මතු නිරයේ දුකට වැටෙනවා. යම් හෙයකින් මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයෙක් ලෙස උපතක් ලැබුවා නම් ඔහු රෝගී භාවය ඇතිව උපත ලබනවා' කියලා. ඒ වගේම 'පෙර ජීවිතයේ දී සත්ත්වයාට මෛත්‍රිය කරුණාව දැක්වීම හේතුවෙන් ඔහු මරණින් මතු මනුෂ්‍ය ජීවිතයක් ලැබුවත් නීරෝගී භාවය ලබනවා' කියලා.

එතකොට බලන්න යමෙක් මේ සමාජයේ නිරෝගීව ජීවත් වෙන්නෙත් තව කෙනෙක් රෝගීව ජීවත් වෙන්නෙත් හේතුඵල ධර්මයක් නිසා. ප්‍රධාන වන්නේ සතුනට හිංසා කිරීමත් මෛත්‍රිය කරුණාව දැක්වීමත් කියන කාරණා. වර්තමානයේ සමාජය දෙස බැලීමේදී මනුෂ්‍යයා පමණක් නොවේ ඔබ ජීවත්වන පරිසරයත් රෝගී බවට පත්වෙලා. මෙතනින් පරිසරය අපි පැත්තකින් තියලා මනුෂ්‍යයා ගැන බලමු. සමහරු රෝගී බවට පත් වෙන්නේ මච්කුසේදීම. මච්කුස පිළිසිඳගෙන

මාසෙන් දෙකෙන් දරුගැබ, කළලය රෝගී බවට පත්වෙනවා. මව්කුසේ සිටියදීම පෙර කළ සත්ත්ව හිංසා කර්මයන් විපාක දෙනවා. සමහර දරුවන් ලෝකයට බිහිවන මොහොතේම නොමේරූ දරු උපතක් හැටියටයි ලොවට බිහිවන්නේ. තවත් ළදරුවන් නොයෙක් ආබාධ ඉන්ද්‍රියන්ගේ අඩුපාඩු සහිතව ලොවට බිහිවෙනවා. මෙලොව එළිය දැකපු දවසේ පටන් මේ ළදරුවන් රෝහලේ දැඩි සත්කාර ඒකකයක නොමේරූ ළදරු ඒකකවල සති, මාස, අවුරුදු ගණන් දුක් විඳිනවා. රටේ ප්‍රධාන ළමා රෝහලකට එසේත් නැතිනම් ළමා වාට්ටුවකට යන්න. මොනතරම් දරුවෝ නොයෙක් වයස් සීමාවල සිතා ගන්නවත් බැරි රෝගවලින් පීඩා විඳිනවාද? සමහර ළදරුවන්ට මාරාන්තික රෝග, තවත් දරුවන්ට අර්ධ මාරාන්තික රෝග. නාසයට මුඛයට බට දමලා, උදරයට බට ගහලා..... ඔබ මේවා දකිනකොට, ඔබ මේවා අත්දකින කොට ඔබට දරන්න බැහැ මේ පොඩි දරුවන් විඳින වේදනාව. පොඩි දරුවන් විතරක් නොවේ මේ දරුවන් නිසා ඒ දෙමාපියන්, සහෝදර සහෝදරියන්, ඥාතීන් මේ හැමෝමත් දුකේ කොටස් කරුවන් වෙලා. මිනිස් ජීවිතයක උපත ලැබුවත් රෝගී දරුවන් නිසා අපා දුක් විඳින දෙමාපියන් මොන තරම් සමාජයේ සිටිනවාද? මේ දුක ඔබට අහම්බෙන් ලැබුන දෙයක් නම් නොවේ. අපලයක් නිසා, දේව කෝපයක් නිසා, රටේ වෛද්‍ය අංශයේ දුර්වලතාවයක් නිසා ලැබුණු දේවල් නොවේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කර්මය සත්ත්වයා දායාද කොටගෙන පවතීය කියල. රෝගී දරුවන් නිසා එම දෙමාපියන්ද විඳින්නේ දුකක් නම් එයත් දෙමාපියන්ගේද සංසාරික කර්මයක දායාදයන්මය. මෙය දෙමාපියන්ට අහම්බෙන් ලැබුණ වගකීමක් දුකක් නොවේ. පෙර ජීවිතයේ දී සත්ත්ව හිංසාව අකුසලය කරගත් මනුෂ්‍යයෙක් මරණයෙන් මතු නැවත මනුෂ්‍ය ජීවිතයක් ලබන්නේ නම් ඔහුට සුදුසු මව්කුස ලෙස තොරා ගන්නේද ඊට අදාල අකුසල් සිදුකරගෙන ඇති මවකගේ මව් කුසක්මයි. මේවා කාටවත් වෙනස් කළ නොහැකි ලෝක ධර්මයන්. දරුවා නිසා අම්මා තාත්තා දුක් විඳිනවාත්, අම්මා තාත්තා නිසා දරුවා දුක් විඳිනවාත් නොවේ. තම තමන් කරගත් අකුසල් නිසා තමන් හවුලේ එම අකුසල් විපාක අත් විඳිනවා පමණි.

ඔබ මෙහෙම හිතන්නකෝ. ඔබේ ගෙදර දොරකඩට බල්ලෙක් එනවා ගෙදර අම්මයි තාත්තයි කියනවා පුතේ ඔය බල්ලට ගහල එලවන්න කියලා. පුතා හොඳ ගලක් හෝ පොලු කැබැල්ලක් අරගෙන බල්ලට

ගහනවා. අර අහිංසක බල්ලා කකුල ඔසවා ගෙන ලේ පෙරාගෙන දුවනවා. දැන් බලන්න මේ සත්ත්ව හිංසාවට කී දෙනෙක් හවුල් වුනාද? බල්ලාට ගැහුවෙ දරුවා තමයි. නමුත් ගහන්න අණ කළේ දෙමාපියන්. අකුසලය වැඩි දරුවට. මරණින් මතු මෙන්න මෙවැනි අකුසල් තිබෙන දරුවන් එවැනිම අකුසල් සහිත දෙමාපියන්ගේ මව්කුසවල ඉපදිලා දරුවා රෝගී භාවයට පත් වෙළා දෙමාපියන්ගේ අකුසලය විපාක දීමට අවස්ථාව සලස්වනවා. දැන් මේ තුන්දෙනාම විඳින්නේ තමන් කරගත් කර්මයක විපාකයක්මයි. භික්ෂුවට සමහර අවස්ථාවල ඇහිල තිබෙනවා රෝගී දරුවන් ඉන්න අම්මලා කියනවා 'මගේ කරුමෙටයි මේ දරුවා ලැබුනේ' කියලා. අන්න එවැනි අම්මලාගේ අදහස සර්ව සාධාරණයි.

අවිද්‍යා සහගත ලෝකය හැඩගැසිලා තිබෙන්නේ සත්ත්වයා දුක දෙසටම තල්ලුකර දමන ස්වභාවයටයි. ඔබ විසින්ම කරනා ලද අකුසලයන් විපාක දෙන විට ලෝකයේ ස්වභාවය සකස් වී තිබෙන්නේ ඒ විපාකයේ අමිහිරි වේදනාව නිසා සත්ත්වයා තව තවත් අකුසල කරගන්න දිශාවටම මෙහෙයවීමටයි. ඔබ මෙතනදි පරිස්සම් වෙන්න ඕනේ. එසේ නොවුනොත් තව තව අකුසල කර්මයන් ඔබත් අන් අයත් දායාද කරගැනීමයි සිද්ධවෙන්නේ. ඔබ අතින් උපස්ථානය ලබන රෝගී වැඩිහිටියෙක්, දරුවෙක් සිටිනවා නම් ඒ අයගේ ක්‍රියාකාරකම් නිසා නිරතුරුවම ඔබට ද්වේෂය, පළිගැනීම, පිළිකුල, නොසලකාහැරීම වැනි චේතනාවන් සකස් වෙන්න පුළුවන්. එය ස්වභාවයක්. මෙවැනි අවස්ථාවකදී ඔබ දක්ෂවෙන්න ඕනේ ලොව්තුරා ධර්මය ජීවිතයට ගලපා ගන්න. ද්වේෂය ඔබ ඔබේ කරගත්තොත් ඔබ ඔබේ කර ගන්නේ මහා ගිනි ගොඩක්මයි. ඒ ඔබ විසින්ම අවුලුවාගත් ගිනි ගොඩෙන්ම ඔබට සසර අප්‍රමාණ කාලයක් පිච්චෙන්නට සිදුවේවි.

ඉහත සඳහන් කළේ දරුවන්ගේ රෝගී භාවය ගැනයි. තරුණ වැඩිහිටියන්ගේ රෝගී භාවය ගැන දකිනකොට මහා රෝහලකට, කුඩා රෝහලකට ඔබ ගොඩ වැදුනොත් ලක්ෂ ගණනක් ජනතාව රෝගීන්. නීරෝගී භාවයද ගොඩක් අඩුයි. වයසට නොගැලපෙන රෝග, මාරාන්තික රෝග, අන්‍යයන්ගේ පිළිකුලට භාජනය වන රෝග, අනුනට ප්‍රකාශ කිරීමට නොහැකි රෝග..... සංසාරයේ සත්ත්ව හිංසාවට අදාළව

ඒවා විපාකදීමට සුදුසු ආකාරයට ලෙඩ රෝග හැදෙනවා. හැබයි පාරිසරික හේතූන් නිසාත්, ඍතු බලපෑම් නිසාත් රෝගී ස්වභාවයන් ඇතිවෙනවා. ඒත් එම රෝග දීර්ඝකාලීන නිදන්ගත රෝග බවට පත්වෙන ස්වභාවය අඩුබවද ඔබ වටහාගත යුතුව ඇත. අකුසල කර්මයන් විපාක දෙන රෝගීන්ගේ ස්වභාවය පැහැදිලිව හඳුනාගන්න පුළුවන්. ඔබ සිතෙන් මවාගන්නකෝ රෝහලේ ඇඳේ නිරතුරුවම අඳෝනා තබන රෝගියෙක්. නාසයට, මුඛයට, උදරයට බට ඇතුළත් කර වේදනාව විඳින රෝගියෙක්. දෑත් දෙපා ඇඳ හතර කොණේ බැඳ දමා ඇති රෝගියෙක්, අසිහියෙන් දින ගණන් දුක් විඳින රෝගියෙක්, ජලය ආහාර රස බැලීමට වාසනාව නොමැති රෝගියෙක්. අතපය වාරු නැති අංගවිකල අංශභාග රෝගියෙක්. භික්ෂුවට නම් මෙවැනි රෝගීන් දකිනකොට සද්ධර්මය කෙරෙහිමයි ගෞරවය ඇති වෙන්නේ. මොනතරම් පැහැදිලිව ලෝක ස්වභාවය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවාද. ඔබ සත්ත්වයින්ට සංසාරයේ දී දුක් දුන්නා. හිංසාකළා. ඒ දුකමයි, හිංසාවමයි ඔබ ඔය අත්විඳින්නේ.

වර්තමානයේ මනුෂ්‍යයා මොන තරම් නම් සත්ත්ව හිංසාව සිදු කරනවාද? සමහරු සත්ත්ව හිංසාව සිද්ධකරන්නේ මෝස්තරයක් හැටියට. තවත් සමහරු සත්ත්ව හිංසාව සිදුකරන්නේ ව්‍යාපාරයක් හැටියට. සමහරු විනෝදයටත් සත්ත්ව හිංසාවේ යෙදෙනවා.

හුඟ දෙනෙක් මේ දේවල් කරන්නේ විපාකයන් ගැන අනවබෝධය නිසා. භික්ෂුව දිනක් ආරණ්‍යයක වැඩ සිටින විට කුටිය ඉදිරියෙන් ළමයින් කීප දෙනෙක් කැලය දෙසට යනවා දැක්කා. මේ අය පොලිතීන් බෑග් එකක යමක් දමාගෙනයි එම ප්‍රදේශයට ගියේ. භික්ෂුවට දැනුනේ නැහැ බෑගයේ මොනවද තිබුණේ කියලා. පසුවදා භික්ෂුව එම දරුවන් ගිය මාර්ගයේ වඩිනවිට සාමාන්‍ය කලුගලක් ළඟ ගොළුබෙල්ලන් විස්සක් පමණ කලුගලේ ගහල මරල. අර ෂොපින් බෑගයේ දමාගෙන ගිහින් තිබෙන්නේ ගස්වල එල්ලිලා හිටපු ගොළුබෙල්ලෝ. ඒ ගොළුබෙල්ලන්ගෙ කටුව ගලේ වැදිල කුඩුවෙනව දැකලා ඒ දරුවන් සතුටු වෙනවා. මෙතන සත්ත්ව හිංසාවකින් එහාට ගියපු සත්ත්ව ඝාතනයකුයි සිද්ධ වෙන්නේ. කුරුල්ලන්ට ගල්වලින් ගහනවා. මාළුන්ට ගල්වලින් ගහල තුවාල කරනවා. සමනළයන්ගෙ පියාපත් කඩනවා. මෙහෙම දරුවො සමාජයේ ඕන තරම් සිටිනවා. වියළි කලාපයේ ප්‍රදේශවල සත්ත්ව හිංසාව ගොඩක් වැඩියි. ගොවිතැන් විනාශ කරන්න

එන අලින්ට හේන රකින අට්ටාලය මත සිට එම සතුන්ගේ ඇඟට ලෝදිය වගේ උණුවතුර හලනවා. ගෝනි ගිනි තියලා අලින්ගේ පිට මතට දමනවා අට්ටාලය මත සිට. ලොකු යකඩ ඇන ලෑලිමත ගහලා අලි එන මංකඩවල්වල තියනවා කකුල්වල ඇනෙන්න. මේවා විපාක දීලා අහවර කරන්න පුළුවන් අකුසල් කර්ම නොවේ. මෙවැනි බරපතල සත්ත්ව හිංසා අකුසල් කිරීමට පෙරාතුව ඔබ මේවා ධර්මානුකූලව ගලපාගන්න දක්ෂවෙන්න ඕන.

ඔබ මෙහෙම හිතන්න. ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවි මහත්මයෙක් තම කුඹුර අස්වද්දනවා. ඔහු කවදාකවත් අස්වනු රැකගැනීම උදෙසා පැල් රකින්නේ නැහැ. තෙල්, බෙහෙත්, පොහොර, යොදලා බොහෝම විවේකීව ඉන්නේ. වතුර හැරවීම වැනි කටයුතු පමණයි කළ යුත්තේ. නමුත් වියළි කලාපයේ ගොවි මහත්මයෙක් බීජ වැපුරුව දවසේ පටන් අස්වැන්න නෙලාගන්නා දවස දක්වාම නිදිවරාගෙන වැස්සෙ පින්නෙ දුක්දින්න ඕනේ අස්වැන්න රැකගන්න. එළිවෙනතුරු නින්දක් නැහැ අස්වැන්න ගන්නා පුරාවටම. හොඳින් ඔබ දකින්න. ගම්පහ ගොවි මහත්මයත් වියළි කලාපයේ ගොවි මහත්මයත් කරන්නේ එකම ගොවිතැන. නමුත් දෙදෙනාට විඳීමට සිද්ධවෙන්නාවූ දුකේ ස්වභාවය එකිනෙකට වෙනස්. මෙය කර්ම විපාකයක් නිසා සිදුවෙන්නක්. වියලි කලාපයේ පින්වත් ගොවි මහතාට තමන්ගේ අස්වැන්න රැකගැනීමට ජීවිතය පරදුවට තබා වෙහෙසවීමට සිදුවී ඇත්තේ ඔහු පෙර ජීවිතවලදී අනුන්ගේ අස්වැන්න විනාශ කිරීමේ අකුසලය සිද්ධ කරන්න ඇති නිසා. මනුෂ්‍යයෙක් හැටියට හෝ එහි කර්ම විපාකය තමයි ඔහු මේ ජීවිතයේ දී අත්විඳින්නේ. දුෂ්කර පළාතක ඉපදුණේ, දුෂ්කර ජීවිතයක් ලැබුණේ..... මේ පෙර කර්ම විපාක. මේ ස්වභාවය හඳුනාගන්න කෙනා කවදාකවත් අතීතයේ කළාවූ අකුසල කර්මයන් නැවත කරන්න පෙලඹෙන්නේ නැහැ. හේතුඵල ධර්මයන්ට අනුව ගලපමින් ඔබ ජීවිතය විග්‍රහකර ගන්න දක්ෂ වෙන්න. පින්වත් ඔබ මේ ජීවිතයේ දී දුෂ්කර වියලි කලාපයේ ගොවි මහතෙක් වශයෙන් ජීවත්වුවද පෙර ජීවිතවලදී ඔබත් අලියෙක්, හරකෙක්, වල් ඌරෙක්, පක්ෂියෙක්, වැනි සතෙක් වෙලා අනන්තවත් අනුනගේ අස්වැන්න විනාශ කරන්න ඇති. සසර ඔබ කරපු ඒ අකුසල් විපාකයන් ඔබම වර්තමානයේ දී අත්විඳිනවා. මේවා ඔබ ධර්මානුකූලව ගලපා නොගත්තොත් ඔබ තව තව අකුසල්මයි සිද්ධ කර ගන්නේ. එම නිසා සත්ත්ව හිංසාවන්ට

යන්නෙ නැතුව උපක්‍රමශීලීව වන සතුන්ගෙන් ඔබේ වගාවන් ආරක්ෂා කරගන්න.

ඔබට නැවතත් මතක් කරනවා, ලෝකයේ පවතින්නේ ඔබව නිරතුරුවම අකුසලය දෙසට යොමු කරන ස්වභාවයයි. ඔබේ දක්ෂභාවය නිසා පමණක්මයි කුසලය දෙසට ගමන් කළ හැකිවෙන්නේ. සමහරවිට මෙම සටහන කියවන කොට ඔබට හිතෙන්න පුළුවන් අලියෙක් කොහොමද මනුෂ්‍යයෙක් වෙන්නේ කියලා. එයත් කුසලභාවයේ ප්‍රතිඵලයක්. මේ ඒ ගැන උදාහරණයක්..

මේ රටේ ජීවත්වන ප්‍රභූ පෙළේ ව්‍යාපාරික මහත්මයෙක් ඉන්නවා ඔහු බොහෝම නිහතමානී, චාම්, ධාර්මික ජීවිතයක් ගත කරන මහත්මයෙක්. එක්තරා භික්ෂුවක් මේ පින්වත් මහත්මයාගේ පෙර ජීවිතය උතුම් සමාධිකයකදි අරමුණුකර බලද්දි අරමුණු වෙන්නේ අලියෙක්. ඒ කියන්නේ මේ මහත්මයා පෙර ජීවිතයේ දී අලියෙක්. හැබැයි වල් අලියකුගේ ස්වභාවයක් නොවේ පෙනෙන්නේ හීලෑ අලියෙක්ගේ ස්වභාවය. සිද්ධස්ථාන, රජමහා විහාර, දේවාල ආශ්‍රිතව සහ පුද්ගලිකව අලි ඇති කරන වැදගත් මහත්වරුන්ගේ භාරයේ ජීවත්වන, ආගමික පෙරහැරවලට නිරතුරුවම සම්බන්ධවන ආගමික පරිසරයක හැදෙන අලි ඇතුන් මරණින් මතු වැදගත් සීලාචාර බෞද්ධ පවුල්වල මනුෂ්‍යයින් වශයෙන් ඉපදීමේ ඉඩකඩ හුඟාක් වැඩියි. එහෙම අය මනුෂ්‍ය ජීවිතයක් ලැබුවහම ධර්මයට හුගාක් ලැදියි. ලෝකයට හරි කීකරුයි. විනය ගරුකයි. තමන් මොන තරම් මහේශාක්‍ය කෙනෙක් වුවත් ඔහු හිතන්නේ හුඟක් නිහතමානීව. මේ ගති ලක්ෂණ තමා සිටි පෙර හීලෑ අලි ජීවිත චර්යාවට හුඟාක් කිට්ටුයි. දැන් ඔබත් වර්තමානයේ විඳින්නට සිදුව ඇති ජීවිතය ගැන ඔබේ අතීත භව චර්යාවන්ට අනුව ගලපාගන්න. ඉහත කතාව අනුසාරයෙන් වියලි කලාපයේ ගොවි මහතා හිතන්න පෙර භවයක මා හැසිරුණු ආකාරය නිසාමයි මට මෙවැනි දේ වෙන්නේ කියලා. මගේ අස්වැන්න බව බෝග සතුන් විනාශ කරන්න එන්නේ මමත් පෙර ජීවිතවලදී තිරිසන් සතෙක් වෙලා මනුෂ්‍යයින්ගේ බව බෝග විනාශ කරපු නිසාමයි කියලා. එවිට ඔබට හරිම පහසුයි සසර කරපු අකුසල් විපාක ලබන ගමන් අලුතින් අකුසල් ඇති නොවන ආකාරයට කටයුතු කරන්න?

# ගොනා පසුපස නගුල එන්නා සේ

සත්ත්ව හිංසාවට අදාළවයි මේ සටහන ලියන්නේ. වර්තමානයේ රැකියාවක්, ව්‍යාපාරයක්, මෝස්තරයක් හැටියටත් සත්ත්ව හිංසාව කරන විශාල පිරිසක් සිටිනවා. බොහෝම ඉහළ ශ්‍රේණියේ සමහරක් බල්ලන් ඇති කරන මහත්වරුන් බැල්ලිය පැටව් ලැබුවට පස්සේ බලු පැටියට සතියක් වෙනකොට පශුවෛද්‍ය මහතා ලඟට බලුපැටව් රැගෙනවිත් එම සතුන්ගේ වලිගය කපා දමනවා. එය කරන්නේ මෝස්තරයකට. කුකුළු ගොවිපොළවල්වල කුකුළු පැටව් කුඩා කාලයේදීම එම සතුන්ගේ හොට කෙටි වෙන්න කපා දමනවා. ඌරු ගොවිපොළවල ඊරිය පැටව් ගැසුවම, පස්සේ ඌරු පැටවුන්ගේ දත් ගලවා දමනවා. ඊරියගේ තනපුඩු ආසාදනය වෙන නිසා. මේවා මහා පරිමානයෙන් සිද්ධවෙන්නා වූ සත්ත්ව හිංසාවන්. මෙතනදී හිංසාවට ලක්වෙන්නේ කුඩා වයසේ සතුන්. මේ තිරිසන් සතුන් කුඩා වයසේම හිංසාවට ලක්වෙන්නේත් එම සතුන්ගේ කර්ම විපාකයක් නිසා. කෙනෙක් අකුසල් විපාකයන් අත්විඳින විට තව කෙනෙක් අකුසල කර්මයන් රැස් කරනවා. මේක තමයි මාරයාගේ ආර්ථික විද්‍යාව. ඉල්ලුම, සැපයුම බොහෝම සමතුලිතව සිදුවෙනවා. මෙවැනි ළදරු වයසේ සතුනට හිංසා කරන උදවිය මරණින් මතු මනුෂ්‍ය ජීවිතයක් ලැබුවොත් ළදරු කාලයේදීම රෝගීන් බවට පත්වෙනවා. උපතින්ම ළදරු ශරීරයේ අඟපසඟ, ඉන්ද්‍රියන් අඩුයි, විකෘතියි. කුසල් වගේම අකුසල්ද විපාකදීමේ දී බොහෝම සාධාරණවයි ඒවා සිද්ධවෙන්නේ. මේක අසාධාරණයි කියලා ඇපිල් (අභියාචනා) කරන්න අවශ්‍ය නැහැ. ඒ තරමට ලෝක ධර්මය සාධාරණයි. හැබැයි ඔබ ධර්මය නොදන්නා නිසා හැම වෙලාවේම මෙම තීන්දු අසාධාරණ හැටියටයි දකින්නේ.

දෙවියන් අප දිහා බලන්නෙ නැහැ. ධර්මයේ පිළිසරණක් අපිට නැහැ කියලයි ඔබ දකින්නේ. ධර්මය කියන්නෙ කුමක්ද? අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය. මේ ස්වභාවයට පුළුවන්ද ඔබට පිළිසරණ වෙන්න. මෙතැන නිත්‍ය වූ, සැප වූ, ආත්ම වූ ස්වභාවයක් තිබෙනවාද. ධර්මයට බැහැ ඔබට පිළිසරණ වෙන්න. ඔබ ධර්මය පිළිසරණ කොට ගන්න. කොහොමද ඔබ ධර්මය පිළිසරණ කර ගන්නේ. ධර්මයේ ස්වභාවය වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය අවබෝධකොට ගැනීම උදෙසා සීල, සමාධි, ප්‍රඥා මාර්ගයට අවතීරණ වෙන්න. මෙතැනදියි සත්ත්වයා ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදීමේ චතුරාර්ය සත්‍ය ධර්මයම නුවණින් දකින්නේ. එහෙම නුවණින් දකින කෙනා දුකට ශාප කරන්නේ නැහැ. දෙවියන්ට දොස් තබන්නේ නැහැ. ධර්මයට නිගරු කරන්නේ නැහැ. දුකත්, දුකට හේතුවත්, දුකින් මිදීමත් අරමුණු කොට ගෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගයම සිය එකම මාර්ගය කොට ගන්නවා. දුකට එකම හේතුව අලියාවත්, බලුපැටියාවත්, රෝගී දරුවාවත් නොව තෘෂ්ණාවම බව අවබෝධ කර ගන්නවා.

සත්ත්ව හිංසාව ගැන කතා කරනවිට ගෘහ ආශ්‍රිතව ඇති දැඩිවෙන ගවයන්, බල්ලන්, බළලුන්, පක්ෂීන් වැනි සතුනුත් ගෘහය තුළ ජීවත්වෙන කෘමීන් වැනි සතුන් මනුෂ්‍යයන් අතින් අනන්තවත් පීඩාවට ලක්වෙනවා. තිරිසන් සතෙක් යනු සතර අපායේ සාමජිකයෙක්. ඒ කියන්නේ මාරයාගේ වසඟයේ ජීවත්වන්නෙක්. පින්වත් ඔබ තුළ අකුසල් මූලයන් රෝපණය කිරීමට මාරයා මෙම තිරිසන් සතුන්ව තමයි උපයෝගී කරගන්නේ. තිරිසන් සතා යනු මාරයාගේ සූරතලායි. පින්වත් ඔබව සතර අපායට බිලිබා ගැනීම සඳහා මාර බිලි කටුවට අමුණන ඇම වන්නේ තිරිසන් සත්ත්වයායි. එහෙයින් ගින්දරෙන් යම් සේද ඔබ පරිස්සම් වන්නේ, තිරිසන් සතුන්ගෙන් ඔබ ඊටද වඩා පරිස්සම් වෙන්න ඕනේ.

ගින්දරට පිච්චුනත් පිච්චිච්ච වේදනාව පමණයි. සතුනට හිංසා කළොත් සතර අපායේම දුක ඔබට උරුම වෙනවා. මනුෂ්‍ය ජීවිතයක් ලැබුවොත් රෝගී පුද්ගලයෙක් වශයෙනුයි ඔබට ජීවත්වෙන්න ලැබෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්ම

මාර්ගයේ ඔබ ගමන් කළොත් ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, මෛත්‍රීයෙන් පරිපූර්ණ මනුෂ්‍යයෙක් බවට ඔබ පත්වුව හොත් ඔබට හැකියාව තිබෙනවා තිරිසන් සතාව උපයොගී කරගෙන කුසල් මූලයන් වැඩෙන ස්වභාවයට ඔබේ ජීවිතය ගෙන යන්න. ඔබේ ගෙදර දොරකඩට බල්ලෙක් එනවා. දෙමාපියන් දරුවට කියනවා පුතේ ඔය බල්ලව හිරිහැර නොකර එලවල දමන්න කියලා. එතනදි ඔබ තුළ මෛත්‍රී සිතිවිල්ලකුත් ඇතිවෙලා. එහෙමත් නැතිනම් ඔබ කියනවා පුතේ ඔය බල්ලට කෑම ටිකක් කන්න දීල කෑම කෑවට පස්සේ හිරිහැර නොකර එලවලා දමන්න කියලා. එතනදි මෛත්‍රී සිතුවිල්ලක් වගේම ත්‍යාග සිතුවිල්ලකුත් ඇතිවුණා. සතුන් සම්බන්ධව ක්‍රියාත්මක වීමට පෙරාතුව ඔබ ඉවසිලිමත් වෙන්න සත්ත්ව හිංසාවට හිරි ඔතප් දෙක ඇතිකර ගන්න.

සත්ත්ව හිංසාව කියන දෙය පින්වත් ඔබ හිතනවාට වඩා බොහෝම සියුම් දෙයක්. මේ සියුම්බව මනුෂ්‍යයාට තේරුම් ගන්න බැරි නිසාමයි රෝගී භාවයෙන් තොර මනුෂ්‍යයෙක් වර්තමාන ලෝකයේ සොයා ගැනීමට විරල. නිරෝගී පින්වතුන්ලා සමාජයේ ඉන්නවා. ඒ අය අත්විඳින්නේ සංසාරයේ තමන්ම කරගත්ත කුසල් විපාකයන්. සත්ත්ව හිංසාව නිසා සත්ත්වයාට විඳින්නට සිදුවන කර්ම විපාකයන්ගේ සියුම් භාවය ඉතාමත් මැනවින් ප්‍රකට වෙන කතාවක් භික්ෂුව දැන් ඔබගේ අවබෝධය සඳහා මෙහි සටහන් කරනවා. මේ කතාව කියවලා ඔබම තීරණය කරන්න සත්ත්ව හිංසාව යනු මොන තරම් සියුම්ව ඔබ අතින් සිදුවිය හැක්කක්ද ඒවායේ අකුසල විපාකයන් මොන තරම් සියුම් ගුප්ත ආකාරයට ඔබට විපාක පිණිස සකස් වෙනවාද කියලා. මේ කතාව කියවලා ඔබ සත්ත්ව හිංසාවන් සිදු කිරීමෙන් අත් විඳින්නට වන අකුසල් විපාකයන් හොඳින් හඳුනාගෙන ඔබද මින් මතුවට සතුන් ඇති කරනවා නම් එම සතුනට හිංසාවක් පීඩාවක් ඇති නොවන ආකාරයට එය කරන්න. සතුන්ගෙන් හරිහම්බ කරගන්න. ආදායම් ලබාගන්න. සතුන්ව හොඳින් පෝෂණය කරමින්, මෛත්‍රිය කරුණාව දක්වමින්ම.

ධර්මයට බොහොම ලැදි මැදිවියේ විවාහක යුවලක් ජීවත් වෙනවා. මේ දෙපළට දරුවන් නැහැ. ඒ නිසා බොහොම නිදහස් ජීවිතයක් තමයි ගත කරන්නේ. ප්‍රධාන නගරයක ව්‍යාපාරික ස්ථානයක් පවත්වා ගෙන යමින් ආදායම් ලබනවා. මේ ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යන්නේ බිරිඳ විසින්. සැමියා අත්‍යවශ්‍ය අවස්ථාවක දී තමයි ව්‍යාපාර කටයුතුවලට හවුල්වෙන්නේ. ඒ කියන්නේ ඇය සහජයෙන්ම ව්‍යාපාරික හැකියාව තිබෙන කාන්තාවක්.

නමුත් මේ පින්වත් කාන්තාවගේ ජීවිතයට බලපාන එක්තරා ප්‍රශ්නයක් තිබෙනවා. එය ගුප්ත ස්වභාවයේ ප්‍රශ්නයක්. ඇය සමහරක් අවස්ථාවල තැතිගත් අයුරක් පෙන්වනවා. සමහර අවස්ථාවල ඇයගේ පසුපස අමනුෂ්‍ය බලවේගයක් තිබෙන බව ඇය පවසනවා. මේ හේතුවෙන් ඇය පීඩා විඳිනවා. ව්‍යාපාරය කරන අවස්ථාවේ බොහෝම හොඳින් කටයුතු කරන ඇය ගෙදර පැමිණි වෙලේ පටන් කේන්ති ගන්නවා. සැමියා පන්සලකට යෑමට, භික්ෂුවක් හමුවීමට යන්න හදන විට ඇය අකමැති වෙනවා. බිය වෙනවා. බිරිඳගේ මෙම ස්වභාවය හොඳින් දන්න ස්වාමිපුරුෂයා ඇයත් සමඟ බොහෝම අවබෝධයෙනුයි කටයුතු කරන්නේ. ඇය සිතනවා තමන්ගේ මියගිය පියා ඇය කෙරෙහි ආදරයෙන් ඇය පසුපස සිටින බව. මේ හේතුව නිසාම ඇය පීඩනයට පත්වෙලා. සමහර අවස්ථාවල තැතිගත්, ගුප්ත ස්වභාවයක් ඇය තුළින් දර්ශනය වෙනවා. නමුත් ඇය තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවයි. සිල්පද ආරක්ෂාකර ගැනීමට උත්සාහ ගන්නවා. පොත පත කියවීමෙන් ධර්මය ගැන හොඳ දැනීමක් තිබෙනවා. මේ ගුණාංගයන් තිබුණත් ඉහත ප්‍රශ්නයෙන් ඇය පීඩා විඳිනවා. මෙම දෙපළ ඉදිරි කාලයේදී සිය ගෙවල් ව්‍යාපාර විකුණා දමා අනගාරිකව ජීවත්වීමටද බලාපොරොත්තුවෙන් පසුවනවා. මේ පසුබිමේ සිදුවීම් හොඳින් ගලපා බලනකොට බොහොම ශ්‍රද්ධාසම්පන්න යුවලක් ලෙසයි මේ දෙපළ පෙනෙන්නේ.

නමුත් ඇයට ස්ථිරව සිතාගන්න බැරි පීඩනයක් ඇය තුළ තිබෙනවා. ඒ පීඩනය නිසා ඇය මානසිකව සමහර අවස්ථාවල දුකට පත්වෙනවා. ඇය මේ පීඩනයට පත් වෙන්නේ ඇය පසුපස අමනුෂ්‍ය බලවේගයක්

සිටින නිසාවත්, ඇයගේ ශරීරය තුළ අමනුෂ්‍ය බලවේගයක් සිටින නිසාවත් නොවේ. ඇයගේ දුර්වල මනෝභාවය නිසයි. ඇය දක්ෂ නැහැ, තමා තෙරුවන් සරණ ගිය, සීලයක හික්මෙන, නිරතුරුව දන්දෙන අයෙක් හැටියට දකින්න. එම දැක්ම විශ්වාසයක් බවට පෙරළාගන්නත්. මේ විශ්වාසය තුළින් ඇය ශක්තිමත් මනෝභාවයක් ගොඩනගාගත් සැනින් ඇයට හැකියාව තිබෙනවා මෙ දුර්වලතාවයෙන් අත් මිදෙන්න. ඇයට මේ නිවැරදි මනෝභාවය සකස්කර ගැනීමට මඟ අහුරන්නේ පෙර ජීවිතයේ දී ඇය විසින් කරන ලද කර්ම විපාකයක්.

එක්තරා භික්ෂුවක් මේ සිද්ධියට අදාළ කාන්තාවගේ පෙර ජීවිතය සමාධියෙන් අරමුණු කර බලනවා. උතුම් සමාධිය තුළදී ඇයගේ පෙර ජීවිතයත්, වර්තමාන කර්ම විපාකයට අදාළ පෙර ජීවිතයේ දී කරන ලද කර්මයත් භික්ෂුවට දර්ශනය වෙනවා.

භික්ෂුවට දර්ශනය වෙන්නේ මී හරක් කිහිප දෙනෙක් සහ කාන්තාවක්. එම කාන්තාවගේ හඬ මේ විදිහට ඇසෙනවා.

'මගේ වැඩ කරපු සල්ලි දෙන්න'

ඔතැනින් දර්ශනය නිමයි.

දැන් භික්ෂුව මෙම දර්ශනය ඇයගේ පෙර ජීවිතයට ගලපනවා, ඇය පෙර ජීවිතයේ කවරෙක්ද? ඇය කළ අකුසල් විපාකය කුමක්ද යන්න දැනගැනීමට. මෙන්න මේ ගැලපීම ඔබට ගොඩාක් වටිනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කොට වදාළ 'කර්මය ඔබ දායාද කොට පවතීය' යන ධර්මය නැවත නැවත ශ්‍රද්ධාවෙන් යුතුව ආවර්ජනය කිරීමට.

පෙර ජීවිතයේ දී ඇය මනුෂ්‍ය කාන්තාවක්. ඇයගේ ආදායම් මාර්ගය වූයේ මී හරකුන්ව කුඹුරු වැඩ සඳහා කුළියට දීම. ඒ කුඹුරු වැඩට යෙදූ වූ මීහරකුන්ගේ ගාස්තුව තමයි කුඹුරු හිමිකරුගෙන් ඉල්ලන්නේ. දැන් මෙම සිද්ධිය පැති කිහිපයකින් බලමු.

පළමු කරුණ පෙර ජීවිතයේ දී ද ඇය ව්‍යාපාරික කාන්තාවක්. පෙර ජීවිතය කියන්නේ මීට අවුරුදු 50 කට පෙරාතුව. අඩ සියවසකට පෙරාතුව වර්තමානය වගේ විවිධ ව්‍යාපාර තිබුණේ නැහැ. වර්තමාන සමාජයේ තිබෙන සංකීර්ණභාවය තිබුණේ නැහැ. ප්‍රධාන ව්‍යාපාරය, ආදායම් මාර්ගය තමයි කෘෂිකර්මය. එය අතීතයේ ගෞරවණීය ව්‍යාපාරයක්. පෙර ජීවිතයෙදී මෙම කාන්තාව මී හරකුන්ව කෘෂිකර්ම කටයුතුවලට දීමෙන් ආදයම ලැබුවා. මේ ජීවිතයේ දීත් ඇයට පෙර සංසාරික පුරුද්ද නිසාම නවීන තාක්‍ෂණික ආම්පන්න විකිණීමේ ව්‍යාපාරයක් තනියම කරගෙන යෑමට ශක්තිය ලැබුණා. සමාජයේදී ඔබ දැකලා ඇති සමහර කාන්තාවෝ ව්‍යාපාර ක්ෂේත්‍රයේදී ඉතාමත් දක්‍ෂ ආකාරයට කටයුතු කරනවා. මේවා පින්වතුනි සංසාරික පුරුදු. එවැනි පුරුදු නැති අය කඩේකට ගිහින් බඩුවක් ගන්නෙත් බොහොම ලැජ්ජාවෙන්. ඔබලාගේ ජීවන ක්‍රියාකාරකම් සමග මේවා ඔබ විසින්ම ගලපා ගන්න ඕන.

දෙවැනි කාරණය තමයි ඇය පෙර ජීවිතයේ දී කළ ව්‍යාපාරය නිසා ඇති කරගත් අකුසලයේ ස්වභාවය. ඇය මී හරකුන්ව කුඹුරු වැඩට යොදවා ආදායම ලබාගත්තත් ඇය සත්ත්ව ඝාතනයට නම් යොමුවෙලා නැහැ. ඒක අතීතයේ මනුෂ්‍යයා තුළ තිබූ සත්ත්ව කරුණාව. වර්තමානයේ මී හරකුන්ව කුඹුරු වැඩට යොදා ගන්නවා ඉතාම අඩුයි. නමුත් මෙයට වසර 50 කට පෙර සමාජයේ කෘෂිකර්මයේ ප්‍රධානම බලවේගය තමයි මීහරකා. කුඹුර, පස පෙරළන මොහොතේ පටන් අස්වැන්න කමතේ පාගන මොහොත දක්වාම මීහරකා තමයි ගොවිතැනට උදව්වෙන්නේ. මෙම සතුන්ගෙන් මිනිස්සු වැඩ ගන්නේ හුඟක්ම අකාරුණික විදිහට. උදේ ඉඳලා සවස් වෙනකම් නඟුලක මී හරක් දෙදෙනෙක් බැඳලා ගන්න වැඩ ප්‍රමානය කොපමණක්ද? හරියට යන්ත්‍රයක් වගේ. ගොවි මහත්තයා ආහාර ගන්න වෙලාවට පමණයි මීහරකාට නිදහසක් ලැබෙන්නේ. ඒත් නගුලෙන් එම සතාව ලිහන්නේ නැහැ. නගුල කරේ තියාගෙනම මීහරකා විවේක ගන්නවා. මහ පොළොවේ පස පෙරළාගෙන, කඩාබිඳ දමාගෙන යන්න මොන තරම් ජවයකින් මී හරකා විසින් නගුළ අදින්න ඕනේද? පොඩ්ඩ බැරිවුනොත් වැදෙන කෝටු පහර, එහි ශබ්දය භික්‍ෂුවට මේ සටහන ලියන මොහොතේත්

දනෙනවා. 'අනේ මට සනීප නැහැ. මගේ දණිස් රිදෙනවා. මගේ හිස කකියනවා. දන් අවු රශ්මිය වැඩියි. මට බඩගිනියි. පිපාසයි.......' මී හරකට පුළුවන්ද මොන තරම් වුවමනා වුනත් මේවා කියන්න. දවස පුරාවට තම ශරීර ශක්තියෙන් නගුල ඇදලා පොලොවේ පස පෙරළලා සවස් වරුවේ ඕවිටේ තණකොල ටික කාලා නිදාගන්නවා. හෙට උදයේ නැවතත් සුපුරුදු රාජකාරියමයි...

මී හරක් හිමියා ආදායම ලබනවා.

අපි හිතනවා මේක ධාර්මික රැකියාවක් කියලා. ඔබම හිතන්න, මනුෂ්‍යයෝ දෙදෙනෙක් නඟුලක බැඳලා කුඹුරට දම්මොත් පස පෙරළන්න එම දෙදෙනා විඳින්නා වූ මානසික, කායික හිංසනය ගණනය කළ හැකිද? මේ අනුසාරයෙන් මී හරකා අත්විඳින්නා වූ හිංසනය ඔබම තීරණය කරන්න. මෙන්න මේ සත්ත්ව හිංසාව නිසා මී හරකා ගෙළ මත තබා බැඳි නගුල මී හරකා පසුපසින් ගමන් කරන්නේ මොන තරමක්ද එම සතාව කායිකව, මානසිකව හිංසාවට ලක් කළේ කොපමණක්ද ඒ තරමටම එම හරක් අයිතිකාර කාන්තාවට ආදායම ලැබුණි. ඇය එම සත්ත්ව හිංසනයෙන් ඉපයෙන ආදායමෙන් සතුටු වූවාය. එහි කර්ම විපාකය හැටියට කාන්තාවක් ලෙසට උපත ලැබූ මෙම ජීවිතයේ දී ඇය අමනුෂ්‍යයෙක් යැයි සිතා සිටින මානසිකත්වය ඇය පසුපස පැමිණෙමින් ඇයට අකුසල් විපාක විඳීමට සලස්වනවා. බලන්න ලෝක ධර්මය මොන තරම් සාධාරණද කියලා. මී හරකාගේ ගෙලේ බැඳි නගුළ එම සතා පසුපස පැමිණෙමින් එම සතුන්ව කායික, මානසික හිංසාවට ලක්කළේ යම්සේද, එහි කර්ම විපාකය හැටියට මේ මනුෂ්‍ය ජීවිතයේ දී අදාළ කාන්තාවට තමා විසින්ම මනසින් අරමුණු කරගත්තා වූ අමනුෂ්‍ය හැඟීමක් ඇය පසුපස පැමිණෙමින් ඇයව කායිකව, මානසිකව පීඩාවට පත්කරනවා. දන් ඔබට තේරෙනවා ඇති සත්ත්ව හිංසාව කියන අකුසලය මොන තරම් සියුම් ආකාරයෙන් ඔබ අතින් සිදුවිය හැකිද කියලා. ඒ වගේම එම සත්ත්ව හිංසාවන්ගේ අකුසල් ස්වභාවය එම හිංසනයේ ස්වභාවයට අනුරූපී ආකාරයටමයි විපාක දීමට සලස්වන්නේ කියලා.

# හිංසාවේ ආදීනව තවදුරටත්

මේ සටහන ලියන මොහොතේ භික්ෂුව වැඩ සිටින කඳු මුඳුනේ කුටියට වැව් පිටිය හොඳට පෙනෙනවා. මේ වෙලාවේ මී හරක් 75 ක් පමණ රංචුවක් තණ උලා කනවා. වැවේ සිටින කිඹුලා ජලයෙන් මතුවෙලා යට යන නිසා වැව් දියට බැසීමට බයෙන් වතුර එකතුවී ඇති කුඩා දිය කඩිතිවල සමහර සතුන් විවේක ගන්නවා. මේ සත්තු රැළ භික්ෂුවට පෙනෙන්නේ මාර සේනාවක් හැටියට. නමුත් මේ මී හරක් රංචුවේ හිමිකරු මේ සතුන් දකින්නේ සෞභාග්‍යයේ උල්පතක් හැටියට. මේ සතුන්ගෙන් කිරි දොවන්නෙ නැහැ. පැටවුනට කිරි බොන්න දෙනවා. වේගයෙන් පැටියා ලොකුවීමට. මේ අය වැඩෙන්නේ මස් සඳහාමයි. මේ සතුන් රැළ නිසා කීදෙනෙක් නම් අපාගත වෙනවාද. පරම්පරා කීයක් අපාගත වෙන්න ඇතිද? තව පරම්පරා කීයක් අපාගත කරයිද. පරිස්සමින් තිරිසන් ලෝකය ඔබව සතර අපායට ඇද දමන මාර දූතයෝමයි. ඒ වගේමයි සමාජයේ දී ඔබ දැකලා ඇති සමහර පින්වත් සත්ත්ව කරුණාව තිබෙන මනුෂ්‍යයෝ සිටිනවා. සතුන්ට හරිම ආදරෙයි. ගොනෙක් කරත්තයේ බැඳල තමයි ජීවත් වෙන්නේ. සතා කරන්නේ බර අදින එකයි. සවසට ගෙදර ගිහිල්ල සතාගේ දණහිසේ තෙල්ගාන මනුෂ්‍යයෝ ඉන්නවා. බර පටවා ගෙන කන්දක් නගින විට තමාගේ ශක්තිය යොදලා කරත්තේ තල්ලු කරල සහයෝගය දෙන මනුෂ්‍යයෝ ඉන්නවා. තමන් බෙදාගන්න බත් පිගානෙන් බත් කටක් සතාට දෙන මනුෂ්‍යයෝ ඉන්නවා. එවැනි අයටත් සත්ත්ව හිංසාව අදාළයි. ඒත් ඔවුන් තුළ කරුණාව, මෛත්‍රිය සහගත ක්‍රියාකාරකම් නිසා ඒවා විපාකදීමේ ස්වභාවය බරපතල නැහැ. කෙසේ වෙතත් සතුන්ගෙන් ඇත්වී ජීවත්වන එක ඔබට හුගාක් යහපත්. මනුෂ්‍යයා අතින් පමණක්

නොවෙයි සත්ත්ව හිංසාව සිදුවෙන්නේ. තිරිසන් සතා අතින් තිරිසන් සතාව හිංසාවට ලක්වෙනවා. ප්‍රේතයා විසින් ප්‍රේතයාව හිංසාවට ලක්කරනවා. යක්ෂයින් විසින් අමනුෂ්‍යයින්ව හිංසාවට ලක්කරනවා. දෙවියන් විසින්ද දෙවියන්ව මානසික හිංසාවට ලක්කරනවා. රාගය, ද්වේෂය, මෝහය ප්‍රහීන නොකළ සත්ත්වයා අතින් අනෙකා හිංසාවට ලක්වීම අරුමයක් නොවේ. අමුනුෂ්‍යයින් අතින් හිංසනය සිදුවන අවස්ථාවක් ඔබගේ අවබෝධය සඳහා මෙහි සටහන් කරනවා. භික්ෂුවක් උතුරුමැද පළාතේ ආරණ්‍යයක වැඩ සිටින අවස්ථාවක රාත්‍රී දහයට පමණ සමාධියෙන් පසුවෙන විට භික්ෂුවට පෙනෙනවා කුටියේ පසුපස කෙලවරේ සුදු සායක් සුදු හැට්ටයක් හැදි ප්‍රාථමික මට්ටමේ දිව්‍ය ස්වභාවයක්. වයස අවුරුදු 45 වගේ වයස් මට්ටමක කාන්තා ස්වභාවයක් ඇයට තිබුණා. සමහර විටක ඇය පරදත්තරූපජීවී ප්‍රේතියක් වීමටද හැකියි. කොහොමහරි ඇය පින්වත් තැනත්තියක්. හැබයි ඇගේ සමේ පැහැය නම් තලඑලළු පැහැයක් තිබුණේ. එයින් අනුමාන කරන්න පුළුවන් ඇය ක්‍රෝධය සහිත චරිතයක් බව. ඇය කුටිය කෙළවරට වෙලා බොහෝම සන්සුන් ඉරියව්වෙන් භික්ෂුව දෙස බලාසිටිනවා. ඇය භික්ෂුව දෙස බලමින් යම් ආස්වාදයක් ලබනවා. ඔබ දැකලා ඇති තරුණ, මධ්‍යම, මහළු වයසේ උපාසක මහත්වරු ඉන්නවා දායිකාවන් ඉන්නවා ස්වාමීන් වහන්සේලාගේ ඉරියව් චර්යාවන් ප්‍රියකරන, කැමතිකරන, ඒවා දැකලා යම් අහිංසක ආශ්වාදයක් ලබන. වින්දනයක් ලබන. මෙවැනි ස්වභාවයේ උපාදානයක් සකස්කර ගෙන මියගිය මැදිවියේ උපාසිකාවක් වෙන්න පුළුවන් ගිය ජීවිතයේ දී ඇය. මේ ජීවිතයේ දී ප්‍රාථමික දිව්‍ය හෝ ඉහළ ප්‍රේත ජීවිතයක් ලබලා ආරණ්‍යය තුළම ජීවත්වෙමින් ස්වාමීන් වහන්සේලා උපාදානය කරගෙන සිටිනවා. භික්ෂුව වැඩ සිටිය කුටිය කෙළවරට වී බලා සිටි සුදු ඇඳුම ඇඳගත් මේ තැනත්තිය බෝහෝම සංවරයි. රාගය ද්වේශය පෙනෙන්නට නැහැ ඇයගේ ස්වභාවයේ. මේ විදියට ඇය භික්ෂුව දෙස නිවිසැනසිල්ලේ බලාසිටින විට තවත් ප්‍රේතයෙක් ඇයට බොහෝම සමීපව ඇය ඉදිරියෙන් ගමන් කළා. ඒ ප්‍රේතයා කෙට්ටු හීන්දෑරි ප්‍රේතයෙක්. මේ ප්‍රේතයා අර ප්‍රේත කාන්තාව ඉදිරියෙන් ගමන් කරන විටම අර සුදු ඇඳුම් ඇඳගෙන භික්ෂුව දෙස

බලාසිටි ප්‍රේතියගේ අවධානය බිඳුණා. ඇය ක්ෂණයෙන් ක්‍රියාත්මක වුනා. ඔබ දකල තිබෙනවා ද නිවෙස්වල ස්වාමිපුරුෂයා අතින් බරපතල වැරද්දක් වුනාම බිරිඳට කේන්ති යනවා. එහෙම කේන්ති ගියහම බිරිඳ අත්දෙක මිටි මොලවලා වේගයෙන් ස්වාමිපුරුෂයාගේ පපු පෙදෙසට පහර දෙනවා. කාන්තාවෝ හුඟක් වෙලාවට තව කෙනෙකුට ක්ෂණික ආවේගයක දී පහර දෙන්නෙ ඔය ඉරියව්වෙන්. මෙන්න මේ ඉරියව්වෙන්ම අර ප්‍රේතිය තමාගේ ඉදිරියෙන් ගමන් කළ තමාගේ අවධානය කැඩුව ප්‍රේතයාට පහර දුන්නා. තමන් කැමති ආශ්වාදයට බාධා කළ සැනින් කේන්තිය සකස්වුනා. ඒ ආවේග යෙන්ම ප්‍රේතයාට නොසැහෙන්න ගැහුවා. එතැනින් මේ දෙදෙනාම නොපෙනී ගියා. හැබයි ඉතින් ප්‍රේතයා නොසැහෙන්න ගුටිකෑව සුදු ඇඳුම ඇඳගෙන සිටිය ප්‍රේතියගෙන්. හැබයි මේ දෙදෙනාම ප්‍රේතයැයි හැඳින්වුවද පෙර ජීවිතයේ ආරණ්‍ය, පන්සල් ඇසුරේ සිටි උපාසක උපාසිකාවන් නමුත් තමන් කළ පින්කම්වලට වඩා වෙනත් ප්‍රියකළ දේවල් කෙරෙහි ඡන්ද රාගය සකස් කරගත් නිසා ආරණ්‍යය පන්සල් ආශ්‍රිතව ජීවත්වන ඉහළ තලයේ ප්‍රේත කොටසක් බවට පත්වුනා වෙන්න පුළුවන්. පින්වත් ඔබලා මේ සතර අපායේ චරිත හොඳින් අධ්‍යයනය කරන්න ඕනේ. එහෙම හොඳින් මෙම අමනුෂ්‍ය චරිත ගැන අවධානය සිදු කළොත්, හේතුඵල ධර්මයන් ගලපා බැලුවොත් පින්වත් ඔබ තුළ යම් අඩුපාඩු තියෙනවා නම් ඒවා නිවරැදි කර ගන්න පුළුවන්. මේ ධර්ම මාර්ගයේ ගමන් කරන ස්වාමීන් වහන්සේලා පන්සලේ වේවා ආරණ්‍යයේ වේවා තමන්ගේ ජීවිත තුළින් ක්‍රියාත්මක කරන ධර්ම ප්‍රතිපදාව නිසාම උන්වහන්සේලා බොහෝම ප්‍රිය මනාපයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ ශ්‍රද්ධාවෙන් සීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ගමන් කරන ඕනෑම ගෞරවණීය ස්වාමීන් වහන්සේ නමක්ව දකින්නට ප්‍රියයි. ඇවතුම් පැවතුම් සංවරයි. දෙවිවරු වගේ පැහැපත් ප්‍රභාශ්වර ස්වාමීන් වහන්සේලා වර්තමාන සමජයේ වැඩ සිටිනවා. එම ස්වභාවය කුසල් විපාකයන් නිසා ඇතිවන්නක්. එම නිසා පින්වත් දායක දායිකාවන් නිරතුරුවම උත්සාහවන්ත වෙන්න ඕනේ එම ස්වාමින් වහන්සේලාගේ සීල, සමාධි ප්‍රඥා ගුණයන්ට ගරු කරන්න කැමති වන්න එම ගුණයන් සිහි කරන්න. එසේ නැතිව එම

පින්වත් ස්වාමීන් වහන්සේලාගේ රූපය කෙරෙහි, කටහඬ කෙරෙහි, ප්‍රසන්න භාවය කෙරෙහි ඡන්ද රාගයක් ඇතිකර ගතහොත් එය දුක පිණිසයි හේතු වෙන්නේ. පින්වත් ස්වාමීන් වහන්සේ නමක් හමුවට ඔබ යා යුත්තේ ධර්මයක් අසා දැනගෙන සතුටු වෙන්න. පන්සලට යන්නේ දාන, සීල, භාවනා මාර්ගයේ ගමන් කර සතුටු වෙන්න. එසේ නොමැතිව වෙනත් රූපයන්, ශබ්දයන්, ගන්ධයන්, ස්පර්ෂයන් කෙරෙහි ඡන්ද රාගයක් සකස් කරගන්න ඔබේ සිතට ඉඩදෙන්න එපා. එහෙම උනොත් එය හරියට අසනීපයකට බෙහෙත් ගන්න රෝහලට ගිහිල්ලා තිබුණු අසනීපයට වඩා භයානක රෝගයක් හදාගෙන ගෙදර පැමිණි කෙනෙක් බවට පත් වෙනවා. ඉහත ප්‍රේතයත් ප්‍රේතියත් පෙර ජීවිතයේ දී පන්සලට ආරණ්‍යයට ගිහිල්ල අවශ්‍ය දෙය කෙරෙහි නොව අනවශ්‍ය අවදානම් සහිත දෙය කෙරෙහි ඡන්ද රාගය සකස් කරගත් දෙදෙනෙක්. ඒ කැමත්ත නිසාම මේ ජීවිතයේ දී භික්ෂූන් වහන්සේලා දෙස බලා සිටිමින් ආශ්වාදය ලබනවා. මෙම කතාව භික්ෂුව ඔබට මතක් කළේ අමනුෂ්‍ය ලෝකයේ සත්ත්ව හිංසනය ගැන ඔබව දැනුවත් කරන්න. ප්‍රේත ලෝකයේ ජීවිත වල රාගය ද්වේශය මෝහය අධික නිසා හිංසනයන් අධික බව සිහි තබා ගත යුතුයි. ඇය සුදු ඇඳුමක් ඇඳගෙන සිටියත් ඔබ සිහිකරන්න ඉහත ප්‍රේතියගේ සිතේ සැඟවී තිබුණ ද්වේශය. ඒ ද්වේශය වේගවත් වන්නේ රාගය නිසා. මේ කරුණු දෙකම සකස් වෙන්නේ මෝහය නිසාමයි. රාගයේ හා ද්වේශයේ තීව්‍ර බව තමයි ඇයගේ වේගවත් පහරදීම තුළ දර්ශනය වූයේ. නිවරැදි දෙය නිවරැදි ආකාරයට ගලපා නොගතහොත් අත්වන ඉරණම ගැන ඔබ තුළ බියක් සකස් කරගන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අමූලිකා ශ්‍රද්ධාව වශයෙන් දේශනාකරන්නේ ඉහත ස්වභාවයයි. මේ ස්වභාවය වර්තමාන සමාජයේ බහුල වශයෙන් පවතින්න පුළුවන්. අනිත්‍ය සංඥා නොමැති බව නිසාමයි රූපය කෙරෙහි මෙවැනි ඡන්ද රාගය සකස් වෙන්නේ. මෙය ගිහි පැවිදි පින්වත් හැමෝම දෙවරක් සිතිය යුතු ප්‍රශ්නයක් බවට පත්කර ගතහොත් එය යහපත පිණිසමයි හේතු වෙන්නේ. අද වැනි සංකීර්ණ සමාජයක අනිත්‍ය සංඥා වැඩෙනවා කියන එකත් දුර්ලභ දෙයක්. ලෝකය සකස් වෙන්නේ රූපයට වටිනාකම් වැඩි කරමින්මයි. සැපයට තව නමක් කියන්න

කීවොත් ලෝකයාගේ පිළිතුර ''රූපයක්මයි''. රූපයේ නිරෝධය තුළයි සැපය තිබෙන්නේ කියලා ලැබෙන පිළිතුර දුර්ලභ දෙයක්.

දැන් නැවතත් මාතෘකාව සත්ත්ව හිංසාව දෙසට හැරෙමු. සත්ත්ව හිංසාව ගැන කතාකරන විට අකුසල් බලවත්ව සකස් වෙන්නේ මනුෂ්‍යයා මනුෂ්‍යයාට කරන හිංසාවන්ට. මනුෂ්‍ය ජීවිතයක් මොන අඩුපාඩුකම් යටතේ වුවද යමෙක් ලබන්නේ පෙර ජීවිතයේ කරගන්නා ලද පින්කම් නිසාමය. විශේෂයෙන් අද වැනි බුද්ධෝත්පාද කාලයක බෞද්ධයෙක් ලෙස ලබන මනුෂ්‍ය ජීවිතය ආශ්චර්යයමත් දෙයක්මයි. මේ මනුෂ්‍ය ජීවිතය යමෙක් ලබන්නේ අති විශාල සතර අපාය අභිබවා ගිහින්. ඔහු සතර අපායට නොවැටුනේ සතර අපායේ උපතකට අදාළව සකස්වෙන ලෝභය, ද්වේශය, මෝහය යම් ප්‍රමාණයකට අවම වීම නිසාමය. ඒ නිසා මනුෂ්‍යයෙකුට හිංසාකිරීම තිරිසන් සතෙකුට හිංසාකිරීමට වඩා බලවත් අකුසලයක් සිද්ධ වෙනවා. මොකද ඔබ හිංසනයට ලක්කරන්නේ සතර අපායෙන් ඔබ්බට සිත පිහිටුවා ගැනීමට ශක්තිය තිබූ පෙර පිනැති මනුෂ්‍යයෙකුට වීමයි. සමාජයේ මොන අංශයකින් බැලුවත් මනුෂ්‍යයා මනුෂ්‍යයාට හිංසා කිරීමේ වර්ධනයක්මයි පෙනෙන්නේ. අවිද්‍යාව නිසා සකස් වෙන ලෝකය සැපයි කියන මතය අයිති කර ගැනීමට යාම නිසාමයි ඔබ අතින් මනුෂ්‍ය හිංසනය සිදුවෙන්නේ. හිංසනය කියන්නේ ආදායම් මාර්ගයක්, රැකියාවක්, උසස්වීමක්, ඉතිරියක්, හීනමානයක්, ආරක්‍ෂාවක්. කොටින්ම ඔබේ පැවත්ම උදෙසා අන්‍යයන් හිංසනයට ලක් කරනවා. වර්තමානයේ උපත ලබන මනුෂ්‍යයාගේ අකුසල් ස්වභාවය වැඩි නිසාමදෝ හිංසා කිරීමත් හිංසාවට ලක්වීමත් ජීවිතයේ කොටසක් බවට පත්වෙලා. මෙතන දී හිංසනය ලෙස ගැනෙන්නේ පහරදීම තුවාල සිදුකිරීම වැනි කායික හිංසනයන් පමණක් නොවේ මානසිකව හිංසාවට පත්කිරීමත් ඔබට බලවත් අකුසල් පිණිස හේතු වෙනවා. රටේ පොදු ප්‍රවාහන සේවය උදාහරණයට ගන්න. එක දිනකට කොන්දොස්තර මහතා රියදුරු මහතා අතින් මොන තරම් මනුෂ්‍ය හිංසාවක් සිදුවෙනවාද? අධිකව මගීන් පැටවීම නිසා, අධික වේගය, හීන වේගය, මගීන්ට බැණ වැදීම් ඇයි මෙහෙම වෙන්නේ වැඩිපුර ආදායම් ලබන්න. හවසට පින්වත් බස් මුදලාලිව සතුටු කරන්න. තමනුත් වැඩිපුර කීයක් හරි

තමාගේ පැවත්ම, දරු පැටවුනගේ පැවත්ම සඳහා ගෙදර අරගෙන යන්න. තමාගේ සතුට උදෙසා අනුන්ව පීඩනයට ලක්වෙනවා. මේවා එකිනෙකට බැඳිල තිබෙන්නේ මාර බන්ධනයෙන්. බස් හිමිකරුට ඔබ ආදායම දුන්නොත් තමයි ඔබගේ රැකියාව ආරක්‍ෂා වෙන්නේ. හැම ක්ෂේත්‍රයකම ස්වභාවය ඔහොමයි. හිර ගෙදරක්, පාසලක්, විශ්ව විද්‍යාලයක්, රෝහලක්, ආරක්‍ෂක අංශ, පරිපාලන අංශය, ගෘහ සේවකයින් මේ හැම තැනකම ඉහත ස්වභාවය තියෙනවා. මේවා නිවැරදි කරන්න, අවම කරන්න පුළුවන් දේවල් නොවේ. මේවායේ වර්ධනයක්මයි දිනෙන් දින සිද්ධ වෙන්නේ. මෙතනදී පින්වත් ඔබ දකින්න ඕනේ අයෙක් අකුසල් කර්ම විපාකයක් ගෙවන විට තව කෙනෙක් අකුසල් කර්ම සකස්කර ගන්න ආකාරය. වර්තමානයේ හිංසනයට ලක්වෙන්නේ පෙර ජීවිත වලදී අන්‍යයන්ව හිංසනයට ලක්කළ පිරිස්මයි. එම නිසා ඔබ මේවා නිවැරදි කරන්න යන්න එපා. ඒවා නිශ්ඵල දේවල්. සටහනේ මුලදී සඳහන් කළා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සුභ මානවකයාට දේශනාකරනවා සුභ යමෙක් මේ මනුෂ්‍ය ජීවිතයේ දී රෝගීව ඉපදේ නම්, නිරතුරුව රෝගවලට ගොදුරු වෙමින් ජීවත්වෙයි නම් ඊට හේතුව පෙර ජීවිතයේ දී සත්ත්ව හිංසාව සිදු කිරීමය කියලා. බලන්න වර්තමානයේ මනුෂ්‍යයෝ හැමෝම රෝගීන්. රෝහල් රෝගීන්ගෙන් පිරිල, වසංගත රෝග පැතිරෙනවා. මේ අපි දකින්නේ පෙර ජීවිතවල දී කරන ළද සත්ත්ව හිංසාවේ ඵලයත් හේතුවත් තමයි. මනුෂ්‍යයා අතින් සත්ත්ව හිංසාව වැඩි වෙන්න වැඩි වෙන්න අනාගත ලෝකයේ රෝග සහ රෝගීන් තව තව බහුල වෙනවා. මේවා ලෝක ධර්මයන් වළක්වන්න බැහැ. දක්‍ෂයාට තිබෙන්නේ අවබෝධයෙන් ලෝකයෙන් මිදීමට උත්සාහ කිරීමයි.

පින්වත් ඔබ රෝගී භාවයන්ගෙන් තොර නිරෝගී ජීවිතයක් ගත කරන අයෙක් නම් සංසාරික පුරුද්ද නිසාම ඔබ මේ ජීවිතයේ දීත් සත්ත්ව හිංසාවට අකමැති කෙනෙක්. ඔබ මනුෂ්‍යයෙකුට තබා තිරිසන් සතෙකුටවත් හිංසා කිරීමට නොපෙලඹෙන කෙනෙක්. එහෙම අය ඕනේතරම් සමාජයේ සිටිනවා. ජාති ආගම් බේදයකින් තොරව නීරෝගී භාවයද නිසාම ඔබ ඒ ලබන කායික මානසික තෘප්තිය හේතු ඵලධර්මයන් සමග හොඳින් ගලපලා එම උතුම් ගුණයන් තව

තව ශක්තිමත් කරගෙන අනුනට හිංසා නොකර සීලයෙන් පරිපූර්ණ පින්වත් මනුෂ්‍යයෙක් වන්න ඔබත් නිරතුරුවම උත්සාහවන්ත වන්න. සීලයෙන් පරිපූර්ණ භාවයට පත් වෙත්ම ඉහත ලෝක ස්වභාවයන් හඳුනාගත හැකි සමාධියක් ඔබ තුළ ඇති වේවි. ඔබ කලබල විය යුතු නැහැ එම තැනට එන්නට මන්ද සීලයෙන් ඔබ පරිපූර්ණ වෙත්දී ඉන්ද්‍රිය සංවරය ඉබේම ඇතිවෙන නිසා ලෝකයාට නොදනීම ඔබ ලෝකය ගැන සිතන්නට පටන් ගනිවී. ඔබ හිතනකොට ප්‍රවේශම් වෙන්න ඕනේ සමාජයේ පවතින දෘෂ්ඨියට යට නොවී මේවා ගැන හිතන්නට. මේ වගේ ප්‍රශ්නයක් තමයි සත්ත්ව කරුණාවේ නාමයෙන් සමාජයේ තිබෙන මාංශ නිර්මාංශ ප්‍රශ්නය. මේ ප්‍රශ්නයේදී හේතුඵල ධර්මයන් නිවරැදිව ගලපා නොගත් පින්වතුන් තිරිසන් සතුන්ට කරුණාව දක්වමින් මනුෂ්‍යයා කෙරෙහි ව්‍යාපාදය සකස්කර ගන්නවා. පින්වත් දායක පිරිස් විසින් සංඝයා උදෙසා කැප ආකාරයට දානයට මාංශයක් පුජාකළත් එය ප්‍රත්‍යාවේක්ෂකොට වළඳන ස්වාමීන් වහන්සේලාටත් සමහර පින්වතුන්ලා විවේචනයන් එල්ල කරනවා අපිට ඇහෙනවා. එම නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ ධර්මයන්ට පටහැනි ආකාරයේ ක්‍රියාවන්ට පෙලඹෙන්න එපා. එහෙම උනොත් ඔබ ධර්මයේ නාමයෙන් අධර්මය ක්‍රියාත්මක කරන කෙනෙක් වෙන්න පුළුවන්. මෙය හරිම අභාග්‍යයක්. මේ පුංචි ජීවිත කාලයේදී ඔබ අප හැමෝම හිතන්න ඕනේ අපි දන්න දේ හුගාක් අඩු බව. එවිට අපිට පුළුවන් ලෝකයේ සියල්ල අවබෝධයෙන් අභිබවා ගිය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකළ ධර්මය නිහතමානීව නිවරැදිව ජීවිතයට ගලපා ගන්න. එහෙම නම් ඔබ තනි තනිවම සත්ත්ව හිංසාවෙන් වැළකෙන්න. එහි ඵලයවන නිරෝගී බව අත් විඳින්නේ ඔබ මය. ලෝකයේ ස්වභාවය අනිත්‍යයයි. අනිත්‍යයේ ස්වභාවය වේගයයි. මේ වේගයෙන් අනිත්‍යභාවයට පත්වෙන ලෝකය ඔබ අවබෝධකර ගැනීමට නම් ඔබ වේගයෙන් තොර විය යුතුයි. ඔබද වේගවත් වුවහොත් ලෝකය ඔබට සංකීර්ණ වෙයි. ඔබ මෙහෙම හිතන්නකෝ වේගයෙන් ක්‍රියාත්මක වන යන්ත්‍රයක් ක්‍රියාත්මක වන ස්වභාවය ඔබට නිරීක්ෂණය කිරීමට අවශ්‍ය නම් ඔබ නිහඬව එම යන්ත්‍රය දෙස බලා සිටිය යුතුය. එවිට ඔබට දැනගන්නට පුළුවන් යන්ත්‍රය ක්‍රියාත්මක

වන ආකාරය එහි තිබෙන දෝෂ. නමුත් ඔබ කලබල වුනොත් ඔබට එමකටයුත්ත කරගන්න පුළුවන් වෙන්නෙ නැහැ. සමහරවිට ඔබගේ කලබලකාරී ස්වභාවය නිසා ඔබට අනතුරක් වෙන්න පුළුවන්. අන්න ඒ වගේ මේ ලෝකය නැමති නාමරූප දෙක දෙස, මේවා අනිත්‍ය භාවයට පත්වෙන වේගය දෙස, ඔබ ද විවේකීව බලා සිටින්න. ඔබ ඔබ දෙස බලා සිටිය ස්වභාවයෙන්ම අන්‍යයන් දෙසත් බලන්න. සතා සිව්පාවා දෙසත් බලන්න. සතර මහාධාතුවෙන් සැදුන රූපයත්, රූපය ඇසුරුකොට සකස්වෙන නාමධර්මයනුත් දකින්න. ඔබට වෙනසක් පෙනෙනවාද? ඔබය අනුන්ය තිරිසන් සතාය කියලා තිබෙනවා පුංචි වෙනසක්. එම වෙනස තමයි චේතනාව හේතුවෙන් සකස් වුන විඤ්ඤාණයේ වෙනස. ඔබ තුළ සකස්වෙන එක සිතක් ධර්මානුකූලව ගලපාගැනීමට අදක්ෂවීම නිසාමයි මේ වෙනස සකස් වෙන්නේ. මෙන්න මේ පුංචි වෙනස තමයි සුගතිය, දුගතිය කියලා සත්ත්වයාව වර්ගකරන්නේ. මේ වෙනස සකස් වෙන්න හේතු වුනේ ශිල්වත්භාවයත්, දුෂ්සීලභාවයත් නිසාමය. මේ ධර්මතාවය නුවණින් තේරුම්ගෙන සිල්පද ආරක්ෂා කරගන්න. සතර අපායෙන් මිදුන පින්වතෙක් බවට ඔබ පත්වීමට නම් ඒ අවශ්‍ය ධර්මතාවයන් සපුරා ගන්න. නිරෝගී බව අත්‍යාවශ්‍ය දෙයක්. රෝගී වූවොත් කොහොමද මේ ජීවිතේදී වත් සිල්පද ආරක්ෂාකර ගන්නේ. ඒ නිසා පින්වත් ඔබ අනුන් ගැන නොසිතා තමතමන් සතර අපායේ දුක දකිමින් සතර අපායෙන් මිදීමේ අරමුණු කරමින්, එතෙක් නිරෝගී ජීවිතයක් ලබමින් සැනසීමට සත්ත්ව හිංසාවෙන් වළකින්න. සශ්‍රික සෞභාග්‍යවත් නිරෝගී මිනිසෙකු, දෙවියෙකු ලබන කායික මානසික සැපය අනිත්‍ය වූවද එම සැපය සිල්පදයක් තුළ සැගවී තිබූ දෙයක් බව සිහිකරමින් සීලයෙන් පරිපූර්ණ වෙන්න. දුශ්සීලභාවය තුළ සැගවුන දුගතියේ අඳුරු දුක විනිවිද සීලයේ අලෝකය ලබන්න පින්වත් ඔබ දක්ෂවෙන්න.

# මෛත්‍රියත් පරෙස්සමින් !

පින්වත් ඔබට ලෝකය සුන්දර ලෙස චමත්කාර ජනක ලෙස පෙනුනද ලෝකය තුළ ක්‍රෝධය, ද්වේශය, ව්‍යාපාදය අති බහුලය. ලෝකය තුළ ක්‍රෝධය, ද්වේශය, ව්‍යාපාදය බහුලයි යනු මනුෂ්‍යයා තුළ සකස් වෙන්නා වූ අවිද්‍යා සහගත සිත ක්‍රෝධය, ද්වේශය, ව්‍යපාදය තුළින් අපවිත්‍රයි යන්නය. ලෝකය යනු සිතයි. සිතක් යනු දුකයි. මේ දුක වැඩි වශයෙන් ඔබට සකස්කර දෙන්නේ ද්වේශයෙන් අපවිත්‍ර වූ ඔබගේ සිතමය. එහෙයින් ලෝකය තුළ ද්වේශය, ක්‍රෝධය, ව්‍යාපාදය වර්ධනය වෙනවා යනු මනුෂ්‍යයා තුළ එම අකුසල් මූලයන් සකස්වීමේ ප්‍රවනතාවය වැඩිවීමයි. වරද ඇත්තේ අප තුළමය. එහෙත් අප අනුනට ආඩපාලි කියමින් සිටින්නෙමු. අනුන් නිසා ඔබද ද්වේශය සකස්කර ගනිමින් සිටින්නේය.

සතර අපායේත්, මනුෂ්‍ය ලෝකයේත් සත්ත්වයා අත්විඳින අති වේදනාකාරී දුක්වලට ප්‍රධානම හේතුව ද්වේශයයි, ක්‍රෝධයයි, ව්‍යපාදයයි. මේ තුළින් ලබන්නාවූ විපාක අති වේදනාකාරීය. තියුණුය බිහිසුණුය. මෛත්‍රිය යම්සේ ශාන්තද, ප්‍රණීතද, මිහිරිද එහි විරුද්ධාර්ථය ද්වේශයයි. රත් වූ යකඩ තැටියකට ඔබ ජලය දැමුවොත් ඒ ජලය යම්සේ වේගයෙන් පුපුරයිද ද්වේශයේ ස්වභාවයත් වේගයෙන් පුපුරු ගැසීමයි. මේ වේගයෙන් පුපුරු ගසන්නේ ද්වේශයෙන් තෙත්වූ ඔබගේ සිත මිස අන් කවුරුත් නොවේ. ඇයි මේ වේගය, ඇයි මේ පුපුරු ගැසීම.... ඒ ඔබ තුළ ගොඩනගා ගෙන ඇති මමත්වයේ දැඩි භාවයට කැළලක් ඇති වේය යන හීනමානය නිසා එය නැතිකර ගැනීමට ඔබ ගන්නාවූ වෙහෙසයි. මේ වෙහෙස දැඩිවෙන තරමට ඔබ දැනගත යුතුයි ඔබ

තුළ මමත්වයේ දැඩිභාවය වැඩිය කියලා. මමත්වයේ දැඩිභාවය වැඩිය කියලා කියන්නේ ඔබ ''මම'' කියන ආත්මීය භාවයෙන් අල්ලාගෙන ඇති සියල්ල කෙරෙහි ඇතිකර ගෙන සිටින ඡන්ද රාගයේ බලවත් බවයි. වර්තමාන සමාජයේ ජීවත්වන පින්වතුන් සකස් වුන ද්වේශ සහගත සිත අති තියුණු ආකාරයට වර්ධනය කර ගන්නවා. ''මම'' කියන පොහොර ද්වේශය කියන කටුපඳුර හොඳ සැපට වර්ධනය කරනවා අතුරිකිලි දමලා. මේ කටුපදූර වර්ධනය වෙන්න, වර්ධනය වෙන්න, ඔබ කැමතියි. මොකද ඔබ සිතන්නේ මේ කටුපදූරේ විෂකටු ඇනෙන්නේ අනුන්ටය කියලා, ඔබේ ද්වේශයට ලක් වෙන්නාටය කියලා. ඔන්න ඔතන තමයි අප වරද්ද ගන්නේ. අපි දැනගත යුතුයි කටු පඳුරත් කටුපඳුරේ විෂකටුත් තමා තුළමයි වර්ධනය වෙන්නේ, එම විෂකටු වලින් තමාමයි දුකට පත්වෙන්නේ කියලා. තමා තුළම වැඩුන විෂකටු පඳුරේ විෂ තමයි ද්වේශය ඇතිවෙන විට ක්‍රෝධය, ව්‍යාපාදය සක්ස්වෙන විට ඔබගේ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයේ වේගය තුළින් දර්ශණය වෙන්නේ. ඔබ සමහර වෙලාවට ප්‍රකාශ කරන්නේ 'කේන්තියෙන් මාව වේව්ලනවා, මාව රතුවුනා, කලුවුනා, මාව ගිනිගන්නව වගේ වුනා, මට කවුරුවත් පෙනුනෙ නැහැ' වගේ අදහස්. මේවා තමයි එහි ප්‍රතිඵලය. විෂ ක්‍රියාත්මක වෙනවා තමාගේ පාලනය අභිබවායමින්. ඇත්ත වශයෙන්ම ද්වේශය ඇතිවුනාම ඔබට හොඳ නරක, ලැජ්ජාව බය, කුසල් අකුසල් මේ මොකුත්ම පෙනෙන්නෙ නැහැ. මොකද ද්වේශය ඔබට සකස්වුනේ මමත්වයේ දැඩිභාවය රැකගැනීම උදෙසා ඔබ තුළ ඇතිවුන හීනමානය නිසා. ඔබ සුදානම් ද්වේශය නිසා ඇන කොටා ගන්න, මිනීමරා ගන්න, සිරගත වෙන්න. එය ඔබ සැපයක් වශයෙන් දකින්නේ. ඔබ තේරුම් ගන්නේ නැහැ ඔබ තුළ යම් රූපයක් එස්සය වීම නිසා සකස්වුන ද්වේශ සිත ඔබට දුකක් බව හඳුනාගෙන එම සිතේ අනිත්‍ය බව දකින්න. එවිට ඒ සිත ඔබෙන් බැහැරට යාවි. මෙවැනි සරල ධර්මයක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඔබට දේශනාකර ඇතත් එහි ප්‍රතිඵලය ලබන්නන් ඉතා අල්ප බව දකින්නට පුළුවන. ද්වේශය, ක්‍රෝධය, ව්‍යාපාදය ලෝකය තුළ මාරයාට අයත් ඉන්ද්‍රිය ධර්මයන්. මේවා අඩු කරන්න නැති කරන්න ඔබට පුළුවන්කමක් නැහැ. ලෝකය තුළ ද්වේශය තිබිය යුතුය. ඔබ

දක්ෂ විය යුතුයි එය ඔබේ ජීවිතයට ආශිර්වාදයක් කරගන්නට. ලෝකය තුළ ද්වේශය තිබුනොත් තමයි ඔබ තුළ ඇති මෛත්‍රිය ඔබට දකින්නට පුළුවන්, වඩන්න පුළුවන්. ක්‍රෝධය, ව්‍යපාදය ලෝකයේ තිබුනොත් තමයි ඔබ තුළ ඇති කරුණාව මුදිතාව ඔබට දකින්ට පුළුවන්. තව තව වඩන්න පුළුවන්. ද්වේශයෙන්, ක්‍රෝධයෙන්, ව්‍යපාදයෙන් පිරුණු ලොවක අපි ඉපදෙන්නේ මේ අකුසලමූලයන්ගේ නිරෝධය දෙසට ගමන් කිරීමට, අපිට සංසාරික කුසල් ධර්මයන් සම්පූර්ණව ඇති නිසාමයි. බුද්ධෝත්පාද කාලයක ඇති දුකින් මිදීමේ අර්ථය අවබෝධ කර ගැනීමට ශක්තිය ඇති නිසාමයි.

ද්වේශය හදගැස්ම කරගත් සුවිශාල වූ සතර අපාය අභිබවා ඔබ බෞද්ධ මව්කුසක උපත ලැබුවේ සසර පුරුදු කළ මෛත්‍රීගුණ ධර්මයන් නිසාමයි. ප්‍රශ්නය තිබෙන්නේ මෛත්‍රිය අයිතිත් මාරයාට වීමයි. ද්වේශයත්, මෛත්‍රියත් දෙකම මාරයාට අයිති ධර්මයන්. ද්වේශයෙන් තම වසඟයට ගන්න බැරිකෙනා මෛත්‍රියෙන් තම වසඟයට ගැනීමයි මාරයාගේ අරමුණ. මොකද මාරයාගේ ගොදුරුබිම භවයයි. සත්ත්වයාට චතුරාර්ය සත්‍යය අවබෝධය දෙසට යාමට නොදී ඉන් මෙහා කුමන හෝ භවයේ නවාතැනක ඔබව නවතා ගැනීමයි මාරයාගේ අපේක්ෂාව. ඒ නිසා චතුරාර්ය සත්‍යය අවබෝධකරන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ පෙරට යන ඕනෑම පින්වතෙකුට මෛත්‍රිය නැමති ඇම දමා අල්ලා ගැනීම මාර ධර්මයයි. එහෙත් ඔබ මෛත්‍රියට බියවිය යුතු නැත. මෛත්‍රිය යනු භවයෙන් නොමිදී සිටින්න යැයි මාරයා ඔබට දෙන අල්ලසකි, සැපයකි. සැබවින්ම එය සැපයකි, මිහිරකි, ආශ්වාදයකි කොටින්ම එය පාරමිතාවකි. එහෙත් ඔබ එක කරුණක් දනගත යුතුව ඇත. මාරයා ඔබට අල්ලස් දෙන්නේ ඔබට ඇති ආදරය නිසා නොව සුදුසු වේලාවේ ඔබව කොටුකර ගැනීමේ ආපේක්ෂාව ඇතිවය. එය මේ ජීවිතයේ දී නොවීමට පුළුවන. ලබන ජීවිතයේ දී නොවීමට පුළුවන. අපි හිතන්නේ මේ ජීවිතයත් ලබන ජීවිතයත් ගැන පමණි. අපි කාලය මනින්නේ අවුරුදුවලිනි. එහෙත් මාරයා කාලය මනින්නේ කල්පවලිනි. මාරයාට අයත් ලෝකය තුළ මේ දිගු භව ගමනේ දී අබුද්ධෝත්පාද කාල පසුකරන ඔබ මෛත්‍රිය ගැන අසන්නටවත් නොලැබෙන අඳුරු කාල පසු කරනු ඇත. එහෙයින්

ද්වේශය, ක්‍රෝධය, ව්‍යාපාදය වෙනුවට මෛත්‍රිය ඔබ ජීවිතයට පුරුදු පුහුණු කිරීම නොව මාරයාට අයත් ලෝකයෙන් මිදීයාම උදෙසා මෛත්‍රිය වැඩීමට ඔබ දක්‍ෂවිය යුතුය. සක්කාය දිට්ඨිය සිඳ දැමීම සඳහා මෛත්‍රිය වැඩීමට ඔබ දක්‍ෂ විය යුතුය.

'ඒ ගොල්ලෝ නපුරුයි, නරකයි, ''මම'' හොඳයි, මෛත්‍රී සහගතයි' කියන මමත්වයේ දැඩිභාවය සිඳ දැමීම සඳහා ඔබ මෛත්‍රිය වැඩිය යුතුය. පින්වත් ඔබ ද්වේශයෙන්, ක්‍රෝධයෙන්, ව්‍යාපාදයෙන් මිදිය යුත්තේ මෛත්‍රිය මගේ කරගැනීමට නොවේ. ද්වේශ සහගත සිතත්, මෛත්‍රී සහගත සිතත් හේතු ධර්මයන් නිසා සකස් වී අනිත්‍යභාවයට පත්වීයන බව සිතීමටය. එවිට ඔබට ද්වේශයෙන් මිදී මෛත්‍රිය දෙසට නොව ද්වේශයෙනුත්, මෛත්‍රියෙනුත් මිදී භව නිරෝධය දෙසට ගමන් කිරීමට හැකිවනු ඇත. මාරයාගේ අල්ලස් ප්‍රතික්ෂේප කළ පින්වත් නිවන් මග වඩන්නෙක් වනු ඇත. සම්බුදු ඇකයේ උණුසුම සොයා පියවර මනින බුදු පුතෙක් වනු ඇත. ඔබ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවත්, සීලයේ පරිපූර්ණභාවයත්, ද්වේශ සහගත සිතත්, මෛත්‍රී සහගත සිතත් අනිත්‍ය බව දැකීමේ දැක්මත් ඔබ තුළින් පරිපූර්ණ නම් එම දැක්ම තුළින්ම ඔබව සම්බුදු ඇකය මතට ඔසවනු ඇත. එය භවගමනේ නිමාව නොව භව ගමනේ නිමාව දැකීමේ මාර්ග යේ ආරම්භයයි. ඉතිරි දුර ගැන ඔබ බියවිය යුතු නැත. මොකද ඔබ සම්බුදු ඇකයේ පිළිසරණ ලබන හෙයිනි. කල්ප සියක් කෝටි ගනනක් පුරාවට ඔබ විසින්ම ඝන භාවයට පත්කළ මමත්වයේ දැඩිභාවය නැමති වරපටවලින් ඔබ දැන් මාරයාගේ දෑත් දෙපාවලට විලංගුදමා අභවරය. මමත්වයේ දැඩිභාවයෙන් දැන් ඔබ නිදහස්ය. මේ නිදහස් වීම ඔබ ලැබුවේ ද්වේශයට වෛර කිරීමෙන්වත් මෛත්‍රීයට මෛත්‍රී කිරීමෙන්වත් නොවේ. ද්වේශයත් මෛත්‍රියත් අනිත්‍යභාවයට පත්වෙන සිතක් බව දැකීමෙනි. මේ මොහොතේ ඔබ ලබන්නේ දැක්මක් පමණකි. අවබෝධයක් නොවේ. නිරතුරුවම සිත දෙස බලාසිටීමෙන් ඔබට මේ අත්දැකීම ලද හැකිය.

පින්වත් ඔබ මෛත්‍රීභාවනාව පැය භාගයක් කිරීම සඳහා සුදුසු ඉරියව්වකින් වාඩිවී මෛත්‍රී භාවනාව කරන්න. මේ පැය භාගය

අතරතුරදී ශාරීරික පීඩා නිසා, වේදනාවන් නිසා, බාහිර ශබ්ද නිසා ඔබ තුළ ද්වේශයක් සකස්විය හැකිය. එය ඔබට ද්වේශ සහගත සිතක් යන්න හඳුනා ගැනීමට බැරි තරමට සියුම් විය හැකිය. අපි එම සිතට 'කේන්තියක්' කියලා කියමුකෝ. එතකොට බලන්නකෝ මෛත්‍රියත්, ද්වේශයත් අතර තිබෙන පරතරය කොතරම් කෙටිද? කෙතරම් සියුම්ද? මේ දෙදෙනා මොනතරම් අසල්වාසීන්ද. මෛත්‍රී සහගත සිත අසලම නිතරම ද්වේශය තලුමරමින් සිටිනවා. මොකද එයා දන්නවා ද්වේශයත් අනිත්‍ය බව. මෛත්‍රිය දන්න දෙයක් ද්වේශය දන්න දෙයක් ඔබ දන්නේ නැහැ. මොකද ඔබ සිටින්නේ අයෝනිසෝ මනසිකාරයෙන්. අයෝනිසෝ මනසිකාරය නිසාම ඔබ මෛත්‍රියට වගේම ද්වේශයටත් ඇලිලයි සිටින්නේ. එක්කෝ ගැටිලයි සිටින්නේ. ඉතාමත් කෙටි වූ අල්ප වූ බුද්ධෝත්පාද කාලවලදී මෛත්‍රියේ මිහිරි ආශ්වාදයෙන් ඔබව කුල්මත් කොට තබා, අති දීර්ඝවූ අති බියකරුවූ අබුද්ධෝත්පාද කාලවල දී ඔබව ද්වේශයේ ග්‍රහණයට ගැනීම මාරධර්මයයි. මේවා ඔබ හඳුනා නොගන්නාතාක් මෛත්‍රියේ කෙටි ආශ්වාදයට වහල් වී අති දීර්ග ආදීනවයන් අත්වීඳීමට ඔබට සිදුවනු ඇත. අතීතයේ ඇතිවූ සෑම බුද්ධෝත්පාද කාලයකදීම මාරයා යුහුසුළු වන්නේ ඔබට මෛත්‍රිය ඉගැන්වීමටය. මාරයා ඔබේ ගුරුවරයා නිසා ඔබ මෛත්‍රිය ජීවිතයට එකතුකර ගන්නේ ගුරුකුලයේ රැව ගුණ සහිතවය. ඒ කියන්නේ සක්කායදිට්ඨිය, මමත්වයේ දැඩිභාවය සමගින්මය. මෙන්න මේ මාර පාක්ෂික ධර්මය පරාජය කර ඔබ මෛත්‍රිය වැඩිය යුත්තේ මුහුණේ ඔපය වැඩිකර ගැනීමට, ලේ ධාතුව පිරිසිදුකර ගැනීමට, දෙවියන්ට මනුෂ්‍යයන්ට ප්‍රියවීමට නොව පින්වත් ඔබ කාන්තිමත්, පිරිසිඳු, මාර්ගඵල ලාභී දෙව් කෙනෙක්, මාර්ගඵලලාභී මනුෂ්‍යයෙක් වීමටය. සක්කාය දිට්ඨිය සිඳෙන තැන ඔබ ලබන සතර අපායෙන් මිදීමේ ජයග්‍රාහී ඉලක්කය අයිතිකර ගැනීමටය. මෙම අර්ථය ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ අර්ථයයි, ඉලක්කයයි. ලෞකික ආනිසංස ලබාගැනීමේ අරමුණු තබාගනිමින් මෛත්‍රිය වැඩීම නොව, ලෝකෝත්තර අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා මෛත්‍රිය වැඩීමට ඔබ දක්ෂවෙන්න. එවිට සතර අපායෙන් මිදීම වගේම, මෛත්‍රියේ ලෞකික ආනිසංස ධර්මයන් අත්විඳීමේත් භාග්‍ය ඔබට මේ ජීවිතයේ දීම උදාවනු ඇත. හැබයි මාරයා මේ ක්‍රමයට කැමති නැහැ.

එයාට අවශ්‍ය පින්වත් ඔබව මෛත්‍රීයේ ලෞකික ආනිසංස ධර්මයන්ට ලොල්කර බෞද්ධයා කියන සැබෑ අර්ථය වන නිවන් මාර්ගයෙන් ඔබව වළක්වන්න. නිවන් මාර්ගයේ නික්ලේශී සුවය ඔබට අමතක කර, සමේ පැහැපත් බව ඔබට මතක් කර දෙන්නට, සතරසතිපට්ඨාන ධර්මතාවයන් දෙසට නොව ලෞකික මෛත්‍රී සමාධියේ ආශ්වාදයෙන්, මිහිරෙන්, පැහැයෙන් ඔබව කුල්මත් කරවන්නට, තමා තුළ මෛත්‍රී ගුණ ධර්මයන් දියුණුකර ගැනීමේ දැඩි අභිලාෂයෙන් ඔබ විසින් සිදුකරන දානමය පින්කම්, අසරණ සරණ පින්කම්, සමාජසේවා ක්‍රියාවන්, සත්ත්ව හිංසාවට එරෙහි වීම් මේ ආදී සෑම ක්‍රියාවකදීම ඔබ තුළ සක්කාය දිට්ඨියේ ගොඩ වැඩිවන බව ඔබට දැනෙනවා නම් ඔබ ප්‍රවේසම් වන්න. මේ බව හඳුනාගන්න ඔබ නිහතමානී වෙන්න. ඔබ තුළ එම නිහතමානීකම නැතිනම් පින්වත් ඔබ මුලින්ම ඔබව අරමුණු කරගෙන මෛත්‍රිය වඩන්න එම නිහතමානීකම ඇතිවේවා කියලා. මොකද ඔබට ඔබ කෙරෙහි මෛත්‍රිය නැති නිසාමයි ධර්මයේ අර්ථවත් මග ඔබ අහුරාගත්තේ.

පින්වත් ඔබගේ ඇස් ඉදිරිපිට පෙනෙමින්, ඇසෙමින් තිබෙන ධර්මයේ අර්ථවත් මග ඔබ අහුරාගත්තේ මේ ජීවිතයේ දී පමණක් නොවේ අතීතයේ ලොව පහළවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගනනකගේ ශාසනවලදී ඔබ මේ අනුවනකම ම කළා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා මුණගැසුන අවස්ථාවන්වලදීත් අනුවනකම් කළ අපි ඒ හේතුවෙන්ම භව ගමනේ ඉදිරියට පැමිණි අපි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් පිරිනිවී වසර දෙදහස් පන්සියයක් පසුකළ මෙවැනි කාලයක අධර්මය බලවත්භාවයට පත්වීමේ ඉඟි පෙනෙන කාලයක, ඔබගේ අවිද්‍යා සහගත, ඇතිවෙමින් නැති වෙන සිත ඔබට දෙන ඇගයීම් ගැන ප්‍රවේසම් විය යුතුය. ඔබගේ ඔය මාරධර්මයන්ට යටවූ සිත ඔබට කියන 'මම හරි, මම වැරදියි, මමයි දන්නේ' වැනි දෘෂ්ඨීන් ඔබ 'මාර්ගය හරි, මාර්ගය නිවැරැදියි, බුදුරජාණන් වහන්සේයි දන්නේ' ආදී වශයෙන් නිවැරැදිකර ගැනීමට දක්ෂවිය යුතුය. එවිට ඔබට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් දැන දේශනාකර වදාළ සැබෑ මග වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කර නිවැරැදිභාවයට පත්වීමට ඔබට හැකිවනු ඇත. නිරතුරුවම ඔබ

සිතන්න පුරුදුවුනොත් 'බුදුරජාණන් වහන්සේමයි සියල්ල දන්නේ' කියලා ඒ හේතුව නිසාම ඔබ අවශ්‍යම යමක් දන්නා කෙනෙක් බව තහවුරුවෙනවා. සතර අපායෙන් මිදීම උදෙසා ඔබට සියුම් ධර්මයක් මෙතැන තිබෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේමයි සියල්ල දන්නේයැයි විශ්වාස කරන තැනදි ඔබතුළ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිවීමට හේතුවෙනවා. සියල්ල දන්නා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මුල්තැනට පත්කර තමා දෙවැනි වීමටත් තමන් නොදන්නා බව දැනගැනීම නිසාත් තමා තුළ මමත්වයේ දැඩිභාවය සියුම් වෙනවා. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව නිසාම තෙරුවන් කෙරෙහි විචිකිච්චාවත්, අන්‍ය සීලව්‍රත කෙරෙහි විශ්වාසයත් ඇතිවෙන්නෙ නැහැ. සතර අපායෙන් මිදීයාම සඳහා මෙය ඔබට හොඳ කමටහනක් වේවී. හැබයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේමයි සියල්ල දන්නේ කියලා ඔබ බුදුරජාණන් වහන්සේව ''මගේ'' කරගන්න යන්න එපා. ඔබ එහෙම කළොත් මාරයා ඔබේ කමටහන කෙලෙසුවා වෙනවා. ''මගේ බුදුරජාණන් වහන්සේ'' වශයෙන් ආත්මීය භාවයෙන් නොගෙන උන්වහන්සේ දේශනාකර වදාළ ධර්මය ඔබ ඔබේ මාර්ගය කර ගන්න. පින්වත් ඔබ සැමවිටම රූපය සතර මහාධාතුවෙන් සැදි රූපයක් මගේ කර නොගැනීමටත් එම රූපය තුළින් සකස්වෙන අනිත්‍යභාවය තුළ සැඟවී ඇති ධර්මය ගැන සිතීමටත් උත්සාහවත් විය යුතුය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශණා කර වදාළ ධර්ම මාර්ගයේ ඔබ යම්සේ අවබෝධයක් ලබත් දී ඔබ බුදුරජාණන් වහන්සේව දකින්නේ ආත්මීය වශයෙන් නොවේ මේ උතුම් අවබෝධයට ඔබට මාර්ගය කියාදුන් ශාස්තෘන් වහන්සේ කියන පෞර්ෂත්වයෙන්, ගෞරවයෙන්. මොකද අවබෝධයෙන් දශමයකින් හෝ ඉදිරියට ගියා කියන්නේ තෘෂ්ණාව දශමයෙන් හෝ ප්‍රහාණය කළාය කියන කාරණයයි. සක්කායදිට්ඨිය නැතිකළාය කියන්නේ තමා තුළ තිබූ මමත්වයේ දැඩිභාවය ප්‍රහාණය කළා කියන එකයි. විචිකිච්ඡාව, අන්‍යසීල ව්‍රතයන් කෙරෙහි ඇති විශ්වාසය නැතිකළාය කියලා කියන්නේ ඒ ගැන දැකීමට, සෙවීමට, විශ්වාස කිරීමට ඇතිවී තිබු තෘෂ්ණාව නැතිවූ බවයි. අවබෝධය තුළින් ලැබු විශ්වාසය නිසා අවිශ්වාසය, දුක සකස්වෙන දේවල් කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් ඔහු මිදුනා. ධර්ම මාර්ගයේ කුමන තැනකදිවත් අල්ලාගැනීමක් නැහැ. අවබෝධයෙන් මිදීමක්මයි තිබෙන්නේ.

# මාරයා කුළුමීමක ලෙසින් පැමිණියේය

මේ සටහන පුරාවට භික්ෂුව ද්වේෂය සහ මාරයා ගැන කරුණු සදහන් කළා. මෙහිදී මාරයා යනු කවරෙක්ද යන්න පින්වත් ඔබ දැනගැනීමට කැමැත්තෙන් ඇති. සමාජයේ බොහෝම තියුණු මතවාදයන් තිබෙනවා මාරයා යනු සංකල්පයක් පමණයි. මාරයා කියලා කෙනෙක් නැහැ. එහෙමත් නැතිනම් මාරයා යනු සිගරට්, අරක්කුයි. ඔය වගේ අවිද්‍යාව නිසා සකස්වෙන ප්‍රථමික අදහස් සමාජයේ තිබෙනවා. මෙවැනි අවිද්‍යා සහගත අදහස් ඇතිවන සිතටත් එම සිත සකස්වීමට හේතුවෙන රූපයටත් මාරයා කියල තමයි ධර්මයේ සදහන් වෙන්නේ. ධර්මය නොදන්නා කම නිසා මෙවැනි අදහස් අපි ප්‍රකාශ කරනවා නම් අපිට වැටහෙන්නේ මාරයාගේ මාධ්‍ය ප්‍රකාශකයන් ගනයටයි. ප්‍රකාශකයා ඔබ වුවත් එම ප්‍රකාශය ඔබට සංස්කරණය කර දෙන්නේ මාරයාගේ පෞද්ගලික සහකාරියන් තුන්දෙනාය. ඒ තණ්හා, රතී, රඟා යන මාර දුවරුන් තුන්දෙනාය. මේ තිදෙනා දිව්‍යංග නාවන්ය. නිරතුරුවම කැමති වේශයක් මාවාගැනීමේ හැකියාව ඇත. ස්වභාවයෙන්ම ප්‍රභාෂ්වරය, සියුමැලිය, රිද්මය, ලාලිත්‍යය එම දිව්‍යශරීරයේ ස්වභාවයයි. ඉදුණු ජම්බෝල ගෙඩියක මදය යම්සේ රෝස පැහැතිද සුසුනිදු මල් පෙත්තක්සේ මටසිළුටු, රෝස පැහැති ශරීරයකි. මේ දිව්‍ය මාර රූමතියන්ගේ කාර්යභාර්ය මාරයාගේ ග්‍රහණය තුළ සිටින ඔබ තුළ තණ්හාව, මාන්නය, දිට්ඨිය නැමති අකුසල් ඇති කිරීමය. මේ මාරධර්ම තුන ඔබ තුළ ඇති වන්න, වර්ධනය වන්න වර්ධනය වන්න ඔබට දැනෙන්නේ මහත් ආශ්වාදයකි. මේ මාරධර්ම නිසා ඔබ දිට්ඨිකාන්තාරයක අතරමන්වී සිටියත් ඔබට දැනෙන්නේ ඔබ දිව්‍ය විමානයක සුරසැප විදින බවකි. ඔබ ලබන මේ අවිද්‍යාවේ සැපය

ඔබට ලබාදෙන්නේ මේ මාරදූවරුන් තිදෙනාය. සුරූපී මාර දූතියන්ගේ ඇඟිලි තුඩුවල පහසින් ඔබ මෝහනයට පත්වී ඇත. ඔබ එම පහසට ඇති ලොල්භාවයනිසා මාරදූතියෝ සංස්කරනය කර දෙන ඕනෑම අවිද්‍යා සහගත ප්‍රකාශයක් තලු මරමරා ප්‍රකාශ කිරීමට කැමතිය. වර්තමානයේ ඇසෙන මාරයා කියල කෙනෙක් ලෝකයේ නැහැ. මාරයා සංකල්පයක් වැනි අදහස් මාරදූතියන්ගේ ග්‍රහණයට නතුවීම නිසාම ප්‍රකාශවන අදහස්ය. මාර දූතියන් විසින් සංස්කරණයට කර දෙන එම අවිද්‍යා සහගත ප්‍රකාශ ලෝකයට ප්‍රකාශකිරීම වෙනුවෙන් පින්වත් ඔබට ලැබෙන ගෙවීම තණ්හාව, මාන්නය, දිට්ඨියයි. පින්වත් ඔබ මෙම තුන් කාරණයෙන් පොහොසතෙක් කිරීම මාර දූතියන්ගේ අරමුණයි. පොහොසත් වෙන්න ඔබට නිරයේ අති දීර්ග කාලයක් පදිංචිවීමේ වරප්‍රසාදය කිසිදු කෙනහිලි කමකින් තොරව ලැබෙනු ඇත. එහෙයින් පින්වත් ඔබ කුමන අදහස් සමාජයෙන් ඇසුනද එය නිතරම ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය සමග ගලපා බලන්න පුරුදුවෙන්න. බුදුරජාණන් වහන්සේගේ වචනයට පටහැනිව, එම අදහස් දුක පිණිසම හේතුවෙන කරුණක් බව අවබෝධ කරගෙන බැහැර කරන්න. තර්ක කරන්න, ගැටෙන්න යන්න එපා. එවිට ඔබත් නොදැනුවත්ම වැටෙන්නේ එම ගොඩටමය. තව තව නිහඬ වෙන්න. නිහඬතාවය තුළින් දිට්ඨි කාන්තාරයක් වූ මේ සිත ගැන අවබෝධය ලබන්න. ඔබ ලබන අවබෝධය සක්කාය දිට්ඨිය සිඳලීම සඳහාම මෙහෙයවන්න. ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් සිටීමට ඉඩහැර ඔබ ලෝකයෙන් මිදෙන ස්වභාවයට පැමිනෙන්න. පිරිස මගහැර ඔබ තනිවන්න. තනිවූ සිතට නොඇලෙන්න. ඇලීමට තරම් නිත්‍යවූ සිතක් නැති බව අනිත්‍යවූ සිත දෙස බලමින් තේරුම්ගන්න. මෙවිට ඔබව තණ්හාව, මාන්නය, දිට්ඨිය නැමති මාර දූතියන්ගේ සියුමැලි ඇඟිලි තුඩුවලින් කුල්මත් කරනු ඇත. කිතිකවනු ඇත. සුරතල් කරණු ඇත. පින්වත් ඔබ ගන්නාවූ උත්සාහය තන්හාව, මාන්නය, දිට්ඨිය නැමති දුකට අයිති ධර්මතාවයන්ගේ කිලිටිවීමට නොහැකිවනසේ දිවි දෙවැනි කොට වීර්‍යය වඩන්න. ලෝකයට, ලෝකයාට යන්නට හැර ඔබ නවතින්න. යමෙක් නැවතුනා යනු සිත හඳුනාගත්තා යනුය.

සමාජය තුළ මාරයා ගැන මොන මතවාද තිබුනද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධකර දේශනාකළ වදාළ ධර්මයේ සඳහන් මාරයා ගැන දක්වන ලද අර්ථයන් ඔබට වර්තමානයේ දී ද ඒ උතුම් ධර්ම මාර්ගයේ අවංකභාවයෙන්, වීර්‍යයයෙන් යුතුව ගමන් කළහොත් අත්දැකීමට හැකිය. ඔබ එවැනි අත්දැකීමක් ලබද් දී ඔබ තුළ ජනිත වන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දැඩි වීර්යයෙන් යුතුව මාර පරාජය සිදුකර අවබෝධකර වදාළ අති උත්තම ශ්‍රී සද්ධර්මයේ ශක්තියයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ නොවන්නට ලෝකයා කෙසේ නම් මේ පාපකාරී, මිසදුටු, අධර්මයම අහාරය ප්‍රීතිය කර ගත් මාරයා හඳුනාගන්නද? මාරයාට ගොදුරුවීම හැර අන් මොන පිළිසරණක්ද? ලොව්තුරා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේට ධර්මය ගරුකරන තුන්ලෝකයාගේම උත්මතම නමස්කාරය වේවා. මේ විෂම මාර ධර්මය අවබෝධකර පරාජයකර දේශනාකළාට. මෙවන් උතුම් ධර්මයක් සරණයන්නට අපි මොනතරම් භාග්‍යවන්තද? ශාසන පරිහානිය යනු අබුද්ධෝත්පාද කාළයක් යනු සත්ත්වයාට මොනතරම් අඳුරු බියකරු විෂම කාළපරිච්චේදයක් වේවිද? ධර්මය ගොදුරුකර ගැනීමට බලා සිටින අධර්මයේ මාර සේනාව ලෝකයේ තනි බලය සියතට ගැනීමට පෙරාතුව ඔබට මුණගැසුණ ධර්මයෙන් ඔබ සනාථවෙන්න. දෙවැනියෙක් ගැන නොසිතා ඔබ ලබන ඊළග උපත මාර්ගඵළලාභී දෙවියෙක්ම වෙන්න.

දැන් භික්ෂුව මෙහි සඳහන් කරන්නේ සැබෑම මධ්‍යම ප්‍රතිප්‍රදාව තුළ එනම් තුන් සිව්රත් පාත්‍රයත් දරමින් දැඩි අධිෂ්ඨාණයෙන් අවංක භාවයෙන් මේ ධර්ම මාර්ගයේ ගමන්ගත් එක්තරා භික්ෂුවක් සමාධියෙන් පසුවෙද්දී අත්දුටු මාරයාගේ නිවට දීන ක්‍රියාවකි. මේ මාරයා යනු පරනිම්මිත වසවර්තිය නැමති දිව්‍යතලයේ අධිපති වසවර්ති මාරදිව්‍ය පුත්‍රයාය. භික්ෂුව රාත්‍රී 11.00 ට පමණ සමාධියෙන් පසුවෙත් දී භික්ෂුව ඉදිරියට ඉතාමත් වේගයෙන්, ජවයෙන්, වියරුවෙන් කුළුහරක් රංචුවක් පැමිණියහ. මෙම වියරු කුළුහරක් රංචුව භික්ෂුවට මීටර් 25ක් පමණ ඉදිරියෙන් ක්ෂණයකින් පහලවී භික්ෂුවගේ ඉදිරියට දිව ආහ. මේ සෑම කුළු හරකෙක්ම ඉතාමත් ජව සම්පන්න හැඩිදැඩි සතුන්ය. මෙසේ වේගයෙන් පිඹිමින් භික්ෂුව ඉදිරියට දිවමින් භික්ෂුවට මීටර්

පහක් පමණ තිබියදී මේ වියරු කුළුහරක් රංචුව දකුණු පැත්තට හැරී පලාගියහ. මෙම රංචුවේ අවසාන මීහරකාත් භික්ෂුවට සමාධියෙන් නොපෙනීයාමත් සමගම එක ක්ෂණයකින්ම භික්ෂුවට මීටර් විසිපහකට පමණ ඉදිරියෙන් තනි කුළුහරකෙක් පහළවිය. මොහු කුළු හරකෙක් නොව හරක් රජෙකි. උස අඩි පහක් පමණ ඇත. හොඳ පුෂ්ඨිමත් කුළු හරකෙකි. මොහුට අං පිහිටියේ නැත. මෙම කුළු හරකගේ සම වෙල්වට් සමකි. එම සතාගේ සම දිලිසෙන ග්‍රීස්වල ඇති කළු පැහැයක් ගෙන තිබිණි. මෙම ප්‍රපාතවත් කුළුහරකාගේ සම කඩ කැපූ සිව්රක්සේ දිගැටි ආකාරයට අගලේ අගලේ ප්‍රමාණයට දිගට දහස්කඩ සිව්රක්සේ සම නිර්මාණයවී තිබිණි. මොහු ආයුෂ, වර්ණය, සැපය, බලය උපරිම තලයේ කුළුහරකෙකි. මෙම කුළුහරකාගේ නාසයට රිදී පැහැති අගල් හයක් පමණ වට රවුමකින් යුත් වළල්ලක් දමාතිබිණි. එය මාපට ඇඟිල්ලක් තරම් මහතය. දැන් ඔබ මොහොතක් සිතන්න නාසයට රිදී වළල්ලක් දැමූ දහස්කඩ චීවරයක් බඳු වෙල්වට් සමක් සහිත මෙම ප්‍රපාතවත් කුළුහරකාගේ ස්වභාවය. ඔබ මනසින් මෙනෙහි කරන්න ඉහත ස්වභාවයේ ප්‍රපාතවත් මේ කුළුහරකා භික්ෂුවට මීටර් 25ක් ඉදිරියෙන් පහළ වෙච්ච තැනදීම වේගයෙන් හිස වරක් කරකවලා බොහොම ඍජුව හිස කෙලින් කර භික්ෂුව දෙස බලා සිටියා. ඔබ දැකලා ඇති මල්ලව පොර තරඟ වලදී බොහෝම හැඩිදැඩි විදේශීය ක්‍රීඩකයන් ප්‍රතිවාදියා සිටින වේදිකාවට ගොඩවෙන කොටම හිස බොහෝම ගාම්භීර ආකාරයෙන් කරකවලා ඍජු බැල්මක් ප්‍රතිවාදියාට හෙලනවා. මෙහෙම කරන්නේ ප්‍රතිවාදියාව තරගයට පෙරදීම බිය ගන්වන්න. ඉහත කුළුහරකාද පහළවූ නිමේෂයේම ගාම්භිර ලෙස නාසයේ රිදී වළල්ලක් පැළඳි හිස කරකවා තේජස් බව තව දැඩිකර ගෙන සමාධියෙන් පසුවෙන භික්ෂුව දෙසට වියරු බැල්මක් හෙළා නාසයේ කුහර දෙකෙන් දුවිලිපැහැ දුමක් පිටකරමින් වියරුවෙන් මෙන් භික්ෂුව ඉදිරියට හඬා පැමිණියහ. හරියටම භික්ෂුවට මීටර් පහක් පමණ ඉදිරියෙන් මෙම කුළුහරක් රජුද දකුණු දෙසට හැරී පලා ගියහ. භික්ෂුව තවමත් සුපුරුදු සමාධිය තුළය. දර්ශනය නිමවූ පසුව භික්ෂුව සමාධියෙන් අවධිවිය. භික්ෂුවගේ මුහුණට සිහින් සිහිනාවක් නැගිනි. සිහින් සිනාවක් සමග මේ සිතුවිල්ල භික්ෂුව තුළ පහල විය. පරනිම්මිත වසවර්ති දිව්‍යතලයේ

වසවර්ති දිව්‍ය පුත්‍රයා භික්ෂුව ඉදිරියේ කුළුහරකෙක් වීමට තරම් දීන වූවා නේද යන සිතුවිල්ල භික්ෂුවට පහළ විය. භික්ෂුව බියගැන්වීම සඳහා කරන ළද මේ පරාජිත මාර ක්‍රියාවේ දී භික්ෂුව බියගැන්වීමට මාරයාට අවශ්‍ය විය. මාර දිව්‍ය පුත්‍රයාගේ නිවට භාවය යනු ඔහු තවමත් සිතන්නේ ධර්ම මාර්ගයේ ගමන් කරන ආර්යන් වහන්සේලා බිය ගැන්වීමට තමන්ට හැකිය කියාය. මේ ආකාරයෙන් මාරයා භික්ෂුව බියගැන්වූවේ සමහරවිට භික්ෂුව අවබෝධ කළ යම් ධර්මයක්වේද එම ධර්මය ලෝකයාට දේශනා කිරීම වැලක් වීමටය. බියගැන් වීමටය. එම අවස්ථාවේ භික්ෂුව වැඩ සිටියේ ලොකු ප්‍රපාතයක් අසලම තිබූණු කඳු බෑවුමක කුටියකය. භික්ෂුව මේ මොහොතේ බියගන්වා ගැනීමට පුළුවන් වුනොත් කුළුමීමා එන වේගයෙන්ම භික්ෂුව බාග බිත්ති බැඳ තිබූ එම කුටියේ එළියට පැන ප්‍රපාතයටවැටී අපවත් කිරීමට හැකියයි සිතුවාද විය හැකියි. එසේ වූවානම් මේ සටහන ඔබ අතට පත්නොවන බව මාරයාදනී. එහෙත් මාරයාට සිදුවූවේ එහි අනෙක් පැත්තය. භික්ෂුවගේ රෝමකූපයකටවත් අනතුරක් කිරීමට මාරයාට නොහැකිවිය. සමාධි සුවයෙන් සිටි භික්ෂුවගේ සමාධිමත් ස්වභාවය එක දශමයකින් හෝ හීන කිරීමට මාර පුත්‍රයාට නොහැකිවිය. මෙම ශක්තිය භික්ෂුවගේ ආශ්චර්යයක් නොව ධර්මයේ ආශ්චර්යයයි. ඔබද දක්‍ෂනම් මෙම ආශ්චර්ය ඔබගේත් උරුමයයි. උතුම් සමාධිය තුළදී බිය යනු ශූන්‍ය දෙයක් යන ධර්මතාවයේ සත්‍යයයි. විචාර විතර්කයන්ගෙන් තොර සන්සිඳුනු සිතේ උපේක්ෂා සහගත ස්වභාවය ඔබව ඇලීම් ගැටීම්වලින් මුදවාලනවාය යන ධර්මයයි. මෙම කතාවේ මාරයා යනු පරනිම්මිත වසවර්තිය නැමති දිව්‍යතලය අයිති වසවර්ති දිව්‍ය පුත්‍රයාය. මොහු ධර්මයට අකමැතිය. පංච කාමයටම නැඹුරු දිව්‍ය රජෙකි. සමාධිමත් භික්ෂුව ඉදිරියට මුලින්ම වියරුවෙන් දිව එන කුළුහරක් රංචුව මාර සේනාවයි. වසවර්ති දිව්‍යපුත්‍රයා මුලින්ම භික්ෂුව බියගැන්වීමට එව්වේ මාර සේනාවයි. මේ අයද දෙවිවරුය. ඔවුනට අවශ්‍ය ආකාරයේ වේශයක් මවාගැනීමට හැකිය. භික්ෂුව බියගැන්වීමේ මේ මෙහෙයුමට ඔවුන් කුළුහරක් වේශයෙන් පැමිණියහ. සමාධිමත් භික්ෂුවට මීටර් පහක් තබා ඔවුන් දකුණට හැරී පලාගියේ සමාධිය තුළ සකස්වෙන නික්ලේෂී ධර්ම ශක්තියට ලංවීමට ඔවුනට නොහැකි

නිසාය. තව සමහර මාර සේනාව භික්ෂුව අබියසට පැමිණ පලායනවිට එම කටයුත්ත වසවර්ති මාරපුත්‍රයා බාරගත්හ. දෙවනුව පහලවූ තේජස් සහිත ආයුෂ, වර්ණ, සැප, බලයෙන් පරිපූර්ණ දිලිසෙන ස්වභාවයේ ලොම් සහිත කුළුහරක් රජු වසවර්ති දිව්‍ය පුත්‍රයාය. මාර සේනාවට නොහැකිවූ තැන මාරයා ඉදිරිපත් විය. මේ තේජස් සහිත කුළුහරක් වේශය ගත් කුළුහරකා දකින විටම මොහු දිව්‍ය ඕජාවෙන් පරිපූර්ණ අයෙකු බව අවබෝධ වෙනවාය. දහස්කඩ සිව්රක්සේ කැටයම් වූ ඔහුගේ සමේ ප්‍රභාෂ්වර ස්වභාවය දෙවියෙකුට හැර වෙන කාට තිබෙන්නද? භික්ෂුවක් සතු පරිපූර්ණ සීලයත් සමාධියත් මෙම මාර පිරිවර සහ මාරයාට මුහුණදෙන අතර මොවුන් මාරයා සහ මාරපිරිවර බව හඳුනාගන්නේ ප්‍රඥාව විසින්මය. සීලයත්, සමාධියත්, ප්‍රඥාවත් එකතු වුන තැනදී ඇතිවන අයෝමය ශක්තිය තුන් ලෝකයම තම ආධිපත්‍යය තුළ රදවාගෙන තිබෙන මාරයාටද අභියොග කළහැකි බවට මාරයා පරාජය කළහැකිබවට මීට වඩා උදාහරණ කුමකටද? ඔබ මේ දකින්නේ ධර්මයේ සන්දිට්ඨික ගුණයයි. ධර්මයේ අකාලික ගුණයයි. ඔබ මෙම සටහන කියවා මුල්තැන දිය යුත්තේ මාරයාට නොව ධර්මයේ සන්දිට්ඨික ගුණයටය.

# මාරයා තවත් මුහුණකින්

මෙම සටහන කියවා ඔබ සෙවිය යුත්තේ මේ අත්දැකීම ලද භික්ෂුව නොව, එම අත්දැකීම උරුම කරදුන් ධර්මයේ සන්දිට්ඨික ගුණයයි. ඔබ භික්ෂුව සොයන්නේ නම් ඒ ඔබ සොයන්නේ මාරයාමය. මන්ද සෙවීම යනු මාර ධර්මයකි. නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වීම රූපයේ ස්වභාවයයි. රූපය අනිත්‍ය භාවයට පත්වේ නම් එහි ඔබට සෙවීමට දෙයක් නැත. ඔබ කළ යුත්තේ රූපයත් රූපය ඇසුරෙන් සකස් වෙන 'සොයන්න' යැයි කියන සිතත් අවබෝධ කර ගැනීමය. එසේ අවබෝධ කර ගැනීමේ දී ඔබද පරාජය කරන්නේ මාරයාමය. එම භික්ෂුවගේ භික්ෂුජීවිතය තුළදී මීට පෙර අවස්ථා දෙකක කලු පැහැති ගොනෙක්, රතුපැහැති ගොනෙක් වශයෙන්ද මාරයා භික්ෂුව ඉදිරියට සමාධිය තුළදී වියරු ස්වභාවයෙන් පැමිණියේය. මෙම ගොනුන්ගේ ස්වභාවය හරියට විදේශීය ගොන් පොර තරඟවළදී තරගවදින ගොනුන් සේ පුෂ්ඨිමත් ජවසම්පන්න වියරු ගතියක් විය. මේ කරුණු භික්ෂුව ඔබට සඳහන් කරන්නේ ඔබ තුළ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේ දී ඇතිවෙන බාධක බැඳීම්වලට එරෙහිව ඔබට වීර්ය ඇතිකර ගැනීමේ අරුත පැහදිලි කර දෙන්ටය. මාරයාගේ ඉහත ස්වභාවයන් ගැන අපි පුදුම විය යුතු නැත. අපි පුදුම විය යුත්තේ මෙවැනි ධර්මයට එරෙහිව වියරුවෙන මාරයාට අපි කැමත්තෙන්ම වසඟවීම ගැනයි. මාරයාගේ වගකීම වන්නේ යමෙක් ධර්මය අවබෝධය කරා යයිද ඔහුව එම ගමනින් ඉවත් කිරීමයි. යමෙක් ධර්මය අවබෝධ කර ගනියිද ඔහුට එම ධර්මය ලෝකයාට දේශනා කිරීමට අවස්ථාව අහිමි කිරීමයි. මේවා ජන්ම ගතිය. ඔබට මේවා වෙනස්කළ නොහැක. කළ හැක්කේ ඔබ මේ මාර්ගයෙන් වෙනස් වීමය.

ඉහත සටහනින් ඔබට වැටහෙනවා ඇති මාරයායනු සංකල්පයක්යයි කියන මතය මොන තරම් අවිද්‍යාවෙන් පිරුණු එකක්ද කියලා. මාරයා යනු මේ ලෝකයේ ක්‍රියාත්මක චරිතයකි. මොහු දෙවියෙකි. මොහුගේ සේනාවද දෙවියෝය. මොවුන් ඔබට පියවි ඇසෙන් දකිය නොහැකිය. පින්වත් ඔබ සීලයෙන් පරිපූර්ණව සමාධියෙන් පරිපූර්ණව ප්‍රඥාව දෙසට ගමන් කිරීමේ දී උතුම් සමාධියෙන් පමණක් දකගත හැක්කකි. පරිපූර්ණවූ සමාධියේ ඇසෙන් මාරයා සහ පිරිවර ඔබටද මුණගැසෙනු ඇත. ඔබ අවංකව මාරයාට එරෙහිව ප්‍රඥාව අවබෝධයකරා යන්නේ නම් පමණක්..

මෙම සිද්ධියෙදී වසවර්ති දිව්‍යපුත්‍රයා කුළුහරක් වේශයක් මවාගෙන තම ආධිපත්‍යය රැකගැනීමට පෙන්වීමට පැමිනෙණ්නේය. වසවර්ති දිව්‍යපුත්‍රයා කියන්නේ කාමය තුළ ඇලීගැලී ඉන්න දෙවියෙක්. ඔහුට හිරි ඔතප් කියල දෙයක් නැහැ. ඔය දේම නේද සමහර මනුෂ්‍යයින් කරන්නේ. බොහෝම සුපිරි පංතියේ මනුෂ්‍යයෝ තම බලය, සැපය, ආධිපත්‍ය රැකගැනීම සදහා මොන මොන වේශයන් මවාගන්නවාද? මිනීමැරීමට, වංචාකාරී ක්‍රියාවන් කිරීමට පැවිදි වේශයන් ගත් අය අතීතයේ නොසිටිය ද, වර්තමානයේ නැති ද? අහිංසක තරුණියන් මුලාකර ගැනීමට ධර්මය නොදන්නාකම නිසාම මොන මොන ආකාරයේ වේශයන් මවාගන්නා අය සමාජයේ සිටිනවාද? කාමයන්ගෙ න් අන්ධවුන තැනදී දෙවියෝ මනුෂ්‍යයෝ කියලා වෙනසක් නැහැ. මේ ආකාරයට හේතුඵල ධර්මයන්ට අනුව මේ ධර්මය ගලපා ගන්න උත්සාහ ගන්න. එසේ නොවුනහොත් නොයෙක් මතවාදයන් ඇතිවේවි. එය ඔබට දුක පිණිසම තමයි හේතු වෙන්නේ. පින්වත් ඔබ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිකර ගන්න. කුමක් නිසාද? මේ වියරු ලෝක ස්වභාවයන් පරාජය කරන්න මාර්ගය ඔබට උදාකර දුන්නාට.

භවය කරා දිවෙන කාල සටහන් ඔබ හකුලා දමන්න. භවය අයිති මාරයාට. එහෙයින් ලැබුණු ජීවිතයෙන් ධර්ම මාර්ගයේ උපරිම දුරක් යන්න. මහාකරුණා සමාපත්ති ගුණයෙන් යුතුව පිරිනිවී යන මොහොත දක්වාම ලෝකයාට දුකෙන් මිදෙන මාර්ගයම මහා කරුණාවෙන් යුතුව දේශනාකර වදාළ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ, වචනයෙන් කිව නොහැකි අකුරකින් ලිවිය නොහැකි

මහා සයුර වැනි අපිරිමිත ගුණ කදම්බයත්, පංචකාමයටම ලොල්වූ නීච මාරයාගේ ගුණමකු භාවයත්, පින්වත් ඔබව දුකටම හෙළීම සඳහා මාරයාගේ පව්ටු ක්‍රියාවනුත් සතියෙන් සිහියෙන් යුතුව දකින්න. එවිට ඔබට දැනේවි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කියන්නේ මොන ගුණකන්දක්ද, මොන ගුණ සයුරක්ද කියලා. ඔබ දක්ෂ නම් මෙම අර්ථවත් අවබෝධයම ප්‍රමාණවත්, තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිකර ගන්න. තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව කියන්නේ සතර අපායෙන් මිදීමට අවශ්‍ය එක සුදුසුකමක්. මාරයාගේ පව්ටු භාවය ගැන හිතලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි, ධර්මරත්නය කෙරෙහි, සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිකර ගන්න.

භික්ෂුව මේ සටහන ද්වේෂය සහ මාරයා ගැන සඳහන් කිරීමටයි සටහන් කළේ. මාරයා ගැන ඉහත සදහන් කළා. ද්වේෂය ගැන මේ කරුණු පින්වත් ඔබට සදහන් කළේ බස් රථයක වඩින විට මහත්මයෙක් සදහන්කළ අදහසක් නිසා. භික්ෂුව කතරගම ප්‍රදේශයට වඩින්න කොළඹ ප්‍රධාන බස්නැවතුමෙන් කතරගම බසයට ගොඩවුනා. රත්මලාන ප්‍රදේශයේදී සුදු සරමක් හා සුදු කමිසයක් ඇඳගත්ත මැදිවියේ මහත්මයෙක් බසයට නැග බසයේ ඉතිරිවී තිබූ එකම ආසනය වූ භික්ෂුව අසලම ආසනයේ වාඩිවුනා. මේ මහත්මයා භික්ෂුව ලඟ වාඩිවුන වේලාවේ පටන්ම පාපුවරුව දෙස බලාගෙනමයි සිටියේ. මුහුණ ඉදිරිපසට කරගෙන සිටියේම නැහැ. භික්ෂුවට මුහුණ හංගාගෙන වගේ අහකබලාගෙනම සිටියා. බස්රථය තේ පානය සදහා අතරමග නතර කළා. මගීන් බසයෙන් බැස්සට පස්සේ මේ අහක බලාගෙන සිටි මහත්මයා භික්ෂුවගෙන් අහනවා හාමුදුරුවනේ ගිලන්පස එකක් ගෙනත් දෙන්නද කියලා. ඔහු කතාකරනවිටම ඔහුගේ මුවින් අරක්කු ගඳ හොඳින් වහනය වුනා. ඒ වෙලාවේ තමයි භික්ෂුව දැනගත්තේ මෙතෙක් වෙලා මේ මනුෂ්‍යයා අහක බලාගෙන සිටියේ ඇයිද කියලා. අරක්කු ගඳ භික්ෂුවට දැනෙයි කියලා තමයි මොහු මුහුණ සඟවාගෙන මෙතෙක් ඉඳලා තිබෙන්නේ. භික්ෂුව කීවා 'ගිලන්පස අවශ්‍ය වෙන්නේ නැහැ මහත්මයෝ' කියලා. නමුත් මේ මහත්මයා බස්රථයෙන් බැසලා ගිහිල්ලා සිසිල්බීම බෝතලයක් ගෙනත් පූජකළා. භික්ෂුව පින්දීල එය වැළඳුවා. තේ පානය අවසන් කරලා නැවතත් බසය ගමන් අරාම්භ කළා. ඒත් මේ මහත්මයා අහක බලාගෙන සිටියේ. එකවරම මොහු

භික්ෂුව දෙසට හැරී බොහෝම ගෞරවයෙන් 'මම ටිකක් බීලා නිසයි මේ විදියට ඔබ වහන්සේට පිටුපාල වාඩිවෙලා ඉන්නේ' කියලා බොහෝම බැගෑපත්ව කීවා. ඒ වෙලාවේ භික්ෂුව විමසුවා මොකද මේ උදේ පාන්දරම අරක්කු බීල කියලා. එවිට මේ මහත්මයා 'හාමුදුරුවනේ මම මාතර ප්‍රදේශයේ පදිංචි අයෙක්. මගේ රැකියාව කට්ටඩිකම්, ගුරුකම් කරන එක. මම රත්මලානට ඊයේ පැමිණියා කෙනෙකුට වැඩක් කරලා දෙන්න. දැන් වැඩේ ඉවරවෙලා ගෙදර යන ගමන්. හාමුදුරුවනේ මම පුරුද්දක් වශයෙන් වැඩක් භාරගන්කොටම මගේ ගණුදෙනුකරුට මම කියනවා වැඩේ ඉවරවුනාම මට බොන්න අරක්කු අවශ්‍යයි කියලා. ඒ නිසා ගුරුකම් වැඩේ ඉවරවුන ගමන් ගාස්තුවත් අරක්කුත් දෙකම ලැබෙනවා' කීවා. භික්ෂුව මොහුගෙන් ඇහුවා 'මහත්තයෝ ඔය ගුරුකම්වලින් ප්‍රතිඵලයක් තිබෙනවද?' කියලා. මොහු බොහෝම උජාරුවෙන් ඔහුගේ දක්ෂකම් ප්‍රකාශ කළා. 'හාමුදුරුවනේ මට අවශ්‍යනම් මනුෂ්‍යයෙක්ව ජීවිතක්ෂයට පත්කරන්න අවශ්‍ය ගුරුකම් මා ලග තිබෙනවා. ඒවා මම කරලත් තිබෙනවා කීවා. ඒ වෙලාවේ භික්ෂුව ඔහුට කීවා 'මහත්තයෝ ඔය රැකියාව මහා පව්කාර වැඩක්නේ' කියලා. ඒ අවස්ථාවේ මේ මනුෂ්‍යයා කියනවා හාමුදුරුවනේ මම ගුරුකම් කරලා මනුෂ්‍යයෙක් නැති කරන්නේ තවත් මනුෂ්‍යයෙකුට කරන උපකාරයක් වශයෙන්ය කියලා. බලන්න මේ මනුෂ්‍යයා අදහස් කරන්නේ මනුෂ්‍යයෙක් විනාශකර දමන්නේ තවත් මනුෂ්‍යයෙකුට උපකාරයක් වශයෙන්ය කියලා. මොහු මේ ගැන උදම් අනනවා. බලන්න මේ මනුෂ්‍යයා, මනුෂ්‍ය ඝාතණයක් සිද්ධ කරන්න තරම් ද්වේශයක් සිත තුළ සකස්කරගෙන, එම ක්‍රියාව සත්පුරුෂ ක්‍රියාවක් හැටියටත් දකිනවා. මොහු කට්ටඩි ක්‍රියාවන් හරහා මනුෂ්‍යයෙක්ව විනාශකරන්නේ, දුකට පත්කරන්නේ, පළිගන්නේ රැකියාවක් වශයෙන්, ආත්ම තෘප්තියක් ලබාගැනීමක් වශයෙන්. මේ කටයුත්තේදී මොහු පමණක් නොවේ, මොහුගේ සේවාදායකයාද ඉහත ක්‍රියාවන් සිදුකරන්නේ පළිගැනීමක් වශයෙන්, තමාගේ ආත්ම තෘප්තිය සදහා. එතකොට බලන්න ඉහත ගුරුකම් වැඩ සිදුකරන අප්‍රමාණ පිරිස් සහ ඔවුනගේ සේවාදායකයන් ධර්මානුකූලව කුසල්, අකුසල් ද්වේශය සහ මෛත්‍රිය ගලපා ගැනීමට නොහැකිවීම නිසා මොනතරම් අකුසල් මේ ජීවිත තුළින් සිදුකර ගන්නවාද? අන්‍යයන්ගේ

ජීවිතවලටද අකුසල් අයිතිකර දෙනවාද? ද්වේශයත් මෛත්‍රියත් හඳුනාගැනීමට නොදන්නා මිනිසුන් කුසල් අකුසල් කෙසේනම් හඳුනාගන්නද? නමුත් මේගැන හිතනවිට භික්ෂුවට දැනෙන්නේ අනේ මොන තරම් පහසුවෙන් මේ දෙක හඳුනාගන්න පුළුවන්ද කියලා. මේ බස්රථයේ භික්ෂුව ලග අසුන් ගෙන පැමිණි අදාළ මහත්මයා තුළ සංඝයා කෙරෙහි ගෞරවයක් තිබෙනවා. ඒ නිසාමයි අරක්කු ගඳ හාමුදුරුවන්ට දැනෙයි කියලා මුහුණ වම් පැත්තට හරවාගෙන සිටියේ ගිලන්පසක් අවශ්‍යද කියලා විමසුවා. හාමුදුරුවෝ අවශ්‍ය නැහැයි කියත්දිත් ඔහු සිසිල් බීම බෝතලයක් බොහෝම ගෞරවයෙන් පුජාකළා. පින්දෙන විට දෑත් එක්කර සාදු කිව්වා. බලන්නකෝ කොච්චර නම් තෙරුවන් කෙරෙහි ගෞරවයක්ද ඔහු තුළ තිබුණේ. කෙනෙකුට තර්ක කරන්න පුළුවන් මොහු තුළින් අනුනට විනාශය අත්කොට දෙන නිසා එම පව්වලින් ගැලවෙන්න සංඝයාට ගෞරවය දක්වනවාය කියලා.

ඉහත කරුණු සියල්ල කැටි කොට ගනිද්දී පින්වත් ඔබට මෙහෙම චරිතයක් පෙනෙනවා. රැකියාවක් වශයෙන් ගුරුකම්, කට්ටඩිකම් කරනවා. ඒවා කිරීමේ දී සේවාදායකයාට ඇති මෛත්‍රිය නිසා ඔහුගේ විරුද්ධවාදියාව විනාශ කරනවා. රෝගී කරනවා. මරණීය දුකට පත්කරනවා. එවැනි චේතනා සකස්කර ගන්නවා. එම චේතනාම සේවාදායකයා තුළත් ඇති කරනවා. දෙවැනුව, එම පුද්ගලයාම, තමන්ගේ මෛත්‍රියට ලක්වූ සේවාදායකයා අතින්ම අරක්කු ඉල්ලාගෙන පානය කරනවා. තෙවැනුව එම පුද්ගලයාම බස් රථයේදී හාමුදුරුවන්ට අරක්කු ගඳ දැනෙයි කියලා, හාමුදුරුවන්ට අපහසුවක් දැනෙයි කියලා මුහුණ සඟවාගෙන සිටිනවා. ගිලන්පස අවශ්‍යද කියලා බොහොම ගෞරවයෙන් විමසනවා. අවශ්‍ය නැතැයි කියද්දිත් බොහොම ගෞරවයෙන් ගිලන්පස පූජා කරනවා. පින් දෙනකොට දෑත් එක්කර සාදුකාර දී අනුමෝදන් වෙනවා. මොහුම සුදු සරමක්, සුදු කමිසයක් පැළඳ උපාසක ලීලාවෙන් ජීවත් වෙනවා. දැන් බලන්න මෙම චරිතය තුළ සකස්වුනා වූ සිත් මොන තරම් විවිධද. එකිනෙකට පරස්පරද, මේ පරස්පරතාව සකස් වෙන්නේ අවිද්‍යාව නිසාමයි. රූප විඳීමට ඇති තෘෂ්ණාව නිසාම, හොඳ නරක තේරුණත් මොහු හොඳ නරක සොයන්නේ අඳුරේ. ඒ නිසා මොහු හොඳ කියලා නරක අතට ගන්නා අතරම නරක කියලා අතට ගන්නා හොඳද නරක ගොඩටම

දමාගන්නවා. ඒ නිසා අවිද්‍යාව හේතුවෙන් සකස්වෙන්නා වූ සිතටද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මාරයා කියලා දේශනා කරනවා.

පින්වත් ඔබ ඉහත ගුරුකම් මහත්මයාගේ ක්‍රියාකාරකම් තුළ දැක්කේ එකිනෙකට පරස්පර ක්‍රියාවන්නේ.... ඒ කිසිවක අර්ථයක් නැහැ. සියල්ල මුලාව තුළමයි තිබෙන්නේ. මේ මාර ක්‍රියාකාරකම් මොහුට නිරයට හැර වෙන කොහෙට නම් පාර පෙන්වන්නද? දුකට පාර පෙන්වන සිතටද 'මාරයා' කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේද මේ නිසාමය. එසේනම් දුකට පාර පෙන්වන සිත සකස්වීමට හේතුවූයේ රූපයක්මය. අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත් හේතුවෙන් දුකට පාර පෙන්වන සිත සකස්වන නිසා රූපයද මාරයා යැයි ලොව්තුරා බුදුරජාණන් වහනසේ දේශනා කර වදාළහ. මේවා සංකල්ප නොව, ඇසට පෙනෙන්නාවූ, සත්ත්වයා නිරතුරුවම අත්විඳින්නාවූ ලෝක ස්වභාවයන්ය. පැහැදිළිව ලෙහෙසියෙන් කුසල් යනු මොනවාද, අකුසල් යනු මොනවාද, ද්වේශය මෛත්‍රියේ වෙනස යනු කුමක්ද යන්න හඳුනා ගැනීමට මෙතරම් සද්ධර්මය ඇසෙන රටේ අවකාශ තිබුණද ඔබව පරස්පර මතවාදයන් තුළ කොටුකර තබන්නේ මාරයාගේ ග්‍රහණය තුළ සකස්වෙන සිත නිසාමය. මෙහිදී සිත යනු ඵස්ස, වේදනා, සංඥා, සංස්කාර, විඥ්ඥාණ වශයෙන් ඔබ දැනගත යුතුය. මේ පස්දෙනාම මාරයාගේ ග්‍රහණයට නතුව ක්‍රියාත්මක වනුයේ ඔබ රූපයේ යථා ස්වභාවය හඳුනා නොගන්නා නිසාමය. රූපය අවබෝධකර ගත්තා යනු මාරයා අවබෝධයෙන් හඳුනා ගත්තා යනුය. මෙතැනදී රූපයත් සිතත් මාරයාගේ අවබෝධයෙන් හෙළිකර ගැනීමට පින්වත් ඔබට හැකිය. මේ තැනට පැමිණීමට පෙරාතුව පින්වත් ඔබ මේ උතුම් ධර්මය අවබෝධයෙන් දේශනාකර වදාළ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණිය යුතුය. ධර්ම රත්නය සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණිය යුතුය. මාර පාර්ශ්වික ධර්මයන් අවබෝධයෙන් හඳුනාගැනීම සඳහා තෙරුවන්ගේ මාර්ගෝපදේශකත්වය හැර අන් කුමන සරණක්ද පිහිටක්ද යන විශ්වාසය තුළින් සතර අපායෙන් ඔබව මිදීම වළක්වන තෙරුවන් කෙරෙහි ඇති විචිකිච්ඡාවත්, අන්‍ය සීලව්‍රතයන් කෙරෙහි ඇති විශ්වාසය කියන මාර බැඳීම් අවබෝධයෙන් මුළිනුපුටා දැමීමට ඔබ දක්ෂ විය යුතුය.

# 'මම' නැමැති කුණු ගොඩට තවත් කසල එකතුවීමට ඉඩ නොදෙන්න

රූපය දෙසත්, රූපය ඇසුරුකොට සකස්වෙන සිත දෙසත් ඔබ සතියෙන් සිහියෙන් යුක්තව බලා සිටින්න. ඇසේ අනිත්‍ය භාවයත්, බාහිර රූපයන්ගේ අනිත්‍ය භාවයත්, රූපයත් විඥ්ඥාණයත් එස්සය වීමෙන් සකස්වෙන වේදනා, හඳුනාගැනීම්, චේතනා, විඥ්ඥාණයන්ගේ අනිත්‍ය භාවයත් දකින්න. 'මේවා අනිත්‍යයයි නේද' යන දැනීම ඔබ තුළ ඇතිවෙන විට මමත්වයේ දෘඩිභාවය කියන සක්කාය දිට්ඨියද ඔබ ගෙන් සිඳී යනු ඇත. සිල් පද ජීවිතය තුළින් ආරක්‍ෂාකර ගැනීම නිසා ද ඔබ තුළ ඇතිවන්නේ, ඔබ අතීතයේ කැමති කළ මාර පාර්ශ්වික ධර්මයන්ගේ අතහැරීමකි. සීලය තුළින් ඔබ තැන්පත්, නිහඬ චරිතයක් බවට පත්වේ. ඒ නිහඬභාවය තුළද තිබෙන්නේ විඳීමේ සියුම් භාවයකි. මේවා ධර්මානුකූලව ගලපා ගැනීමට ඔබ දක්‍ෂ වුවහොත් එය ඔබගේ භාග්‍යයකි. මන්ද, ඔබ ගන්නා වූ සෑම උත්සහයකදීම ඉහත මාර පාර්ශ්වික ධර්ම ඔබට මාරයාගේ සක්කාය දිට්ඨිය නැමැති කටු ඔටුන්න පළන්දා ලෝකය තුළ අභිෂේක කිරීමට උත්සාහ ගන්නා හෙයිනි. එහෙයින් පින්වත් ඔබ මමත්වයේ දෘඩි භාවය ක්‍ෂය වන ආකාරයට දන් දෙන්න. සිල් ආරක්‍ෂා කරන්න. මෛත්‍රිය වඩන්න. සද්ධර්මය ශ්‍රවණය කරන්න. ධර්ම මාර්ගයේ පෙරට යන්න.

යම් තැනකදී ඉස්මතු වන්නේ 'මම' නම් වහාම අඩියක් පසුපසට තබන්න. 'මම' කියන දෘෂ්ඨියට හැම මොහොතකම පරාජයම අත්කර දෙන්න. ඒ ඔබ පරාජය කිරීමට උත්සාහ ගන්නේ සක්කාය දිට්ඨියයි. ඒ කියන්නේ සතර අපායේ උපතයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ සතර අපායෙන් මිදීමේ මේ උතුම් මාර්ගය පින්වත් ගිහි පින්වතුන්ලා උදෙසාමයි දේශනා කරලා තිබෙන්නේ. මෙවැනි ගැඹුරු ලෝකාවබෝධයක් ලබන සරල

ධර්ම මාර්ගයක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ හැර වෙන කව්රු නම් දේශනා කරන්නද? පින්වත් ගිහි පින්වතුන්ලාට ගිහි වගකීම්වල යෙදෙන ගමන් මෙම ධර්ම මාර්ගය වඩන්නට පුළුවන්. ව්‍යාපාරයක්, රැකියාවක්, ගොවිතැනක්, අධ්‍යාපන කටයුත්තක් කරන ගමන් සතර අපායෙන් මිදෙන ධර්මතාවයන් වඩන්න පුළුවන්. විවාහ ජීවිතයක් ගතකරන ගමන්, බිරිඳ දූව දරුවන් නඩත්තු කරන ගමන් එම වගකීම්ද නිවැරදිව ඉටුකරමින් සතර අපායෙන් මිදීමේ ධර්මතාවයන් ඔබට පුහුණු කරන්න පුළුවන්. ඔබට ඒ වගේ ලෞකික ආශ්වාදයන් ලබමින්ම, ඒවා ප්‍රතික්ෂේප නොකර සතර අපායෙන් මිදීමේ ධර්මතාවයන් පුහුණු කරන්න පුළුවන්. ඒ කියන්නේ සෝවාන් ඵලයට පත් වෙන්න පුළුවන්. මොන තරම් සුන්දර ධර්මයක්ද, අවස්ථාවක්ද ලොව්තුරා සම්මා සම්බුදු ගුණයෙන් අවබෝධ කරගෙන පින්වත් ඔබට ගැලපෙන, ඔබව සැනසෙන ලෙසින් මේ සා සරල කර දේශනා කර තිබෙන්නෙ. මේ සරල භාවය නිසාම අපි වැනසෙන අවස්ථාවන්ද තිබෙනවා. එහෙම වෙන්නේ අප මේ ධර්ම මාර්ගය තවත් සරල කර ගැනීමට යාමෙන්.

අපි එහෙම කරන්නේ අපේ තිබෙන්නාවූ අධිමානය නිසාමයි. මේ ගැඹුරු ලෝකාවබෝධයන් පිළිබඳව ලොව්තුරු බුදුරජාණන් වහන්සේ යමක් දේශනා කර තිබෙනවා නම්, පහදා දියහැකි සරලම අර්ථයෙන් තමයි එම ධර්මය දේශනා කර තිබෙන්නේ. අපේ තිබෙන අධිමානය නිසා තෙරුවන් කෙරෙහි අශ්‍රද්ධාව නිසා  ලොව්තුරා සද්ධර්මය අපේ දෘෂ්ඨීන්ට අනුව තවත් සරල කරගන්න හදනවා. මෙතැනදී ඔබත් ඔබගේ පිරිසත් සැනසීමක් නෙවෙයි ලබන්නේ. මිථ්‍යාදෘශ්ඨීයක්මයි.

කෙටි කිරීමත්, දීර්ඝ කිරීමත් දෙකම අයිති මාර ධර්මයන්ට. ඔබ මධ්‍යම ප්‍රතිපදාව ඔබේ මාර්ගය කරගන්න. ධර්මය සරල කරන්න අපිට බැහැ. වයසට යන ස්වභාවය සරල කරන්න පුළුවන්ද? ඉර, හඳ පායන එක සරල කරන්න පුළුවන්ද? සතර සතිපට්ඨානය, පටිච්ඡසමුප්පාදය, පංච උපාදානස්කන්ධය සරල කරන්න පුළුවන්ද?

මේවා ලෝක ස්වභාවයන්. මේ ලෝක ස්වභාවයන් ලොව්තුරා සම්මා සම්බුද්ධ ඥාණයෙන් අවබෝධ කර සරල, සුගම ආකාරයෙනුයි ඔබට දේශනා කර තිබෙන්නේ. අපට තිබෙන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේට, ධර්මරත්නයට, සංඝරත්නයට මුල්තැන දීලා, මේ උතුම්

ධර්ම මාර්ගයේ ගමන් කරලා අවබෝධය ලබන එකයි. මේ ධර්ම මාර්ගයේ ගමන් කරලා අවංකවම සතර අපායෙන් මිදෙන්න කැමති පින්වතුන්ලා, ධර්මය තුළින් ඔබට දීලා තිබෙන ප්‍රතිලාභය ගැන හොඳට හිතන්න ඕනේ. මේ සිතීම ඔබට තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිකර ගැනීමට හේතුවක් වෙනවා. උදාහරණයක් වශයෙන් මෙහෙම සිතන්නකෝ. තරුණයෙක් හෝ තරුණියක් සිටිනවා, ඔහු හෝ ඇය අවංකවම ධර්ම මාර්ගයේ ගමන් කරලා, තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇතිකර ගෙන, සීලයෙන් පරිපූර්ණ භාවයට පත්වෙලා. පංච උපාදානස්කන්ධයේ, එහෙම නැතිනම් සිතේ අනිත්‍ය භාවය දකිනවා. මේ ධර්මතාවයන් තුන සම්පූර්ණ වීම නිසාම මොවුන් තුළින් සක්කාය දිට්ඨිය, විචිකිච්ජාව, සීලබ්බත පරාමාස කියන ධර්මතාවන් ප්‍රහීනය වෙලා, සතර අපායෙන් මිදෙන අයෙක් බවට පත්වෙනවා. දැන් මේ තරුණයා හෝ තරුණිය සෝවාන් ඵලය, අවබෝධය ලැබූ කෙනෙක්. නමුත් ගිහි පින්වතෙක්. දැන් මොහු හිතනවා, මම විවාහයක් වෙන්න ඕනේ කියලා. ඔහු විවාහ වෙනවා, දරුවන් හදනවා, රැකියාවක් ව්‍යාපාරයක් කරනවා, දරුවන්වත් බිරිඳවත් ඔවුන් කැමතිනම් ධර්ම මාර්ගයට ගන්නවා. සෝවාන් ඵලයට පත්වූ ගිහි පින්වතා තුළ කාම, රාග, පටිඝ තිබෙනවා. නමුත් කිසිම අවස්ථාවක ඔහු ලොව්තුරා බුදුරාජාණන් වහන්සේගේ වචනය ඉක්මවා යන්නේ නැහැ. සිල් පද බිඳගන්නේ නැහැ. ඇසුරු කරන හැම දෙයක්ම අනිත්‍යය කියන දැක්ම තුළ හිඳිමින්, හැම දෙයක්ම ඇසුරු කරනවා. මොහු රැකෙන්නේ පංච සීලයෙන්, ආජීව අෂ්ඨමක සීලයෙන්. එම නිසා විවාහයක් වී කම් සැප විඳීම, මිල මුදල් රන් රිදී පරිහරණය කිරීම වැනි දේවල්වලින් මිදෙන්න ඔහුට අවශ්‍ය නැහැ. ඔහු ගිහියෙක් විසින් සමාදන් වියයුතු පංච සීලයෙන්, පරිපූර්ණ භාවයට පත්වෙලා. බලන්න පින්වත් ඔබට මොන තරම් සංවරයකින් යුතුව, කම් සැප විඳිමින්ම, මේ සතර අපායෙන් මිදීමේ ධර්මය අත්විඳින්න පුළුවන්ද. මෙය ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව නිසාම ඔබගේ කැමැත්තටත්, ලෝක සත්‍යයට අනුකූලවත් එකිනෙක ගැලපෙන ආකාරයට දේශනා කළ ධර්මයක් නේද? බුදුරජාණන් වහන්සේ ගැන සිතලා නොවේ, පින්වත් ඔබ ගැන සිතලාමයි මේ ධර්මය දේශනා කරලා තිබෙන්නේ.

කම් සැප විඳින්නත් පුළුවන්, විකාලයේ ආහාර ගන්නත් පුළුවන්, නැටුම්- ගැයුම්- වැයුම්, ශරීරය ලස්සන කරන්නත්, සැප පහසුකම්

දෙන්නත් පුළුවන්. මේ සියල්ල අවබෝධයෙන් කරමින්, ගිහි පින්වතුන්ට සීලයෙන් පරිපූර්ණභාවයට, ආර්යකාන්ත සීලය තුළ පිහිටීමට මාර්ගයකුයි මෙතැනදී ඔබට බුදුසමිඳුන් දේශනා කර තිබෙන්නේ. බලන්න මෙවැනි සරල අවස්ථාවක්, ධර්මයක් ඔබට මට ලබාදීලත්, සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනක් ගෙවී යන තුරුම අපි මේ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන නැහැ. නමුත් පින්වත් ගිහි පින්වතුන් එක දෙයක් මතක තබා ගන්න. අතීතයේ පැවැති ශාසනවලදී, අධිමානය නිසාම 'මම සෝවාන්' කියන මිථ්‍යාවබෝධය තුළ නම් අප්‍රමාණ වාරයක් ඔබත් මමත් ඉඳලා තිබෙනවා. එය තේරුම් ගන්න ඔබ නිහතමානී වෙන්න. මේ ධර්ම මාර්ගයේදී ඔබට මුණගැහෙන පළමු කළ්‍යාණ මිත්‍රයා ඒ නිහතමානී බවය කියන එක හොඳින් තේරුම් ගන්න. එම කළ්‍යාණ මිත්‍රයාව මුණ ගැසුනොත් පමණයි, ඔබට ලොව්තුරා ධර්මය කළ්‍යාණ මිත්‍රයෙක් බවට පත්කර ගන්න අවස්ථාව ලැබෙන්නේ. මේ ස්වභාවය ගලපාගැනීමට අදක්ෂවීම නිසාම, මෙතෙක් අපේ කළ්‍යාණ මිත්‍රයා වී සිටියේ මාරයාම බව තර්කයකින් තොරව තේරුම් ගැනීම ඔබගේම ජයග්‍රහණයකි. පින්වත් ඔබ ඔබගේ අධ්‍යාපනය්, රැකියාව, ව්‍යාපාරය, ඥාතීන්, ගේදොර උදෙසා ඔබ තුළ ඇති කැමැත්ත, මේ ජීවිතයේ දීම සතර අපායෙන් මිදීම උදෙසාද ඔබ ඇතිකර ගන්න. ඔබ ලබන මේ අවබෝධය ඔබට ඉහත සැපයන් අර්ථවත් ලෙස විඳීමේ අවස්ථාවද සලසාදෙනු ඇත. මේ කරුණු කියවනකොට ඔබට දැන් දැනෙනවාද ලොව්තුරා බුදුරජාණන් වහනසේට ඔබව මේ මාර ග්‍රහණයෙන් ගලවා, නිවන් මාර්ගයට යොමු කරන්න මොන තරම් උවමානාවක් තිබුණාද කියලා.

අම්මා, තාත්තා, බිරිඳ, දරුවා, ඥාතියා ඔබට පාර කියන්නේ භවයටමයි. භවයට පාර කියන එම ඥාතීන් ඔබෙන් දුරස් නොකොට, භව නිරෝධය දෙසට පාර පෙන්වන මේ උතුම් ධර්ම මාර්ගය ඔබ ඔබේ පරම ඥාතියා කරගත්තොත් ඔබත්, ඔබේ ඥාතීනුත් මෙලොව ලබන පරම සැනසීම එය වනු ඇත.

මෙය කියවා ඔබ ඉක්මන් නොවන්න. කලබල නොවන්න. අවිශ්වාසයක් ඇතිකර නොගන්න. ඔබ නිහඬව සිතන්න. බැහැය කියන අවිශ්වාසය බැහැර කරන්න. විශ්වාසය ඔබ කෙරෙහි නොව, පළමුවෙන්ම තෙරුවන් කෙරෙහි ඇතිකරගන්න. බුදුරජාණන් වහන්සේට අංක

එක දෙන්න. ඔබ හැකිතාක් පසුපසට යන්න. බුදුරජාණන් වහන්සේත් ඔබත් අතර ඇති පරතරය හැකිතාක් දුරස් කරන්න. එම දුරස්භාවය බුදුරජාණන් වහන්සේගේ ඥාණාවබෝධයත්, ඔබගේ දැනීමේත් පරතරය දකින්න. ඒ දුරස්භාවය තුළින් ඔබ ඔබට බොහෝ ඉදිරියෙන් සිටිනා බුදුරජාණන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ ශ්‍රද්ධාව ඇතිකර ගන්න. ඔබ සම්බුදු ගුණම සිතන්න. ආශ්චර්යමත් සම්බුදු ඥාණයන්ම මනසින් දකින්න. බුදුරජාණන් වහන්සේලාට පමණක් සාධාරණවූ මහා කරුණාසමාපත්ති ඥාණය, එයින් සැනසුණු ලෝකය ගැන සිතන්න. දැන් ඔබට දැනෙනවාද, ඔබ බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ ධර්ම මාර්ගයට කොපමණ ඈතින්ද සිටින්නේ කියලා. බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්මයේ ගමන්කොට විමුක්තිය සාක්ෂාත් කරගත් සැරියුත් මහෝත්තමයන් වහන්සේ, මුගලන් මහෝත්තමයන් වහන්සේගේ ගුණයන්ට ඥාණයන්ට ඔබ තව කොතෙක් දුරින්ද සිටින්නේ කියලා. මුලින්ම මෙම පරතරය හොඳින් සිහිනුවණින් දකලා, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගන්න. මේ ශ්‍රද්ධාව ඔබ තුළ ඇතිවන්නේ තෙරුවන්ගේ අයෝමය ගුණයන්, ඥාණයන්, ආශ්චර්යන් දකලා, අහලා, ඔබගේ ජීවිතය සමග සසඳලා. පින්වත් ඔබ නිරවුල්ව ඔබත්, ධර්ම මාර්ගයත් අතර තිබෙන පරතරයේ තරම දකලා, එම පරතරය අවම කරගැනීමට, පුරවාගැනීමට දැන් උත්සහග න්න අවශ්‍යයි. මේ පරතරය ඔබ පුරවන්නේ සීලයෙන්, දානයෙන්, මෛත්‍රියෙන්. සතර අපායෙන් මිදීමට අවශ්‍ය ඉහත සාධක ඔබ අවංකව ජීවිතයෙන් ක්‍රියාත්මක කරන විට, ඔබත් ධර්ම මාර්ගයත් අතර ඇති පරතරය අවම වෙනවා. ඉහත සත්පුරුෂ ධර්මයන් ඔබ තුළින් වැඩෙන විට ඔබව ධර්මයෙන් දුරස් කළ, ලෝභ-ද්වේශ- මෝහ අකුසල මූලයන් ඔබට ක්‍රමානුකූලව අතහැරෙනවා. මේ අතහැරෙන්නේ අතීතයේ ඔබ කැමති කළ දේවල්. ඔබ මේවා ප්‍රයෝජනයට ගත්තේ ඔබේ මමත්වයේ දැඩිභාවය ශක්තිමත්කර ගැනීමටයි. ලෝභකම ඔබ තුළ තිබුණේ වැඩි වැඩියෙන් සැප අයිතිකර ගන්න රැස්කර ගන්න. ද්වේෂය ඔබ තුළ වැඩුනේ මමත්වයට හිමි ආත්මගරුත්වය ඇතිකර ගන්න. මෝහය ඔබ තුළින් වැඩුනේ සැප නිත්‍යයි කියන මුලාව පෝෂණය කරන්න. මේ විෂම ධර්මයන් ඔබට අතහැරෙනවා කියන්නේ මමත්වයේ දැඩිභාවය ඔබ තුළින් සියුම් වෙනවා කියන කාරණයයි. පින්වත් ඔබ මේ ක්‍රියාන්විතයේ දිගින් දිගටම යෙදෙන්නේ අනුන් උදෙසා නොවේ.

ඔබ උදෙසා. ඔබ තවම ලෝකයේ ස්වභාවය ඉගෙන ගෙන නැති නිසා අනුන්ට ඉගැන්වීමට නොයන්න. නිදහසේ, සුවසේ, නිහඬව ඔබ සතර අපායෙන් මිදෙමි යන අරමුණ ජයගන්න. ලෝකයා අඬබෙර ගසමින් ධර්මය සොයා වෙහෙසෙද් දී ඔබ නිවසේම හුදකලාව අදාල ප්‍රතිප්‍රදාවේ යෙදෙමින් ධර්මය දකින්න. නිරතුරුවම සිත දෙස විමසිලිමත් වන්න. ''මම'' දැඩි වෙන ''මම'' ඉස්මතු වෙන සෑම අවස්ථාවකදීම එම කැමත්ත ඔබ දන් දෙන්න සතර අපායේ බිය දකිමින්. ආහාර ටොන් එකක් දන් දෙනවාට වඩා ''මම'' දානපතියෙක් යන ඔබට ඇතිවූ මමත්වයේ සිත දන් දීමෙන් එසේත් නැතිනම් අතහැරීමෙන් ඔබට විශාල අර්ථයක් වන බව දකින්න. ''මම'' කියන කුණු ගොඩට තවත් කසල එකතු වීමට ඉඩනොදෙන්න. ඇස නැමති කුණු භාජනය ඉපදීම නිසා සකස් වුනාවූ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නැමති කුණුකන්දරාව වගේම අනෙකුත් ආයතන පහෙන් ඉපදෙන කුණුද උපකාරී වූයේ මමත්වයේ දැඩි භාවය ඔබ තුළ තිව්‍ර කිරීම සඳහාමය. සලායතනත් කුණුත් එකතුව ඔබට පැළඳූ මාරයාගේ කටු ඔටුන්න වන සක්කායදිට්ඨිය සියුම්වන ස්වභාවයට නිරතුරුවම කටයුතු කරමින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පින්වත් ගිහි පින්වතුන් උදෙසාම දේශනාකර වදාළ සතර අපායෙන් මිදීමේ ධර්ම ප්‍රතිපදාව පින්වත් ඔබගේ ජීවිත තුළින් ක්‍රියාත්මක කර ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උදෙසා ඔබ ඔබේ යුතුකම ඉටුකරන්න. මේ ශාසන පරිහාණියක් ගැන ඉඟි ඇසෙන කාළයක උතුම් මනුෂ්‍යයෙක්ව මේ ධර්මද්වීපයේ ඔබ උපත ලැබුවේද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උදෙසා ඔබේ යුතුකම ඉටුකිරීමට ය. මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය තුළ ලැබෙන අවසාන අවස්ථාව ලබාගනිමින්ය. එම උතුම් අවස්ථාව ඔබ මග හැරියා යනු සැපය ඔබෙන් මග හැරුනා යන බව ඔබ තේරුම් ගත යුතුය. හෙමින් උදාවෙන අති දීර්ඝ අබුද්ධෝත්පාද කාලය මිනිසුන්ගේ කාලයක් නොව ධර්මයෙන් තොර මිනිස් තිරිසනුන්ගේ කාලයක් වනු ඒකාන්තය. එදාට මිනිසාද තිරිසන් සතාද ක්‍රියාත්මක වන්නේ දෙයාකාරයකට නොව එකම ආකාරයටය. මේ කටුක අභියෝගයෙන් ඔබට මිදිය හැකිවන්නේ නායකයෙක්, පාලකයෙක්, කෝටිපතියෙක්, උගතෙක් ලෙස මියයාමෙන් නොව සතර අපායෙන් මිදුනු මනුෂ්‍යයෙක් ලෙස මිය යාමෙන් බව ඔබ නිහතමානීව සිතිය යුතුව ඇත.

# ලොව සුන්දරම මරණයට ඔබටද හිමිකමක් ඇත

ධර්මය තුළ ජීවත්වන පින්වත් ඔබට, ඔබගේම ජීවිතය දෙසට හොඳින් සිත යොමුකරලා බැලුවහොත්, වැරැද්ද- නිවැරැද්ද හොඳින්ම පෙනෙනවා. ධර්මය කියලා කියන්නේ අනිත්‍යයට. යමක් අනිත්‍යයැයි අපි නුවණින් දකිනකොට, ඒ කෙරෙහි බිය සකස් වෙනවා. මොකද එය වෙනස්වන දෙයක්. මේ වෙනස්වීම නොදන්නා කෙනා, ස්වභාවයෙන්ම වෙනස්වන දෙයක් වෙනස් නොවී පවත්වා ගැනීමට වෙහෙස ගන්නවා. එතැනදියි දුක සකස් වෙන්නේ. සද්ධර්මයෙන් ඈත්වීම නිසා නිත්‍ය සංඥාවන් තුළින් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ ධර්මයන් ගැනීමෙන් වර්තමාන සමාජය ලෝභය, ද්වේෂය, මෝහය තුළින් ඔද්දල් වෙලයි තියෙන්නේ. විනාශය දැක දැකත්, විනාශය ගැන කතා කරමින්ම, එහි ආදීනව දකිමින්ම විනාශය දෙසටමයි සැවොම ගමන් කරන්නේ.

**තෘෂ්ණාව, ඔබට ලස්සනට පාර පෙන්වනවා තව වේගවත්ව ඉදිරියට යන්න. ද්වේෂය ඔබට ඇති තරම් ආත්ම ශක්තිය ලබාදෙනවා, හිරි ඔතප් හීන කරලා දෙනවා, ඇතිවන ඕනෑම බාධකයක් මැඩගෙන ඉදිරියට යන්න. මෝහය ඔබට ආශිර්වාද කරනවා 'මේ මාර්ගයමයි සැප ඇති මාර්ගය' කියලා තව තවත් ඒත්තු ගන්වන්න. දුකේ කළ්‍යාණ මිත්‍රයන් තිදෙනාගේ ඇකයේ උණුසුමට තුරුල් වුනාම දැනෙන ගොරෝසු පහසට ඔබ හරිම කැමතියි. මේ කුණු සැපය විඳිමින්ම ඔබ පන්සල් යනවා. සිල් සමාදන් වෙනවා. දාන-මානත් දෙනවා. සද්ධර්මයත් ශ්‍රවණය කරනවා. ඒ කියන්නේ මොකද්දෝ බියකුත් තියෙනවා. සැබැවින්ම, ඒ බියත් සකස් කරලා දෙන්නේ ලෝභ, ද්වේශ, මෝහය විසින්මයි.**

**තමන් කැමති කරන්නා වූ කුණු සැපයේ ආරක්‍ෂාව උදෙසා, අර්ථයෙන් තොරව ජීවිතයේ කොනක් ධර්මයේ ගැටගසනවා. තමා තමාවම රවටාගන්නවා. කුණු සැපයේ ආරක්‍ෂාව උදෙසා ධර්මයේ රැකවරණය අපේක්‍ෂා කරනවා.**

**මෙය තමයි සැබෑම පෘතග්ජනභාවය.** අයෝනිසෝමනසිකාරය. ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන්ගේ වර්ධනය උදෙසා, දියුණුව උදෙසා ධර්මයේ පිහිට සොයනවා. ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන්ගේ මිදීම උදෙසායි අපි සද්ධර්මයේ සරණ සෙවිය යුත්තේ. වර්තමාන සමාජය ගමන් කරන්නේ සද්ධර්මයේ අර්ථයට පරස්පර විරෝධී ගමනකයි. මමත්වයේ දැඩි භාවය නැමැති, ඔබ හඳුනා නොගත් කුණු හැව, සකස්වෙන පංච උපදානස්කන්ධයන්ගෙන් වෙලී ඇති නිසා, සැබෑ මාර්ගය වැසී නොමගටමයි පාර පෙන්වන්නේ.

වැරදි මාර්ගය ඔස්සේම නිවැරදිවීමට යෑමේ පුංචි සිද්ධියක් පින්වත් ඔබට මෙහි සටහන් තබනවා.

මෙය සටහන් තබන භික්ෂුව හමුවට ධර්මය අහන්න එන ශ්‍රද්ධාවන්ත දරුවෙක් ඉන්නවා. ඔහු විවාහකයෙක්. ළමා වයසේ දරුවන් කිහිපදෙනෙක් ඉන්නවා. මේ මහත්මයා සද්ධර්මය නිසාම ජීවිතය නිවැරදි කරගත් අයෙක්. දිනක් මේ මහත්තයා කියනවා 'දරුවන්ගේ අකීකරුකම් නිසා, මගේ බිරිඳට හරියට කේන්ති යනවා. එයාට කොච්චර කිව්වත් කේන්තිගන්න එපා කියලා, මොහොතකින් එය අමතක වෙනවා. හැබැයි මම කියලා කියලා දැන් හුඟක් අඩුවෙනුයි කේන්ති ගන්නේ' කියලා.

දවසක් ඒ නෝනාට කේන්ති ගිය වෙලාවක මහත්තයා උපක්‍රමයක් වශයෙන් කියලා තියෙනවා 'ඔයා කේන්තිගන්න නිසා ඔයාගේ මුහුණ දැන් කැත වෙලා. ඒ නිසා ඔයා කේන්ති ගන්න එපා' කියලා. ඒත් මහත්තයා එහෙම කියපු වෙලාවේ ඉඳලා ඒ නෝනා කරන්නේ මිල ගණන් අධික, ලස්සන වෙනවාය කියන ක්‍රීම් වර්ග අරගෙන මුහුනේ ආලේප කරන කටයුත්තලු.

බලන්න! වැරදි මාර්ගය ඔස්සේමයි අපි නිවැරදි වෙන්න හදන්නේ.

ලෝකය නිවැරදි කරන්න අපට බැහැ. ඒ නිසා ලෝකය කමටහනක් කරගෙන පින්වත් ඔබ නිවැරදි වෙන්න. ලෝකය නිවැරදි කරන්න බැරි බව නුවණින් හඳුනා ගෙනම....

එවිටයි ඔබට පුළුවන් වෙන්නේ වඩාත් නිවැරදි තැන ඔබගේ සිත පිහිටුවා ගන්න. වඩාත් නිවැරදි තැන තමයි සද්ධර්මය.

'අනිච්චාවත සංඛාරා' සියළු සංස්කාරයෝ අනිත්‍යයි. ඔතැනම තිබෙනවා, ලෝකය නිවැරදි කරන්නට බැරි බවට බුදුරජාණන් වහන්සේ දෙන සහතිකය. පින්වත් ඔබ ධර්මයේ අර්ථයට විවෘත වෙන්න. එවිට එය සමාජයටත් ආදර්ශයක් වේවි. සංස්කාරයන්ගේ අනිත්‍ය බව තමයි ලෝකයේ තිබෙන සංකීර්ණභාවයට, අධිවේගීභාවයට හේතුව. පින්වත් ඔබ සෑම මොහොතකම මෙනෙහි කරන්න 'මම මැරෙණවා'ය කියන කාරණය. නැවත මැරිලා ඉපදෙනවාය කියන කාරණය. පාංශුකූලය, හත්දවසේ, තුන්මාසේ පින්කම්.... සාම්ප්‍රදායික මළගෙදරක චාරිත්‍ර වෙනුවට මියයෑමට පෙරම ඔබ, මරණින් මතු සුරක්ෂිත පුද්ගලයෙකු වන්න. එවිටයි ඔබට අවස්ථාව ලැබෙන්නේ ඔබම රැස්කරපු සංස්කාර හේතුවෙන් ලබන භවය අනුන්ගේ පින් ගොටුවකින් යැපීමට අවශ්‍ය නොවන තැනට පත්කර ගන්න.

**කෙනෙක් මැරුණාට පසු ඔහුගේ මරණය ගැන කම්පා නොවී, ජීවත්ව සිටින විට තමාගේ මරණය ගැන සිතන්න. මරණයත් සමග ජීවත්වෙන්න. එය හරිම සුන්දර ඇත්දැකීමක්. මරණයේ සුන්දරම අත්දැකීම ලබන්නේ රහතන් වහන්සේය. මරණය උන්වහන්සේට ආශිර්වාදයකි. මංගල කාරණාවකි. උන්වහන්සේ අවිද්‍යාව අවසන්කර ඇත. ඒ උත්තමයා දුකත්, සැපත්, උපේක්ෂාවත් අනිත්‍ය බව ප්‍රත්‍යක්ෂකොට ඇත. ඒ උත්තමයාගේ මරණය හුදු ක්‍රියාවක් පමණක්මය. එය මේ ලෝකයේ ඇති සුන්දරම මරණයයි. මාර්ගඵලලාභී දේව් බඹුන් සාධුකාර දෙන මරණයයි. අනෙකුත් දෙවිවරුන්ට ශෝක උපදවන මරණයයි. මාර පිරිස අත්පොළසන්**

**දෙන මරණයයි. මහපොළොවට පස්වන ඇටකැබලිත් පූජණීයත්වයට පත්වෙන මරණයයි.**

**බලන්නකෝ මරණයක තිබෙන වටිනාකම. අපි මරණය අඩු ලංසුවෙන්, අසුබ ලංසුවෙන් සැලකුවත්, බලන්න! මරණයක ඇති ගාම්භීරත්වය, ප්‍රෞඪත්වය.** කොටින්ම එය මරණයක් නොව නිවීයෑමකි. ඔබට මට නොදැනුනාට, රහතන් වහන්සේගේ මරණය අභියස ලෝක ධාතුව කම්පා වෙයි. ලෝක ධාතුව කම්පාවන්නේ, රහතන් වහන්සේ අවබෝධඥාණයෙන් ලෝක ධාතුව කම්පා කළ අයෙකු හෙයිනි. අයෝමය සතරමහා ධාතුව විනිවිද දකිමින් අවබෝධ කළ හෙයිනි. මුළු ලෝක ධාතුවම අනිත්‍යාවබෝධයෙන් හෙළි කොට ගෙන, මුලාව විනිවිද අවබෝධය කරා ගිය හෙයිනි. ඔහුට ලෝකය තවත් හිස් දෙයක්, එලයක් නැති දෙයක් පමණක්මය.

මේ තරම් අර්ථවත් මරණයක් ධර්මය තුළ තිබියදී, තුණ්ඩු කැල්ලක නම ගම ලියා පරදත්තරූප ජීවී ප්‍රේත ප්‍රේතියන්ට පින්දෙමින් අපි මරණයට මොන තරම් අවනම්බුවක්ද, අගෞරවයක්ද කරන්නේ. හිතන්න! ඔය සාම්ප්‍රදායික තුණ්ඩු කැබැල්ල බිමින් තියලා 'මට නම් ඔය අනුන්ගෙන් පින් ගන්න මරණයක් එපා'ය කියල. ශ්‍රද්ධාව, වීර්යය මද භාවය නිසා එච්චර හිතන්න බෑ කියමුකෝ. ඉන් මෙහා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සීලයෙන් පරිපූර්ණ පින්වතා, පින්වතිය මැරෙන්නේ සිහිනුවණින් සාධුකාර දෙමින්ය කියලා. කවුද මේ සීලයෙන් පරිපූර්ණ පින්වතා? ඒ සතර අපායෙන් මිදුණ පින්වතායි. මරණින් මතු ඔහු ලබන උපත මොන තරම් ශ්‍රේෂ්ඨ උපතක් වේවිද? ඇයි අපි එවැනි මරණයකට සූදානම් නොවන්නේ.

ලොකු හෝටලයක තිබෙන මඟුල් උත්සවයකට අඳින සාරිය ගැන හිතන තරම්වත් අපි මරණය ගැන හිතන්නේ නැහැ. ඒකෙන් අදහස් වෙන්නේ, සාරිය ගැන ඔච්චර හිතන්නේ සාරිය දවටගන්න ඔය කය, මරණයට පත්වෙන කයක් කියලා නොසිතනා එකමයි. පින්වත් ඔබට මරණය අමිහිරි අත්දැකීමක්. අනුන්ගේ මරණය ගැන කතා කරන අපි තමාගේ මරණය ගැන සිතීමටත් බිය වෙනවා. අසුන්දර මරණයක්

අභියස ඇති අසුන්දර කථන්දරය වගේම සුන්දර මරණයක් අභියස ඇති සුන්දර නව ජීවිතය මොන තරම් චමත්කාර ජනකද? ලෙඩ ඇඳේ ජීවත්වන අවුරුදු හැත්තෑපහේ මහළු පින්වතාද යදින්නේ ජීවිතයයි. ඔහු තුළ ඇත්තේද ජරා, ව්‍යාධි, මරණ පමණක්මය. එහෙත් ඔහුගේ බලාපොරොත්තුව ජීවිතයයි. ධර්මය සරණ කර නොගත් පුද්ගලයා නිරතුරුවම සැප-දුක පටලවාගනී. දුක, සැපයක් කරගන්නා ඔහු සැබෑ සැපයට බියවෙයි. සැබෑ සැපයට අප තුළ බිය සකස් කරන්නේ අකුසලයයි.

පින්වත් ඔබ, මරණයට වටිනාකමක් ලබාදීම උදෙසාම, මරණින් මතු හේතුඵල ධර්මයන්ගෙන් සකස් වෙන නව ජීවිතයට වඩාත් හොඳ වටිනාකමක් ලබාගැනීම පිණිසම මේ සටහන උපයෝගී කර ගන්න. මෙය කියවා ඔබ තුළ ජවයක් සකස් කර ගන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සිතේ ඇතිවූ සිතිවිල්ලක් ඔබේ සිතේ ඇතිකර ගන්න. රහතන් වහන්සේගේ, රහත් භික්ෂුණීන් වහන්සේ නමකගේ සිතේ ඇතිවූ සිතිවිල්ලක් ඔබේ සිතේ ඇතිකර ගන්න. මාර්ගඵල ලාභී උපාසක, උපාසිකාවකගේ සිතේ ඇතිවූ සිතිවිල්ලක් ඔබේ සිතේ ඇතිකර ගන්න.


මෙය සටහන් තබන වේලාව රාත්‍රී 1.30 යි. නින්ද අහලකවත් නැහැ. පංච නීවරණ පළා ගොසින්. සද්ධර්මයට ඇති හිරි ඔතප් දෙක නිසා අදහස් එනවා, දෝරෙගලාගෙන. භික්ෂුව ඒ අදහස් ඉදිරියේ අනිත්‍ය සංඥාව තබන්නේ නැහැ. පින්වත් ඔබගේ යහපත උදෙසාම... පින්වත් ඔබලාට නොදන්නා යමක් දැනගැනීම උදෙසාම.... මේ ගලා එන්නේ අදහස් නොව කරුණාවයි. මේ කරන්නේ සටහනක් තැබීම නොව ධර්මයේ සංදිට්ඨික ගුණයේ අර්ථයයි. මේ මධ්‍යම රාත්‍රිය ගෙවී උදාවන අළුයම ආකාශය සිසාරා සියුම් සංගීත රාවයක් පැතිරෙනවා. හොඳින් අවධානය යොමු කරන විට ඒ දිව්‍ය සංගීතයයි. සංගීත හඬ, ජය මංගල ගාථාවල සංගීත ස්වරයයි. සංගීත ස්වරය බොහොම පැහැදිළියි. ඒ කියන්නේ දෙවියන් ආයුෂ, වර්ණය, සැපය, බලය ලැබේවා කියලා සිල්වත් ලෝකයාට ප්‍රර්ථනා කරනවා. ආශිර්වාද කරනවා. දෙවියන් ඒ ආකාරයට ආශිර්වාද කරනු ලබන දිව්‍ය සංගීත හඬ ඇසෙන විට භික්ෂුවට හොඳටම විශ්වාසයි මේ මොහොතේ භික්ෂුව අපවත්

නොවෙන බව. අතීත සංස්කාරයන් තව ගෙවීමට ඇති නිසයි මේ මොහොතේ ජීවත් වෙන්නේ. නමුත් මීළඟ නිමේශයේ දිව්‍ය තලවලින් ශෝකී සංගීත රාවයක් භික්ෂුවගේ ශ්‍රෝත වලට ඇසුනහොත් භික්ෂුව අනිවාර්යයෙන්ම දන්නවා තමා දූන් මරණයට සූදානම් වෙන්නේ කියලා.

බලන්න! මොන තරම් ආශ්චර්යමත් ධර්මයක්ද ඔබ ඉදිරියේ තිබෙන්නේ කියලා. මෙයයි ධර්මයේ සංදිට්ඨික ගුණය. තමා ජීවත්වන බවත්, තමා මැරෙණ මොහොතත් දූනුවත්වයි ඔහු ජීවත්වෙන්නේ. **පින්වත් ඔබ ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ත්‍යාගයෙන්, දේවතානුස්සතියෙන් පරිපූර්ණ නම් ඔබ මැරෙණ මොහොත දෙවියන් දන්නවා. දෙවියන් ඔබට පාවඩ එලනවා දිව්‍ය තලයකට. බලන්න! මොන තරම් ආශ්චර්යමත් ධර්ම මාර්ගයක්ද? මරණය කියන කාරණය මොන තරම් සුන්දර මංගල්‍යයක්ද. පින්වත් තරුණ ඔබ දෑඟිලි බැඳලා, අත්පැන් වත්කරලා, පෝරුවට නැගලා, ජයමංගල ගාථා කියවලා මංගල්‍යයක් කරගතහොත් ඒ බැඳුණු මොහොතේ පටන් ඔබ මොන දුක් කන්දරාවක්ද විඳින්නේ. 'මම' කියන දුක වෙනුවට තව 'මගේ' කියන දුක් කීයක් කරගහ ගන්න සිද්ධවෙනවාද? පින්වත් ඔබ බැඳෙන සාම්ප්‍රදායික මෝහ මූලික බැඳීම් මංගල්‍යවලට වඩා බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්ම මාර්ගය ඔබේ සහකරු, සහකාරිය කරගතහොත් එයයි සැපයම ඉතිරිය කරගත් සැබෑම මංගල්‍යය.** අපි 'මරණය මරණය' යැයි අඳෝනා තැබුවද, ධර්මයට අනුව මෙතැන මරණයක් නැහැ. පුද්ගලයෙක් මැරෙණ නිමේශයේම ඊළඟ ප්‍රතිසන්ධිය සකස්කර ගන්නවා. රැස්කර ගන්නා වූ සංස්කාරයන්ට අනුරූපීව. අපි මෝහය නිසා කුණුවෙන මළකුණක් එම්බාම් එකෙන් සරසවලා, ඒකට මඟුල් ඇඳුම අන්දවලා අඬනවා, වඳිනවා, විලාප තබනවා. අපි මේ විලාප තබන්නේ ඒ මොහොතේ භවයේ කොතැනක හෝ උපත ලබා ඇති සත්ත්වයෙක් වෙනුවෙන්. අන්න ඒ නිසාමයි බුදුරජාණන් වහන්සේ මළකුණකට වටිනාකමක් නොදී මරණින් මතු ලබන භවය සැපවත් කරගැනීම උදෙසාම මාර්ගය කියා දෙනනේ. මෙතැනදීත් අපිට පැහැදිළියි බුදුරජාණන් වහන්සේගේ ධර්මය මරණය ගැනම කතා කරන ධර්මයක් නොව, මරණින් මතු සැපයටම මාර්ගය කතා කරන

ධර්මයක් කියලා. පින්වත් ඔබයි මෝහ මූලිකව මරණයක් බදාගෙන ධර්මයේ නැති දුකක් උපදවා ගන්නේ, තෘෂ්ණාවේ දැඩි භාවය නිසාම....

ශ්‍රද්ධාව අඩු පින්වතුන් නිරතුරුවම මැසිවිලි නගනවා, සද්ධර්මයට එරෙහිව. 'බුදුරජාණන් වහන්සේ දුක ගැනමයි කියන්නේ' කියන කාරණය 'ධර්මයට අනුව ගියොත් අපට අඹුදරුවන්, දේපළ, තනතුරු අත්හරින්නයි වෙන්නේ' කියන කාරණය. නමුත් ගිහි පින්වතුන්ලාට ධර්ම මර්ගයට අදාළව ඉහත කාරණා කිසිවක් අත හරින්න යැයි කොතනකවත් දේශනා කරලා නැහැ. පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් ඉහත සැප සම්පත් පරිහරණය කරන්න කියලයි බුදුරජාණන් වහන්සේ ගිහි පින්වතුන්ලාට දේශනා කරන්නේ. නමුත් පින්වත් ඔබ අත්හැරීමට ගන්නා උත්සහයේ තරමටම දුක අඩු වෙනවා කියන කාරණය ප්‍රකාශ වෙනවා. පින්වත් ඔබට, බුදුරජාණන් වහන්සේ මරණය ගැන නිතරම මෙනෙහි කරමින් ජීවත් වෙන්න කියලා කියන්නේ, පින්වත් ඔබට මරණය පෙර සඳහන් කළ පරිදි මංගල්‍යයක් කරගන්න මිස හඬමින් විලාප තබමින් කරන අවමංගල්‍යයක් තත්ත්වයට පත්කර ගැනීමට නොවේ. **පින්වත් ඔබ මරණයට පෙර සූදානම් වුවහොත් පමණයි ඔබට මරණය මංගල්‍යයක් කරගන්න අවකාශ ලැබෙන්නේ. එම මරණය නැමැති මංගල්‍යයේදී සග්‍රික දිව්‍යතල වල දෙවියන්, දිව්‍යාංගනාවන් ජයමංගල ගාථා සංගීත ස්වරය නගමින්ම ඔබව දිව්‍ය තලවලට පිළිගන්නවා. මේ මනුෂ්‍ය ලෝකයේ කුණු, ජරා, ව්‍යාධි මරණ සැපය වගේද පින්වතුනේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් ඔබට පෙන්වන ශ්‍රද්ධාවේ, සීලයේ, දානයේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වන සැපය. ධර්මයෙන් පින්වත් ඔබට කතා කරන්නේ ඉහත මංගල්‍යයක් වන මරණය නමුත් ශ්‍රද්ධාව අඩු පින්වතුන් 'මරණය' ලෙස දකින්නේ මොන තරම් මෝහ මූලික දෘෂ්ඨිගත මරණයක්ද?**



ගෝරතර  සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-02-9

9 789557 887029

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 140/-